*Monika Pushpa Kumari*
*Hadavila pubuda*

# හදවිල පුබුදා



The Reader's Place

## මොනිකා පුෂ්ප කුමාරි

තහ පාට ලොකු පොකුරු
විහාර පිච්ච මල් පුවඳ
සනසනා හද විලම
පිබිද එයි ඔබ නමට..

එකතු වී අප දෙදෙන
ගොඩ නැගූ මේ ගෙදර
දැසමන් මල් පොකුරු
පිදේවි මුදු පුදට..

සංසාරේ කෙළවරට
එකට ගමනකට
කල්ප ගානකට පෙර
එකතු වූ අප දෙදෙන..

පහන් සිළ පිවිසේ
ඔබයි මගෙ ආදරේ
ගෙනෙන්නම් වාසනා
දිවි පුරා ඔබ නමට..





The Reader's Place





# 01

නුවරට ආරූම හීනල තුනීවට පරිසරය පුරා පැතිර තිබිණි. දොළ පාර ළඟ ගල් බැම්ම මත හිඳගත් ශික්ෂා දෙකකුල් දොළ පාරට ඔබා ගත්තාය. සිනිඳුවට පය තෙමන වතුර රිදීපාටය. පිරිසිදුය.

"නංගෝ.."

ඒ අක්කා - මෝක්ෂාගේ කටහඬය. ශික්ෂා ගෙල හරවා බැලුවාය. අක්කා ගල්පඩි දෙක තුන බැහැගෙන එන්නේ කලබලයෙනි.

"මං හැම තැනම බැලුවා.. පස්සෙ මතක් වුණේ මෙතන ඇති කියලා.."

මෝක්ෂාත්, ශික්ෂා සේම දියට දෙපය දමා ගල් බැම්ම මත හිඳ ගත්තාය.

"ඊහ්.. සීතල නැද්ද මෝඩියේ.."

මෝක්ෂා කැගසමින් යළි දෙපා උඩට ගත්තාය.

''මේ සීතල මට පුරුදුයි අක්කා..''

ශික්ෂා හීන් හඬින් කීවාය. ඇත්තය. දොලේ දියේ සීතල ඇයට පුරුදුය. ශික්ෂා ඒ සීතලට ආදරේය.

''ඔව් ඉතිං ඔයා නම් දවසම උනත් මෙතන ඉඳී..''

මෝක්ෂා ආයෙම කීවාය.

එකම රුවින් යුත් සහෝදරියන් දෙන්නා දිහා බලා ඉගි කරමින් රෝස පාත්තිය පුරා පිපී පාට පාට මල් සුළඟට සෙලවිණ. මේ රෝස පාත්තිය දොළ පාර ළඟ හැදුවේ ශික්ෂාගේම අත්වලිනි.

''ඒක හෙමේ ගුඩ් නිව්ස් එකක් තියෙනවා.. කිව්වොත් මොනාද දෙන්නෙ..?''

මෝක්ෂා නැගණිය දෙසට බරව ඇසුවාය.

The Reader's Place

''මොකක්ද අක්කා..?''

ශික්ෂා උනන්දුවෙන් ඇසුවාය.

''ඒක තමා මං ඇහුවෙ, කියනවට මට මොනාද දෙන්නෙ කියලා..''

මෝක්ෂා අගය කළාය.

''අනේ අක්කා අගේ නොකර කියන්නකෝ. මං ළඟ තියෙන හැම දෙයක්ම ඔයාටත් අයිතිනේ..''

ශික්ෂා පෙරලාගෙන උන් පොත වසා අක්කා දෙස බැලුවාය. ඇත්තය. නිවුන් සොයුරියන් ලෙස ඉපදුණ, එකටම හැදුණ වැඩුණ ඔවුන් අතර හැමදේකටම තිබුණේ සමාන අයිතිවාසිකම්ය.

''මාව අර පේපර් ඇඩ් එකට තෝරගෙන හලෝ..''





මෝක්ෂා සතුටින් කෑගැසුවාය. ඒත් ඇය බලාපොරොත්තු වූ සතුට නැගණියගේ මුහුණ මත ඇඳුණේ නැත.

''ඇයි නංගි ඔයාට සතුටු නැද්ද..?''

''අක්ක හිතනවද ගෙදරින් අක්කට ඒකට යන්න දෙයි කියලා..''

ශික්ෂා සිහිපත් කළේ මෝක්ෂා ඔනෑකමින්ම අමතක කර සිටි කාරණයකි. තාත්තා හෝ අම්මා කොහොමවත් මෝක්ෂා නිරූපිකාවක් වෙන්නට දරන උත්සාහයට කැමති නොවූහ. එහෙත් මෝක්ෂාගේ ජීවිතයේ එකම පැතුම වූයේ නිරූපිකාවක ලෙස දුර ගමනක් ඉදිරියට යාමය. කවදාක හෝ රංගන ශිල්පිනියක වීමේ ආශාවක්ද ඇගේ සිතේ විය. මේ දෙකටම උචිතමනා දුර්ලභ රුවකුත්, ආකර්ශනීය හැසිරීම් රටාවකුත් මෝක්ෂා ළඟ උපතින්ම තිබිණි.

එහෙත් උඩරට රදල පෙළපතක අවසන් පුරුක වූ තාත්තා හෝ ඒ තාත්තාගේ වචනයට කීකරු බිරියක වූ අම්මා මෝක්ෂාගේ මේ බලාපොරොත්තුවට කොහෙත්ම කැමැත්තක් පෙන්වූයේ නැත.

''තාත්තියි, අම්මියි නම් බර බරේ දායි තමා.. ඒත් මං හිතන් ඉන්නෙ මේ පාර නම් චාන්ස් එක අතාරින්නෑ කියලා..''

මෝක්ෂා තිර හඬින් කීවාය.

''තාත්ති එපා කිව්වත් ඔයා යනවද අක්කි..?''

ශික්ෂා පුදුමයෙන් ඇසුවාය.

''මේ වගේ චාන්ස් එකක් අරගන්න කොච්චර අමාරුද කියලා ඔයා දන්නෑ නංගි..''

මෝක්ෂා නංගිගේ ප්‍රශ්නය මගහරිමින් කීවාය.

''ඔයා ගියොත් ගෙදර ගිනි ගනී..''

හතර අතට පෙනෙන තේ යාය පාලනය කළ තාත්තා

ගෙදරටත් ඒ වාගේම දැඩි නීති පද්ධතියක් පනවා තිබිණි. එහෙත් ඒ නීතිවලට යටින් වූයේ හැම සෙනෙහෙබර තාත්තා කෙනෙක් ළඟම ඇති ආදරයමය.

"දැම්ම යන්නෑ අනේ.. නාම මට මාරියෝ කිව්වෙ මාව සිලෙක්ට් කරගත්තා කියල විතරයි.. එන්න ඕන දවස එයා කෝල් කරලා කියයි.."

"කවුද අක්කි මාරියෝ..?"

"අර මගෙ යාළු ෆොටෝග්‍රැෆර්.. අන්න එයා.."

"එයාද ඉතිං අක්කිව තෝරගෙන තියෙන්නෙ..?"

"අපෝ නෑ.. එයා ගාව මගෙ ෆොටෝස් වගයක් තිබ්බනෙ.. ඒවා දැකල ඔය මැගසින් එකට ස්පොන්සර් කරන කෙනා තමා කැමති වෙලා තියෙන්නෙ.."

මෝක්ෂා නැගණියට තේරුම් කළාය. තමාට තියෙන සමාජ දැනුම ගෙදර ලෝකය කරගත් නංගීට නැත.

"කවුද නංගි අර සුපරින්ටැන්ඩන් බංගලෝ එක පැත්තෙ ඉන්නව පේන්නෙ.. අපේ චන්දනද..?"

මෝක්ෂා හදිසියේම ඇසුවාය. කතාව වෙනතකට පෙරළිණ.

"ඔව් අක්කි.. මං අහගෙන තාත්ති උදේ චන්දනට කියනවා බංගලෝ එක අස් කරල දාන්න කියල.."

"හදිසියෙම මොකද..?"

මෝක්ෂා කුහුලින් දෙනෙත කුඩා කළාය.

"අලුතින් සුපරින්ටෙන්ඩ් පෝස්ට් එකට කාව හරි තාත්ති ඉන්ටවිව් කරලා පාස් කරලා මා හිතේ.."

ශික්ෂා තමා දන්නා තරම කීවාය.





"අපෝ ඇත්තද..? මොනාද ඉතිං.. තාත්තිගෙ පාස් කිරිල්ල මං දන්නවනෙ.. සුපර් එකටම තාත්තිගෙ වයසෙ.. ඔළුව තට්ටෙ පැදිච්ච, බඩ ඉදිමිච්ච.. අඩි දහයක් පයින් යන්න බැරි නාකි කොල්ලෙක්ව තෝරගෙන ඇති.."

මෝක්ෂා උපහාසයෙන් කීවාය. ශික්ෂාගේ මුහුණ සිනාවකින් එළිය වැටිණ.

"නිකමටවත් ඇහැට කනට පේන කොල්ලෙක්ව ගන්නෙ නැනෙ.. කම්මැලිකමට ගෙදර ඉන්න වෙලාවට බලබලාවත් ඉන්ඩ.."

මෝක්ෂා කියවාගෙන ගියාය. වතු අධිකාරී තැන වූ රාජිත වරුසප්පෙරුමගේ නිවසත් ඔහුගේ වතුවල සියලු අධීක්ෂණ කටයුතු කරන දෙවෙනියාගේ නිවසත් තිබුණේ පෙනෙන දුරකිනි. මේ නිවෙස් දෙක වෙන්වූයේ සොයුරියන් ළඟින් ගලා ගිය සීත දොළ පාරෙනි.

"අපට බල බලා ඉන්ඩ කොහොම උනත් අක්කි ගිය පාර වගේ අපිව බලාගන්න කෙනෙක්ව තෝරගෙනද දන්නෑ.."

ශික්ෂා ළඟ අතීතය සිහිපත් කළාය.

"අපෝ ඇත්ත.. මතකනේ ගුණරත්න අංකල් උන්නෙ කාලෙ.. අපට ගෙයින් මිදුලට බහින්න නෑ.. අපි පස්සෙං.. එයා වත්ත නෙමේ බලාගත්තෙ අපි දෙන්නව.."

අක්ක නගාලට ආයිමත් හිනාය.

"අනේ අනේ.. මං මේ අක්කල නගාල කොහෙද බැලුවා.. දැන් තාත්ති එන වෙලාව.. ගෑනු ළමයි දෙන්නව ගොම්මන් වෙලාවෙ වතුර පාරවල් ළඟට ඇරියා කියලා තාත්ති මටයි කෑගහන්නෙ.."

අක්කාගේත්, නංගීගේත් හිනා හඬ නතර විය. ඔවුන් ගෙල

හරවා බැලුවේ එකවිටමය. කන්ද උඩ මිදුල කොණට වෙන්නට අම්මා දැත් ඉනට ගහගෙන බලා හිඳී.

''මෝක්ෂා.. නංගිත් එක්ක එන්න..''

රෝෂණී දියණියන්ට කීවාය. මෝක්ෂා දොළ පාර ළඟින් නැගිට්ටේ ශික්ෂාගේ කරේ එල්ලීගෙනය. ඇගේ ඇතිල්ලීගෙන ගල් පඩි නගින අක්ක නගෝ දෙස රෝෂණී බලා උන්නේ ආඩම්බරයෙනි. මේ බෝනික්කි පැටවුන් දෙන්නා තමන්ගේ කුසින් මෙලොවට බිහි කළ දවස රෝෂණීට අද වාගේ මතකය.

''ඔන්න නුවරටම ගැළපෙන ලස්සන රෝස මල් දෙකක් මිසිස් වරුසප්පෙරුමට ලැබිලා..''

ගෙවන වාට්ටුවේ ප්‍රසව වෛද්‍යවරයා එදා රෝෂණීට කීවේ එහෙමය. පරම්පරාව ගෙනියන්නට පුතු රත්නයක් බලා උන් රාජිතගේ මුහුණ තරමක් අඳුරුව ගියා ඇත්තය. ඒත් දියණියන්ගේ මුහුණු දුටු රාජිතගේ හිතේ ඇඳුණු සොම්නස එදා මුහුණින් පිළිබිඹු විය.

''එක වගේ උනාට දෙන්නගෙ ගතිගුණ වෙනස්.. ශික්ෂා අහිංසකයි.. ඒත් මෝක්ෂා පොඩි කාලෙ ඉඳලම දඟයි..''

රෝෂණී සිහි කළාය. මිදුලට ගොඩවූ සොයුරියන් දෙදෙන දෙපැත්තෙන් අම්මාගේ කරේ එල්ලුණහ.

* * * * * * * *

'වරුසප්පෙරුම එස්ටේට්' යන පුවරුව ළඟින් බයිසිකලය ඇතුළට හරවාගත් සස්මිත තේ යාය මැදින් වැටුණු පාර දිගේ එය පදවාගෙන ගියේය. නුවරට පමණක් ආවේණික පැහැයන් කීපයකින් යුත් ලොකු රෝස හා ඩේලියා පඳුරු කීපයකින් වටව ගිය වරුසප්පෙරුම බංගලාව ළඟටම ඔහු බයිසිකලය පදවාගෙන ආවේය.





ළපටි තණතිල්ල මත බයිසිකලය නතර කළ සස්මිත හෙල්මටය හිසින් මුදා හාත්පස බැලුවේය. ඇහැපේන මානේ සුවිසල් ගෙදර මිස පණ ඇති කිසිවෙකු නොවේ.

එහෙත් සස්මිත පය තැබූ තැනට ඉහළින් ලොකු පේර ගහේ දෙබලක හිඳ දෑසක් සස්මිත දෙසට යොමුව තිබිණ.

''කවුද මේ හැන්ඩියා.. මාර ලස්සනයිනේ..''

හෙල්මටයෙන් මිදුණ සස්මිතගේ කඩවසම් මුහුණ දැක මෝක්ෂා හිතුවාය. පේර කඩන්නට ගහට ගිය ඇ බයිසිකලයක් පාර දිගේ ගේ පැත්තට ඇදී එනවාත් එයින් කිසිදා දැක නැති තරුණයෙක් බිමට බහිනවාත් නිහඬවම බලා උන්නාය.

සස්මිත උන්නේ දෙගිඩියාවෙනි. කතා කරම්දෝ නොකරම්දෝ කියා හිත හිතා පේන්නට කවුරුවත් ඇද්දැයි වටපිට බැලුවත් දැස මානේ කිසිවෙක් නොවේ.

''ශීර්...!''

''උහ්..!''

ඉතා තදින් යමක් සස්මිතගේ උරිස්සට වැදිණ. ඔහු ගෙල හරවා බැලුවේ වේදනාවෙනි. එහෙත් ඇගේ වැදුණේ මොකක්ද කියලාවත් පැහැදිලි අදහසක් ඔහු තුළ නොවිණ.

'විදුණද කොහෙද..?'

පේර අතු අස්සේ හැංගී හිඳ පේර ගැටයකින් සස්මිතට ගැසූ මෝක්ෂාගේ හිතේ සොම්නසක් වැතිරිණ.

''ගෙදර කවුද..? ගෙදර කවුද..?''

සස්මිත කතා කළේ වකිතයෙනි.

ගෙදරින් කවුරුවත් එළියට බහින්නට පෙර මෝක්ෂා දෙවන



The Reader's Place

පේර ගැටයක් සස්මිත දෙසට විසි කළාය. තාත්තාගේ අණට යටත්ව ගෙදරට හිරකාරියක්ව ගෙවන ජීවිතේ මෙහෙමවත් සතුටක් අත් විඳින්නට ලැබෙන්නේ කලාතුරකිනි.

"ඩිග්..!"

එවර පේර ගැටය සස්මිතගේ ඔලුවේ වැදිණ.

"උහ්..!"

ඔහුට වේදනාවට කෙඳිරි ගෑවිණ. වහා හැරී ඈත මෑත බැලූ ඔහුට කිසිවෙක් නොපෙණින. බිම බැලූ සස්මිත තමන්ගේ දෙපා මුල තිබූ පේර ගැටය හැඳින්නේය. ඔහු ළඟ පාතම වූ පේර ගස දෙස බැලුවේ ඊළඟටය.

මෝක්ෂා - පේර අතු දෙබල මත හිඳ අතින් කට වසා උන් රුවැත්තිය සස්මිත දුටුවේය.

"ගෙදරට ආව ආගන්තුකයාට සලකන්නෙ මෙහොමද..?"

සස්මිත තරමක් කෝපයෙන් ඇසුවේය.

"අ..න්..නේ.. ඔයාගෙ නම ආගන්තුකයද..? එහෙම නමක් තියෙන කෙනෙක් මේ හම්බවුණාමයි.."

මෝක්ෂා බොහෝ සැහැල්ලුවෙන් කියා පේර අත්තෙන් බිමට පැන්නාය.

'මේ කෙල්ල මාර ලස්සනයිනේ..' තමා ඉදිරිපිට හිටගත් දඟකාරියගේ රූමත් බව සස්මිත හොඳින්ම දුටුවේ ඒ මොහොතේය. මුලින් හිතට ආ තරහව කොහේදෝ අතුරුදන්ව යනවා ඔහුට දැනිණ.

"රිදුනද..?"

දෑස ඉදිරිපිට උන් තරුණයාගේ සිත් ඇදගන්නා පෙනුම





මෝක්ෂාගේ හිතත් හිරිවට්ටා තිබිණ. ඈ සස්මිතගෙන් ඇසුවේ ඒ හින්දාය.

"නරක තැනකට වැදුන නම් එහෙම.. වන් ෂොට්ම තමා.. මං මෙතනම ඉවරයි.."

සස්මිත හිනාවී කීවේය.

"සොරි.. පේර ගෙඩියක් දෙන්නද..?"

අත තිබූ පේර ගෙඩි දෙක තුන මෝක්ෂා සස්මිතට පෑවාය. සස්මිත ඉන් එකක් ප්‍රවේශමට අතට ගත්තේය. ඒ ඇගේ හිත රිදවන්නට අකමැති වූ නිසාය.

"මට මිස්ට රාජිත වරුසප්පෙරුමව හම්බවෙන්න පුළුවන්ද..?"

සස්මිත ඇසුවේය.

"තාත්ති ඇතුළෙ ඉන්නවා.. ඇවිත් ඉඳගන්න.. මං පණිවිඩේ කියන්නං.."

මෝක්ෂා ගේ ඇතුළට ඉගිළිණ.

'එතකොට මේ මිස්ට වරුසප්පෙරුමගෙ දුව වෙන්නැති.. ඉඳල ඉඳලා මටත් රස්සාව හම්බවෙලා තියෙන්නෙ මාර තැනක තමා..' සස්මිත සිතුවේය. ආගන්තුක සතුටක් ඔහුගේ හිත ඇතුලේ පෙරළි කළේය.

"ආ.. එන්න.. එන්න ඇතුළට.. මට නම නම් මතක නෑ.. එදා ඉන්ටවිව් කළාට ඔය නම් මට මතක හිටිනව හොරයි.."

රාජිත සස්මිතව ළෙංගතුව පිළිගත්තේය.

"මං සස්මිත මහානාම.."

සස්මිත ඉදිරියට ගියේ එහෙම කියාගෙනය.

"ම.. සස්මිත.. වැඩිය අහල පුරුදු නමක් නෙමේ.. ඉඳගන්න.."

රාජිත අසුනක් බර කළේ තරුණයාට ඉදිරි අසුන පෙන්වමිනි. සස්මිත කබාය මුදාහරිමින් අසුන බර කළේය.

"සස්මිත මං හිතන්නෙ නතර වෙන්නම බලාගෙන වෙන්නැති එන්න ඇත්තෙ නේද..?"

රාජිත ඇසුවේය.

"ඔව් සර්.. මං ඇඳුම් අරගෙන ආවා.."

"අර එහා පැත්තෙ තියෙන බංග්ලෝ එක සස්මිතට පාවිච්චියට ගන්න පුළුවන්.. අපේ චන්දන එතන ඇති.. මං ඉන්ටවිව් එක දවසෙ සස්මිතට අඳුන්වලා දුන්නෙ.. මතකයි නේද..?"

"මට චන්දනව මතකයි සර්.."

"චන්දන කියල දෙයි වැඩ කටයුතු කෙරෙන විදිහ.. කොළඹ ඉඳල ඇවිත් සස්මිතට මහන්සි ඇතිනෙ.. ගිහින් ඇඳුම් එහෙම මාරු කරගන්න.. හෙට උදේට ඔෆිස් එකට ඇවිත් මාව මුණ ගැහෙන්නකො.."

රාජිත උවමනා කළේ තරුණයා ඉක්මනට පිටත් කර හරින්නටය. අඩුම තරමේ කොළඹ වාගේ දුර බැහැරක සිට නුවරට යතුරු පැදියේම ආ සස්මිතට තේ කෝප්පයකින් සංග්‍රහයක් කරන්නවත් ඔහු උනන්දු නොවිණ.

තමන්ගේ වතුයායේ සියලු අධීක්ෂණ කටයුතු සඳහා තරුණයෙකු තෝරා පත්කර ගන්නට රාජිත තීරණය කර තිබුණේ පළමු පාරටය. මින් පෙර ඔහු මේ රාජකාරියට පත් කළේ මැදිවිය ඉක්මවූ පිරිමින්ය. ඒ ගෙදර ඉන්නා ගැහැණු තිදෙනාගේ ආරක්ෂාව ගැන සිතාය.

'දැන් ඉතිං මේ වගේ ඉලන්දාරියෙක්ව නැතුව මගෙ වයසෙ





කෙනෙක්ව මේ වැඩේට පත් කරගෙන බෑ.. මටත් දැන් ඉස්සර වගේ දුවල පැනල මුකුත් කරගන්න බැරි එකේ මේ වැඩවලට සේවකයො පාලනය කරගන්න ඉන්න ඕන මේ වගේ ඉලන්දාරියෙක්..' නිවසින් එළියට බහින සස්මිත දෙස බලා රාජිත සිතුවේය.

සස්මිත වරුසප්පෙරුම බංගලාවේ සිට බයිසිකලය ආපසු පැද ආවේ බොහෝ සෙමිනි. ඔහුගේ සිත නොදන්නා සතුටකින් වැසී තිබිණි. ඒ සතුට උතුරා ගියේ පේර ගසේ උන් යුවතිය දැන් - මේ මොහොතේ - පාර දිගේ තමා දෙසට එනවා දුටු හින්දාය.

දොළ පාර ළඟ ඇවිදින්නට ගිය ශික්ෂා ලා තැඹිලි පාට ලොකු රෝස මල් පොකුරකුත් කඩාගෙන පාර දිගේ ආපසු එමින් උන්නාය. මේ තමා කලින් දුටු යුවතියම බව සැක හැර දැනගත් සස්මිත ඇගේ ඉදිරිපිට මග හරස්කොට බයිසිකලය නතර කළේය.

"වැඩේම රස්තියාදු ගහන එකද..?"

සස්මිත හෙල්මටය මුදා ශික්ෂාගෙන් ඇසුවාය. ශික්ෂා තරුණ පිරිමි ළමයින් සමඟ ඒ තරම් ළඟ ඇසුරක් නැත්නී තිගැස්සී තමා ඉදිරිපිට ඉන්නා තරුණයා දෙස බැලුවාය.

"මොකෝ බයවෙලා.. ඔක්කොම චණ්ඩිකම් ගෙදෙට්ට නේද..?"

සස්මිත ආයේම කීවේය. වරුසප්පෙරුම බංගලාවේ මිදුලේ පේර ගහ යටදී වාගේ මේ දැස ඉදිරිපිට ඉන්නා තරුණිය ආයේමත් දඟ කරනවා දකින්නට ඔහු ආසා කළේය.

"ම්.. මට.. යන්..ඩ දෙනවද..?"

ශික්ෂා ගොත ගැසුවාය. දැස ඉදිරිපිට ඉන්නා තරුණයා සිත් ඇදගන්නා ආකර්ශනයක් ඇත්තෙකි. ඒත් ඒ නැනැත්තාව දකින්නේ පළමු වතාවටය. මෝක්ෂා මෙන් එඩිතර නොවූ ශික්ෂා සස්මිත හා කතා කරන්න බය වූවාය.

''යන්ඩ.. යන්ඩ දෙන්ඩ නෙමේ වටින්නෙ උස්සන් යන්ඩ.. මට කරපු දේට..''

සස්මිත කීවේ මෝක්ෂා පේර ගැටවලින් හැංගී පහර දුන් එක සිහිකොටය.

''අ.. නේ.. මට යන්ඩ දෙන්ඩ..''

ශික්ෂා අහිංසක හඬින් කීවාය. ගෙය තිබුණේ ජේන දුර බව ඇත්තය. මේ තමන්ගේ තාත්තාගේම ආධිපත්‍යය යැදී වතු යාය බවත් ඇත්තය. එහෙත් ඇත්තටම මග අවුරා උන් තරුණයාට ඈ බය වූවාය.

''අපෝ.. චණ්ඩිකම් කළාට පොඩ්ඩ ඇත්නං අඬනවනේ..''

සස්මිත ශික්ෂාගේ නෙත් මත විසුරුන කඳුළින් තැති ගත්තේය.

''ඔන්න අපි ගියා.. හැබැයි මීට පස්සෙ පේර විතරක් දීල නම් බේරෙන්නෙ ලැබෙන්නෑ.. තේරුණාද..?''

සස්මිත බයිසිකලයේම පල්ලමට යන ගමන් කීවේය.

ශික්ෂා උන්නේ කිසි දෙයක් තේරුම් කරගන්න බැරිවය. ගල්පඩි දෙක තුන නැග මිදුලට ගොඩවුණේ කල්පනාබරවය.

''නංගෝ..''

ශික්ෂා බිම බලාගෙන මිදුලට ගොඩවෙනකොට මෝක්ෂා මිදුලේය.

''යකඩ අශ්වයෙක් පිටේ නැගලා ලස්සන කුමාරයෙක් ගියා දැක්කද..?''

මෝක්ෂා හිනාවෙවී ඇසුවාය.

''මොකක්ද අක්කා..?''





ශික්ෂාට මේ මොකුත් හරියට තේරුම් ගන්න අමාරුය.

''ළමයෝ.. මොන කල්පනාවකද ඉන්නෙ..? බයිසිකලේක ලස්සන කොල්ලෙක් ගියා මෙහෙ ඉඳලා හම්බවුණාද..?''

''හම්බුණා නේන්නං..''

ශික්ෂා පුදුමයෙන් කීවාය.

''කතා කළාද..?''

''ඒක නේන්නං අක්කා.. මං දැක්කෙත් අදමයි.. ඒත් මීට කලින් අඳුනනවා වගේ බයිසිකලේ නතර කරලා මාත් එක්ක කතා කළානෙ..''

ශික්ෂා හිතේ පුදුමය වචන කළාය.

''ඉතිං.. ඉතිං.. මොනාද කිව්වෙ..?''

''මොකක්දෝ පේර කතාවක් කිව්වා අක්කා.. මට නම් මුකුත් තේරුණේ නෑ..''

ශික්ෂා අසරණ හඬින් කීවාය. මෝක්ෂාට සතුටේ බැරිය. ඇගේ මුවින් ලොකු හිනාවක් විසිරිණ.

''අක්කි ඔයා මොනා හරි මට හංගනවා..''

අක්කාගේ සිනාවේ ලොකු අදහසක් ඇතැයි ශික්ෂාට හිතිණි. ඈ කැමති දඟ කරන්නය. අනුන්ව රවටන්නය. එහෙම දෙයක් කර මෙහෙම හිනාවෙන්නය.

''මුකුත් නෑ හලෝ.. අර මැන්.. දැන් මෙහේ ඉඳල ගිය කෙනා.. එයා අපි දෙන්නව පටලවගෙන.. ශුවර් එකටම එයා ඔයා එක්ක කතා කළේ ඒ මං කියලා හිතලා..''

සිද්ධ වෙන්නට ඇති දෙය ශික්ෂාට තේරෙන්නේත් දැන්ය.



The Reader's Place

අම්මාට තාත්තාට ඇරුනකොට මේ ගමේ බොහෝ දෙනෙකුට ශික්ෂාවත් මෝක්ෂාවත් වෙන්කොට හඳුනාගන්නට පුළුවන්කමක් නැත. බාහිර පෙනුමින් මේ දෙදෙනා ඒ තරමම සමීපය.

''ඔයා එයාව මීට කලින් අඳුනනවද අක්කි..?''

ශික්ෂා ඇසුවාය.

''මං එයාව ඔයාට කලින් අඳුනනවා.. තේරුණාද..? මං එයාව දැක්කෙ ඔයා දකින්න පැය භාගෙකට විතර කලින්..''

''එයා ආවේ මෙහාටද අක්කි...?''

''ඔව්.. තාත්ති හම්බවෙන්න..''

''ඇයි ඒ..?''

ශික්ෂා වහා ඇසුවාය. මෝක්ෂා නළල රැළි කොට නැගණිය දෙස බැලුවාය.

''නංගෝ..''

ඇ කීවේ තාලයටය.

''හොර පූසි වගේ මගෙන් ඔක්කොම අහගන්න හේද ලෑස්තිය.. මොකද කොල්ලව දැක්ක ගමන් හිත ගියාද..?''

ශික්ෂාට ලැජ්ජා සිතිණි. ඇගේ කම්මුල් රතු විය.

''න්.. නෑ.. ම්.. මං.. නිකං ඇහැව්වෙ..''

ශික්ෂා ගොත ගැසුවාය.

''ඕං.. කෙල්ල බොරු කියනවා.. ඒ වගේ කොල්ලෙක් දැක්කම එකපාරට දෙපාරක් හැරිල බලන්නැති කෙල්ල කවුද මෝඩි.. මං නම් ඔයා වගේ මටම බොරු කරගන්නෑ.. මැන් දැක්ක විතරයි මාව කරකැවිලා ගියා..''





ශික්ෂා අක්කාගේ ඒ ගතිගුණය හොඳින් දැන උන්නාය. ඇ තමන්ගේ හිතේ පිරිමියෙකු ගැන ඇතිවන හැඟීමක් උනත් හංගා නොඇද එළිපිට කීවාය.

''එයා මෙහෙ ආවෙ ඇයි අක්කි..?''

ශික්ෂා ආයේම ඇසුවාය.

''ඒක නම් හරියටම හොයාගන්න බැරිවුණා. දන්නවනෙ තාත්තිගෙ හැටි.. ගෙදෙට්ට පිරිමි ප්‍රාණියක් ආව වෙලාවට අම්ම හරි අපි දෙන්නගෙන් කවුරු හරි පේන තැනක ඉඳල අහුවුණොත් වසල හමාරයි.. ඒ හින්දා මට හැංගිලා ඉඳලවත් සාලෙට මූට්ටිය දාල බලන්න බැරිවුණා.. මොනා උනත් කලාතුරකින් දකින්න ලැබෙන ගති කොල්ලෙක්..''

මෝක්ෂා කීවාය.

ශික්ෂාටත් එහෙම්ම හිතිණි. අක්කා වාගේ හිතට එන හැම දෙයම එළියට දා පුරුද්දක් ශික්ෂාට නොවුණත් ඇගේ හිතේ කොණක ඔහුගේ මුහුණ හැංගී තියෙනවා ශික්ෂාට දැනිණි.

සාමාන්‍යයෙන් අහල ගම් හතක කිසිම තරුණයෙක් ශික්ෂා ඉදිරිපිට ඔය වගේ විහිළු කරන්නට පෙළඹෙන්නේ නැත. ඒ ශික්ෂා, රාජිත වරුසප්පේරුමගේ දියණියක් බව දන්නා නිසාය. එහෙත් දැන හෝ නොදැන ඔහු නෙත ඉදිරිපිට නිර්භයව හැසිරුණ දඟකාරී විලාසය ශික්ෂාගේ හිත ගිරිවට්ටා තිබිණි.

* * * * * * * *

කොළඹ හුරුපුරුදු දේශගුණයට වඩා මේ මධ්‍යම කඳුකර දේශගුණය කොයි තරම් සුවදායකද කියා පහුදාට පහන් වෙද්දී සස්මිතට හිතිණි.

''මහත්තයට හොඳට නින්ද ගියාද..?''

චන්දන උදේ කෑම මේසයේදී සස්මිතගෙන් ඇසුවේය.

''මේ මොනාද අහන්නෙ.. මෙහේ තියෙන්නෙ පට්ට සීතලක්නේ.. ඇඳට වැටුණා විතරයි මතක.. සනීපෙට නින්ද ගියා..''

සස්මිත සතුටින් කීවේය.

''කවුද මේ බත් ඉව්වෙ..? චන්දනද..?''

පිඟානට කෑම බෙදාගන්නා අතර සස්මිත ඇසුවේය.

''ඔව් මහත්තයා.. මේ බංගලාවෙ ඉන්නෙ ඉතිං අපි දෙන්න විතරනේ.. සමහර දවසට ලොකු සර්ගෙ ගෙදරින්නුත් කෑම එවනවා.. ඒත් ඉතිං මං කැමති ඔය පුළුවන් විදිහකට මොනා හරි හදාගන්න.. මහත්තයට නම් මගෙ කෑම අල්ලයිද දන්නෑ..''

චන්දන කීවේය.

''ම්.. වරදක් නෑ.. කඩෙන් කනවට වඩා හොඳයි..''

The Reader's Place

සස්මිත බත් කන අතරේ කීවේය.

''චන්දන මෙහෙට ඇවිත් ගොඩක් කල්ද..?''

ඔහු ආශයෙමත් ඇසුවේය. වරුසප්පෙරුම වතු යාය ගැන තොරතුරු අසා දැනගන්නට සස්මිතට ඕනෑ වී තිබිණි.

''මං මෙහෙට ආවෙ දහයෙ පන්තියට පාස්වෙච්ච අලුත මහත්තයා.. දැන් අවුරුදු විස්සක් විතර..''

චන්දන කීවේය.

''කොහොමද මිස්ටර් වරුසප්පෙරුම එහෙම හොඳද..?''

සස්මිත ඇසුවේය.





''ලොකු සර්ද..? අනේ හරි හොඳයි.. හැබැයි හරි නීතිකාරයා.. අකුරට වැඩ.. හැමදේකම පිළිවෙලටයි පිරිසිදුකමටයි කැමති..''

චන්දන විස්තර කළේය.

සස්මිතට වරුසප්පෙරුමගේ ගෙදර ගැන තොරතුරු දැන ගන්නටත් ලොකු ඕනෑකමක් තිබිණි. විශේෂයෙන් අර වරුසප්පෙරුමගේ විටෙක දඟකාර, විටෙක අහිංසක රූමත් දියණිය ගැන තොරතුරු දැන ගන්නට ලොකු ආසාවක් ඔහු තුළ තිබිණි.

'ඒත් මං එකපාරටම චන්දනගෙන් ඒව අහන එක හරි නෑ.. චන්දන උනත් මං ගැන වරදවලා හිතන්න පුළුවන්..' සස්මිත හිතුවේය. 'කමක් නෑ.. මමත් දැන් ඉතිං ඉන්නෙ මෙහෙනෙ..' ඒ අදහස සස්මිතගේ හිතට මිහිරියාවක් ගෙනාවේය.

* * * * * * * *



# 02

සස්මිත. වරුසප්පෙරුමගේ කම්හලට යන්නට බයිසිකලයට නැග්ගේ ද ප්‍රබෝධමත් හිතෙනි. කම්හලත් කාර්යාලයත් එකට පිහිටා තිබුණද ඒ දෙක තිබුණේ මේ බංගලා දෙකින්ම වෙනත් කඳු ගැටයකය.

සස්මිතගේ බයිසිකලය පාරට දැම්මා විතරය. සැහැල්ලු අත් දිග ටී ෂර්ටයක් හැඳ ඒ ටී ෂර්ටයේම කොටසක් වූ තොප්පිය හිසේ දමාගෙන සුදු ඉරක් වැටුණු නිල් කලිසමක් ඇඳ පාර දිගේ සැහැල්ලුවට දුව එන යුවතිය අඳුනාගන්නට ඔහුට අමාරු නොවිණි.

වරුසප්පෙරුමගේ දියණිය සස්මිතගේ බයිසිකලය ඉදිරිපිට පාරේ දුව එමින් උන්නාය.

ශරීරයේ හැඩ තල ගැන ශික්ෂාට වඩා උනන්දු වන මෝක්ෂා කොයි තරම් ශීතල උදයක උනත් ව්‍යායාමයට වතු යායේ පාරවල් අතර දිව්වාය. සැමදා උදෑසන කරන මේ සැහැල්ලු ව්‍යායාමය





ගමාර කොට ආපසු එන යුවතිය පෙරදා හවස ගෙදරට ආ යතුරු පැදියත් එහි අයිතිකරුවාත් හොඳින් හඳුනා ගත්තාය.

''ගුඩ් මෝනිං..''

මෝක්ෂා පාර මැද හිටගෙන දෑත ඉණට ගහ ගත්තාය. සස්මිත යතුරුපැදිය නතර කළේය.

''ගුඩ් මෝනිං.. මොකද උදේ පාන්දර හති දාගෙන දුවන්නෙ.. ඊයෙ රෑ හොරකමේවත් ගියාද..?''

සස්මිත ඇහුවේත් හිනාවීගෙනය.

''පිස්සුද.. මං මේ හොරකමේ ගියා නෙමේ.. මං මේ හොරෙක් අල්ලන්න ගියා.. මං දැන් තමා හොරාව අතටම අහුවුනේ.. මේ මහත්තයො මට කියනවද අපේ එස්ටේට් එකේ පාරවල් ගානෙ බයිසිකලෙන් රවුම් ගහන්නෙ කාගෙන් අවසර අරන්ද කියලා..''

The Reader's Place

මෝක්ෂා දඟකාරී ලෙස කීවාය. හාන්පස දැඩි ශීතල ඇයට අමතකව තිබිණි. ඇත්තටම සස්මිතගේ හමුවීම ඇගේ හිත උණුසුම් කොට තිබිණි.

''දැන් ඔහොම ඇහුවට ඔය ප්‍රශ්නෙ හෙට අනිද්ද වෙනකොට අහන්න වෙන්නෙ මටයි.. මං මේ වරුසප්පෙරුම එස්ටේට් එකේ සුපිරින්ටෙන්ඩන් විදිහට වැඩ බාරගන්ඩ යන ගමං.. අදින් පස්සෙ මං කාක්කෙකුටවත් මට හොරෙං මේ පාරක පියාඹන්න දෙන්නෑ..''

සස්මිතත් දඟකාරී ඉරියව්වකින් කීවේය.

''න්.. නෑ.. ඔයාද අපේ අලුත් සුපිරින්ටෙන්ඩන්..''

මෝක්ෂාට හිත උපන් සතුටට කෑගැසිණ.

''හෝව්.. හෝව්.. ඔයාලගෙ නෙමේ.. ඔයාලගෙ වත්තේ.. වත්ත බලාගන්නට මට ඔය ගෑනු පරාන අධීක්ෂණය කරන්න බෑ..''

''හරි හලෝ.. වත්ත තමා.. අපේ තාත්ති ඔයාට අපිව බලාගන්න දෙන්නෑ කීයටවත්.. දැන් කොහොමද දන්නවද ඔක ඊළඟට වෙන්නෙ.. ඔයා වත්ත බලාගන්නවා.. ඊළඟට අපිට තමා ඔයාව බලාගන්න වෙන්නෙ.. කමක් නෑ.. මොනා උනත් ෆිට් තමා.. දාන්ඩ පතක්..''

මෝක්‍ෂා අත්ල විදහා සස්මිතට පෑවාය. සස්මිත ඒ අතට සියුම් තට්ටුවක් දැම්මේ දෙවරක් නොහිතාය.

ඇය විවෘත කෙල්ලෙකි. ඈ ඉන්නා තැනක පාළුවක් නැත. ඔක්කෝටම වඩා වතු අයිතිකාරයාගේ දියණිය විදිහට ඈ ළඟ තිකමට හෝ තිබිය යුතු ආඩම්බරකම, අහංකාරය බොරුවටවත් ඈ ළඟ නැත. මේ සැහැල්ලු සොඳුරිය හෙමින් හෙමින් සස්මිතගේ හිතට රිංගමින් තිබිණි.

''ඊයේ හවස පුස් පාට් එකක් දාලා මග ඇරලා ගිය විදිහට මං හිතුවෙ නෑ ඔයා ආයෙ මේ විදිහට මට කතා කරයි කියලා..''

සස්මිත හිටිහැටියේ කීවේය.

''ආ.. ඒ.. ඒ..''

මෝක්‍ෂා ගොත ගැසුවාය. ඔහු මේ කියන්නේ කා ගැනදැයි මෝක්‍ෂාට පැහැදිලිය.

''මං හිතුවෙ අහස වගේ ඔයත් මේ හිටියා මේ පාට මාරු කරන කෙනෙක් කියලා.. ඇත්තටම මොකද ඊයෙ හවස මාව දැකලා අඳුරන්නැති පාට් එකක් දාලා බයවෙලා දිව්වෙ..?''

සස්මිත ඇසුවේය.

''ඊයේ හවස..? කොහෙදිද..?''

මෝක්‍ෂා ඇහුවේ යටි හිතේ සැලැස්මක් තියාගෙනය.

''ඇයි අර ගේ ඉස්සරහ පාරෙදි..''





සස්මිත කීවේය.

''අයියෝ.. ආපු ගමන්.. ආපු ගමන්.. ඔයත් එයාව දැක්කද..?''

මෝක්‍ෂා මුහුණට දුක්මුසු පෙනුමක් ආරූඪ කර ගත්තාය.

''එයා.. ඒ කවුද..?''

සස්මිත පුදුමයෙන් ඇසුවේය.

''එයත් මං වගේම ගෑනු ළමයෙක් නේද..? හැබැයි මට වඩා අහිංසක පාටයි..''

මෝක්‍ෂා ඇසුවාය.

''ඔව්.. ඔව්... මං හිතුවෙ ඒ ඔයා කියලා.. එතකොට ඒ ඔයා නෙමේද..?''

සස්මිත පුදුමයෙන් ඇසුවේය.

''න්.. නෑ.. පොඩ්ඩක් හිතන්ඩකො.. මං ගෙදර ඉඳන් ඔයා එක්ක කතා කළේ.. එතකොට මං උන්නෙ ගෙදරනෙ.. ඔයා පාරට බහිනකොට ගෙදර හිටපු මං කොහොමද ඔයාව හම්බවෙන්නෙ පාර දිගේ ඉස්සරහට එන්නෙ..''

මෝක්‍ෂා විස්තර කළාය.

''ඇත්ත නේන්නං.. මට ඒ ගැන කල්පනා වුණේම නෑනෙ.. එතකොට ඒ කවුද...?''

සස්මිත පුදුමයෙන් ඇසුවේය.

''ඒ ගැන මගෙන් අහන්නෙපා ප්ලීස්..''

මෝක්‍ෂා බිම බලාගත්තාය. මුහුණට දැඩි දුක්මුසු බවක් ආරූඪ කර ගත්තාය.

"ඇයි ඒ..? එහෙම කියන්නෙ මොකද..? මට එයා කවුද කියල දැනගන්න ඕන.."

සස්මිත කීවේ දැඩි අවුලකට පත්වය. එදා හවස මුණ ගැසුණ යුවතිය රුවින් මැයමය. ඉතින් ඇය මේ දැස ඉදිරිපිට ඉන්නා යුවතිය නොවේ නම් ඇය කවුද..?

"ඒක හරිම දුක හිතෙන කතාවක්.."

මෝක්ෂා දුක් සුසුමක්ද හෙලුවාය. සස්මිතට ඒ සුසුමේ තිබූ දුක්බර ගතිය දැනිණ.

"ඒ මගෙම සහෝදරී.. ඒත් එයා දැන් අපි අතර නෑ.."

මෝක්ෂා කීවාය.

"ම්... මොකක්ද..?"

සස්මිතට අදහාගන්න අමාරුය.

"ඒ මගෙ නංගි.. ඒත් එයා හදිසියෙම අපට නැතිවුණා.. ඒක සිද්ධ වුණේ හරිම හදිසියේ.. අපි කවුරුවත් නොහිතුව විදිහට.. අඩුම තරමෙ එයාවත් හිතුවෙ නෑ එයාට එහෙම දෙයක් වෙයි කියල.. එයා උන්නෙ කොහොමවත් අපිව තනි කරල යන්න බලාගෙන නෙමේ.. අපෙන් ඈත්වෙලා ගියත් මගෙ නංගි තවමත් අපි අතර සැරිසරන්නෙත් ඒ හින්දා.."

මෝක්ෂා අසා ඉන්නා කෙනෙකුගේ නෙතට කඳුළක් උනන තරමට සංවේදීව කීවාය. ඇගේ රඟපෑම ඒ තරමට තාත්විකය. රංගන ශිල්පිනියක වෙන්නට හැමදාම හීන දැක්ක ඇයට මේ මොහොත දැනුණේ තමා ජනප්‍රිය ටෙලි නාට්‍යයක කොටසක් රඟපානවා සේය.

"ඒ.. ඒ.. කියන්නෙ.. ඒ.. කියන්නෙ එයා එයා ජීවතුන් අතර.. නෑ කියලද..?"





සස්මිතට ඇඟ සීතලව යනවා දැනිණි.

"ඔව්.. එයා නැතිවෙලා දැන් අවුරුදු දෙකකට වැඩි.."

"එතකොට.. එතකොට.. මං ඒ දැක්කෙ ඔයාගෙ නංගිගෙ හොල්මන කියලද ඔයා මට කියන්නෙ..?"

"ඔයා විතරක් නෙමෙ අනේ.. මේ එස්ටේට් එකේ ගොඩ දෙනෙකුට එයාව පෙනිලා තියෙනවා.. පුදුමෙ කියන්නෙ අපේ ගෙදර කාටවත් තාම එයාව පෙනිලා නැති එක.."

මෝක්ෂා කීවාය.

"අනේ මන්දා.. හරි පුදුමයි.."

සස්මිත කීවේ දෙලොවක අතරමං වෙමිනි.

"හොල්මන් කතා අහගෙන ඉඳලා ඔයාට පරක්කු වෙනවා.. අපි ඒ ගැන පස්සෙ කතා කරමු.. ඔයා දැන් යන්න.. හැබැයි.."

මෝක්ෂා සස්මිතගේ දෙනෙත් දෙස කෙලින් බැලුවාය.

"ඔයා මට එක දෙයක් පොරොන්දු වෙන්න ඕන.."

"මොකක්ද..?"

සස්මිත ඇසුවේය.

"අපේ නංගිව ඔයා දැක්කා කියලා හරි.. එයාට වෙච්ච දේ ඔයා දන්නවා කියලා හරි මෙහේ කාටවත් කියන්න එපා.. කොටින්ම අපේ නංගි ගැන වචනයක්වත් ඔයා කිසි කෙනෙක් එක්ක කතා කරන්නෑ කියල මට පොරොන්දු වෙන්න ඕන.."

මෝක්ෂාට උවමනා කළේ සස්මිත ඇත්ත දැන ගන්නා එක නතර කරන්නය. ඔහු කාගෙන් හෝ මෙහි ඇත්ත නැත්ත හෙළි කරගන්නට උත්සාහ දරන එක වළක්වන්නය.



The Reader's Place

''ඇයි ඔයා එහෙම කියන්නෙ..?''

සස්මිත අවුලෙන් අවුලට පත්ව උන්නේය.

''අපේ නංගිට අපේ ගෙදර අය පණ වගේ ආදරය කළා.. මේ වත්තෙ හැමෝම සේවකයො පවා එහෙමයි.. නංගි ජීවතුන් අතර නැති වුණත් අපේ හිත්වල නංගි ගැන තිබ්බ ආදරේ අදටත් ඒ විදිහමයි.. නංගි ගැන අහලා මං දැන් කම්පා උනා දුක් උනා වගේ ඔයාගෙ කටින් ඕක දැනගත්ත මේ එස්ටේට් එකේ කවුරු උනත් වේදනා විඳිනවා.. ඒ හින්දා ප්ලීස් මට පොරොන්දු වෙන්න.. ඔයා මේ ගැන කාටවත් නොකියා මේක රහසක් විදිහටම තියාගන්නවා කියලා..''

මෝක්ෂාගේ ඇස් අග කඳුලක්ද තිබිණි. ඈ මේ කතාව කොයි තරම් දුක්බර විදිහට ගෙතුවාද කීවොත් ඒ කතාව ඇගේ නෙතම තෙත්කොට තිබිණි.

''ප්‍රොමිස්.. මං ඔයාට පොරොන්දු වෙනවා.. මං ඒ ගැන ඔයා එක්ක ඇරෙන්න වෙන කා එක්කවත් කතා කරන්නෙ නෑ සත්තයි..''

සස්මිත වහා පොරොන්දු විය. මෝක්ෂාගේ ඇස් කඳුලින් තෙමී යනවා ඔහු දුටුවේය. මෝක්ෂා ඇගේ රඟපෑමේ ඉතිරි අඩ සම්පූර්ණ කරමින් සමුගැනීමකින් තොරවම නිවස දෙසට පාර දිගේ දිව ගියාය. ඒ ආපසු හැරී බලාද නොවේ.

'පව් අහිංසක කෙල්ල.. මං උදේ පාන්දරම එයාව පැරුවා.. කවුද හත්තිලව්වෙ ඉතිං ඔහොම කතන්දරයක් දන්නෙ..? එතකොට මාත් දැන් හොල්මනක් ෆේස්ටු ෆේස් හම්බවෙලා ටෝක් කරපු පොරක්.. ඒත් මං බයවුණේ නැනෙ.. ඔය සමහරුන්ට මෝහිණී පෙනුණම බයවෙනවා කියන්නෙ.. මට මේ ලස්සන හොල්මන් ගෑනු පරාණයක් ටෝක් කරලත් නූලක්වත් දාන්ඩ බයවුණේ නැනෙ.. යකඩෝ එතකොට මාත් රියල් පොරක්.. ඔව්.. මාත් මාර පොරක් තමා..'





බයිසිකලය ඉදිරියට පදවාගෙන යන අතරේ සස්මිත හිතුවේය.

හිනාව අමාරුවෙන් හංගාගෙන ගෙය තුළට දිව ගිය මෝක්ෂා හාමත් නිදන නැගණියගේ ඇඳට පැන්නාය. ශික්ෂා ඇහැරුණේ ගැස්සීගෙනය.

''අක්කා.. මොකෝ හලෝ හොල්මන වගේ.. මං බයවෙච්ච තරම..''

ශික්ෂා පපුවට අතක් තියාගෙන කීවාය.

''හොල්මන.. මේ... මම.. මම නෙමේ මීට පස්සෙ හොල්මන ඔයා තමා..''

මෝක්ෂා කීවාය.

''අනේ යන්න විහිළු නොකර.. මට තව ටිකක් නිදාගන්න එපෑ..''

ශික්ෂා තව තවත් පොරෝනයට ගුලි ගැසුණාය.

''ඔය නිදාගත්ත ඇති හලෝ.. මට ලස්සන කතාවක් කියන්න තියෙනවා.. නැගිටිනවා.. නැගිටිනවා..''

මෝක්ෂා ශික්ෂාගේ පොරවනය ඇද බිමට දැමුවාය.

''මොනාද අක්කි.. ඔය්..යා..''

ශික්ෂා වීසිරුන දුහුල් නයිටිය හද හදා ඇඳේ ඉඳගත්තාය.

''හොල්මනක්ම තමා.. ඔය නිදාගෙන හිටිය විදිහ දැක්ක නම් දැක්ක එකාට දහ අට සන්නිය නටන්න වෙනවා.. ඇගේ ඇඳුම වැලේ..''

මෝක්ෂා සුරතල් පහරක් නැගණියගේ උරහිසට ගැසුවාය.

''ඉතිං මොනාද කියන්න තියෙන්නෙ..?''



The Reader's Place

ශික්ෂා විසිරුන කොණ්ඩය අතින් හද හදා ඇසුවාය.

''ඔයාට මීට පස්සෙ හොල්මනක් විදිහට රඟපාන්න වෙනවා.. මං මේ කියන්නෙ ඇත්තම ඇත්ත..''

''අනේ විහිළු නොකර කියන්නකො අක්කි.. මොකක්ද කියන්න තියෙනවා කිව්වෙ..''

''මේ කියන්නෙ ඒ කතාව තමා ඉබ්බියේ..''

මෝක්ෂා, සස්මිත හමුව සිදුවූ සියල්ල ඒ විදිහටම ශික්ෂා එක්ක කීවාය.

''අයියෝ නංගි බබා.. ඔයා දකින්න තිබ්බෙ මං ඔයා ජීවතුන් අතර දැන් නෑ කියල එයාට කියපු වෙලාවෙ මැන්ගෙ මූණෙ සයිස් එක.. ඒ මූණ හතරැස් වෙලා ගියා..''

The Reader's Place

මෝක්ෂා හිනාවී කීවාය. ශික්ෂාට හිනාහාය. ඒත් පෙරදා හවස දුටු අර දැකුම්කළු තරුණ රුව සිහිවද්දී ඇයටත් නොදැනීම ඇගේ හිත උණුවිය.

''අනේ පව් අක්කා..''

ශික්ෂා කීවාය.

''පව්.. මොනාද හලෝ පව්.. අපි එයාගෙ මුකුත් උදුරගන්න ගියාද..? එයාට බලහත්කාරකම් කරන්න ගියාද..? ඔන්න එහෙනං පව්.. මේ අහිංසක ෆන් එකක් ගන්නට ඒක පව් වෙන්නෑ නගෝ..''

මෝක්ෂා කීවාය.

අක්කාගේ හැටි ඔහොමය. කොල්ලෙක් අහු උනොත් හදන්නේ මෝඩයා කරන්නය. තාත්තා ලවා වැඩක් කරවා ගන්න හෝ අඩුම තරමේ ආධාර පත්තරයක් අරගෙනවත් මේ මිදුලට ගොඩවෙන කෙනෙකු අක්කාගෙන් ගැලවෙන්නේ කලාතුරකිනි. වෙන එකක් තියා චන්දන මේ ගෙදර උන් කාලේ අක්කා කළේ පුළුවන් තරම්





ඔහුව මැඩවීමය. තාත්තා බැරි තැන කළේ චන්දනගේ නවාතැන් පොළ අල්ලපු බංගලාවට මාරු කිරීමය.

''ඒත් අක්කා එයා ඇත්ත දැනගත්තොත්..?''

''එයාට ඇත්ත දැනගන්න මේ කපේදි හම්බවෙන්නෑ.. එහෙනං ඉතිං මේ කල්පෙ ඉවර වෙන්න ඕන..''

''කොහොමද අක්කා ඔයා ඒ තරම් විශ්වාසෙටම කියන්නෙ..?''

''එයා හොල්මනක් දැක්කා කියලවත් ඔයා ගැනවත් කා එක්කවත් කතා කරන්න යන්නෑ.. මං එයාව ඒකට පොරොන්දු කරගත්තා..''

මෝක්ෂා කීවාය.

''අනේ මන්දා මට නම් බයයි..''

ශික්ෂා කීවාය.

''මේ.. මේ.. එහෙම කියල හරියන්නෑ නංගි.. ඔයාටත් අද ඉඳල හොල්මන විදිහට රඟපාන්න වෙනවා..''

''අනේ මට නම් බෑ අක්කා.. මට ඕවා පුරුදු නෑ..''

''හරි මං පුරුදු කරල ගන්නංකො.. ඔය මං දැන් ඒ මැන් ඉස්සරහපිට රඟපෑවෙ කලින් රිහසල් කරලද..? නැනෙ.. ඒත් මං කොච්චර දුක්බර විදිහට ඒ සීන් එක කළාද කියනව නම් බලන් හිටිය මැන්ගෙ ඇස්වල කඳුළු..''

මෝක්ෂා කීවාය.

ශික්ෂා මුණිවත රැක්කාය. ඒත් ඇගේ හිත දොඩමළු වෙමින් තිබිණි. ඒ පුද්ගලයා කවුරුන් උනත් ඔහු තමාගේ හිතේත් තැනක රිංගා උන් බව ඇයට දැනිණි.

''නංගෝ.. මොකද එකපාරටම ගොළු උනේ..''

''නෑ අක්කා මං මේ කල්පනා කළේ ඔය එක්කෙනා අපේ එස්ටේට් එකේ මොකද කරන්නෙ කියලා..?''

''ගුඩ් ක්වෙක්ෂන්.. දැටිස්ද පොයින්ට්. උවමනාම දේ මට කියන්ඩ බැරි උනානෙ.. එයා තමා අපේ අලුත් සුපිරින්ටෙන්ඩන්..''

''ම්.. මොනා අක්කි..!''

ශික්‍ෂාට පුදුමය.

''පුදුමයි නේද..? ඔව් හලෝ.. ඕක ඉස්සරවෙලාම දැනගත්ත වෙලාවෙ මටත් නිකං ලෝක පුදුමෙ වගේ දැනුණා..''

''තාත්තා ඔය වයසෙ කෙනෙක්ව ඔය වැඩේට ගත්තමයි මං හිතන්නෙ..''

''ඒකනේ.. අතට ලැබිච්ච චාන්ස් එක අතාරින්න නරකයි.. ආයෙ ඉතිං මේ වගේ චාන්ස් එකක් කවද එයිද දන්නැනෙ.. ඒ හින්දා අපි එයාට හොඳ හොල්මන් ටිකක් පෙන්නමු.. හරිනේ.. දාන්න පහක්..''

මෝක්‍ෂා අත පෑවාය.

ශික්‍ෂා ඇඟිලි පහ විහිදා අතට අත තට්ටු කළාට හිතින් දෙලොවක උන්නාය. ජීවතුන් අතර නැති කෙනෙකු වී ඔහු ඉදිරිපිට ඉන්නට සිදුවීම ඇගේ හිත පාරා තිබිණි.

සස්මිතට එදා හවස ආයේමත් වරුසප්පෙරුම බංගලාවට යන්නට අවස්ථාව උදා විය. අත්‍යාවශ්‍යම ලියවිල්ලකට අත්සනක් දමාගෙන යන්නට ගෙදරට එන්නැයි රාජිත සස්මිතට කීවේය. ඒත් සස්මිත එහි යන විට රාජිතත් රෝෂණීත් ටවුමට ගිහින්ය.

''සර් ගෙදර නැද්ද..?''

බෝනික්කි වාගේ ලස්සනට හිනාවීගෙන ඉස්සරහට ආ මෝක්‍ෂාගෙන් සස්මිත ඇසුවේය.





''තාත්තියි, අම්මියි ටවුන් ගියා..''

මෝක්‍ෂාත්, සස්මිතව පිළිගත්තේ ප්‍රීතියෙනි.

''ඕව්.. මට මේ ඩොකියුමන්ට් එහෙකට අත්සනක් දාගන්න තියෙනවා..''

සස්මිත කීවේය.

''ඇවිත් මෙහෙන් ඉඳගෙන ඉන්ඩ.. තාත්තිලා ඉක්මනට එයි..''

මෝක්‍ෂා කීවාය.

සස්මිත ගෙට නොගොස් විවෘත ආලින්දයේ පුටුවක හිඳ ගත්තේය. කවුරුත් නැතිව තරුණියක් විතරක් ඉන්නා ගෙයකට රිංගන එක තමාටත් හොඳ නැත.

''මං බොන්න මොනා හරි අරං එන්නං..''

මෝක්‍ෂා කීවාය.

''න්..නෑ.. ඕන්නෑ..''

සස්මිත කීවේය.

''බයවෙන්නෙපා.. ඒවට පඩියෙන් කපන්නෑ.. මේ ගෙදෙට්ට එන ඕන කෙනෙකුට කෑම බීම දෙන්නෙ නොමිලේ..''

එසේ කියාගෙන මෝක්‍ෂා ගෙතුළ නොපෙනී ගියාය. සස්මිත ළා තණ පලසින් හැඩවුණු ගෙමිදුල සිසාරා නෙත් යැව්වේය.

''ගෑනු ළමෙක් ඉන්න ගෙදර ලස්සනයි කියන්නෙ ඇත්ත තමයි..''

සස්මිතට හිතිණි. දැස පේන මානයේ මිදුල වටකොට තිබුණේ ලොකු පොඩි විවිධ වර්ගයේ මල් ගස්ය. ඒ අතරින් රෝස වර්ග වඩාත්ම කැපී පෙනිණි.

The Reader's Place

එහෙත් හදිසියේම හදිසියේම සස්මිත වෙව්ලා ගියේය. මල් ගස් අතරින් ඇතින් ඇදී එන සුන්දර රූපය ඔහුගේ ඇඟ කිළිපොලා යැව්වේය.

තමා දැන් මොහොතකට කලින් කතාබහ කළ, තමාට බීමට යමක් ගේන්නට නිවසට ගිය යුවතියට හැඩරුවින් සියයට සියයක් සමානකම් ඇති යුවතිය මල් ගස් අතරින් නිවස දෙසට ඇවිද ඒ. ඇය පියකරු රෝස මල් පොකුරක් දෝත දරා උන්නාය.

'දෙයියනේ මෙයා කිව්වෙ ඇත්ත.. මේ ඒ හොල්මන තමා.. මේ ගර්ල්ගෙ ජීවතුන් අතර නැති නංගි..' සස්මිතට පුටුවෙන් නැගිට්ට විණ. අත තිබූ ලිපි ගොනුව ඔහු අතින් ගිලිහී 'දඩස්' හඬින් බිම පතිත විය.

හැමදා පුරුද්දට හවසට දොළ පාර අයිනේ ඇවිදින්න ගිහින් රෝස පොකුරකුත් කඩාගෙන ආපසු එමින් සිටි ශික්ෂා ඉදිරිය බැලුවේ ඒ සියුම් හඬටය. සස්මිතගේ රුව දුටු ශික්ෂාද වෙව්ලා ගියාය. ඒ තරුණියා තමාගේ නිවසේ විවෘත ආලින්දයේ හිටගෙන බයවී තමා දෙස බලා සිටී.

ශික්ෂාගේ මුවේ මඳ සිනාවක් ඇඳෙන්නට ඇවිත් එයත් අතරමග නතර විය. තමාට සිනාසෙන්නට බැරිය. ඔහු හිතා ඉන්නේ තමා හොල්මනක් කියාය. මේ විදිහට බයවී තමා දෙස බලා ඉන්නේ ඒ නිසාය. තවත් ඉදිරියට යනවාද..? නැතිනම් හැරී යනවාද තීරණය කරගත නොහැකිව ශික්ෂා මොහොතක් ගල් ගැසී උන්නාය.

"මොකෝ මේ බයවෙලා..?"

මෝක්ෂා, සස්මිත වෙත ආවේ උණුසුම් කෝපි කෝප්පයක් බන්දේසියක තියාගෙනය. ගල් ගැහී උනුන් වෙත බලා ඉන්නා නංගීත් - තරුණියාත් දෙස බැලූ මෝක්ෂා සිදුවන දේ තේරුම් ගත්තත් හැසිරුණේ කිසිවක්ම නොදන්නා සේය.

"ඇයි මේ හිටගෙන..? බයවෙලා..?"





සස්මිත ගැස්සී මෝක්ෂා දෙස හැරී බැලුවේය.

"අ..ර.. අර.. ඉස්..සර..හා.."

හිත ගැස්සී තිබුණ නිසා ඔහුගේ කටට හරියට වචන එන්නේත් නැත.

"ඉස්සරහ මොකද..?"

නැගණිය මිදුල කොණේ ගල් ගැසී හිටගෙන ඉන්නවා දැක දැකත් මෝක්ෂා ඇහුවේ නොදැක්කා සේය.

"ඇයි ඔයාට පේන්නැද්ද..? අර ඔයා වාගෙම කෙනා මේ මිදුලෙ හිටගෙන ඉන්නවා.."

"ඕ.. මොනවා..!"

මෝක්ෂා බන්දේසිය පසෙක තැබුවාය.

"ඔයා ඔය කියන්නෙ මගෙ නංගි මේ වෙලාවෙත් අපි ඉස්සරහ ඉන්නව කියලද..?"

"ඔව්.."

සස්මිතට කෙඳිරිගැවිණ.

"අනේ දෙවියනේ.. කොයි හරියෙද..? කෝ කොහෙද..? නංගී.. නංගී.."

මෝක්ෂා මිදුලට බැස බොරු රඟපෑමක් කළාය.

"ඔයාගෙ ඉස්සරහම ඉන්නවා.."

සස්මිත කීවේ පුදුමයෙනි.

"අනේ දෙවියනේ.. මං ඔයාට කිව්වෙ එයා අපට පේන්න එන්නෑ කියල.. එයාව පේන්නෙ විශේෂම කෙනෙකුට විතරයි.."



The Reader's Place

මෝක්ෂා යළි සස්මිත වෙත ආවාය.

"ෆයිල් එකත් බිම.."

ඈ විසිරුණ කඩදාසි ටික ගොනු කළාය. සස්මිතත් බිමට නැවී ඇයට උපකාර විය. ලද අවසරයෙන් ශික්ෂා වහා කුස්සිය පැත්තට රිංගා ගත්තාය.

"පිස්සු හැදිලා ආයෙත් හැදෙනවා.."

ලිපිගොනුව සකසාගෙන කඳ කෙලින් කරගත් සස්මිත දෑස ඉදිරිපිට මිදුලේ කලින් දුටු රුව නොදැක කීවාය.

"ඇයි..?"

මෝක්ෂා කිසි දෙයක් නොදන්නා විදිහට කතා කළාය.

"එයා අතුරුදහන් වෙලා.."

සස්මිත කීවේය.

"එයා එහෙම තමා වැඩි වෙලාවක් පේන්න ඉන්නැලු.. දකින අය කියන්නෙ එහෙම.. කොහොම උනත් නංගි ඔයාට ළෙංගතුයි වගේ.. ඒකනේ දෙපාරක්ම ඔයාට පේන්න ආවෙ.."

මෝක්ෂා කීවාය.

"මට කැමතියි.. ඒ ඇයි..?"

සස්මිත පුදුම වූයේය.

"ඒක දන්නෙත් ඉතිං එයාම තමා.. ඔයා දන්නවද නංගිගෙ මරණය අදටත් අබිරහසක්.. එයා නැතිවුණේ කොහොමද කියලා කාටවත් හිතාගන්න බෑ.. එයා ඔය විදිහට ඔයාව හොයාගෙන එන්නෙ ඒ රහස කියා ගන්නද දන්නෑ.."

මෝක්ෂා කීවාය.



The Reader's Place



"එහෙනම් එයාට වැරදිලා.. ජීවතුන් අතර ඉන්න එකෙකුගෙ රහසක්වත් දහ දොලොස් දෙනෙකුට නොකියා පරිස්සම් කරගන්න බැරි මං.. මැරිච්ච කෙනෙකුගෙ රහසක් පරිස්සම් කරන්නෙ කොහොමද..?"

සස්මිත කීවේය.

"එහෙම කියන්නෙපා අනේ.. ඔයාට වැදගත් නැති උනාට ඒ කතාව මගෙ ගෙදර අයට වැදගත්නෙ.."

"අනේ මන්දා මේ හොල්මන් එස්ටේට් එකට මං මොකට ජොබ් කරන්න ආවද මන්දා.."

සස්මිත ඒ ටික කීවේ ඇහෙන නෑහෙන ගානටය.

"මොකක්ද කිව්වෙ..?"

ඇත්තටම මෝක්ෂාට ඒ කීවක් නෑසිණ.

"හ්.. නෑ.. මං කිව්වෙ.. ඔය ෆයිල් එක සයින් කරවලා තියන්ඩ.. මං හෙට ඇවිත් අරං යන්නං කියලා.."

සස්මිත කීවේය.

"ඉතිං මං මේක තාත්තිට දෙන්නෙ කවුරු දුන්නා කියලද..?"

මෝක්ෂාට ඔහුගේ නම දැනගන්නට උවමනාකොට තිබිණි.

"මං සස්මිත මහානාම.. සස්මිත දුන්නා කියල දෙන්ඩකො.."

සස්මිත බයිසිකලයට ගොඩවෙමින් කීවේය.

"සස්මිත මහානාම.. පොර වගේම නමත් ලස්සනයි.."

මෝක්ෂා සිතුවාය.

බයිසිකලයේ හඩ නැසී ගිය පසු ඈ නැගණිය හොයා ඉගිල

ගියාය. රෝස පොකුර අතේ තියාගත් ගමන්ම කාමරේ ඉඳගත් ශික්ෂා බර කල්පනාවකය.

"ඊහ්.. ඔයා නම් මාරයි නංගි බබා.. ෂෝක් එකට ඇක්ට් කළා.. දාන්ඩ පහක්.. දාන්ඩ පහක්.."

මෝක්ෂා සතුටින් උඩ පැන්නාය.

"පව් අක්කි.."

ශික්ෂා කීවේ දුකෙනි.

"එයා මාව දැක්කම හොඳටම බයවුණා.. ගල් ගැහිල වගේ මං දිහා බලා හිටපු හැටි මට ජීවිතේටම අමතක වෙන්නෑ.."

ශික්ෂා ආයේම කීවාය.

"අයියෝ.. ඒක තේන්නං ඔයාගෙ රඟපෑම් හොඳා කියන්නේ.. බයවෙච්ච පාර ආව ඉක්මනටම ආපහු ගියා.. මං එයාට හදපු කෝපි එක තාම ටීපෝ එක උඩ.. ඔන්න හොඳම හරිය තියෙන්නෙ අද රෑට.."

මෝක්ෂා අලුත් සැලැස්මක් හිතේ තියාගෙන කීවාය.

"ඒ කිව්වෙ අක්කි..?"

"අද රෑට අපි හොල්මන එයාගෙ බංගලෝ එක ළඟට අරිමු.."

"මට තේරුන්නෑ අක්කි ඔයා කියන දේ..?"

"ඔයාට තියෙන්නෙ අද රෑටත් දැන් රඟපෑවා වගේම පොඩ්ඩක් එයාට පේන්න රඟපාන්න.."

"අනේ මට බෑ අක්කි.. ඊටත් රෑට කොහොමද එයා ඉන්න තැනට අපි යන්නෙ..?"

"ඒක එච්චර දුරක්ද මේ ගෙදරින් අල්ලපු ගෙදරටනෙ ළමයෝ..



මේ ගේන දුර දොළ පාර ගොඩ වුණාම එයාගෙ මිදුල.. අනික ඔයාව මං තනියම යවන්නෑ.. මාත් මගට එනවා.."

"ඒත් අක්කි තාත්තිය අහු උනොත් අපි දෙන්නම විනාශයි.."

ශික්ෂා ඇත්තටම උන්නේ බයෙනි.

"අනේ නංගී එහෙම වෙන්නෑ.. තාත්තියි අම්මියි නිදාගත්තම මේක උන්නත් ගියත් ඇහැරෙන්නෑ.. ප්ලීස්.. ප්ලීස්.. ඔයා මේක මං වෙනුවෙන් කරන්නකො.. මං වෙනුවෙන්.."

ශික්ෂා අක්කාට බොහෝ සේ ආදරය කළාය. ඒ ආදරය ඈ අසරණකොට තිබිණි. ශික්ෂාගේ ලොවේ වීරවරිය වූයේ ඇගේ අක්කාය. අක්කා සතුටු කරන්නට ශික්ෂාට අකමැත්තෙන් උනත් කැමැත්තෙන් උනත් ඇයට එකඟ වන්නට සිදුව තිබිණි.

* * * * * * * *

නුවර හීතල එළිය කරන්න හඳ පායා එමින් තිබුණි. අත් දිගට ජර්සිය හැඳගත් සස්මිත මිදුලට බැස්සේ හුළං ටිකක් වදින්න සිතාගෙනය.

The Reader's Place

"මහත්තයා දැන්ම නිදාගන්නෙ නැද්ද..?"

දොරවල් ජනෙල් වහගෙන සාලෙ වටේ රවුමක් යන ගමන් චන්දන මිදුලට කරපොවා බලා ඇසුවේය. සස්මිත මිදුලේ ගල් බංකුව මත ඉඳගෙන හඳ දිහා බලාගෙනය.

"මේ වගේ ලස්සන රෑක වෙලාසනම නිදාගන්ඩ පුළුවන්ද මෝඩයා..?"

සස්මිත හිනා වෙවී ඇහුවේය.

"ඔය ලස්සන මම ඇතිවෙන්න දැකල තියෙනවා.. එහෙනං මහත්තය පස්සෙ නිදාගන්ඩ.. මං යනවා නිදාගන්ඩ.."

චන්දන නොපෙනී ගියේය.

සස්මිතගේ හිත කොළඹට ගියේය. කොළඹින් නුවරට එද්දී ජීවිතය මේ තරමට වෙනස් වේයැයි සස්මිත හිතුවේ නැත. දැන් සස්මිතගේ හිත නුවරට කැමති වී හමාරය. වරුසප්පෙරුමගේ සුන්දර දියණිය - දඟකාර දියණිය සස්මිතගේ හිත වසඟ කර තිබිණි.

'එයා මට කැමති.. මට හිතෙන්නෙ එහෙම.. කොහෙද මේ හොල්මනක් එක්කනෙ මට මොකුත් කරන්න බැරි.. ඇත්තටම ඒ හොල්මනක්ද..? ඔව්.. එහෙම වෙන්න ඕනේ..'

සස්මිත කල්පනා කළේය. හදිසියේම ඔහුට දැනුණේ කවුරුන් හෝ ඔහු දෙස බලා ඉන්නා බවය. සස්මිතට ඉදිරිය බැලිණි. ඒ සමගම ඔහුගේ ඇඟපත වෙව්ලා ගියේය.

''හො.. හො..ල්ම..න..''

The Reader's Place

සස්මිතට වචන පිට නොවිණි. මුහුණට ගෙලට මේ ශීත රැයේ උනත් දහඩිය ගැලුවේය. දහවල පෙනුණ රුව මේ රැයේත් තමාට නුදුරිනි. දුහුල් සුදු පැහැ රාත්‍රී දිගු ගවුමකින් සැරසී කොණ්ඩය කඩා විදිහාගෙන සඳ එළියේ ඇ හෙමිහිට සස්මිත දෙසට ඇවිද එමින් උන්නාය. සස්මිතට කෑගසන්නට උවමනා විය. මෙතැනින් පැන දුවන්නට උවමනා විය. එහෙත් ඒ කිසිවක් කළ නොහැකි ලෙසට ඔහු බියෙන් ගල් ගැසී උන්නේය.

ශික්ෂා හෙමිහිට සස්මිත වෙතට ඇදී ආවාය. කට ඇරී - ඇස් පලල් වී - බය වී බලා ඉන්නා සස්මිත ළඟින් ඇගේ ගෑවී නොගෑවී ආයෙමත් ගස් වැල් අතරට රිංගා ගත්තාය. අක්කා උගන්වා තිබුණේ එහෙමය.

''වැඩේ හරිද..?''

නැගණිය එනතුරු දොළ පාර ළඟ රැක උන් මෝක්ෂා ඇසුවාය.





''මොනාද මේ අහන්නෙ අක්කි.. මට බය ඇත්තටම එයාට බිය හැඟිවෙයිද කියල..''

ශික්ෂා කීවාය.

''යං.. යං.. යං.. කාට හරි අහුවෙන්න කලින් මෙතනින් නැගගම්මු..''

මෝක්ෂා ශික්ෂාගේ අතකින් අල්ලාගෙන ලහි ලහියේ දොළ පාර ගොඩවී ගල් පඩිපෙළ නැගුණාය. අක්ක නගාලගේ දඟකාරකම් ඉවසාගෙන පිපුණු රෝස මල් කළුවරේම නිහඬ වූයේ නොදැක්කා ගානටය.

* * * * * * * *

රාජිත වරුසප්පෙරුම උදෑසන තේ ජෝගුවේ රස විඳිමින් පත්තරය අතට ගත්තේය. දවසේ කොයි රාජකාරියටත් කලියෙන් දිනපතා පත්තරයේ අත්‍යාවශ්‍යම ලිපි කිහිපය කියවා හමාර කිරීම ඔහුගේ සිරිතය.

''ලොකු සර්..''

ඒ හඬට රාජිත හිස ඔසවා බැලුවේය. චන්දන මිදුලේ හිටගෙන උන්නේය.

''ගුඩ් මෝනිං චන්දන.. ඇයි උදෙන්ම..?''

රාජිත පත්තරය නවා පැත්තකින් තැබුවේය.

''සස්මිත මහත්තයා කිව්වා මෙහෙ ෆයිල් එකක් ඇති ලොකු සර් අත්සන් කරල ඉවර නම් අරගෙන ගිහින් ඔෆිස් එකට බාරදෙන්න කියලා..''

චන්දන කීවේය.

"ආ.. මං ඒක අත්සන් කරලා සස්මිත එයි කියලා මේ බල බලා උන්නෙ.."

රාජිත කීවේය. ඔහු වාගේම සස්මිත උදේම එවියි මග බලාගෙන උන් තව දෙදෙනෙක් ගේ ඇතුලේ හිඳ මේ කතාබහට සන්දිගෙන උන්හ. ඒ මෝක්ෂා - ශිකෂා අක්ක නගාලාය.

"සස්මිත මහත්තයට සනීප නෑ සර්.."

චන්දන කීවේය.

"සනීප නෑ.. ඇයි මක්වෙලාද..?"

රාජිත කලබලයෙන් ඇසුවේය.

"උණ ගැනිලා.. ඊයෙ මහ රෑ කෙඳිරිගානවා ඇහිලා මං බලනකොට සහලවල උණ.."

චන්දන කීවේය.

"මං හිතන්නෙ සස්මිතට මෙහෙ දේශගුණේ තවම හරියට අල්ලල ගියෙ නෑ.. ඔය කොළඹ ඉඳල එන මිනිස්සුන්ට නුවර හීතල අල්ලගන්ඩ ටිකක් කල් යනවා..."

රාජිත කීවේය.

"ඒක නම් ඇත්ත සර්.."

චන්දන කීවේය.

"හා.. අර මේසෙ උඩ ඇති චන්දන ෆයිල් එකක් අරං යන්ඩ.. සස්මිතට කියන්ඩ සනීප නැත්තං අද ඔෆිස් එන්ඩ කරදර වෙන්ඩ ඕන්නෑ කියලා.."

රාජිත කීවේ කතාබහ නිමා කරන අදහසිනි.

සස්මිතට උණ ගැනී තිබේ. ඒ නිකම්ම උණක් නොවේ.





වෙච්ලා හටගත් උණකි. මේ ආරංචියෙන් මෝක්ෂාට දැනුණේ සතුටකි. එහෙත් ශිකෂා දුක් වූවාය.

"හරි පව් අක්කි.. අපි කළේ හොඳ වැඩක් නෙමේ.."

ශිකෂා පසුතැවුණාය.

"ඔන්න ඉතිං ඔයා බයවෙලා.. බයවෙන්නෙපා ළමයෝ.. චූටි උණක් හැදුණට සස්මිතට මුකුත් වෙන්නෑ.."

මෝක්ෂා ශිකෂාගේ හිතේ බය නැති කරන්නට උත්සාහ කළාය.

* * * * * * * *

සස්මිත දවස් දෙකක්ම උණෙන් පීඩා වින්දේය. තුන්වෙනි දවසේ ඔහු ආයෙමත් රාජකාරියට වාර්තා කළ හැකි තරමට සුවය ලැබුවේය. ෆැක්ටරිය දක්වා පාර දිගේ බයිසිකලය පදවා යන අතරේදී සස්මිතට මෝක්ෂා මුණ ගැසිණ. ඇ වෙනදා වාගේම ව්‍යායාමයට පාර දිග ඇවිදිමින් උන්නාය.

"උණ සනීපද..?"

මෝක්ෂා හිනාවී ඇසුවේය.

"මොන උණද..?"

සස්මිත ඇහුවේත් හිනාවීගෙනය.

"අපට බොරු කරන්ඩ එපා.. මෙහෙ හිටියට එහෙ වෙන දේවලුත් අපට ආරංචි වෙනවා.."

මෝක්ෂා කීවාය.

"පොඩි උණක් හැදුණා.. දැන් සනීපයි.. ඒක නෙමේ මාත් මේ ඔයාව හම්බ වෙනකම් තමා බල බලා උන්නෙ.. වැදගත් දෙයක් කියන්ඩ.."



The Reader's Place

සස්මිත කීවේය.

''ඇයි..?''

''ඔයාගෙ නංගි ඔන්න දැන් මාව බලන්න රෑටත් එන්ඩ පටන් අරං..''

''ඒ කිව්වෙ..?''

මෝක්ෂා කිසිවක් හිතාගන්නට බැරි ගානට කතා කළාය.

''පෙරේදා රෑ මං ටිකක් එළියෙ ඇවිද ඇවිද ඉන්නකොට ඔයාගෙ නංගි සුදු ගවුමක් ඇඳලා කොණ්ඩෙත් කඩාගෙන මෙන්න මං ඉස්සරහපිට ඉන්නවා..''

''නෑහ්.. එතකොට ඔයාට උණ ගැනුණේ අපේ නංගිට බයවෙලාද..?''

මෝක්ෂා පුදුමයෙන් වාගේ ඇහුවත් ඇගේ කටහඬේ තිබුණේ උපහාසයකි. තමාගේ කට වැරදුන බව සස්මිතට තේරුණේ දැන්ය.

''න්.. නෑ.. මේ.. මේ..''

සස්මිත ගොත ගැසුවේය.

''අයියෝ.. අපේ නංගිට බයවෙන්නෙපා අනේ... එයා හරී හොඳයි..''

''කවුද 'හොල්මන්වලට බය..?''

සස්මිත වහා කීවේය.

''ඒ කියන්නෙ ඔයා බය නෑ..''

''නෑ.. බයවෙන්න ඕන මැරිච්ච මිනිස්සුන්ට නෙමේ ජීවත්වෙන අයට..''





''ඇත්තමයි සස්මිත..''

''ඔයාගෙ නංගි ආයෙ මට හම්බවුණොත් එහෙම මං එයා එක්ක හොඳට කතා කරනවා..''

සස්මිත කීවේය.

''අනේ කොච්චර දෙයක්ද..? ඇත්තටම එයාට මොකද උනේ කියලා එතකොට දැනගන්ඩ පුළුවන් වෙයි..''

මෝක්ෂා කීවේ තවත් ලොකු රඟපෑමක් මවන අදහස හිතේ තියාගෙනය.

''මං යන්නද එහෙනං.. දවස් දෙකක නිවාඩුවකට පස්සෙ අදනෙ වැඩට යන්නෙ.. පරක්කු වෙලා බෑ..''

සස්මිත බයිසිකලය පණ ගන්වාගෙන ගියේය.

'මහොම යංතො බබෝ.. ඔයාට අපි හොල්මන් අවතාර විතරක් නෙමේ දිව්‍ය ලෝකෙ, අපාය දෙකත් ළඟකදිම පෙන්නන්නංකො..'

මෝක්ෂා දුර ඇදී යන බයිසිකලය දිහා බලා යටි හිතින් හිනා වෙවී සිතුවාය. ඇ නංගි ශික්ෂා සොයා ඉගිලුණේ හිතේ සතුට බෙදාගන්නය.

''මං කිව්වෙ මිනිහට පොඩි ජෝක් එකක් කළාට කමක් නෑ කියලා.. අද රෑට අපි ආයෙමත් සස්මිතට හොල්මන් පෙන්නමු..''

මෝක්ෂා සතුටින් කීවාය.

''අනේ මට නම් බෑ අක්කි. මට තවත් හොල්මන වෙන්න බෑ..''

ශික්ෂා තරයේ කීවාය.

''මොනාද නංගා.. ඔයා කොයි වෙලාවෙ බැලුවත් නහයෙන් අඬාගත්තු ගමන්නෙ..''

"බැරි වෙලාවත් අපි අහු උනොත් එහෙම...?"

"එහෙම අහුවෙන්නෑ ඉබ්බි.."

"අනේ අක්කා මට බෑ.."

"නංගි ප්ලීස්.. ප්ලීස්. මං හින්දා අද ඒ විතරක් කරන්න.. මං වෙනුවෙන්.."

මෝක්ෂා බැගෑපත් වූයේ සොයුරියට බෑ කියන්න බැරි වෙන විදිහටය.

"ඔන්න අක්කි අද විතරයි හොඳේ.."

ශික්ෂා අක්කාට එකතු වූයේ ඒ කොන්දේසිය එක්කය.

* * * * * * * *





03

චන්දන ගේ බතට අල හොද්දක් බණ්ඩක්කා බැදුමක්, ගෝවා සලාදයක් හදා පපඩම් බැද තිබිණි. සස්මිත බත්පත බෙදා ගත්තේ කතාබහ අතරේමය.

"සර්ට අපේ ලොකු මහත්තයා පුතෙකුට වගේ ආදරෙයි නේද..?"

චන්දන හිටි හැටියේ ඇසුවේය.

"කවුද රාජිත සර්ද..?"

සස්මිත ඔළුව උස්සා බලා ඇසුවේය.

"ඔව්.."

"ඒක නම් මටත් තේරුණා.. උණ හැදිලා ඉදපු එකේ තව දවසක්වත් රෙස්ට් කරන්න තිබ්බනේ කියලා අද උදේ මට කෑගැහුවා.."

සස්මිත කීවේය.



The Reader's Place

"ලොකු සර් පුතෙකුට හරිම ආසාවෙන් ඉඳල තියෙන්නෙ.. ඒත් සර්ට ඉන්නෙ දුවල දෙන්නෙක්නෙ.."

චන්දන කීවේය.

"දුවල දෙන්නෙක් ඉන්නවා..?"

සස්මිත පුදුමයෙන් ඇස් ලොකු කර චන්දන දෙස බැලුවේය.

"ඔව්.. නිවුන්නු.. ඔය ඉන්නෙ අක්කයි නංගියි රෝස මල් දෙක වගේ.."

චන්දන විස්තර කළේය. සස්මිතට දැනුණේ දෙකොනින් ගිනි පිටවෙන්නා වගේය.

"නිවුන්නු..?"

සස්මිතට මේ කණට ඇසෙන සියල්ල විශ්වාස නොවන තරමය.

The Reader's Place

"ඔව්.. දෙන්න එක වගේමයි.. කාටවත් වෙන් කරලා අඳුනගන්න බෑ.."

චන්දන කීවේය. සස්මිතට දැන් සියල්ල පැහැදිලිය. මේ එක වාගේ අක්ක නගෝ එක්ව තමාව රවටා තිබේ. සස්මිතට මහා ලැජ්ජාවක් දැනිණි. හිතට අපමණ වේදනාවකුත් කෝපයකුත් එකතු විය. කිසි දෙයක් හොයා බලන්නේ නැතුව තමා ඔවුන් කළ කී හැමදේම විශ්වාසයට ගත්තා නොවේද..? සස්මිතගේ පිරිමි ආත්මය වෙව්ලුවේය.

"ඒ දෙන්න කොහොම දෙන්නෙක්ද..?"

සස්මිත අමාරුවෙන් වචන ගලපාගෙන ඇසුවේය.

"නංගි ශික්ෂා හරි ලැජ්ජයි, අහිංසකයි.. අක්කා මෝක්ෂා.. හරියට විසේ.. කාට හරි ගිනිගෙඩියක් දීලා හිනාවෙන්න තමා බලා ඉන්නෙ..."





චන්දන කීවේය.

"ගිනි ගෙඩියක් දෙනවා කිව්වෙ..?"

සස්මිතට ඕනෑ කළේ චන්දනගෙන් තව විස්තර ටිකක් අසා දැනගන්නය.

"දන්නැද්ද ඔය කාව හරි රවට්ටලා හිනාවෙන එක.. මෙහේ ආව අලුත මාත් කාලයක් ඔය ගෙදර හිටියනෙ.. මෝක්ෂා බේබිගෙ ඒ දවස්වල බයිට් එක මං.. කොච්චරවත් මාව ගොනා කළා.. අන්තිමේදී ලොකු මහත්තයටත් වැඩේ තේරිලාද කොහෙද මාව මෙහාට මාරු කළා.."

චන්දන කීවේ හිනාවෙවිය. එහෙත් සස්මිතට හිනා වෙන්නට අපහසුව තිබිණි. ඇත්තටම ඔහු උන්නේ හිත ඇතුළෙන් දැවෙමිනි. චන්දන කියන විස්තරයට අනුව තමාවත් රවටා තිබෙන්නේ අක්කා මෝක්ෂා විය යුතු...

"එතකොට උදේට උදේට එක්සයිස් එකට පාරෙ දුවන්නෙ අක්කද..? නංගිද..?"

සියල්ල සැක හැර දැන ගන්නට සස්මිත ඇසුවේය.

"අක්කා.. අක්කා.. ඇයි සර්ට උදේට හම්බවෙනවද..? විහිලුවටවත් කතාවට යන්න එපා.. විසකුරු සර්පයා.. සර්ටත් දෙයි හොඳ ලණුවක්.."

චන්දන කීවේය. තමා දින දෙක තුනක් තිස්සේ මෝක්ෂාගේ ලණුව දිගටම කෑ බවත් දැන් ඉන්නේ කෑ ලණුව දිරවාගන්න බැරිව බවත් සස්මිත නොකීවේය. ඒත් ඔහුගේ හිත පෙලූ ලැජ්ජාව විනාඩියෙන් විනාඩියට වැඩිවෙමින් තිබිණි.

'මගෙ නංගි මැරුණද, මැරුවද කියලා අදටවත් කවුරුවත් දන්නෙ නෑ.. ඇත්තටම නංගිට මොනවද උනේ කියලා අපට හිතාගන්න බෑ...'

මෝක්ෂා තමා එක්ක කී හැටි සස්මිතට සිහිවිය. චන්දන කියන්නේ ඇත්තය. මෝක්ෂාට හොඳට රඟපාන්න පුළුවන. සස්මිත අතගෑවා මිස කුසෙන් අඩක්වත් නොකෑවේය. ඔහු අත සෝදා වතුර බීවේ කෑම පිරියක් නොවූ නිසාය.

''මහත්තයා කෑවයැ.. අත ගගා හිටිය විතරනේ..''

චන්දන කීවේය.

''කන්න බෑ චන්දන.. ඔය බඩට අල්ලන ගාන තමා..''

සස්මිත සරම සකසා නැවත හැඳ ගත්තේය.

''උණ සනීපයි කිව්වට මහත්තයගෙ ඇඟ ඇතුළෙ තාම උණ තියෙනවා වගේ.. කෑම අප්පිරියා ඒකයි..''

චන්දන කෑම මේසය අස් කරන ගමන් කීවේය.

The Reader's Place

'උණ ඇඟ ඇතුළෙ විතරක් නෙමේ මගෙ මුළු ශරීරෙම තියෙනවා වගේ..'

එහෙම හිතුවත් සස්මිත මුවින් කිසිවක් නොකීවේය.

''මහත්තය දැන්ම නිදාගන්නවද..? මට නම් හරි නිදිමතයි..''

චන්දන කීවේය. කවදත් රෑ කෑමෙන් පසු නිදාගැනීම ඔහුගේ සිරිතය.

''චන්දන නිදාගන්න.. මට දැන්ම නිදිමත නෑ..''

ගෙයින් මිදුලට බහින අතරේ සස්මිත කීවේය.

මිදුලටම සඳ දිය ගලාවිත් තිබිණි. පුර පෝය ළඟ හින්දා වටකුරු සඳ අහස මැද අහංකාරයෙන් පිම්බී උන්නේය. ඒත් පරිසරයේ තිබෙන මේ ලස්සන කිසිවක් සස්මිතට නොපෙනිණ. ඔහු ගල් බංකුවේ හිඳගත්තේ සිදුවූ සියල්ල යළි අග සිට මුලටත් - මුල සිට අගටත් සිහි කරමිනි.





'එහෙනාට හොල්මන විදිහට රඟපෑවෙ අක්කද නංගිද.? අක්ක වෙන්න බෑ.. ඒ නම් නංගිම වෙන්න ඕන.. කමක් නෑ.. අක්කා උනත් නංගි උනත් මට ප්‍රශ්නයක් නෑ.. අද දෙන්නම්කො හොල්මන් ඔලුවෙන් තරු විසිවෙන්ඩ..'

සස්මිත හිතින් සැලසුමක් දිග හැරියේය. සස්මිතගේ දැස් ඉදිරිපිට සියල්ල හෙළිදරව් වී ඇති බවක් නොදත් අක්කා නගෝ දෙන්නා ඊට මදක් නුදුරින් වෙලාව එනතුරු බලා උන් බවක් සස්මිත නොදත්තේය.

''නංගා.. ඔන්න දැන් තමා වෙලාව..''

මෝක්ෂා නැගණියට කීවාය. ශික්ෂා පෙරදා සේම සුදු දිග ගවුමින් සැරසී උන්නාය.

''මගෙ නම් හිතට මහ මොකක්ද වගේ අක්කි..''

ශික්ෂා ගැහෙන පපුවට අත තියා ගත්තාය.

''මං කිව්වනෙ අද විතරයි කියලා.. සස්මිත මට කිව්ව විදිහට ඔයා අද සුවර් එකටම ඔයා එක්ක කතා කරනවා.. මතකනේ.. මං ඔයාට කට පාඩම් කරවපු ටික.. ඒක ඒ වෙලාවට කියන්න.. ආ.. දැන් හොඳ බබා වගේ යන්නකො.. අද විතරයිනේ..''

මෝක්ෂා ශික්ෂාගේ හිත හැදුවාය. ශික්ෂා නැගිට හැංගී උන් රෝස පඳුරු අතරින් මෑත්ව සස්මිතගේ මිදුල කොණින් මතුවිය. හරියටම ගල් බංකුව ඉදිරිපිටින් අඳුර බිඳ මතුවූ සුදු පාට ගැහැණු රූපය නිකම්ම සස්මිතගේ හිත හෙලෙව්වේය. ඒත් ඊළඟට ඒ සැණින්ම වාගේ ඔහුගේ බිය හිරු දුටු පිණි සේ විය. අද සස්මිත උන්නේත් හොල්මන බලාපොරොත්තුවෙනි.

'ඔය එන්නෙ බබා වගේ.. වරෙංකො බබා හම්බවෙන්ඩම දෙන්න.. හරි නම් මට කරපු දේට අත පුරෝල කන පැලෙන්න එකක් දෙන්න වටිනවා.. ඒත් මං පිරිමියෙක්.. ගැනියෙක් මොන වරද කළත් ගැනියෙකුට අත උස්සන්න හරිහමන් පිරිමියෙකුට බෑ..

මට නම් කොහොමවත් බෑ.. මේ වගේ කෙනෙකුට තන් දෙකේ ඇඟිලි ගහගන්න බැණලා එලවන්න පුළුවන්.. ඒත් එහෙම එලවලා වැඩක් නෑ.. දෙන්න ඕන ජීවිතේටම මතක හිටින පාඩමක්.. ඔව්.. ආ දෙන්කෝ.. මං දන්නව කරන්න ඕන දේ..'

සස්මිත හිතුවේය. සුදු හැඳගත් රුව සඳපානේ සස්මිත ඉදිරියට එමින් උන්නේය. සස්මිත වහා ගල් බංකුවෙන් නැගිට්ටේය. ඔහු රඟපෑවේ හරියට හොල්මනක් දැක බයවුණා වාගේය. ශිෂා ඉදිරිය බලාගෙන සස්මිත ළඟින් ඔහුගේ ඇඟේ ගෑවී නොගෑවී සෙමින් ගමන් කරමින් උන්නාය.

සස්මිත පැන ශිෂාගේ අතක් දැඩිව අල්ලා ගත්තේය. ශිෂා හිටි තැනම නතර වූයේ අදහාගන්න බැරිවය. ඒ ලද අවසරයෙන් සස්මිත ශිෂාගේ අතින් ඇද ඇයව තුරුළට ගත්තේය. ශිෂාට හිතාගන්නවත් ඉඩක් නොතියා සස්මිත, ශිෂාගේ සිහින් මෘදු දෙතොල මත තම දෙතොල තැබුවේය. සඳ අහසේ හරියටම මුදුනතින් හිටගෙන මේ සිදුවීම නිහඬව බලා උන්නේය. මේ සිදුවීම සැඟවී බලා උන් තවත් දෑසකට කෑගැසෙන්න ආවේය.

''දෙ..යි..යනේ..''

මෝක්ෂා ඇත්තටම තමන්ට කෑගැසේවි බයට දෝතින් මුව වසා ගත්තාය.

මොහොතකට පසු සස්මිත අකමැත්තෙන් නමුත් ශිෂාගේ මෘදු දෙතොලින් මිදී ඒ මුහුණට එබිණ. ශිෂා උන්නේ ගල්වීය. ඇගේ ඇස් ලොකුව තිබුණත් ඒ ඇසිපිය සැලුණේ නැත.

''ඇතිද..? තව ඕනද..? ම..''

සස්මිත ඇගේ මුහුණට ළංව ඇසුවේය. සැණින් ශිෂාගේ ඇස් කඳුළින් පිරිණ. ඈ සස්මිතගේ අත ගසා දමා රෝස පඳුරු අතරින් දුව ගියාය.

''නංගෝ..''





මෝක්ෂා ඉදිරියට දිව ආ නැගණිය පිළිගත්තේ දෝත බදාය.

''අක්කි.. අ.. නේ.. අක්කි..''

ශිෂාට කියාගන්නට ලැබුණේ එච්චරය. ඇයට කෑගැසී ඇවිණි.

''අපි යං නංගෝ.. කවුරුවත් දකින්න කලින් යං..''

මෝක්ෂා හඬන ශිෂාව තුරුළු කරගෙනම ඉස්සර විය. හැර දමා ගිය තුස්සියේ දොරින් අක්ක නගෝ ගෙට ඇතුළු වූයේ සොරුන් සේය. කාමරයට ආ සැණින් ශිෂා ඇඳට කඩා වැටිණි.

''නංගි.. දැන් අඬන්නෙ නැතිව ඉන්නකෝ.. හොඳ ළමයනෙ.. අඬන්නෙ නැතුව ඉන්න..''

මෝක්ෂා, ශිෂාගේ හිස අතගා කීවාය. ශිෂා කොට්ටය හපා ගත්තේ කෑගසා හැඬේවි බයටය.

''මං හීනෙකටවත් හිතුවෙ නෑ ඒකා එහෙම දෙයක් කරයි කියලා.. මාර කොල්ලෙක් තමා.. ෂිට්..!''

මෝක්ෂා කනස්සල්ලෙන් කීවාය. මෝක්ෂා තබා ශිෂාවත් සස්මිත ඒ වාගේ දෙයක් කරාවී සිහිනෙන්වත් නොසිතුවාය.

''ඇයි සස්මිත ඒ වගේ දෙයක් කළේ.. සමහර විට මිනිහා අපි කළේ බොරුවක් කියලා දැනගෙනද..? ඒත් කොහොමද ඒක දැනගන්නෙ.. මොනවා නමුත් ආරංචි වෙලා තියෙනවා.. නැත්නම් ඔයත් නැතුව ඔය වාගේ දෙයක් කරන්නෙ නෑ..''

මෝක්ෂා තමන්ටම කියා ගත්තාය. ශිෂා අක්කාගේ වචනවලට ඇහුම්කන් තැබුවේ නැත. ඇගේ නිසල ලොව එකම තත්පරයකදී වෙනස්ව තිබිණි. අහම්බෙන් හමුවූ අර කඩවසම් තරුණයා - සස්මිත ඇගේ ලොව සසල කර තිබිණි.



The Reader's Place

"මීට ඉස්සර කවුරුත් මට මෙහොම දෙයක් කරල නෑ අක්කි.. ඇයි එයා ඒ වගේ දෙයක් කළේ.. ඇයි එහෙම කළේ..?"

ඉකි ගසා හඬන අතරේ ගිෂා කියවාගෙන ගියාය.

"සොරි බබා.. ඔයාව කරදරේ දැම්මෙ මං.."

මෝක්ෂා හැබැවටම කණගාටු වූවාය. ඈ නංගි ගැන හොඳින් දැන උන්නාය. නංගි තමා වගේ නොවේ. ඈ අහිංසකය. සෙල්ලමටවත් දඟ කරන්නට හිතන්නේ නැත. ඈ මේ පවුලත් ගෙයත් තමන්ගේ ලෝකය කරගෙන පාඩුවේ ජීවත්වන කෙනෙකි. ඒ වාගේ කෙනෙකුට මේ උන දේ හොඳ නැත.

'මගෙ ජීවිතේට මේක මතක හිටින පාඩමක්.. මීට කලින් කී දෙනෙකුට නම් මං විහිළු කරල තියෙනවද..? කොල්ලො කීයක් නම් ගොනාට අන්දල තියෙනවද..? ඒත් ඒ කවුරුවත් මට මෙ වගේ පාඩමක් ඉගැන්නුවෙ නෑ.. පොඩ්ඩක්වත් බය නැතුව එහෙම කරපු හැටි.. සස්මිත නම් මාර කොල්ලෙක්..'

මෝක්ෂා හිතුවාය. ඒත් ඇය ඒ කිසිවක් නංගී එක්ක කතා කරන්නට ගියේ නැත. මෝක්ෂාට දැනුණේ මේ සිදුවීම නිසා නංගීටත් වඩා තමන්ගේ හිත කැළඹී ඇති බවය. සස්මිත ගැන වෙනස්ම හැඟීමක් තමන්ගේ හිත ඇතුළේ පෙරළි කරනවා මෝක්ෂාට දැනිණ.

ගිෂාට ඒ රැය ඇහැ පියවුණේම නැත. ජීවිතයේ පළමු වරට දැනුණු ඒ අත්දැකීම ඇගේ ලොව අවදියෙන් තැබුවේය. ගැහෙන හදවතින් උනත් ඇය ආයෙ ආයේම ඒ සිදුවීම සිහි කළේ හිත යට තිබූ මිහිරියාවකිනි. සස්මිත වාගේ කඩවසම් තරුණයෙකුගේ දෑතට මැදිව ගත කළ නිමේෂය කිසිදා පිරිමියෙක්ගේ පහසක් නොලද ගිෂාට ලෙහෙසියෙන් අමතක කළ නොහැකි විය. ඇගේ හිත තුළ සස්මිතගේ රුව තැන්පත්ව ගියේ පහසුවෙන් උදුරා දැමිය නොහැකි වන පරිදිය. ඒත් ගිෂා ඒ හැඟීම හඳුනාගෙන නොතිබිණි.



The Reader's Place



සස්මිත අවදි වූයේ නිදි නැති රැයක් ගෙවාය. පාඩමක් විදිහට ළඟින් ගිෂා ළඟ ගත කළ නිමේෂය සස්මිතගේ හුදකලා ලොව කළඹා තිබිණි.

'ඒ අක්කද..? නංගිද..? අක්ක වෙන්න බෑ.. නංගි වෙන්න ඕන.. මං අතින් ඇල්ලුව පාර අත අයිස් වගේ ගීතල වෙලා ගියා.. ළඟට ඇදල ගත්තම මං දිහා බැලුවෙ ඇස් දෙක ලොකු කරගෙන.. ඒ අහිංසක හැසිරීම තියෙන්නෙ නංගිට.. එහෙනම් එයා ගිෂා..'

සස්මිත තීරණය කළේය. පාසල් කාලේත් ඉන් පසුවත් සස්මිතට ප්‍රේම කතා තුන හතරක් තිබිණි. ඒ සියල්ල දින ගණනකට වඩා දුර නොගිය කෙටි කාලීන ඒවාය. ඒ කාටවත් තමන්ගේ හිත භාර්ග කරන්නට බැරිවූ බව ඔහු දැන උන්නේය. මේ ඔහු යුවතියක හිප ගත් පළමු වතාව නොවේ. එහෙත් ගිෂාගේ මෘදු පහස සස්මිතගේ හිත කළඹා තිබිණ.

මේ අක්කා හෝ නංගී මුණ ගැහෙන්නට ආසාවෙන් සස්මිත දින සීපයක්ම මග බලා උන්නේය. ඒත් කෙල්ලන්ගේ ගෙදරදීවත්, මග පාරේදීවත්, තේ වතුයායේ කොතනකදීවත් ඔහුට මේ දෙන්නාගෙන් එක්කෙනෙක්වත් මුණ නොගැහිණ.

'මං එහෙම කළ එක වැරදී.. මොනා උනත් මට තව ටිකක් ඉවසන්න තිබ්බා.. කෙල්ලො දඟකාරකමට එහෙම කළාට මට පාඩුවක් උනේ නැතෙ..'

සස්මිතගේ හිතේ අන්තිමේදී ඉතිරි වූයේ පසුතැවීමක් පමණි.

* * * * * * * *

ජීවිතයේ පළමු වරට අක්ක නගාලාට මහ හුගාක් හිතන්නට දෙයක් හිත් අස්සේ තිබිණි. තම තමන්ගේ ලෝකවලට වී කල්පනා කළා මිසක වෙනදා වාගේ දෙදෙනාට එක්ව කතා කරන්නට කිසිවක් ඉතිරිව නැතැයි දෙදෙනාම තේරුම් ගෙන උන්හ.

ශිෂා දොළ පාර ළඟට යාම අතහැර දැමූවාය. ඈ පොතක් කියවන්නට උනත් තෝරා ගත්තේ මිදුලේ සාදික්කා ගහක් යට තිබූ ගල් බංකුවය. ශිෂා මේ වාගේ පොතක් පෙරලාගෙන ගල් බංකුව මත උන් උදය වරුවක සස්මිතගේ බයිසිකලය කන්ද නැග මිදුලටම ආවේය.

''ඍ..යා..''

ශිෂා කලබල වූවාය. ආයෙමත් ඒ ඇස් වලට පේන දුරකවත් ඉන්න බැරි තරම් ලොකු ලැජ්ජාවකින් හිත වැසිණ. ශිෂා පොතත් ගෙන ගෙට දිව්වාය. බයිසිකලයෙන් බිමට බහිමින් උන් සස්මිත ගෙතුළට දුව යන යුවතිය දෙස බලා උන්නේ පුදුමයෙනි.

'හැංගුණා නේද..? කවදා වෙනකම් ඔහොම හැංගිලා ඉන්නද..? ඔය දෙන්නවම මං අල්ල ගන්නම්කො..'සස්මිත යටි තොල හපමින් හිතුවේය. අක්කා මෝඩයා මූණ ගැසිය යුත්තේ හොඳවයින් දෙකක් කියන්නය. ඒත් සස්මිත නංගී ශිෂාව මූණ ගැහෙන්නට පැතුවේ ඊට වඩා වෙනස් දෙයකටය. එදා ඇ තමා වෙතට යොමුව තිබූ ඒ ලොකු වටකුරු ඇස් දෙස ආයෙමත් මොහොතක් බලා ඉන්නට හිත යට පණ ගසන ආසාව මෙල්ල කරන විදිහක් ඔහු දැන උන්නේ නැත.

රාජිත වරුසප්පෙරුම හමුව අදාල ලිපි ගොනුවලට අත්සන් ලබා ගත් සස්මිත බයිසිකලයට නැගුණේ පුන්ව ගිය බලාපොරොත්තුවෙනි.

ඉන් දින දෙකකට පසු එළඹුණ හැන්දෑවක ශිෂා ගල් පඩිපෙළ බැස දොළ පාර ළඟට ආවාය. ඈ දොළ පාර ළඟ හිඳගත්තේ සුපිරින්ටැන්ඩන් බංගලාව දෙස බලාගෙනය. පෙර තමා බොහෝ ආසා කළ මේ තැන පවා එපාවී ගියේ මොන තරම් පුදුමයකටදැයි ශිෂා හිතුවාය. අතු රිකිල්ලක් බිඳෙන හඬින් හිස හරවා බැලූ ශිෂා තමා අසළ උසට උසේ හිටගෙන ඉන්නා සස්මිත මහානාමව දුටුවාය.





''දෙයියනේ..''

ශිෂා කලබල විය. ඈ උන් තැනින් නැගිටලට ගෙදර දුවන්න හදාගෙනය. ඒත් එයට පෙර සස්මිත පැන ශිෂාගේ අත දැඩිව අල්ලා ගත්තේය.

''ප්ලීස්.. පොඩ්ඩක් ඔහොම ඉන්න.. මට ටිකක් කතා කරන්න ඕන..''

සස්මිත කීවේ සෙමිනි. ශිෂා හැරුණාය. ඇය බැලුවේ සස්මිතගේ දෑස දෙස නොවේ. ඔහුගේ සවිමත් අතකට සිරව තිබූ තමන්ගේම අත දෙසය.

''ස්.. සොරි..''

සස්මිත වහා ශිෂාගේ අත අතහැරියේය. මිනෑ නම් පිම්මේ ගෙදරට දුවන්නට ශිෂාට නිදහස තිබිණි. ඒත් ඈ ගල් ගැසී උන්නේ කිසිවක් හිතාගන්න බැරිවය.

''ඔයා හිතනව ඇති නේද මං මහ නරක පිරිමියෙක් කියලා.. ඇත්තටම එදා එහෙම දෙයක් කරන්න මං කීයටවත් හිතාගෙන උන්නෙ නෑ.. ඔයයි අක්කයි එකතුවෙලා මාව ගොනාට අන්දවල කියල දැනගත්තම මගෙ හිතේ ඇතිවෙච්ච තරහට මං එහෙම කළේ.. එදා මං උන්න තැන වෙන පිරිමියෙක් උන්න නම් සිද්ධවෙන්නෙ ඔයිට වඩා බරපතල දෙයක්.. සොරි.. මං ඒක හිතල කළේ නෑ..''

සස්මිත කීවේය.

ශිෂාට දෑස ඉදිරිපිට ඉන්නා මේ තරුණයාව තේරුම් ගන්නට පුළුවන්ව තිබිණි. ඔහු හරිය. වෙන පිරිමියෙක් උනා නම් රැවටීමට වංචාවට විදින්නට ලැබෙන්නේ මීට වඩා ලොකු දඬුවමකි. කඳුළු පටලයකින් වැසුණු නෙත් උස්සා ගෙන ශිෂා සස්මිත දෙස බැලුවාය. ඇගේ නෙත්වල ගිය දෑස් සස්මිතගේ හිත පිච්චුවේය. ඇය කෙතරම් අහිංසකද..?



The Reader's Place

"ඔයා ශික්ෂා නේද..?"

සස්මිත ඇසුවේය. ශික්ෂා පුදුමයෙන් බලා උන්නා විතරය. පවුලේ සමීපතම නෑයින්ට පවා සමහර වෙලාවට අක්කාවත් නමාවත් වෙන්කර හඳුනාගන්නට බැරිය. සස්මිත නිවැරදිව හඳුනාගත්තේ කොහොමද..?

"මොකද පුදුම වෙලා බලන්නෙ.. ඔයා අක්ක නෙමේ නංගි කියලා මං දන්නවා.. කොහොමද හොයා ගත්තෙ කියලද හිතන්නෙ.. මං ගොඩක් වෙලා මිදුලට වෙලා ඔයා දිහා බලා උන්නා.. අක්ක වගේ නෙමේ ඔයා හරි අහිංසකයි කියලා මං දන්නවා.."

සස්මිත කීවේය. ඒත් ශික්ෂා කතා කළේ නැත. ඇයට දැනුණේ උගුර කට වියලී ඇතිවා වාගේය.

"මොනා උනත් කෙල්ලෙකුට එහෙම කරපු එක වැරදී කියලා මට හිතුණෙ ඊට පස්සෙ.."

සස්මිත ශික්ෂා දෙස බලා කීවේය. ඈ අර ලස්සන ඇස්වලින් ඔහුගේ දෑස් තුළ කිමිදී උන්නාය. ඒත් වචන තිබුණේ ශික්ෂාට බොහෝ දුරිනි.

"මාත් එක්ක වචනයක්වත් කතා කරන්නෙ නැද්ද..?"

සස්මිත ගෙල ඇලකොට ඇගේ මුහුණ බලා ඇසුවේය. ඒ බොහෝ සෙමිනි.

"ශික්ෂා.. මං සමාව ඉල්ලුවනේ.. හොඳ ළමයා වගේ මා එක්ක වචනයක් කතා කරන්න.. ප්ලීස්.."

සස්මිත කීවේය.

"ම්.. මං යන්ඩ ඕන.."

ශික්ෂා ගොත ගසමින් කීවාය. සස්මිතගේ හිතට සතුටක් දැනිණ. වෙහෙස වී යමක් හිමි කරගත්තා වගේ සැනසීමක් හිතට දැනිණි.





"මම හෙටත් මෙතන බලා ඉන්නවා.."

සස්මිත කීවේය. ශික්ෂා කිසිත් කීවේ නැත. ඒත් ඇගේ ලා [illegible] දෙතොල විවරව සිනාවක් නැගෙනවා සස්මිත බලාගෙනය.

"ම්.. මං යනවා.."

ශික්ෂා ගල් පඩිපෙළ උඩට දිව්වේ ආපසු හැරිවත් නොබලාය. [illegible] දෙක අහක් හිත අස්සේ තිබුණ හැඟීම වතුර දැම්මා වගේ [illegible] ආත්මයම සිහිල් වෙනවා සස්මිතට දැනිණ.

මේ ටික දවසට නොදුටු අපූරු හිනාවක් එක්ක නංගී ගල් පඩි පෙළ නැග මිදුලට ගොඩවෙනවා මෝක්ෂා දුටුවාය. ශික්ෂා ආවේ [illegible] හිනා වෙවීය.

"නංගො.. මොකද කවදාවත් නැති ජොලියකින්.."

මෝක්ෂා නැගණිය වෙත ගියාය.

"මාර වැඩක් උනේ අක්කි.."

සතුට ශික්ෂාගේ වචනයක් ගානේ උතුරයි. අක්කාට කිසිවක් [illegible] අදහසක් ඇය වෙත නොවිණ. අක්කාත් මේ කතන්දරය [illegible] සතුටු වෙනු ඇත.

"මට සස්මිතව හම්බවුණා අක්කි.."

ශික්ෂා කීවාය. මෝක්ෂා ගැස්සිණි.

"ඉතිං. මොකද උනේ..?"

මෝක්ෂා පැන නංගීගේ අත අල්ලා ගත්තාය.

"එයා බැන්නද..? අදත් මොනා හරි කරන්න හැදුවද..?"

මෝක්ෂා එකපිට ඇසුවාය.

"අනේ නෑ අක්කි.. එයා හරි වැදගත් විදිහට කතා කළේ.."

ශික්ෂා කීවාය. මෝක්ෂාගේ හිත කුහුලකින් පිරිණි.

"ඉතිං මොනවද කිව්වෙ..?"

"එදා කරපු දේට එයා සමාව ඉල්ලුවා.. කවදාවත් ඒ වගේ දෙයක් කරන්න හිතා උන්නෙ නැලු.. අක්කියි, මායි රවට්ටපු නිසාලු එහෙම කළේ..?"

ශික්ෂා තේරුම් කළාය. සස්මිතව දකින්නට ලොකු ආසාවක් මෝක්ෂාගේ හිතේ තිබිණ. එහෙත් සස්මිතට මුහුණ දෙන්නට බයෙන් සිටි ඇයට නංගිගේ කතාව ලොකු සතුටකි.

"ඔයින් ගියා ඇති.. මං හිතුවෙ මිනිහා ආයෙමත් අපට කරදර කරයි බනියි කියලා.."

"නෑ අක්කි.. එයා එහෙම කෙනෙක් නෙමේ.. ගොඩක් හොඳ කෙනෙක් වගේ.."

The Reader's Place

ශික්ෂා කීවාය. මෝක්ෂා කතා කළේ නැත. එහෙත් ඇගේ හිත කීවේත් සස්මිත හොඳ කෙනෙකු වෙන්න ඕනෑ කියාය.

සස්මිතට මුහුණ දෙන්න හිතේ තිබූ බිය නැතුව ගිය හින්දා පසුදා උදේ මෝක්ෂා වතු යායේ ඇවිදීමට ගියාය. සස්මිත හමුවන්න බලාපොරොත්තුවක් ඇගේ හිතේය. කන්ද පහළින් සස්මිතගේ බයිසිකලයේ හඬ ඇසෙද්දී තමාගේ පැතුම ඉටුවන බව ඇයට දැනිණ.

"ම්.. මෙයා.."

සස්මිතගේ හිතට කොහෙත්ම සතුටක් නොදැනිණි. ඔහු ශික්ෂාව මිස මෝක්ෂාව හමුවන්නට කැමති වූයේ ද නැත. එහෙත් ව්‍යායාමය පිණිස උදේ වත්ත වටේ යන්නේ අක්කාය. ඒ බව ඔහු දැන උන්නේය.

"ගුඩ් මෝනින් බබා.."





මෝක්ෂා සස්මිතගේ යතුරුපැදිය ඉදිරිපිටට පැන්නේ දුකෙනාටවය.

"ඔබා.. බබෙක් කියල හිතාගෙන වෙන්නැති මාව ගොනාට ඇන්දුවෙ.. අපරාදෙ මං අර අහිංසක කෙල්ලට පාඩමක් ඉගැන්නුවෙ.. මොකටයි ඔහොම දෙයක් කරන්න තිබ්බෙ..?"

සස්මිත කතා කළේ තරහෙනි.

"අයිම් සෝ සොරි සස්මිත.."

මෝක්ෂා අමාරුවෙන් කීවාය.

"සමාව ඉල්ලන්න කලින් ඔහොම දෙයක් කරනකොට දෙපාරක් හිතන්න තිබ්බා.. මං හින්දා හොඳයි.. වෙන එකෙක් ළඟා නම් අක්කවයි නංගිවයි දෙන්නවම කැළේට ඇදගෙන ගිහින්.."

සස්මිත කීවේය.

"මං ආයෙ කවදාවත් එහෙම දේවල් කරන්නෑ සස්මිත.. ඔයා මට සමාව දෙනව නේද..? අපි ආයෙත් අර කලින් හිටිය වගේ යාළුවො වෙනවා නේද..?"

සස්මිත ගැන ලොකු ලෝබකමක්.. ආශාවක් තමන්ගේ හිතේ තිබූ බව මෝක්ෂා දැන උන්නාය. ඇයට උවමනා කළේ කුමන කැපවීමක් හෝ කර ඔහුව නැවත යාළු කරගන්නය.

"අපෝ මේ.. එකපාරක් ඉගෙන ගත්ත පාඩම ඇති මට.. ඔයාල වගේ ගෑනු ළමයි ළඟින් ගියත් ඇහැක් නෑ.. මේන් වැන්දා.. ඒ යාළුකම් නැතුවට කමක් නෑ.. මට පාඩුවේ ඉන්ඩ දෙන්ඩ.."

සස්මිත කීවේ බයිසිකලය පදවාගෙන ඉදිරියට යන අතරේය. මෝක්ෂා පාර මැද එහෙමම උන්නාය. ඇ ගල් ගැසුණා සේය. සස්මිතව යාළු කර ගැනීම ලේසි පහසු දෙයක් නොවේ. තමා අතට ආ වාසනාවට පයින් ගැසූ බව මෝක්ෂාට වැටහිණ. ඇගේ නෙත්වලට කඳුළු පිරුණේ නිකම්මය. මෝක්ෂාගේ ඇස්වලට

ලෙහෙසියෙන් කඳුළක් එන්නේ නැත. ඈ නංගි වාගේ කොයිදේටත් ඇස්වල කඳුළු පුරවාගන්නේ නැත. එහෙත් අද බොහෝ කාලයකට පස්සේ තමන්ගේ ඇස්වලට කඳුළු ඇවිත්ය. ඒ සස්මිත නිසාය.

දවස පුරාම මෝක්ෂා උන්නේ කල්පනාබරවය. එහෙත් ශික්ෂා අක්කාගේ මේ වෙනස හැඳින්නේ නැත. ඇගේ හිත තිබුණේ වෙනතකය. සස්මිත ගැන ලොකු බලාපොරොත්තුවලින් ශික්ෂාගේ හිත පිරී තිබිණ. සස්මිත හමුවන්නට දොළ පාර අයිනට යන්නට හිතා ශික්ෂා එදා නවස රෝස සායකට සුදු පාට වී ෂර්ටයක් අල්මාරියෙන් එළියට ගත්තාය.

'මෙයා හැඩ වැඩ වෙලා කොහේ යන්නද..?' මෝක්ෂා නැගණිය දෙස හොරැහින් බලා සිතුවාය.

'ආ අද සස්මිත හම්බවෙනවා කිව්වනෙ.. දොළ ළඟට යන්ඩ වෙන්නැති.. එතකොට දැන් ඔක්කොටම මෙයි වැරදිකාරි.. එයා හොඳයි.. සස්මිතටත් එයා හොඳයි.. ඒත් මට ලේසියෙන් සස්මිතව අමතක කරන්න බෑ..'

මෝක්ෂා වේදනාවෙන් තරහෙන් හිතුවාය. ශික්ෂා ගීයක් මුමුණමින් නාන කාමරය ඇතුළේය. වහා හිතට ආ අදහස හරි යැයි මෝක්ෂා සිතුවාය. ඇය කණ්ණාඩිය ඉදිරිපිටට ගියාය. නංගි වැඩිපුර ඉන්නේ කොණ්ඩය කඩා දමාය. පිට මැද්දට දිග කොණ්ඩය ලෙහා දැමූ මෝක්ෂා හිස පීරා.. විලවුන් ටිකක් ඇඟට ඉස ගත්තාය. දෙපාරක් හිතන්න ඉඩක් නොතියා ඇය දොළ පාර දෙසට ගියාය.

'කලින්ම ඇවිත්..'

සස්මිත ගල්පරය මත හිඳ ඉන්නවා දැකී මෝක්ෂාට හිතිණි. ඈ හෙමින් ගල්පඩිපෙළ බැස්සාය. නංගීගේ හැසිරීම තැන්පත්ය. කතා කරන්නේ පවා සෙමිනි. සස්මිතව ආයෙමත් ලබාගන්නට නංගී වාගේ හැසිරිය යුතුය.

''ඔයා..''



The Reader's Place



සස්මිත ශික්ෂා යැයි සිතා මෝක්ෂාව පිළිගත්තේ උණුසුමට සිය හිනෙනි. ඇත්තටම මේ නිවුන් සොයුරියන් අතර වෙනස්කම් හඳුනාගන්නට තරම් පිටස්තරයෙකු වූ සස්මිතට තවම කල් වැඩිය.

''මං ටිකක් වේලාසන ආවා.. ඉඳගන්න..''

සස්මිත මදක් ඈත්ව මෝක්ෂාට ඉඩ දුන්නේය. මෝක්ෂා සීරුමාරුවට ගල්පරය මත හිඳ ගත්තාය.

''මට අද උදේ ඔයාගෙ අක්කා හම්බවුණා.. මං එයාට කියල දුන්න එයා කරපු වරදෙ බරපතලකම.. ආයි නම් එයා මාව රවට්ටන්න එන එකක් නෑ..''

සස්මිත සැහැල්ලුවෙන් කීවේය.

'ඔයා දන්නෙ නැතුවට මිස්ට සස්මිත මහානාම.. ඒ අක්කා දැන් මේ කර කරා ඉන්නෙත් ඔයාව රවට්ටන එක තමයි..'

මෝක්ෂාගේ හිත කෑගෑවාය. ඒත් ඈ නිහඬව සීතල දියඹ දෙස බලා උන්නාය.

''ශික්ෂා..''

සස්මිත මෘදු හඬින් කීවේය. මෝක්ෂා දිගටම බිම බලා උන්නාය. පුරුදු කෙළිලොල් බවින් ඈත්ව නංගීමෙන් රඟපාන්නට ඇයට සෑහෙන වෙහෙස මහන්සියක් ගන්නට සිදුව තිබිණි. එහෙත් සියල්ල සස්මිත නිසාය. සස්මිත කෙරේ බැඳුණු සිත නිසාය.

''ඇත්තටම වේලාවකට මට ඔය දෙන්නව වෙන් කරලා අඳුර ගන්න බෑ.. මං ඔය දෙන්නව වෙන් කරන්නෙ හැසිරීමෙන්.. අක්කයි ඔයයි අතර කෙනෙකුට වෙන් කරලා අඳුරගන්න පුලුවන් වෙන ලකුණක් කියන්නකෝ.. මේ නිකම් බර්ත් මාක් එකක් වගේ දෙයක්වත් නැද්ද..?''

සස්මිත ඇහුවේ ඔහු හිත හිතා උන් දේය.

මෝක්ෂා හා ශික්ෂා අතර පිටතට පෙනුණ එකම ලකුණක් විය. ඒ මෝක්ෂාගේ අතේ මැණික් කටුව ළඟ තිබූ අඟලක් පමණ දිග පිළිස්සුම් ලකුණය. අවුරුදු තුනේදී මෝක්ෂා කසල ගොඩකට ගිනි තබා තිබූ මිදුලේ නංගීත් එකක් සෙල්ලම් කරමින් උන්නාය. කසල ගොඩේ පිච්චෙන සිලි උරයක් අතට ගනිද්දී එහි ඉටි අතට වැටී මෝක්ෂාගේ අත ගැඹුරට පිළිස්සිණි. අද ද ඒ පිළිස්සුම් ලකුණ ඇගේ අත මතය.

"මේක තමා අපි දෙන්නව වෙන් කරලා අඳුරගන්න තියෙන ලකුණ.."

මෝක්ෂා තම අත සස්මිතට පෑවාය.

"පිච්චිලා නේද..?"

සස්මිත මෝක්ෂාගේ අත අල්ලා ගත්තේ දෙවරක් නොහිතාය. මිහිරි හිරි වැටීමක් ඒ පිරිමි ඇඟිලි මතින් අත පුරා විහිදෙනවා මෝක්ෂාට දැනිණ.

The Reader's Place

"මක්වෙලාද පිච්චුණේ..?"

සස්මිත තුවාල කැළල අත ගා බලා ඇසුවේය.

"පොඩි කාලෙ ගිනි ගොඩක තිබ්බව සිලිබෑග් එකක් අතට අරං.."

මෝක්ෂා කීවාය.

"දැන් මට ඔය දෙන්නව ආයෙ වරදින්නෙ නෑ.. ඔයාගෙ අක්ක එක්ක මගෙ හිතේ තරහක් නෑ ශික්ෂා.. ඒත් අක්කට සමාව දීලා ආයෙමත් එයා එක්ක සැහැල්ලුවෙන් කතා කරන්න බැරි තරමට මට එයා එපාවෙලා තියෙන්නෙ.."

සස්මිත කීවේය. ශික්ෂා මෙන් පෙනී සිටි මෝක්ෂාගේ හිත පිදිණි.





...ළමෙක් උනහම ටිකක් සෙල්ලක්කාර උනාට කමක් නෑ.. ඒත් ඒකට ලිමිට් එකක් තියෙන්නෝන.."

"අනේ අක්කා ඔයා හිතන තරම් නරක නෑ සස්මිත.."

මෝක්ෂා කීවාය.

"මෝක්ෂා නරකයි කියලා කිව්ව නෙමේ.. මට මුලින්ම මුණ ගැහුණ අක්කා බව ඇත්ත.. ඒත් ඔයා ගැන දැන ගත්තට පස්සෙ.. ඔයාගෙ හැසිරීම කතාබහ අඳුරගත්තට පස්සෙ මට තේරුණේ ඔයා අහිංසකයි කියල.."

සස්මිත තේරුම් කළේය. මෝක්ෂාගේ අත තවමත් ඔහුගේ ඇඟිලි අතරය. ඒත් ඒ අත මුදාගන්නට මෝක්ෂාට කොහෙත්ම උවමනාවක් නොවිණි.

ශික්ෂා නාගෙන හැඳ පැළඳ කණ්ණාඩිය ළඟ වැඩි කාලයක් ගත්තාය. හිතට මොනවාදෝ සිද්ද වෙලාය. ඒත් ශික්ෂා මේ පිළිබඳව හිත තේරුම් ගන්නට මහන්සි නොවිණි. සස්මිතට වඩා ලස්සනට පේන විදිහට සැරසී යන්නට ශික්ෂාට උවමනා වී තිබිණි.

'එයා හිතයිද දන්නෑ මං පැනල දෙන කෙනෙක් කියල.. අදත් පරක්කු වෙන්න ගියහම.. නෑ.. එහෙම හිතන එකක් නෑ.. මගේ හිතටත් මොනවා වෙලාද කියලා මටම තේරෙන්නෙ නෑ.. එයාව එක පාරක් හරි දකින්න තියේ නම් කියලම තමා හිතෙන්නෙ..'

ගෙයින් එළියට බැස දොළ පාර වෙත යන අතරේ ශික්ෂා දිගටම හිතුවාය.

ඒත් ගල් පඩිපෙළ උඩදීම ශික්ෂාගේ සිහින බිඳිණ. රෝස පඳුරු අතරින් පෙනෙන පහල ගල්තලාවේ හිඳ ඉන්නා යුවළ ශික්ෂාගේ හිත කලබල කළේය.

"අක්කි.. සස්මිතත් එක්ක.."

ශික්‍ෂා පැතූ සිහින ලෝකය ඇගේ දෙපා මුල බිඳී විසිරිණ. දරුණු වේදනාවක් පපුව ඉරාගෙන යනවා ඇයට දැනිණ. ඒ හින්න වඩා බලවත් වූයේ එකට පැටලී තිබූ අක්කාගේත් සස්මිතගේත් දෑත දකිද්දීය.

"සස්මිත.. ඇයි අක්කත් එක්ක..? එතකොට.. එතකොට.. ඒ දෙන්න ආදරේ කරන්න පටන් අරන්ද..?"

ශික්‍ෂා හිතට දැනෙන දැවීම තේරුම් ගන්නට අකමැති වූවාය. ඇස් දෙකට පේන සියල්ල විශ්වාස කරන්නට අකමැති වූවාය. සස්මිත තමාට අහිමිව ගිය බව අක්කාට හිමිව තිබූ බව පිළිගන්නේ කොහොමද..?

"අනේ සස්මිත මට ඔයාව ඕන.. හැමදාටම ඕන.. අක්කා නෙමේ ඔයාට ඇත්තටම ආදරේ මං.. ඔයා මගෙ ජීවිතේම වෙලා ඉවරයි.."

ශික්‍ෂාගේ හිත විලාප දුන්නාය. ඒත් ශික්‍ෂා අක්කාත්, සස්මිතත් ඉදිරියට යන්නට මැලි වූවාය. හද උතුරන වේදනාව දෙනෙතින් පිටාර ගලද්දී ශික්‍ෂා අතකින් මුව වසාගෙන ගෙදර දිව්වාය.

ගස් අතු අතරින් පෙරී ආ බැස යන හිරුගේ රශ්මි දහරාවක් දොළේ දියට වැටී බැබළිණ. හිරු අහසේ කොණක සැඟවෙන්න සූදානමේය.

"මං දැන් යන්නෝන.."

මෝක්‍ෂා කීවේ කැමැත්තෙන් නොවේ. මේ රැය එළිවෙනතුරු උනත් ඇයට සස්මිත ළඟ ඉන්න හිතය. ඒත් ඒ තරමට ඉක්මන් විය යුතු නැත. ආයෙමත් සස්මිතව අහිමි කරගන්න බැරිය. සස්මිත ලැබුණේ පෙර කළ පිනකටය. මෝක්‍ෂා උන්නේ සස්මිත ළඟ ගන්නට ඕනෑම දෙයක් කරනා අදහසිනි.

"මං කොළඹ ඉඳල නුවර ආවෙ මගෙ ජීවිතේ මෙහෙම වෙනසක් වෙයි කියල හිතාගෙන නෙමේ ශික්‍ෂා.. ඒත් මගෙ ජීවිතේ





වෙනස් වුණා. ඒ ඔයා නිසා.. කවදාවත් ඒක අමතක කරන්න බෑ.."

සස්මිත පැහැදිලිව කීවේය. ඔහු ශික්‍ෂාට ආදරය වුණේ අනුකම්පාවෙනි. ඒ ශික්‍ෂාගේ රූපයට නොවේ. ශික්‍ෂාගේ රූපයට ආදරය කළ හැකි නම් ඔහුට මෝක්‍ෂාගේ රූපයටත් ආදරය කළ හැකි විය යුතුය. හිත තුළ මෝක්‍ෂා ගැන එහෙම අදහසක් නැත. ඇත්තේ ශික්‍ෂා ගැන පැහැදීමක් කැමැත්තක් ආදරයක් විතරය. සස්මිත මේ බව හොඳින් අවබෝධ කර උන්නේය.

මෝක්‍ෂා ගෙදර ආවේ සතුටිනි. ඒ සතුට සසලව ගියේ ඇඳේ පෙරළී ඉන්නා ශික්‍ෂා දුටුවිටය.

"මෙයා සමහර විට සස්මිත මං එක්ක ඉන්නවා දකින්න ඇති.."

මෝක්‍ෂා අනුමාන කළාය. කතා නොකර මඟ හැර යන්න ඇයට පළමුව හිතිණි. එහෙත් නංගී එක්ක කතා කරන්න ඊළඟට තීරණය කළේය. සස්මිත ද දැන් තමාගේය. එය නංගීට අඟවන්න ඕනෑය.

"නංගී.."

මෝක්‍ෂා ඇඳේ කොණක හිඳ ගත්තාය. නිහඬ කඳුළු එක දෙක නෙතු අතරින් ගිලිහී යද්දී ශික්‍ෂා නිහඬවම උන්නාය.

"මට සස්මිත හම්බවුණා.."

මෝක්‍ෂා කීවාය. හිතේ නංගීට කියාගන්න මහ හුගාක් තිබිණි. ඒත් පටන් ගන්නා තැනක් නොතේරේ.

"සස්මිතව ඉස්සෙල්ලාම හම්බවුණේ මටනෙ.. එයා මේ මෙහෙට ආව දවස්වල ඉස්සරවෙලාම කතා කළේ අඳුර ගත්තෙ මාවනෙ.. ඉතිං එයා තරහවෙලා ඉන්නෙක මට හිතට හරි නෑ.. ඒ හින්දා මං ගිහින් සස්මිතගෙන් සමාව ඉල්ලුවා.."

මෝක්ෂා කීවාය. සස්මිතට අයිතිය ඇත්තේ තමාටය. ඒ අයිතිය පෙන්වන්නට මෝක්ෂා ළඟ ඕන තරම් කරුණු තිබිණි.

''නංගි දන්නවද සස්මිත ඉඳල තියෙන්නෙත් මම එයාගෙන් සමාව ඉල්ලනකං.. නංගි, සස්මිත මට ආදරෙයි.. මට වගේම එයාටත් මාව ඕනේ..''

මෝක්ෂා කීවේ ඇත්තම නොවේ. සස්මිත ඒ තරමට වත් තමා සමඟ කතා කළේ ශික්ෂා කියා වරදවා හිතාගෙනය. ඇරත් සස්මිත ආදරය ගැන කෙලින් කිසිවක් කීවේ නැත. මෝක්ෂාට උවමනා කළේ සස්මිතට බැඳි නංගීගේ හිත බිඳින්නය. දෙන්නා ඈත් කර තියන්නය.

''සස්මිත මට ආදරෙයි කිව්වම මට ඒක පිළිගන්නෙ නැතුව ඉන්න බැරිවුණා.. සස්මිත හොඳ කොල්ලෙක්.. තාත්තා කියන්නෙත් පැහැදිලි අනාගතයක් තියෙන එකෙක් කියල.. ඒ හින්දා මාත් එයාට කැමතී..''

The Readers Place

මෝක්ෂා කියවාගෙන ගියාය. ශික්ෂා හිස තබා උන් කඳුළින් තෙත්ව ගිය කොට්ටයේ කොණක් සපා ගත්තේ ඉකි බිඳේ බයටය. සියල්ල මේ විදිහට සිදුවනවා නම් සස්මිත ගැන මේ තරම් ආදරයක් අහිංසක තමාගේ හිතේ මොකට ගොඩ ගැහුණාද..? අසරණියට නොතේරිණි.

''නංගී..''

මෝක්ෂා නැගණියගේ උරහිස මත අත තැබුවාය.

''මට ඔයාට දෙයක් කියන්න තියෙනවා.. හැබැයි මේ රහස කවදාවත් සස්මිතට දැනගන්න තියන්නෙපා.. එදා සස්මිත බලෙන් කිස් කළේ මාව කියලා සස්මිත හිතාගෙන ඉන්නෙ.. ඒ මම නෙමේ කියලා මං කවදාවත් එයාට කියන්නෙ නෑ.. ඔයා කියන්නත් එපා..''

සිප ගත්තේ තමාය කියා විතරක් නොවේ. ශික්ෂාත් තමාට





කියා සස්මිත හිතා ඉන්නා බව මෝක්ෂා හෙළි කළේ නැත. එය නැගණියගෙනුත් හංගා රැක ගත යුතු රහසකි.

''නංගී.. ඔයා අපට උදව් කරනව නේද..?''

මෝක්ෂා කීවාය.

ශික්ෂා කිසිත් කීවේ නැත. එහෙත් උදව් කරන බව අඟවන්න ඈ හිස සෙලෙව්වාය. හිත තිබුණේ පිච්චෙමිනි. සස්මිත මේ ඉක්මනට මේ තරමට තමාගේ හිතට රිංගා උන් බව ඔහු අහිමිව යනතුරු ඇයට නොතේරිණි.

'අනේ සස්මිත.. කොහොමද මං ඔයාව අමතක කරන්නෙ..? කොහොමද දෙයියනේ මං එහෙම කරන්නෙ..? ඔයා දැන් මගෙ ජීවිතේ හැම අහු මුල්ලකටම රිංගලා ඉවරයි.. ඒත් මට මගෙම අක්කට ද්‍රෝහි වෙන්න බෑ.. ඒ හින්දා අමාරුවෙන් උනත් මං ඔය ආදරයෙන් ඈත්වෙන්න ඕන..'

හඬා වැටෙමින් ශික්ෂා සිතුවාය. ඒත් ශික්ෂාගේ මේ හිතේ වේදනාව මෝක්ෂාට නොතේරිණ. ඈ නංගී වැතිර උන් තැනින් ළඟින් ඉවත්ව ගියේ සස්මිතව තනියම අයිති කරගත්තා කියා ප්‍රීතියෙනි.

* * * * * * * * *

# 04



ඒත් වතු යාය පුරා අළු පාට මීදුම් සළුවක් පැතිර තිබිණි. සස්මිත හිත හිරි වට්ටන ශීතලේ වරුසප්පෙරුම බංගලාව තෙක් බයිසිකලයෙන් ආවේය. ඔහු උන්නේ ප්‍රීතියෙනි. කාටත් රහසේ ගලා ගිය ශික්ෂාගේත් ඔහුගේත් ප්‍රේමය ඔහුව සතුටින් තැබුවේය. ඒත් හැමදා හවස දොළ පාර අයිනේ තමාට ළංව ඉන්නේ ශික්ෂා නොව මෝක්ෂා බව ඔහු නොදත්තේය.

The Reader's Place

''සස්මිත..''

සස්මිත බයිසිකලයෙන් බහිද්දී ශික්ෂා උන්නේ මිදුලේය. ඔහු මග හැර ගෙට දුවන්නට හිත ඇයට කීවේය.

''ඔහොම ඉන්නවා...''

යුවතිය දුව යන්නට හදන බව දැක සස්මිත කීවේය. ඔහු ඇ ළඟට ආවේය. යුවතියගේ දකුණතේ සලකුණ සෙව්වේය. එහෙම ලකුණක් නැත. තමා හිතුවා හරිය. මේ නංගි නොව අක්කාය.

''මොකද මාව දැක්කම යකෙක් දැක්ක වගේ දුවන්නෙ.. නිකම් දුන්නත් මං ඔයා වගේ කෙල්ලෙක්ව ගිලින්නෑ මෝක්ෂා..''





සස්මිත කීවේය. ශික්ෂාගේ පපුව පැලිණ. තමා මෝක්ෂා නොව ශික්ෂා කියා කියන්න දහස්වර හිතිණ. ඒත් ඇගේ අත පය වෙව්ලමින් දෙතොලත් හිරි වැටී තිබිණි.

''ඉතින් එක්කෙනා නැද්ද ගෙදර..?''

සස්මිත ඇසුවේය. හිත ආදරය කළ රූපය දැක ගන්නට ඔහුගේ හිතේ ලොකු ආසාවක් තිබිණි. ශික්ෂා, සස්මිත දෙස බැලුවේ ඇස් ලොකු කරය.

''මොකෝ බයවෙලා බලන්නෙ..? මං ආවෙ ශික්ෂාගේ මූණ බලාගන්න.. අර රූපෙ ඔයා වගේ උනාට හැදියාව ඔයා වගේ නැති කෙනා.. මේ වරුසප්පෙරුම බංගලාවෙ අහිංසක කෙල්ල.. ශික්ෂා.. එයා නැද්ද ගෙදර..?''

සස්මිත ඇසුවේය. දෙවියනේ.. මේ තරම් අපූරුවට තමන්ගේ හිත ගැන දැක දෙන්නට ඔහු දැන උන්නේ කොහොමදැයි ශික්ෂාට තේරුමක් නොවිණ. අක්කා තමා මෙන් පෙනී සිට ඇත. ශික්ෂා ඔහු අක්කායි සස්මිත හිතා සිටියි. එය වරදකි. වංචාවකි. එහෙත් මේ වරද හරිගස්සන ක්‍රමයක් ශික්ෂාට නොතේරිණ.

''එකාතකින් මං ඔයාට ණය ගැතී මෝක්ෂා.. මට ශික්ෂා කොයි තරම් අහිංසක හොඳ ළමයෙක්ද කියලා තේරුණේ ඔයා හින්දා.. මං දන්නෑ ඔයාගෙ ගෙවල්වලින් මං වගේ එකෙකුට ශික්ෂාව දෙයිද කියලා.. ඒත් ශික්ෂාව ලැබුණෙ නැත්තං මං ආයෙ වෙන කාවවත් බඳින්නෑ..''

සස්මිත කීවේය. ශික්ෂාගේ දෙපතුලින් ගිනි පිටවිණ. උගුර හිරවිණ. නෙත පිරිණ. මේ තරම් ආදරයක්, මේ තරම් පැතුමක් මේ පිරිමියාගේ හිතේ තමා ගැන තිබුණාද..? ඒත් ඒ පැතුම් සියල්ල දැන් ගලා යන්නේ වැරදි පාරක නොවේද..?

''ප්ලීස් මෝක්ෂා.. ගිහින් එයාට කියනවද මං ඇවිත් කියලා..''

සස්මිත කීවේය. ශික්ෂා වහා ගේ දෙසට හැරිණි. මහා හයියෙන් මුළු ලෝකයටම දුක කියා හඬන්න උවමනාවක් ශික්ෂා තුළ තිබිණි.

'වෙලාවකට මෙයාවත් තේරුම් ගන්න බෑ..' ගේ දෙසට යන ශික්ෂා දෙස බලා සස්මිත හිතුවේය.

'අද හරියට හා පැටියෙක් වගේ ඇස් දෙකේ කඳුළු පුරෝගෙන මා ළඟ තැන්පත් වෙලා හිටියෙ.. අර පුරුදු කපටිකම, දඟලිලි කොහෙ ගියාද දන්නෑ.. ඔය ඔක්කොම මා එක්ක දාපු සෙල්ලම් මගෙ අතටම අහුවෙච්ච හින්දා.. ඒකෙන්වත් පාඩමක් ඉගෙන ගත්ත නම් ඇති..' සස්මිත හිතුවේය.

මෝක්ෂා උන්නේ හිනැදි චිත්‍රපටයක් නරඹමිනි. හිත කොයි තරම් එයට ඇදී තිබුණාද කීවොත් සස්මිතගේ බයිසිකලයේ හඬවත් ඇයට නෑසිණි.

''අක්කි..''

ශික්ෂා හීන් හඬින් කීවාය. ඒ මෝක්ෂා ළඟට කිට්ටු වෙලාය.

''ම්..''

මෝක්ෂා කීවේ ඇස් දෙක තිරයෙන් ඉවතට ගෙනවත් නොවේ.

''සස්මිත ඇවිත්..''

ශික්ෂා කීවේ බිඳුණු හඬිනි.

''සස්මිත ඇවිත්..''

මෝක්ෂා තුළ ඇඳුණු කලබලය ශික්ෂා දුටුවාය.

''ඔව්.. ඔයාව අහනවා..''

ශික්ෂා කීවේ ඉකිබිඳින හිත වහගෙනය.

''ඇත්තට..''





මෝක්ෂා ගෙයින් මිදුලට ඉගිළිණි. මෙතෙක් ශික්ෂාගේ නෙත පැටලුණු කඳුළු ඇගේ නෙතින් මිදිණි. ශික්ෂා කාමරයට දිව්වේ හඬාගෙනය.

ලිපේ උතුරමින් තටන මුරුංගා හොද්ද ලිපෙන් බා රෝෂණී කෑමට මැල්ලුම ලියන්න ගත්තාය. මිදුල දෙසින් සිහින් සිනා හඬක් ඇසී ආවේ ඒ වෙලාවේය. රෝෂණී මිදුලට එබිණ.

''මේ ළමයා..?''

සස්මිත, මෝක්ෂාත් එක්ක බර කතාවකය. සස්මිත ගුණ යහපත් තරුණයෙකු බව රෝෂණී දැන උන්නාය. වෙනකක් තබා [illegible] තරුණයින්ගේ අඩුපාඩු දකින සැමියා රාජිතවත් සස්මිතගේ දොසක් ගෙදර කියන්නේ නැත. ඒ හින්දා දියණිය සස්මිත එක්ක සමීප ඉන්නවා දැකී රෝෂණීගේ හිතට වෙනසක් නොදැනිණි. ඈ අත් දෙක රෙදි කඩක පිස දමමින් දොරකඩට ආවාය.

''මේ ළමයා මේ වෙලාවෙ..?''

සස්මිතත්, මෝක්ෂාත් ගේ දෙසට හැරුණේ ඒ හඬටය.

''සස්මිත තාත්තා හම්බවෙන්න ඇවිත් අම්මා..''

මෝක්ෂා වහා කීවාය.

''මහත්තය වවුමට ගියානෙ.. ගමන් දෙක තුනක්ම තියෙනවා කිව්වා.. එන්න වෙලා යයි මා හිතේ..''

රෝෂණී කීවාය.

''මං එහෙනං ගිහින් පස්සෙ එන්නං..''

සස්මිත හෙල්මටය අතට ගත්තේය.

''හදිසි පණිවිඩයක් නම් අපි මහත්තයට කියන්නං..''



The Reader's Place

රෝෂණී කීවාය.

''නෑ.. ඒ තරම් හදිසි වැඩකට නෙමේ.. පොඩි පොඩි වැඩ දෙක තුනක් තියෙනවා කතා කරගන්න.. මං හවසට එන්නං..''

සස්මිත බයිසිකලයට ගොඩවිය.

ඔහු ආවේ රාජිත වරුසප්පෙරුම මුණ ගැහෙන්නට නොවේ. තමාගේ හිත හොරකම් කළ අහිංසකාවිය දැක බලා ගන්නය. ඒ මූණ දකින්නට හිතේ ඇත්තේ ලොකු ආසාවක් නොවේද..?

''මං යනවා පුදූ.. තාත්තා හම්බවෙන්න නෙමේ මං ඔයාගෙ මූණ බලලා යන්න ආවෙ.. උදේ ඉඳලා ඔයාවම මතක් වෙනවා ඒකයි..''

සස්මිත බයිසිකලය පණ ගන්වමින් මෝක්ෂාට කීවේය. මෝක්ෂාගේ හිත මිහිරියාවකින් පිරිණ. මේ තරම් ආදරයක් මේ කොල්ලා ළඟ කොහේ හැංගී තිබුණාද..? සස්මිතගේ බයිසිකලය පාරට ඇදෙද්දී මෝක්ෂා, අම්මා පස්සේ ගෙට ආවාය.

''අක්කි..?''

මෝක්ෂා තනිවනතුරු ගිෂා බලා උන්නාය. අක්කා ළඟට ගියේ ඊට පස්සේය.

''ඇයි..?''

මෝක්ෂා ඇසුවේ නැවතුණ තැනින් හින්දි චිත්‍රපටය නැවත ක්‍රියා කරවමිනි. රෝෂණී අතරමග නතර කළ මැල්ලුම ලියන්නට කුස්සියට ගිහින් උන්නාය.

''අක්කි සස්මිත හිතා ඉන්නෙ ඔයා මම කියලා..''

ගිෂා කීවාය. ඇයට මේ වරද නිවැරදි කර ගන්නට උවමනා කොට තිබිණි. සස්මිතට මහ හුගාක් ආදරය කළ හිත සස්මිත ලබා ගන්නට පොර බදමින් උන්නේය.





"ඔයා හිතා ඉන්නෙ ගිෂා කියන්නෙ ඔයා කියලා.. ඔයා [illegible] නෙමේ නංගී කියලා..''

ගිෂා කීවාය. මෝක්ෂා නංගී දෙස බැලුවේ ගැස්සිය. නංගී [illegible] දැහැගෙන තිබේ. ඒත් සස්මිත වාගේ හිතට දැනෙන්නට [illegible] කොල්ලෙක් දෝතින් ගිලිහී යන්නට ඉඩක් තියන්න නැතිය.

"ඇයි ඉතිං..?"

මෝක්ෂා ඇසුවේ ගණනකට නැතිවය.

"ඔයා එහෙම හිතාගෙන ඉන්නව කියල අක්කි කලින්ම දැනන් හිටියද..?"

ගිෂා අසරණ හඩින් ඇසුවාය.

"ඔව්.. එයා එහෙම හිතං ඉන්නවා.. මං ඒක දන්නවා.. ඒත් මං ඒක වෙනස් කරන්න ගියේ නෑ.. ඔය අකුරු දෙක තුනක වෙනසක් තියෙනේ.. අනික රූපෙ අපි දෙන්නගෙම එකවගේනේ.."

මෝක්ෂා කියවාගෙන ගියේ හිතක් පපුවක් නැති ගාණටය.

"ඒත් ඒක වැරදි අක්කි.."

ගිෂා කීවාය.

"ඒක මං බලාගන්නං.. ඔයා කලබල වෙන්න එපා.."

"ඔයා ආයෙමත් එයාව රවට්ටනවා අක්කි.."

ගිෂා වේදනාවෙන් කීවාය.

"මං කිව්වනෙ.. ඒක මං බලාගන්නං කියලා.."

මෝක්ෂා තරමක් සැරෙන් කීවාය. සස්මිත සම්බන්ධව නංගිට පොඩි බුරුලක්වත් දෙන සූදානමක් මෝක්ෂා තුළ නොවිණි.



The Reader's Place

"එයා ඇත්ත දැනගත්ත දවසක අපි දෙන්නටම වෛර කරයි.."

ශිකෂා ආයෙමත් කීවාය.

"නෑ... ඔයා හිතනව වැරදි.. ඇත්ත දැනගත්ත දවසක එයා මට සමාව දෙයි.. එයා මට ගොඩක් ආදරෙයි ඒකයි.."

මොක්ෂාගේ කටහඬේ තරමක ආඩම්බරයක් තිබිණි. ශිකෂාගේ රෝස කම්බුල් රතු විය. නෙත මත පොර බැඳි කඳුළ ගිලිහිණ. ඇ නිහඬවම කාමරයට රිංගා ගත්තේ හදවත තුළ මහා වේදනාවක් පෙරළි කරමින් තිබූ හින්දාය.

'මට තේරෙන්නෑ මොනා කරන්නද කියලා දෙයියනේ.. එක්කො මං සස්මිතටයි, අක්කටයි ඕන දෙයක් කරගන්න ඉඩදීලා පාඩුවෙ ඉන්න ඕන.. ඒත් කොහොමද මං එහෙම කරන්නෙ..? දැන් මගේ හිතත් පුදුම තරම් සස්මිතට ආදරෙයිනේ.. දැන් මගෙ ජීවිතේටත් එයා නැතුව බෑ දෙයියනේ..' ශිකෂා වේදනාවෙන් බරිත හදවත අතින් අල්ලාගෙන ඇඳේ පෙරළිණ.

* * * * * * * * *

රාජිත වරුසප්පෙරුම උන්නේ සතුටිනි. දැන් ඉස්සර වාගේ වතු යායේ හැම වැඩක්ම ඔළුවේ තියාගෙන ඉන්න ඕනෑ නැත. අලුතින් ආ කොල්ලා - අර ප්‍රියමනාප තරුණයා සස්මිත මහානාම තමාව ඒ සියලු වගකීම්වලින් නිදහස් කර තිබිණි.

"රාජිත.."

රෝෂණී දිය නා තෙත කොණ්ඩය පිස දමමින් කන්තෝරු කාමරයට ආවාය. සැමියා ලිපි ගොනුවක් පෙරළාගෙනය. බිරියගේ හඬින් රාජිත ලිපිගොනුව තුළින් දෑස මුදා බැලුවේ 'ඇයි' කියා අහනවා සේය.

"මේ ළමයි දෙන්නගෙ බර්ත්ඩේ එකත් ළඟටම ආවා.. මේ





[illegible] ඒ ගැන කිසි කතාවක් නෑ කියලා මට කුණු කුණු [illegible].."

රෝෂණී කීවාය. රාජිතගේ මුහුණේ අපූරු සිනාවක් ඇඳිණි. [illegible] මල් කැකුළු දෙක තමාට ලැබී අවුරුදු විසි දෙකකුත් [illegible]. රාජිතට ඒ අපූරු දිනය අද ඊයේ වගේ මතකය.

"[illegible] යන ඉක්මණ.. අගෝස්තු විසි අට කට ළඟටම ආවා [illegible].."

රාජිත කීවේය.

"මේ පාර මොකද කරන්නෙ රාජිත..?"

"මේ පාරත් බර්ත්ඩේ පාටි එකක් ගන්න වෙනවා.. ඔය දෙන්නා ඉතිං බලා ඉන්නෙ ඒකටනෙ.. අපට කියලත් වෙන ළමයි ඉන්නවද..? ඉන්න දෙන්නගෙ හිත රිද්දන්න නරකයි.."

රාජිත කීවේය. දරුදූ නිති රිති කීපයක් දියණියන් දෙන්නා [illegible] ඇති බව හැබෑය. ඇත්තටම ඒ ඔවුන් රැකගන්නය. රාජිත නීති රීති දැම්මත් දියණියන් දෙන්නාට පණ සේය. දියණියන්ට [illegible] හොඳින් අම්මා වූ රෝෂණී එය දැන උන්නාය.

"ගොඩක් කට්ටියකට කියන්නද කල්පනාව..?"

රෝෂණී නැවත ඇසුවාය.

"වැඩිය නෙමේ.. එස්ටේට් එකේ ස්ටාෆ් එකටයි, ඔය [illegible]රාලගෙ පවුලටයි.. විශ්වනාදන්ගෙ ෆැමිලි එකටයි කිව්වම ඇති."

රාජිත තීරණය කළේය.

"විශ්ව නාදන්ගෙ වයිෆ් ඊයෙත් මට මාකට් එකේදි හම්බවුණා.."

"ඉතිං මොකද කිව්වෙ..?"



The Reader's Place

"දුවල දෙන්නගෙ අනාගතේ ගැන තාම මොකුත් තීරණය කරල නැද්ද ඇහුවා.."

රෝෂණී කීවාය. රාජිත බැලුවේ ගැස්සීගෙනය.

"ඒ කිව්වෙ..?"

"ඒ කිව්වෙ ඉතිං අපි මේ දෙන්නව කාට හරි බන්දල දෙන්න අදහසක් නැද්ද කියන එකනෙ.."

රෝෂණී තෙත කොණ්ඩය වටා තුවාය බඳින අතරේ කීවාය. රාජිත ගැඹුරු කල්පනාවකට වැටිණ. ඇත්තටම දියණියන් දෙදෙනා තනි තනිව පවුල් ජීවිත පටන් ගතයුතු වයසත් පැමිණ තිබේ. ඒත් තමාට තවමත් ඔවුන් දෙදෙනා කුඩා දැරියන් වාගේය.

"මොකෝ රාජිත කල්පනාව..?"

The Reader's Place

සැමියා නිමක් නැති කල්පනාවක ගිලී උන් බව රෝෂණී දුටුවාය.

"මේ ළමයි දෙන්නා මට නම් තාම පොඩි උන් වගේ.. ඒත් ඉතිං පිටින් ඉඳන් බලන අයට පේන්නෙ දීග දෙන වයසෙ උන් වගේ.."

රාජිත කීවේය.

"මිසිස් විජේවාදන් කිව්ව කතාවෙ වරදක් නෑ අනේ.. මේ ළමයි වැඩි වයස යන්න කලින් පිළිවෙලක් කරන්න ඕන.. ළමයි පිළිවෙලක් කරනවා කියන්නෙ අපෙන් අයින් කරල දානව කියන එක නෙමේ.. අපි ඉතිං ළමයි දෙන්නව රස්සාවල් කරන්න යවන්න බලාපොරොත්තුවකුත් නැති එකේ.. තවදුරටත් ඉගෙන ගන්ට දෙයක් ඒ දෙන්නට නැති එකේ.. පිළිවෙලක් කරන එක තමා හොඳ.."

රෝෂණී කියාගෙන ගියාය. මෙය කාලයක් තමා කියාගන්නට උන් දෙයකි. දියණියන් දෙන්නා කොයි තරම් ලොකු උනත් ළඟ





[illegible]ගන්නා අදහස මිස. ඔවුන්ට තනිවම ජීවිත පටන් ගන්න ඉඩ [illegible] සැමියා තුළ නැත.

"හරි.. හරි රෝෂණී.. මටත් තේරෙනවා ඒක තමා කෙරෙන්න ඕන කියලා.. ඒත් ඔවට කලබල වෙලා බෑ.. අපි බලමුකො හෙමිහිට.."

[illegible]ත ලිපි ගොනුවට දෑස යොමන අතරේ රාජිත කීවේය.

"ඔයා ඊයෙ ඉඳන් ෆයිල් අස්සේ ඔළුව ගහන් ඉන්නෙ මොකද..? එස්ටේට් එකේ අකවුන්ට්ස්වල මොනා හරි වරදක් තියෙනවද..?"

කාමරෙන් පිටවෙන්නට දොර ළඟට ගිහින් ආයිමත් හැරී රෝෂණී ඇහුවාය.

"අනේ නෑ.. ජීවිතේ පළවෙනි වතාවට තමා මං එක [illegible] දෝෂයක් නැතිව ෆයිල් ටික ක්ලියර් එකට තියෙනවා [illegible].. රෝෂණී දන්නවද අලුත් සුපිරින්ටෙන්ඩ්.. අර සස්මිත.. ඒ [illegible]ඩියා අකවුන්ට්ස්වලටත් මාර දක්ෂයි.."

රාජිත හිතේ සතුටින් කීවේය. කවදාවත් සේවකයෙකුගේ [illegible] හොඳ ගතිගුණයකට ප්‍රශංසා කරන්නට රාජිත අමතක කළේ නැත.

"මටත් ඒ ළමයා දැක්ක ගමන් පැහැදීමක් ඇතිවුණා.. අපේ [illegible]ට තියෙන තරම්වත් දැගලීමක් නැති තැන්පත් ළමයා.."

රෝෂණී කීවාය. මිදුලේ සිට කාමරයට රිංගාගන්නට ගිය [illegible]ට අම්මා හා තාත්තා අතර කෙරෙන මේ දෙබස ඉතා හොඳින් ඇසිණි.

"හ්ම්.. එස්ටේට් එකත් තමන්ගෙම එකක් වගේ හොඳට බලාගන්නවා.."

රාජිත කීවේය. තාත්තා කී ඒ වචන ශිෂාට ඉතා හොඳින් ඇසිණි. ඇත්තය. සස්මිත එහෙමය. ඔහු රුවින් සේම ගුණින් ද

අගතැන්පත්ය. තමාට නැතුව ගියේ - වංචාවෙන් අක්කා අයිති කරගත්තේ ඒ හොඳ පිරිමියාය.

'ඔයා කාට අයිති උනත් මට දුකක් නෑ සස්මිත.. මගෙ අක්කා බොරුවක් කරලා ඔයාව අයිති කරගත්ත එකත් මට උහුලන්න පුළුවන්.. ඒත් මට දරාගන්න බැරි ඔයා මට වෛර කරන එක.. මාව පිළිකුල් කරන එක..'

ශිෂා හිතුවාය. ආදරය කරන කෙනෙක් පෙරලා තමාට ආදරය නොකරන එක උහුලන්නට පුළුවන. ඒත් හිත ආදරය කරන කෙනා, හිතේ ජීවත්වෙන කෙනා පෙරලා තමාට වෛර කරන එක, තමාව පිළිකුල් කරන එක පහසුවෙන් දරන්නට බැරිය. ශිෂා වැනි සියුමැලි අහිංසක යුවතියකට කොහොමටත් ඒ වේදනා ගින්දරක්ම වූවාය.

* * * * * * * * *

මෝෂා උන්නේ පියාඹන්නට තටු ලැබුණා සේය. අක්කා ජීවිතයේ කවරදාකවත් නැති සතුටකින් ඉන්නවා ශිෂාට පෙනිණි ඇත්තය. එය එහෙම වෙන්න ඕනැය. සස්මිත වාගේ පිරිමියෙකුගේ ආදරය, රැකවරණය හිමිවීම ජීවිතයට ලොකු සතුටක් නොවේද..?

"නංගෝ.."

මෝෂා, ශිෂා ඉදිරියේ උන්නේ ඩෙනිම් කලිසමට බතික් රෙද්දෙන් කළ අලංකාර බ්ලවුසයක් හැඳගෙනය.

"ඉක්මනට ලැස්තිවෙන්න.. මාත් එක්ක ටවුමට යන්ඩ.."

මුළු ලොවට හංගා වංචාවක් කරන අතරේ අක්කා මේ තරම් සැහැල්លුව හැසිරෙන විදිහ ශිෂාට නොතේරිණි.

"ඇයි අක්කි..?"

"ශාන්ති කිව්වා බර්ත්ඩේ පාටි එකට ඇඳුම් අරගන්න කියලා.."

මෝෂා කෙරේ වූ ඒ උනන්දුව ශිෂා කෙරේ ඇති නොවිණි.





ශිෂාගේ හිතේ වූයේ අලසතාවකි. හැම දෙයක් ගැනම කලකිරුණු ගතියකි. එහෙම වූයේ ඇයිදැයි ඇත්තටම ඇයවත් දැන උන්නේ නැත.

"අක්කී ගිහින් එන්න.."

ශිෂා කීවාය. ඒ තරහින් නොවේ.

"ගන්න ඇඟින් පිස්සු නටන්න හදනවා.. මොනාද හෙට පාටි එකට අඳින්න හිතා ඉන්නෙ..?"

මෝෂා ඇසුවාය.

"මං ඔය තියෙන එකක් අඳින්නං.."

අක්කාට වාගේ තමාට හැඩවැඩවීමේ උවමනාවක් නැත. ඒ අයගේ ලස්සන බලා 'ලස්සනයි' කියන්නට විශේෂ දෑසක් නැති නිසා.

"තොලං නැතුව යං.. ලැස්තිවෙනවා.."

මෝෂා, ශිෂාගේ අතින් ඇද කීවාය. ඒ සැරෙනි. අක්කා ඇඳගන්න හොඳ නැත. ශිෂා නිල් ඩෙනිමකට පාට පාට බිංදු තිබුණ කුර්තා බ්ලවුසයක් හැඳ එළියට ආවය.

"පරිස්සමින්.. ලොකු දුව.. නංගිව හොඳට බලාගන්න.."

රෝෂණී ත්‍රීවිලරයට නගින දියණියන්ට කීවාය. නිවුන් සොයුරියන් රැගත් ත්‍රීවිලරය පාර දිග ඉගිලිණ. මෙහෙම ගමනක් ගෙදරින් එළියට යන්න ලැබෙන්නේ කලාතුරකිනි. බොහොම කලාතුරකිනි. අම්මාගේ කැමැත්ත අකමැත්ත කොහොම වුණත් තාත්තාගේ කැමැත්ත ගැනීම ලේසි නැත. මේ විශේෂ අවසරය හෙට පැවැත්වෙන උපන්දින සාදය නිසාය.

"බයිලූ.."

නවීන පන්නයේ රෙදි සාප්පුවක් ළඟින් බැහැගත් මෝක්ෂා වටපිට බැලුවේ කවුරුන් හෝ හොයන්නා සේය.

"අක්කා.."

පාර අයිනේ හිටගෙන වටපිට බලන අක්කා දෙස ශිෂා බැලුවාය.

"කාවද හොයන්නෙ..?"

උනුලා බැරි තැන ශිෂා ඇසුවාය.

"පොඩ්ඩක් ඉන්නකො.."

මෝක්ෂා කීවේ නොසන්සුන්වය. ඈ සෙවූ දෑස - ඒ රුව - පාර එහා පැත්තේය. ලොකු ෆයිනස් ගස් පෙළ පාමුල බස් නැවතුමේ සස්මිත මහානාම දෑස් නොසෙල්වා බලා උන්නේය.

මේ පියකරු යුවතියන් දෙදෙනා ත්‍රීවිලරයෙන් බහිනවා සස්මිත බලාගෙනය. කලාතුරකින් ගෙදරින් එළියට යන්න ලැබෙන අවස්ථාවේ මුණ ගැහෙන්න කියා ආරාධනාව ලැබුණේ මෝක්ෂාගෙනි. සස්මිත පාර පැත්තේ අවුලක් ඔළුවේ තියාගෙනය. දෙන්නාම එක වගේය. එක විදිහමය. අත බලා මිස අක්කා නගෝ වෙන් කරගන්න බැරිය.

"සස්මිත.."

අඩි කීපයක් පෙරට ගිය මෝක්ෂා, සස්මිතගේ අතක් අල්වා ගත්තාය. සස්මිත බැලුවේ ඇගේ අත දෙසය. සුදු අතේ කළු පාට පිලිස්සුම් ලකුණු තිබේ. ඔහු දන්නා ශිෂා - නංගී මේ ය.

සස්මිත පාර මරුවී එනවා දුටු ශිෂාගේ ලෝකය පිච්චිණි. අක්කා මේ ගමනට සස්මිතව එකතු කරගෙනය. මේ ශිෂා කොහෙත්ම බලාපොරොත්තු වූ දෙයක් නොවේ. එහෙත් කලබල කරන්නට බැරිය. හිතේ තැවුල පෙන්වන්නට අවසර නැත.





"හ්ම්.."

ශිෂාට බැල්මක්වත් සස්මිතගෙන් නැත. මෝක්ෂාගේ අතින් අල්ලා ගත් ඔහු සාප්පුව ඇතුළට වැදිණි. පැටලෙන දෙපා ශිෂා ඒ දෙසට යොමු කළේ අසරණවය. වෙන කරන්න දෙයක් නැති නිසාය. මෝක්ෂා ජීවිතයේ මෙතෙක් නොලද සතුටක් වින්දාය. ඒ සතුටේ නියම අයිතිකාරිය උන්නේ ඈ පස්සෙන් බව හීනෙන්වත් ඇයට නොසිතිණි. ශිෂා - මේ ආදරය ලැබිය යුත්තේ ඇයටය. ගොළුවුණේ ද ඇයටමය. දුක වේදනාව හදවත ඇතුලේ සඟවාගෙන අසරණිය දිගටම ඉහිලුවාය. සස්මිත මහානාම නමට ඔහු තුළත් ආදරය කරන හිත උනුලා දරා උන්නාය. සස්මිත-ශිෂා නමට ආදරය කළ සස්මිත, මෝක්ෂාගේ අතගෙන සාප්පුවේ රෙදිපිළි අතර ඇවිද්දේය. ඇයට ඇඳුම් තේරුවේය. ඒ අත අල්ලාගෙන ළඟින්ම උන්නේය. ඉඳහිටක විහිලුවක් කර කණට ළං වී හිනැහුණේය. ඔහුගේ ලෝකය කෙලවරකවත් තමා පස්සේ ඉන්නා කෙල්ල ගැන. තමාගේ ආදරයේ නියම උරුමක්කාරිය ඇය ගැන හැඟීමක් නොවිණි.

ඇඳුම් පැළඳුම් බෑග් කීපයක්ම තෝරාගෙන ජෝඩුව ගොඩවූයේ අවන්හලටය. ශිෂා රතු, කහ මල්විසුල එකම ගවුමක් හා එයට ගැළපෙන රතු පටි සෙරෙප්පු ජෝඩුවක් තෝරාගෙන ඒ පස්සේම අවන්හලට ගොඩ විය.

"මොනාද බොන්නෙ..?"

සස්මිත, මෝක්ෂාගෙන් ඇසුවේය.

"මිහ දෙයක්.. ඇවිදලා මගෙ ඔළුවත් රිදෙනවා.."

මෝක්ෂා කීවාය.

"මං ටිකක් අත ගාන්නද..?"

මෝක්ෂා, සස්මිත දෙස බැලුවේ පුදුමයෙනි. අවට මේස [illegible] සෙනගය. ඒත් සස්මිතට ගානක් නැත. ඒ පිරිමි හිතේ වූ

ආදරය ඊට වැඩිය. ඔහු හෙමින් ආදරයෙන් මෝක්ෂාගේ හිසකේ නලල පිරිමැද්දාය. මෝක්ෂා ඒ වැගිරෙන ආදරයෙන් මත්ව ගියාය. ඇගේ දෑස් පියවිණ. මේ ස්පර්ශයෙන් දැනෙන ආදරය, අවංක ආදරය මොන තරම් වටිනවාද ඇ දැන උන්නාය.

"මගෙ උරිස්සෙන් ඔළුව තියාගෙන ඉන්න ටිකක්.. අඩුවෙයි වස්තුවේ.."

සස්මිත හෙමිහිට කීවේය. ඒත් ඒ වචන ඊට පස්සෙන් උන් කෙල්ලට ඇසිණි. ශික්ෂා පිච්චී ගියාය. ඔය තමා නොවේ, අක්කායි කෑගසා කියන්නට ඇගේ හිත කීවේය.

"සස්මිත.."

මෝක්ෂා කෙඳිරුවාය.

"පැටියෝ.."

The Reader's Place

සස්මිත කෙල්ලකට දිය හැකි උපරිම ආදරය ඇය වෙත දී තිබිණි. ඒ මහමෙරකට ආරක්ෂාවක්, රැකවරණයක් එක්කය.

"ඇයි.. මෙ.. මෙච්...චර මට.. ආ..දරේ..?"

මෝක්ෂා ඇසුවේ පැටලි පැටලීය. සස්මිතට පහදන්න නොතේරිණ. ඒත් ආත්මයේ මහා ගැඹුරක ඇ නමට ශික්ෂා නමට - තමා ඇ වෙතින් දුටු අහිංසක බවට දැඩි බැඳීමක් වූ බව ඔහු ඇඳුනුවාය:

"දන්නෑ වස්තුවේ.. ඒත්.. ගොඩක් ආදරෙයි මං.."

සස්මිත කීවේය. ඒ ඇත්තය. පපුව පුරා වූ ඇත්තමය.

"ශික්ෂා..?"

සස්මිතගේ ඒ වචනය මෝක්ෂාට සේම පිටුපසට වී තනිවී උන් යුවතියටත් ඇසිණි.





"දෙ..යි..යනේ.."

ශික්ෂාගේ ආත්මය හැඬුවාය. ඇ සෙමින් නෙතු හරවා බැලුවාය. සස්මිතගේ සවිමත් උරහිසට හිස හේත්තු කර ඉන්නා අක්කාව ඇයට පෙනුණේ බොඳවය.

"මෙහෙමම හිමිහට.. කම්බුලට කිස් එකක් දෙන්නද..?"

සස්මිත ඇසුවේ උහුලා දරාගන්න බැරිවය. ආදරය කරන මුළු හදවතින්ම ආශා කරන කෙල්ල, මේ තරම් පපුවට ලංවී ඉදියදී ඔහු හිතට උහුලාගන්න ටිකක් අමාරුය.

"අ..රයා.. ඉන්නවා.."

මෝක්ෂා 'අරයා' යි කීවේ නංගී ශික්ෂාටය. ඒ සස්මිතට පසුපස මේසයේ තනිව හිඳ ඉන්නා ශික්ෂාව හිසෙන් පෙන්නාය.

"අහෝදෙ.. එයාටත් තනියට කාව හරි හොයාගෙන එන්න තිබ්බෙ.."

සස්මිත කීවේය. ශික්ෂා වෙව්ලා ගියාය.

"එයාටත් ඉක්මණට හම්බවෙයි.. මේ වගේ එක්කෙනෙක්.."

මෝක්ෂා, සස්මිතගේ මුහුණ අත ගා කීවාය.

"එච්..! මට ඒ කොල්ල ගැන දුකයි.."

සස්මිත කීවේය.

"ඇයි..?"

ශික්ෂාට වගේම මෝක්ෂාටත් සස්මිත කියන්නට හදන දෙයක් නොතේරිණ.

"කෙල්ලෙක් තමන්ගෙ කොල්ල ළඟදි චූට්ටක් දඟකාර වුණාට කමක් නෑ.. ඇත්තටම ඒකට එයාට අයිතියක් තියෙනවා.. ඒත්

දකින දකින කොල්ල ළඟදි දඟකාර වෙන්න. විහිළු කරන්න ඇත්තටම කිව්වොත් කෝලම් කරන්න පුරුදු වෙච්ච කෙල්ලෙක්ව බඳින කොල්ලා අසරණ වෙනවා. ඒ වගේ කෙල්ලන්ව කසාද බැන්දා කියලවත් හඳාගන්න බෑ.."

සස්මිත විස්තර කළේය. ශික්ෂාගේ ලෝකය පිපිරිණ. ඔහු හරිය. ඒ වචනයක් වචනයක් ගානේ හරිය. එහෙත් තමා ඔහු කියන ඒ කෙල්ල නොවේ. ඔහු හිතා ඉන්නා කෙල්ලත් නොවේ.

'දෙයියනේ..! මේක මේ..ක.. මොන තරම් නම් රැවටීමක්ද..?' ශික්ෂාගේ හිත විළාප දුන්නාය.

"එයා ඔයා හිතන තරම් නරක කෙල්ලෙක් නෙවේ සස්මිත.."

මෝක්ෂාට උනත් සස්මිතගේ වචන බර වැඩිවිය. නංගි අහිංසකය. අවංකය. ඔක්කොම කළේ තමාය. ඇරත් මේ විඳින්නේ නංගීට අයිති ආදරයයි. මේ සියල්ල හිත ඇතුළේ හංගා හිඳි මෝක්ෂාට සස්මිත, නංගීව මේ තරම් පිළිකුල් කරන එක දරන්න අමාරුය.

"අපි වෙන දෙයක් ගැන කතා කරමු.. අපි අපි ගැන කතා කරමු.."

සස්මිතටත් මේ කතාව මග හරින්න උවමනා කර තිබිණි. මෙවාගේ අවස්ථාවක් එන්නේ කලාතුරකිනි. ඉතිං ඒ වෙලාවේ ආදරය ගැනම කතා කරන්නට ඇගේ සුවඳ දැනෙන සීමාවේ ඉඳිමින් ජීවිතය විඳින්නට සස්මිත ආශා කළේය.

"කවදා හරි මේ ඔක්කොම දේවල් ඔයාලගෙ ගෙදරින් දැනගත්ත දවසට ගොඩක් ප්‍රශ්න ඇතිවෙයි.. එදාටත් ඔයා මාත් එක්ක මෙහෙම ඉන්නවද කෙල්ලෙ..?"

ඊළඟට සස්මිත ඇහුවේය. ඇය ලස්සනය. හුරුබුහුටිය. හොඳය. ඔක්කෝටම වඩා තමන්ගේ හාම්පුතාගේ දුවය. විසි කරන්න සල්ලි තියෙන සවුලක කෙල්ලෙක් තමාට ලැබෙයි හිතන්න අමාරුය.



The Reader's Place



"අ..ඩ.."

මෝක්ෂා කීවාය.

"ඒවිතේම..?"

සස්මිත ඇසුවේය.

"ඇ..ම.."

මෝක්ෂා කෙඳිරිලි හඬින් කීවාය. ඇත්තටම ඈ සස්මිතට ආලය. ඒත් මෝක්ෂා, සස්මිතටත් වඩා ලෝබ කළ, ආසා කළ දෙයක් - ඉලක්කයක් ඇයට තිබිණ. උපතින් ගෙනා මේ රුවින් සමාජයේ ප්‍රසිද්ධියට පත්වෙන්නට ඈ ආසා කළාය. නිරූපිකාවක් හෝ නිළියක් වන්නට හීන දැක්කාය. සස්මිත තවමත් මේ බවක් දන්නේ නැත.

"සස්මිත.. බැරි වෙලාවත් මං ජොබ් එකකට ගියොත් ඔයා කැමතිද..?"

හීන කළ පැහෝනා විදුරුව ළං කර ගනිමින් මෝක්ෂා ඇසුවාය.

"ජොබ් කරන්න..? ඔයා..? වරුසප්පෙරුම එස්ටේට් එකේ අනාගත උරුමක්කාරියො දෙන්නගෙන් එක්කෙනෙක්වත් ජොබ් කරන්න යවන්නෑ.. ඒක මට විශ්වාසයි.."

සස්මිත කීවේය.

"නිකමට හිතන්නකො.. මට ගෙදරින් පර්මිෂන් ලැබුණා කියලා.. ඔයා මොකද කියන්නෙ..?"

මෝක්ෂාට, සස්මිතගේ අදහස දැනගන්නම ඕනෑකර තිබිණි.

"මොන වගේ රස්සාවකටද..?"

සස්මිත වචනය එළියට දාන්න ඉස්සර නොවිණ.

"බැරි වෙලාවත් මට මොඩල් කෙනෙක් හරි ඇක්ට්‍රස් කෙනෙක් හරි වෙන්න ලැබුණොත්..?"

මෝෂා කීවේ ගෙල ඇල කරගෙනය. හුරතල්ම හුරතල් ඉරියව්වක් මවාගෙනය. ඒත් සස්මිතගේ මුහුණ අඳුරු විය.

"ඔයාට මාවද රස්සාවද කියලා දෙකින් එකක් තෝරගන්න වෙයි.."

සස්මිත සෘජුව කීවේය. ඔහු එහෙම පිරිමියෙකි. ඒ පිරිමිකමට ආශා කළේ - ආදරය කළේ - ගරු කළේ මෝෂා නොවේ. මේ සියල්ල නිහඬව අසා උන් යුවතිය ගිෂාය.

"ඇයි ඒ..?"

මෝෂාට, සස්මිතගේ හිත තේරුම් ගන්න අමාරුය.

"මගෙ ගෑනිගෙ ලස්සන දකින්න ඕන, විඳින්න ඕන මං විතරයි ගිෂා.. ආදරේ කරන කෙල්ල දිහා බල බලා අනික් පිරිමි තලු මරනවා, හීන දකිනවා, හිතෙනුත් ඇඳුර ගොඩ කරගන්නවා දකින්න පුළුවන් පිරිමියෙක් ඉන්නවද මං දන්නෑ.. ඒත් මං ඒ පිරිමියා නෙමේ.. ආදරේදි විවාහයෙදි මගෙ ගෑනි මට විතරයි.. මං ඒ අතින් ටිකක් තණ්හාවද මන්දා.. ඒත් ආදරේදි තන්හාව තියෙන්නෙ ඕන.. නැත්නම් පොදු වස්තුවක් වෙනවනෙ.."

ගිෂාට මේ කතා නෑසෙන දුරකට පියාඹන්නට ඕනෑ කළාය. 'මේ ආදරය - මේ දෑස ඉදිරිපිට පෙනෙන ආදරය - තමා මුළු හිතෙන්ම සෙවූ ආදරය නොවේද..? තමාට පිටුපා අක්කාට ළංව ඉඳ ඉන්නා පිරිමියා ළඟින් විහිදෙන මේ ආදරය ආත්ම ගණනක් සංසාරය පුරා තමා සොයා ආ බව හිතට දැනෙන්නේ ඇයි..? මේ සුන්දර මිනිසා, මේ තරම් සොඳුරු ආදරයක් ගෙන ජීවිතයට ළංවී ඒ ආදරය පෙන්න පෙන්නා තමාගෙන් ඈත් කළේ ඇයි..? දෛවය මොන තම් පුදුමාකාරද..?' ගිෂා වේදනාවෙන් සිතුවාය.

මෝෂාට, සස්මිතව නොතේරිණ. මේ තරම් ගැඹුරු ආදරයක් ඇයට කොහෙත්ම ඕනෑ නොවිණ. සස්මිතගේ කඩවසම් පෙනුමට - නිර්භය පිරිමිකමට මෝෂා ලොබ වූවාය. ඒත් ඒ ලොබකම ඔහුගේ හිත ගැන - ඔහුගේ හැඟීම් ගැන ඇගේ හිතේ ඇතිවූයේ





සැබෑ හද පත්ලේ ගැඹුරින් - මුළු ආත්මයෙන් විහිදෙන ආදරයක් ඇය කොහොමටවත් බලාපොරොත්තු නොවිණ.

"අපි යං.."

මෝෂා කලබල වූවාය. සස්මිතගේ සෙවණේ, ඒ සුවඳ දැනෙනා මායිමේ ඇ අපූරු සුන්දර සිහිනයක් අත් වින්දාය. දැන් ඒ සිහිනයෙන් ඇ ඇහැරී තිබේ. මෝෂාට දැන් උවමනා මේ සිහිනයෙන් පලා යන්නය.

"ඇයි..? ආශය කවදා මෙහෙම ළඟින් ඉන්න වෙයිද..? තව ටිකක් ඉඳල යං.."

සස්මිත මේ තරම් සොඳුරු වූ අවස්ථාව මඟ හැර යන්නට අකමැති වූයේය.

"පරක්කු උනොත් ශාන්ති සැක හිතයි.."

මෝෂා ඉක්මන් විය. සස්මිත කෙල්ලන් දෙදෙනා ත්‍රීවීලරයට ගොඩවනතුරුත් ළඟ සිටියේය.

"හෙට හවස පාටියෙදි හම්බවෙමු.."

මෝෂා කීවාය. සස්මිත හැරී නිහඬවම ත්‍රීවීලරයට ගොඩවන ගිෂාගේ මුහුණ බැලුවේය. මොහොතකට ඔහු ළඟින් ත්‍රීවීලරයට ගොඩවෙද්දී තමාට අර අපූරු ආදරයක් ගැන අහන්නට ලැබුණ ඒ තරුණියා දෙස ගිෂාත් දෙනෙත් විදා බැලුවාය. එක මොහොතකට - එකම එක මොහොතකට ගිෂාගේත්-සස්මිතගේත් දෙනෙත් එකට යාවිණි. ඒ තත්පරය.. බොහෝ හැඟුම්බර විය. ගිෂාගේ කඳුළු පිරුණු ඇස් සස්මිතගේ හිත පෑරුවේය. ආත්මයම කලබල කළේය. ඇ තමට - මුලින් තමාවම රවටා, තමාව විහිළුවට ලක් කළායි වෛර කරන, පිළිකුල් කරන ඇ තමට මහා තිගැස්සීමක්, කැළඹීමක් සස්මිතට දැනිණ.

'ඇයි... ඒ ඇස්වල කඳුළු..?' සස්මිතට නොතේරිණ. 'සමහර විට එයා දැන් කරපු වරද ගැන පසුතැවෙනවා ඇති.. ලැජ්ජත්

ඇති.. ඒක වෙන්නැති ඇස්වල කඳුළු.. හැබැයි ඉතින් ඒ ඇස්වල කඳුළු තියෙනවා දැක්කම මටත් මොකක්ද වෙලා ගියා..' යුවතියන් දෙදෙනාත් එක්ක දුර ඇදී යන ත්‍රීවීලරය දෙස බලා සස්මිත සිතුවේය.

* * * * * * * * *

ශික්ෂා හැදුණේ පොතපතත් එක්කය. මෝක්ෂා ටෙලි නාට්‍ය, චිත්‍රපට ලෝකය කරගනිද්දී ශික්ෂා පොත පත තමන්ගේ මුළු ලෝකයම කර ගත්තාය. ආදරය ගැන ඈ දැන උන්නේ ඒ පොතපතිනි. ඒත් ශික්ෂාගේ ආත්මයේ ගැඹුරට තැන්පත්ව තිබූ පිරිමි රුවක් තිබිණි. පැහැදිලි මුහුණක්, ඡායාවක් නොවූ ඒ පිරිමි ආත්මයට උරුම ගතිගුණ තිබිණ. අදහස් තිබිණි. ශික්ෂා ආදරය වෙනුවෙන් සෙව්වේ ඒ වාගේ ගතිගුණ අදහස් ඇති පිරිමි ආත්මයකි.

අද.. ඇගේ හිතේ නිදන්ගතව ඇති ඒ පිරිමි ගතිවලට ගැළපෙන ගතිගුණ ඇයට අහන්නට දකින්නට ලැබී තිබේ. ඒ සස්මිත ළඟය. අද ඇගේ ආත්මයේ සැඟව උන් පිරිමි රුවට ගැළපෙන මුහුණක් - රූපයක් ඇයට ලැබී තිබේ. ඒ සස්මිතගේ මුහුණය. ඔහුගේ කඩවසම් රූපයය. ඒත්.. දැන් අක්කාට හිමිව ඇති සස්මිත ගැන සිතීම යනු මිරිඟුවක්ම නොවේද..? 'ජීවිතේ හරිම පුදුමාකාරයි.. ඇයි මෙහෙ උනේ..? ඇයි මං හිතින් මේ තරම් සස්මිතට ළංවුණේ..?' ශික්ෂා පාට පාට විදුලි බුබුළු සොඳුරු කළ ගෙළයන දෙස බලා හිතුවාය. උපන්දින සාදය ඇරඹී තිබේ. අවුරුද්දකට වරක් පැවැත්වෙන මේ සාදයේදී අක්කා තරමට තමාත් සතුටු වූවා ශික්ෂාට මතකය. 'ඒත් අද සතුට මගෙන් ගොඩක් දුරයි..' ශික්ෂා උඩු මහලින් පහළට බසින අතරේ සිතුවාය. සාලය පුරා විසිර සිටි සෙනග අතරේ ඈ එක් රුවක් සෙව්වාය. ඇගේ සිත සෙවූ ඒ රුව ඈ කෙළින්ම අඩි කීපයක් දුරින් තමා දෙසම බලා ඉන්නා බව ශික්ෂා කොහෙත්ම නොදුටුවාය.

මෙපමණ වේලාවක් මෝක්ෂා ළඟ ඇස් තියන් උන් සස්මිත, ශික්ෂාව දකින්නේ දැන්ය. ඇත්තටම වාම් ගවුමක් හැඳ උන් සුදු කෙල්ල ඔහුගේ හිත සසල කළාය.





'ඇත්තටම ලස්සනයි.. මෙයත් ශික්ෂා වගේ තැන්පත්, අහිංසක කෙල්ලෙක් උනා නම් වටිනාකම කියල වැඩක් නෑ..' සස්මිත සිතුවේය.

'හැපි බර්ත්ඩේ ටූ යූ.."

මොහොතකට පෙර තමාගේ කෙල්ලට සුබ පැතුවා සේ ඇගේ සොයුරියටත් සුබ පතන්නට තරම් සස්මිත නිහතමානීව සිටියි. හදිසියේම දැස ඉදිරිපිට පෙනී සිට සුබ පතන පිරිමියා ශික්ෂාගේ පපුවට බරක් දුන්නේය. නෙතට කඳුළු පිරෙව්වේය.

'හැ..න්..ක්..ස්.."

ශික්ෂා කඳුළු ඇස් හංගන්නට වෙහෙසුණේ නැත.

'හැම වෙලාවෙම ඇස්වල කඳුළු පුරෝගත්ත ගමන්.. ඇත්තටම මෙයාව තේරෙන්නෙ නෑ..' සස්මිත අවුලකට පත්ව උන්නේය.

"සස්මිත.."

රාජිත වරුසප්පෙරුම කොහේදෝ සිට සස්මිත ළඟට ආවේ ඒ වෙලාවේය.

"ඔව්.."

සස්මිත, රාජිත දෙස බැලුවේ ගෞරවය පිරුණු ඇසකිනි. රාජිතගේ අතේ එල්ලී උන් මෝක්ෂා යටැසින් සස්මිත දෙස බලා ඉඟි කළාය.

"සස්මිත දන්නවනෙ මගෙ රෝස මල් දෙක..?"

රාජිත ආඩම්බරයෙන් කීවේ නිවුන් දරුවන් දෙස මාරුවෙන් මාරුවට බලමිනි. සස්මිත හිනැහුණා විතරය.

"දැන් ලොකු කෙල්ලො දෙන්නෙක්.. පොඩි කාලෙ මටවත් මේ දෙන්නව වෙන් කරල අඳුරගන්න බෑ.. ඒත් එක්කෙනෙක් අත



The Reader's Place

පුච්චගත්තු දවසේ ඉඳන් තමා මං අක්කයි, නංගියි වෙන් කරලා අඳුරගන්නෙ.."

රාජිත කීවේය. තමාත් එහෙම නොවේදැයි සස්මිතට හිතිණි.

"සස්මිත දන්නවද මේ දෙන්නාව වෙන් කරලා අඳුනගන්න..? ඔට්ටුයි බැරුවට.."

ලොකු සතුටකින් උන් රාජිත, සස්මිතට කීවේය

"බලමු පුළුවන්ද කියලා.. මේක ඔට්ටුවක්.. සස්මිත හරියටම අක්කවයි, නංගිවයි වෙන් කරලා දුන්නොත් මං ලබන මාසෙ සස්මිතගෙ පඩිය රුපියල් දෙදහකින් වැඩි කරනවා.. ප්‍රොමිස්.."

රාජිත කීවේය. සෙනග අතර සිටි රෝෂණීත්, රාජිත අසළට ආවේ ඒ මොහොතේය.

"අනේ එහෙම ඕන්නෑ සර්.. ඔට්ටුවක් වගේ නෙමෙ.. නිකං සෙල්ලමට වගේ මං ඕන්නං මට හිතන විදිහ කියන්නං.."

තමාට පුතෙකු සේ සලකන රාජිත වරුසප්පෙරුම මහතාව සතුටු කරන්නට සස්මිත කීවේය.

"හරි.. හරි.. කියමු බලන්න.."

රාජිත සිනාවී කීවේය.

"ම්.."

ජීවිතේ පළමුවරට දකින දෙන්නෙකු දෙස බලන්නා සේ සස්මිත නිවුන් සොයුරියන් දෙස මාරුවෙන් මාරුවට බැලුවේය. මෝක්ෂා සම්පූර්ණයෙන්ම ගිනිගෙන දැවෙමින් උන්නාය. සියල්ල නෙත ඉදිරිපිටම එළිවෙන්නට යයි. මෙතුවක් හංගා ඇති සියල්ල දැන් එළිවෙන්නට යයි. මෝක්ෂාගේ ඇඟපත පවා වෙව්ලීය. මෝක්ෂා තරමට නොවුණත් ශික්ෂාත් උන්නේ තරමක කැළඹීමකිනි. කිසිවක් කිසිදා රහසක් වන්නේ නැත. සියල්ල හෙළිවීමට යයි.





ඇත්ත දැනගත් පසු සස්මිත මොන තීරණයක් ගනීවිද..? අක්කාටවත් නංගීටවත් ඒ ගැන හිතන්නට පවා බැරිවිය.

"ම්.. මේ ඉන්නෙ අක්කා වෙන්න ඕන.. ඒ කියන්නෙ මෝක්ෂා.."

තමා දන්නා පරිදි ශික්ෂා දෙසට ඇඟිල්ල දිගු කර සස්මිත කීවේය. හිතේ තැළඹීම නිසා ශික්ෂා ගැස්සිණ.

"මෙයා තමා නංගී.. මං හිතන විදිහට ශික්ෂා.."

රාජිතගේ අතේ එල්ලී උන් මෝක්ෂා දෙස බලා සස්මිත කීවේය. වරුසප්පෙරුම යුවළට සිනා ගියේ එකවිටමය.

"ඉලන්දාරියා.. ඔන්න ඉතිං වරද්දා ගත්තා.."

රාජිත, සස්මිතගේ උරහිසට අතකුත් තියා කීවේය.

"ඇයි සර්..?"

සස්මිත හිතා උන්නේ ඇත්ත තමා හරියටම දන්නවා කියාය.

"මෙයා අක්කා මෝක්ෂා.. මෙයා නංගී ශික්ෂා.."

සොයුරියන් දෙන්නාව නිවැරදිව පෙන්නා රාජිත කීවේය.

"ඒක වෙන්න බැනෙ සර්.."

සස්මිත පුදුමව කීවේය.

"ඇයි වෙන්න බැරි..?"

"අනේ පිච්චුණ කැළළ තියෙන්නෙ මෙයාගෙ.."

සස්මිත, මෝක්ෂා දෙසට ඇඟිල්ල දිගු කළේය.

"ඉතිං හරිනෙ.. එයා තමා මගෙ ලොකු දුව.. මෝක්ෂා.."

රාජිත කීවේය. සස්මිත අදහාගන්න  බැරිව උන්නේය. තමාගේම ආත්මය තුළ අතරමව උන්නේය.



The Reader's Place

"සස්මිත.. මගෙ දරුවො දෙන්නගෙන් ලොකු එක්කෙනා නමා පුංචි කාලෙ අත පුච්ච ගත්තෙ.. ඒ හින්දා අතේ කැළල තියෙන්නෙ එයාගෙ.. එයා නමා පුංචි කාලෙ ඉඳලම දඟමල්ල මුරණ්ඩු කෙල්ල.. හිතුවක්කාර කෙල්ල.. මෝක්ෂා.. මේ ඉන්නෙ එයා.. බලන්න බොරුද කියලා.. මේ තියෙන්නෙ දකුණු අතේ පිච්චුණ පාර.."

රාජිත, මෝක්ෂා පෙන්වා කීවේය.

"මගෙ චූටි කෙල්ල පොඩි කාලෙ ඉඳලම නිශ්ශබ්දයි.. ලෝකෙ පෙරළිගෙන එනව කිව්වත් කොහේ හරි මුල්ලකට වෙලා ගුලි ගැහිල ඉදී.. මේ ඉන්නෙ ඒ අහිංසක කෙල්ල ශික්ෂා.."

රාජිත අතින් ඇද ශික්ෂාව තුරුළට ගෙන කීවේය. සස්මිතගේ ලෝකය පිපිරිණ. ආත්මයම පුංචි පුංචි කෑලි කෑලිවලට කැඩී බිඳී වෙන්වී විසිර යනවා සස්මිතට තේරුණි. නමා ඡවට් තිබේ. නැවත නමාව රවටා තිබේ. නැවත වරක් රවටා තිබේ. නැවත වරක් ඉතාම නින්දිත ලෙස රවටා තිබේ. සස්මිත ඇහිපිල්ලමක් වත් නොගසා ගල්වී උන්නේය.

"මචං.. රාජිත.."

විශ්ව නාදන් මහතා සෙනග අතර සිට රාජිතට අත වනා කතා කළේය. රාජිත ඒ දෙසට ගියේ රෝෂණීත් එක්කය. සස්මිත අක්කාත්, නංගීත් අතර විනාඩියකට තනිවිය.

"ස..ස්..මි..ත.."

ගල්ගැසී නිසොල්මන්ව ඉන්නා සස්මිතගේ අත මෘදුව අල්ලා ගෙන මෝක්ෂා කීවේ පැටලිලි හඬකිනි.

"ච්ත්..!"

සස්මිත වහා මෝක්ෂාගේ අත ගසා දැමුවේ පිළිකුලෙනි.





"මාව අල්ලන්න එපා.. මට තමුසෙ වගේ ගෑනු පිළිකුල්.."

සස්මිත කීවේය.

"අනේ සස්මිත.."

මෝක්ෂාගේ ඇස්වල කඳුළුය.

"මට සමාවෙන්න සස්මිත.."

ඈ බැගෑපත්ව කීවාය.

"සමාවෙන්න.. සමාවෙන්න.. ඒ වචනෙටවත් තමුසෙ සුදුසු නෑ මෝක්ෂා.. ආයෙම පාරක් මාව ඡවට්ටුවා නේද..? මේ පාර මගෙ ජීවිතේට අපායක් කළා නේද..? හිතන්ඩ එපා මං කවදාවත් තමුන්ට සමාව දෙයි කියලා.. ආයෙ ජීවිතේ කවදාවත් වැරදීමකින්වත් මගෙ ඇස් ඉස්සරහට එන්ඩ එපා.. තේරුණාද..? අපි අතර තිබිච්ච සම්බන්ධය දෙවල් අදින්.. මේ මොහොතෙන් ඉවරයි.."

සස්මිත, මෝක්ෂාට කියා ගෙයින් පිටව ගියේ කෝපයෙනි.

"ස..ස්..මි..ත"

නමා මේ තරමට සස්මිතට ළංව උන් බව මෝක්ෂාට තේරුණේ දැන්ය. ඇස්වලින් ගලන කඳුළු පිස දමමින් මෝක්ෂා නංගීට දිව්වාය. ශික්ෂා උන් තැනම නොසෙල්වී උන්නාය. ඇගේ දෑස තෙතලව තිබිණි. ගල්වී තිබිණි. අක්කාගේ ඇස්වල කඳුළු තියෙනවා ඈ දකින්නේ ජීවිතේ පළමු පාරටය. අක්කා ගැන අනුකම්පාවක් හිත්වට ශික්ෂාගේ සිත දැවටිණ. ඒත් ඊට වඩා දහස් ගුණයක් වැඩියෙන් සස්මිත ගැන දුකක්, වේදනාවක් ශික්ෂාගේ හදවතට දැනෙමින් තිබිණ.

* * * * * * * * *



The Reader's Place

## 05



කහ පාට ලොකු ඩේලියා මල් පොකුරක් වටා සුදු සමනල් ජෝඩුවක් නට නටා යනවා සස්මිත බලාගෙනය. කාමරයේ ජනේලයෙන් පිටත බලා උන් සස්මිතට ඇසට වැටෙන මේ ලස්සන කිසිවක් හිතට නොවැටිණ. හිත තිබුණේ තුවාලයක්වය. මතකය සැරව ගුලියක්ව ඒ තුවාල හිතේ පැසව පැසවා තිබිණි.

The Reader's Place

"සස්මිත මහත්තයා.."

වෙනදාට උදෙන්ම කාර්යාලයට යන්නට ලක ලැහැස්ති වෙන සස්මිත අද තවමත් කාමරයේය. චන්දන කාමරයට එබුණේ අසනීපයක්වත්දැයි බලන්නය.

"අද ඔෆිස් යන්නෑ..?"

චන්දන ඇසුවේය.

"න්...නෑ චන්දන.. අද මගෙ ඇඟට හරි නෑ.."

සස්මිත කීවේ මලානික හඬිනි. ඇඟට නොව හරි නැත්තේ හිතටය. ගීෂා යැයි හිතා මහ හුගාක් මෝක්ෂාට ආදරය කළ හිතටමය.





"ඔෆිස් එකට කෝල් එකක් දෙන්න එහෙනං.. මං මාකට් එක පැත්තෙ ගිහින් එන්නං.."

චාලුව ගිය ගිහින් සස්මිත නැවතත් කඳුකරය දෙස බලා උන්නේය. දැන් ඉතින් තවත් මේ රස්සාව කරන්න හිත හදාගන්න බැරි තරමට සස්මිතගේ හිත බිඳී ඉවරය. අහම්බෙන් මෙන් ඔහුගේ සිතට ගීෂා මතකයට ආවේය. 'එයා තමා අහිංසක එක්කෙනා.. මේ අහස.. මේ මහපොළව වගේ එක්කෙනා.. මං එයා කියල හිතාගෙන එයාගෙ අක්කට ආදරේ කරන බව එයා දැනගෙන උන්නා.. ඒත් එයා නිහඬවෙලා උන්නා. දරාගෙන උන්නා.. ඒ තරම් ඉවසීමක් එයාට තිබ්බෙ කොහොමද..?' සස්මිත පුදුමයෙන් සිතුවේය.

'මං එයාට දොස් කියද්දි.. එයාව පිළිකුල් කරද්දි.. කිසි වරදක් නොකළ එයාට කොහොම හිතෙන්න ඇත්ද..? නිහඬ වෙලා හිටියා ගිහින් එයා ගොඩක් දුක් විඳින්නැති.. ඒකයි ටවුමෙදි ත්‍රීවීල් එකට නගින වෙලාවෙ එයාගෙ ඇස්වල කඳුළු තිබ්බෙ.. ඒත් ඒ වෙලාවෙවත් මේ කිසි දෙයක් මං දැනගෙන උන්නෙ නෑ.. මගෙ හිත ප්‍රාර්ථනා කරපු කෙල්ල එයා.. ඒත් ඒ ආදරේ මට උරුම නෑ.. ඒකයි ආයෙමත් මං මෝක්ෂාට රැවටුණේ..' සස්මිතගේ හිත වේදනාවෙන් පුපුරා ගසනු දැනිණි.. නුවරට එද්දි ආදරය කරන බලාපොරොත්තු හිත නොවිණි. ඒත් ජීවිතය ගැන බලාපොරොත්තු රැසක් හිතේ තිබිණ. ආදරය - අලුත් බලාපොරොත්තුවක් වී සිතට එකතු වුණේ මේ නුවරදීය. දැන් ඒ බලාපොරොත්තු සියල්ල බිඳ වැටී තිබේ. ඉතිරි වී ඇත්තේ හිස් අතින් ආපහු ගමට යාම පමණි. නොදැනීම සස්මිතගේ මුවින් සුසුමක් ගිලිහිණ.

* * * * * * * * *

ජීවිතය ඉරිතලා යන යමක් සිදුව තිබේ. මේ සිදුවූ දෙයින් මෝක්ෂා තරමක් තිගැස්සුණ බව සැබෑව. එහෙත් ඊටත් වඩා සසල වූයේ ගීෂාය. ඇයට සස්මිත ගැන දුකය. 'පව්.. එයා දෙවෙනි පාරටත් රැවටුණා කියල තේරුණාම.. ඇත්ත මොකක්ද කියල දැන

ගත්තම ඒ ඇස්වල මං ලොකු අසරණකමක් දැක්කා..' ශික්ෂා මේ හැඟීම සියල්ල යටි හිතේ තෙරපාගෙන මෝක්ෂා ළඟට කිට්ටු විය. මෝක්ෂා විලාසිතා සඟරාවක් පෙරළාගෙන ඇඳේය.

"අක්කි.."

ශික්ෂා හෙමිහිට කතා කළාය.

"ම්.."

මෝක්ෂා සඟරාවෙන් එළියට ඇස් මුදාගත්තේ නැත.

"ඇයි ඔයා සස්මිත හම්බවෙලා සමාව ඉල්ලන්නෙ නැත්තෙ..?"

හිතට වද දෙන ප්‍රශ්නය ශික්ෂා ඇසුවාය. අක්කා ගැන නොවේ. ඇයට දුක අර අහිංසකයා ගැනය. තමා යැයි හිතා අක්කාට අපමණ ආදරය කෙරූ කොල්ලා ගැනය. මෝක්ෂා, නංගි දෙස බැලුවාය.

"වැඩක් නෑ නංගෙෝ.. මං සස්මිත ගැන හොඳට දන්නවා. ඒකා පිරිමිකම ඇඟේ හැම ලේ බිංදුවකම තියාගෙන ඉන්න එකෙක්. මට පණ වගේ උන්නෙ.. දැන් හිතන් ඉන්නෙ මං එයාව රැවැට්ටුවා කියල.. ඔය වගේ පිරිමියෙක් මට කවදාවත් සමාව දෙන්නෑ නංගි. බැරිවීමකින්වත් සමාව දුන්නත් ආයෙ ආදරේ දෙන්නෑ.. ඉතිං හොඳම දේ තමා මං පැත්තකට වෙලා ඉන්න එක.."

ශික්ෂාට පුදුමය. අක්කා ගැන පුදුමය. මේ තරම් සැහැල්ලුවෙන් සස්මිතත් ඔහුගේ ආදරයත් ඉවත හෙලන්නට අක්කාට පුළුවන් වුණේ කොහොමද..? ඒ කියන්නෙ සුවඳ දැනෙන තරමට ඒ පිරිමි ආත්මයට ළංව උන්නත් අක්කා කවදාවත් ඔහුට ආදරය කර නෑ කියනා එක නොවේද..?

"ඔයාට සස්මිත පව් කියලා හිතෙන්නෙ නැද්ද අක්කි..?"

ශික්ෂා උහුලන්නට බැරි තැන ඇසුවාය.

"හ්ම්.. දැන් නම් පව් කියලත් හිතෙනවා.. ඇත්තටම පොඩි





[illegible] කරලා සතුටුවෙන්න මිසක් සස්මිත එක්ක ඔය තරම් [illegible] මං කවදාවත් හිතා උන්නෙ නෑ නංගි.. මක් කරන්නද..? මං එයාට ළංවුණා විතරයි එයා මාව එයාගෙ මුළු ලෝකෙම කර ගත්තා.. ඒක මගෙ වරදක් නෙමේ.."

මෝක්ෂා කීවාය. අක්කා ඔහොමය. කිසි දෙයක් අනුන්ගේ පැත්තෙන් හිතා තේරුම් ගන්නේ නැත. පොඩි කාලේ සිට හිතුවේත්, කළු කළේත් තමන්ගේ පැත්තෙන් හිතා විතරය.

"එහෙනම් මොනාද අක්කි දැන් කරන්න හිතා ඉන්නෙ..?"

මේ සිදුවීම් මාලාවේ අවසානය ගැන වද වූ ශික්ෂා, මෝක්ෂා ගෙන් ඇසුවාය.

"අද උදේ මට මාරියෝ කතා කළා.. මගෙ වැඩේ හරිලු.."

"ඒ මොකක්ද..?"

"මාව අර ෆොටෝ ෂූට් එකට සිලෙක්ට් කරගත්තු එක.. අනිද්දා ඉඳලා ඒකෙ වැඩ.."

"අක්කි.."

ශික්ෂා අදහාගන්න බැරිව උන්නාය.

"එහෙනම් අක්කි ඔයා යනවද කොළඹ..?"

"ඔව්.. හෙට මට යන්න වෙනවා.."

"අක්කි.. ඔයා මේක ගෙදරට කියන්නැද්ද..? තාත්තිට.. අම්මිට.. කවුරුත් කවදාවත් ඔය වගේ දේකට කැමති වෙන්නෙ නෑ.."

ශික්ෂා කීවේ කලබලයෙනි. අක්කාගේ මුරණ්ඩුකමේ සීමාවක් නැත. ඒ හිතුවක්කාරකම්වලින් දුක් විඳින්නේ ඈ නොවේ. ඇය නිසා උන් අනෙක් අයය. අම්මා, තාත්තා හා සහෝදරිය වූ තමාය.



The Reader's Place

"ඊට මං තාත්තිට කියන්න ඉන්නෙ.. ඒ උනාට මං දන්නවා තාත්ති කවදාවත් මට මේ ගමන යන්න ඉඩක් දෙන්නෑ.."

මෝක්ෂා කීවාය.

"එහෙනං ඔයා මොනාද කරන්න හිතා ඉන්නෙ..?"

ශික්ෂා ඇසුවාය.

"කවුරු විරුද්ධ උනත් මං මේ ගමන යනවා නංගෝ.. මගෙ ජීවිතේ මං හදාගන්න ඕන.. මේ ගේ ඇතුළට හිරවෙලා ඉදලා මං බලාපොරොත්තු වෙන කිසි දෙයක් කරගන්න ලැබෙන්නෙ නෑ.."

අක්කා තනි තීරණයක උන්නාය. ඒ බව ශික්ෂාට තේරිණ. ඒ තීරණය වෙනස් කරන්න උත්සාහ කිරීම පලක් නැති බවත් ඇ දැන උන්නාය. ඒ රාත්‍රිය එළඹෙනතුරු ශික්ෂා උන්නේ හදවතින් ගැහෙමිනි. තවමත් දුක් විඳින විදවන හිතට තවත් ගින්දරක් එකතු නොවේවායි ඇ පැතුවාය.

රාත්‍රී කෑම මේසයේදී මුළු පවුලම එක්ක එකතුවී කෑම ගන්න රාජිත කැමතිය. රාජිතගේ ආසාව දැන උන් රෝෂණී දියණියන් දෙදෙනාවත් රාත්‍රී කෑම මේසයට අනිවාර්යයෙන්ම වාඩි කරවීමට වග බලා ගත්තාය.

"අම්මී හැමදාම හදන්නෙ තාත්ති ආසා කරන කෑම විතරයි.. අම්මි වැඩිපුරම ආදරේ තාත්තිට.."

මෝක්ෂා කෑම මේසයට වාඩිවූයේ නෝක්කාඩුවක් කියාගෙනය. සුදු ආප්ප, පැණි ආප්ප, ලුණු සම්බෝලය හා මිරිස් හොද්ද තාත්තා කැමති කෑමය.

"ඔව් ඉතිං.. මට ඉස්සෙල්ලම හම්බවුණේ ඔයාලගෙ තාත්තිනෙ.. අනික ඔයාලා දෙන්නව මට දුන්නෙත් ඔයාලගෙ තාත්තිනෙ.."

රෝෂණී හද උතුරා යන සතුටින් කීවාය. ශික්ෂා හිස ඔසවා තාත්තා දෙස බැලුවාය. තාත්තාගේ මුහුණේ වූයේ ද සතුට උතුරා



The Reader's Place



ගත බැල්මෙනි. මේ ගෙදර මේ තියෙන සතුටින් සෑහී එය රැක ගන්නට අක්කා තුළ උනන්දුවක් නොවීම ශික්ෂාගේ හිතට වේදනාවකි.

"තාත්ති.."

මෝක්ෂා කටහඬ අවදි කළේ පැය කාලයකට විතර පස්සේය. රාජිත ඇස් ඔසවා බැලුවා ඇත්තය. එහෙත් වචනයක්වත් කතා කළේ නැත.

"මට තාත්තිට කියන්න වැදගත් කාරණයක් තියෙනවා.."

මෝක්ෂා බිංදුවෙන් බිංදුව හිතට ධෛර්යය එකතු කරමින් උන්නාය. රාජිත කෙලින් බලා උන්නා මිස කතා කළේ නැත.

"මාව පේපර් ඇඩ් වාගේකට තෝරගෙන තාත්ති.. ෆොටෝ ෂූට් එක තියෙන්නෙ කොළඹ.."

මෝක්ෂා කීවාය. රාජිත ගැස්සිණ. රාජිතටත් වඩා ගැස්සුණේ රෝෂණීය.

"අනීතාරූ දරුවා.. තාත්තා එපා කියන දේමයි කරන්න හදන්නේ"

රෝෂණී කම්පාවෙන් සිතුවාය.

"කවුද දැන් ඔයාගෙ ඩීටේල්ස් එහෙට යැව්වෙ..? ෆොටෝස් එහෙමත් යවන්න ඇතිනෙ..?"

රාජිත රළු හඬින් ඇසුවේ කෑම ගැනීමත් නවතාය.

"තාත්ති.. මේ.. මේ.."

මෝක්ෂාගේ දහිරිය බිඳිණ. කතා කරගත නොහැකි විය.

"මෝක්ෂා මගෙ යකා අවුස්සන්නැතුව කියනවද කවුද ඔයාගෙ ඔය ඒ වගේ දේකට ඇප්ලයි කළේ කියලා..?"

රාජිත ගිගිරුවේය. මෝක්ෂාටත් වඩා ශිෂා ගැස්සිණ. ශිෂා කෑම ගැනීම නවතා ඇස්වල කඳුළු පුරවාගෙන ගල් ගැසී උන්නාය.

"ම්.. මං.."

මෝක්ෂා උත්තර දුන්නේ තාත්තාගේ දෑස බලා නොවේ. අහක බලාගෙනය.

"දඩාස්..!"

රාජිත මිරිස් හොදි තසිමට අතින් ගැසුවේය. මේසයෙන් බිමට ලිස්සා ගිය තසිම බිඳී සී සීකඩ විසිරිණ.

"මං කලිනුත් කීප සැරයක්ම කියල තියෙනවා.. ඇඟ පෙන්නලා හම්බ කරගෙන කන්න මගෙ ලෙයින් ජාතක වෙච්ච දරුවෙක්ව කීයටවත් මං මේ ගෙයින් එළියට යවන්නෑ කියලා.. මෝක්ෂා මේක හොඳට මතක තියාගන්නවා.. අද නෙමේ.. මං බඩට කන්න නැතුව මහ පාරට වැටුණත් මගෙ තීරණේ වෙනස් කරන්නෑ. මගෙ දරුවො හැදෙන්න ඕන මට ඕන විදියට.."

The Reader's Place

රාජිත ඉඳුල් අත සෝදාගෙන මේසයෙන් නැගිට ගියේ කන්නට ගත් කෑම පිඟාන එහෙම්මම තිබියදීය. රෝෂණීගේ පපුව දැවිණ. ශිෂාගෙන් එහෙමය. ඒත් මෝක්ෂාගේ හදවත තුළ තරහවක්, ක්‍රෝධයක් වැඩෙමින් තිබිණි.

"මෝක්ෂා.. දැන්වත් ඔය තාත්තා අකමැති දේවල් කරන එක නතර කරනවා.."

රෝෂණී, සැමියා ගැන උපන් අනුකම්පාවෙන් පිච්චුණාය. දියණියට කෑගැවේ ඒ නිසාය.

"මේ ගෙදර කවුරුවත් මගෙ සතුට ගැන හිතන්නෑ.."

මෝක්ෂාත් කෑම ගැනීම නතර කර නැගිට්ටාය. මේසයේ ඉතිරි වූයේ රෝෂණීත්, ශිෂාත් විතරය. ශිෂාගේ ඇස් කඳුළින් පිරී වැසී





තිබිණි. ඈ අම්මා දෙස බැලුවේ ඒ කඳුළු අතරිනි. රෝෂණී බාල දියණිය දෙස බලා හෙලුවේ දිගම දිග දුක් සුසුමක් විතරය.

* * * * * * * * *

රැය බොහෙවින් වේදනාබර විය. ඒ වේදනාබර රැය ගෙවුණේ [illegible] නොහෙට්ටු කරමිනි. උදේ ඇස් අරිද්දි මහා මැලිකමක්, [illegible] ඇගේ හිත මතට ගොඩව තිබිණි. නැගිට ඇඳේ හිඳගත් ශිෂා ඇඳේ අනෙක් පස බැලුවාය. හිස්ය. අක්කා සමහර විට [illegible] අමතක කොට වෙනදා සේ ව්‍යායාමයට වතු යාය පුරා [illegible] ගන්න ඇත. 'මේ පාරවත් අක්කි ඔය පිස්සු වැඩේ හිතෙන් [illegible] හරලා දැම්මොත් හොඳයි' ශිෂා ඇඳෙන් නැගිට්ටේ එහෙම [illegible]. කෙටි කෙස් කළඹ අතින් හදමින් කණ්ණාඩි මේසය ළඟ [illegible] ශිෂා රෝස මල් පෝච්චියට යට කර ඇති හතරට නැවූ [illegible] කඩදාසිය දුටුවාය.

'මොකක්ද මේ..?' කුතුහලයෙන් - ගැහෙන හිතින් ශිෂා [illegible]ගෙන දිග හැරියාය.

"අම්මී, තාත්ති හා නංගිට.."

මෝක්ෂාගේ අත් අකුරුය. ශිෂා පිච්චිණ.

"මං මගේ අනාගතය වෙනුවෙන් තීරණයක් ගත්තා.. මං ගෙදරින් යනවා.. මාරියෝ මට නවතින්න තැනක් හොයල තියෙන්නේ.. ගෙදර එන්න බැරිවෙයි.. මාව හොයන්න කරදර වෙන්න එපා.. කොහේ ගියත් මං සතුටින් ඉදියි.. - මේ මෝක්ෂා.."

ශිෂාගේ දෙපා පණ නැතිවිය. ඈ බිත්තිය අල්ලාගෙන එයට [illegible]. අක්කා.. ඈ ගොසිනි. ජීවිතයෙන් භාගයක් වූ අක්කා නික්ම ගොසිනි.

"අම්මී.."

ලිපියත් ගෙන ශිෂා අම්මා සොයා ගියේ කෑගසාගෙනය.

"අම්මී.. අක්කි ගෙදරින් ගිහින්.."

අම්මාත්, තාත්තාත් අතරට ගිය ගිෂා ලිපිය දිගු කළේ හඬාගෙනය. රාජිත සුදු කඩදාසිය අතට ගත්තේ විශ්වාස කරගන්න බැරිවය. මෝක්ෂා දඟකාර බව, හිතුවක් කරන බව ඇත්තය. ඒත් ඈ මේ තරමට අකීකරු වේ යැයි ඔහු නිකමටවත් හිතුවේ නැත.

"මේ මෝඩ ළමයා මොනාද දෙයියනේ මේ කරගත්තේ..?"

රාජිතගෙන් පසුව ලිපිය කියවා බැලූ රෝෂණී හඬන්නට වූවාය.

"කරගත්තෙ ඒයාට ඕන දේ.."

රාජිත කලකිරීමෙන් කීවේය.

"අනේ රාජිත.. අපි ඉක්මණට මෝක්ෂාව හොයමු.. පොඩ්ඩක් මහන්සි උනොත් අපට ඉන්න තැනකින් හොයාගන්න පුළුවන් වෙයි.."

The Reader's Place

රෝෂණී හඬමින් කීවාය.

"ඕන්නෑ.. මිට පස්සෙ මේ ගෙදර කවුරුවත් එයා ගැන කතා කරන්න ඕන්නෑ.."

රාජිත දැඩි හඬින් කීවේය.

"අනේ රාජිත.."

රෝෂණී බැගෑපත් විය.

"අක්කි පව් තාත්ති.."

ගිෂාත් බියෙන් කීවාය.

"එයා ගියේ අපි ඔක්කොම එපා කියලනෙ.. ඉතිං ඇයි අපි එයා ගැන හොයන්නෙ..? ආයෙ කවදාවත් එයා මේ ගෙදරට





එන්නෙ නෑ.. හොඳට මතක තියාගන්න.. මං මේ කියන්නෙ ඔය දෙන්නට.. මට අකීකරු වෙලා දෙයක් කරනවා නම් ඔය දෙන්නටත් මේ ගෙදරින් එළියට ගිහින් ඕන දෙයක් කරගන්න පුළුවන්.. හැබැයි ආයෙ මගෙ මරණෙටවත් එන්ඩ එපා.."

රාජිත ස්ථිර තීරණයක උන්නේය. තාත්තා වෙනස් කරන්න බැරි බව ගිෂාට තේරිණ. අක්කා තුළ වූයේ ද මේ ගතිගුණම නොවේද..? ගිෂා වේදනාවෙන් හිතුවාය.

* * * * * * * * *

බෙන්තොට වෙරළ තීරය ළා නිල් පාට පිරිසිදු ජලයෙන් ද සුදු පාට පිරිසිදු වැල්ලෙන්ද පැරයී තිබිණි. කෙවින් විජේන්ද්‍ර අව් කණ්ණාඩිය හිසේ රඳවා ගත්තේය. කැමරා ආම්පන්නවල අඩුපාඩු බලමින මිතුරා මාරියෝ දෙස බැලුවේය.

"ඔන් බං උඹේ ආර්ටිස්ට.. ඓශ්වර්යා පරාදයි කියලා උඹ මහ ලොකුවට කිව්වෙ.. බලපං දැන් කීයද වෙලාව කියලා..?"

කෙවින්, මාරියෝට කෑගැහුවේය.

"හරි.. හරි බං.. තව වෙලා තියෙනවනෙ.. කෙල්ල වෙලාවට එනවා ඇති.."

මාරියෝ මිතුරාව සැනසුවේය. මෝක්ෂා වරුසප්පෙරුමට මේ ස්ථානයට එන්න කියා දන්වා යවා දවස් දෙක තුනකි. ඈ නොවරදවාම එන බවට වචනයද දී තිබිණි.

'මේ ගොං වැස්සි කීයට එයිද දන්නෑ..' මාරියෝට හිතින් මෝක්ෂා එක්ක තරහාය. වෙලාව පරක්කු වෙන්න වෙන්න කෙවින් නොඉවසුනේය. කෙවින් විජේන්ද්‍ර යනු ලේසියෙන් තරහා කරගත හැකි මිතුරෙක් නොවේ. රටේ සුපතල ව්‍යාපාරිකයෙකුගේ පුතු රත්නය වූ කෙවින්ට විසි කරන්නට සල්ලි තිබිණි. කෙවින්ගේ සල්ලි යොදවා මෙගා ටෙලියක් කරන්නට මාරියෝ අදහස් කරගෙන උන්නේය.

"ආං.. කෙල්ල එනවා.."

හෝටල් අංගනයෙන් මතුව එන මෝක්ෂාගේ රුව දැක මාරියෝ සතුටින් කීවාය.

කෙවින් ළඟ එන යුවතිය දෙස උවමනාවෙන් බැලුවේය. අලුත් මෝස්තරයට කැපූ කොණ්ඩය, සුදු දිගටි මුහුණ, ජීන් එකට ගැළපුණ සිහින් ඉඟ ටීෂර්ට්යෙන් මප් වුණ පුන් පියොවුරු දිගු දැත් ඇත්තටම ලස්සන කෙල්ලෙක් නොවේද කියා කෙවින් සිතිණි.

"කොහොමද..? එළ පාර නේද..?"

ඇහැක් වසා ඉඟිකොට මාරියෝ, කෙවින්ට කීවේ ක කොණකින් හිනැහෙන ගමන්ය. මෝක්ෂාගේ රූපය දැකී ගම කෙවින්ගේ මුහුණේ වැටුණු එළිය, දෙනෙතේ වූ දීප්තිය මාරියෝ හොඳින් හඳුනාගෙන තිබිණි. දකින දකින මලේ රොන් ර බලන්නට ගිජුකමක් දක්වන කෙවින්ගේ ගතිගුණ මාරියෝ හොඳි දැන උන්නේය.

"මං පරක්කුද අයියෙ..?"

මෝක්ෂා, මාරියෝගෙන් ඇසුවාය.

"නෑ නංගි.. වෙලාවට ආවා.. ඔයාට අඳුන්වලා දෙන්න කෙනෙ ඉන්නවා.. මෙයා තමා අපේ ප්‍රොජෙක්ට් එකට ඉන්වෙස් කරන්නෙ.. මේ මිස්ට.."

මාරියෝ, කෙවින්ව අඳුන්වා දෙන්නට සූදානම් විය.

"කේවි.. මං කේවි.."

මාරියෝ නම කියන්නට පෙරාතුව කෙවින්, මෝක්ෂා දෙස අත දිගු කළේ ක්ෂේත්‍රය තුළ ප්‍රසිද්ධ තමන්ගේ කෙටි නම ඉස්සරහ දමාය. නමින් කෙවින් විජේන්ද්‍ර වුවාට ඇත්තටම ඔහු මිතුරන් අතර, සමාජය තුළ ප්‍රසිද්ධ වූයේ ඒ නමිනි. වෙනකක් නියා කෙවින්



The Reader's Place



කෙසෙත් කළෙන් තේ සහ වී අකුරු දෙකය. මෝක්ෂා සිය සියුමැලි අත කෙවින්ට දිගු කළාය. බෙහෙවින් උස් කඩවසම් පිරිමි රුවට ඉතා ඉදිරිපිට විසිතුරුව ඇඳ පැළඳ උන් මේ හැඩකාරයාට මෝක්ෂාගේ හිත සොලවන්නට පුළුවන්ව තිබිණි. අඩුම තරමේ ඇය වෙනතුරුත් හිතේ හොල්මන් කරපු සස්මිතගේ රූපය පවා මේ මොහොතේ කොහේ ගියාද කියා නැත.

"එහෙනම් ඔයා..?"

මෝක්ෂාගේ අත දැඩිව මිරිකා ගනිමින් කෙවින් ඇසුවේය.

"මෝක්ෂා වරුසප්පෙරුම.."

"ම්.. මෝක්ෂා.. නම ලස්සනයි.. ඒත් ඉතිං මේ වගේ ෆීල්ඩ් එකකට ඔය වගේ නමක් ගැළපෙන්නෙ නැනෙ.."

කෙවින් කීවේය.

"මං ඔයාට ඒක කිව්වා මචං.."

මාරියෝත් කතාවට සම්බන්ධ විය.

"මං කියන්නද.. අපි එයාට මිකී කියල කතා කරමු.. ෂෝට් ඇන්ඩ් ස්වීට්.. ජස්ට් ලයික් යූ.. ඕකේ.."

කෙවින්, මෝක්ෂාගේ උරයට අතක් තබා මුහුණට එබිණ. කොහෙදෝ ගිනාවක් පා උන්නා මිසක මෝක්ෂා ඇබින්දක්වත් විරුද්ධ වූයේ නැත.

ඡායාරූප ගැනීම ඇරඹිණ. බොන්තොට බිච් හෝටලයේ එක කාමරයක් මෝක්ෂාට වෙන්කර තිබිණි. එක එක ඇඳුමින් සැරසී ගිය මෝක්ෂා වෙරළේ මනහර ඉරියව් මැව්වාය. මාරියෝගේ නවීන ඩිජිටල් කැමරාව ඒ සියල්ල එක දිගට හසුකර ගත්තේය. මෝක්ෂාගේ රූ සිරිය උරාගත්තේ අජීවී කැමරාව පමණක් නොවේ. කවුරුත් පඳුරක් යට දිගු ලැලි පුටුවක හාන්සි වී සිසිල් බීම වීදුරුවක්

නොලගාමින් උන් කෙවින්ගේ සජීවි දෙනෙතත් මෝක්ෂාගේ රුසි
සොරා ගනිමින් උන්නේය.

"මිකීට මං වැදගත් දෙයක් කියන්න උන්නේ.."

ඡායාරූපයකට ගැලපෙන පරිදි මෝක්ෂාගේ ඇඳුම් සහ හිසකේ
සකසමින් ලංව ඉන්න අතරේ මාරියෝ කීවේය. මෝක්ෂා ඔහු දෙස
සෘජුව බැලුවාය.

"කේවි ව ටිකක් ෂේප් එකේ තියාගන්න බලන්න.. ඌ හෙ
බරකාරයා.. අහල ඇතිනෙ විජේන්ද්‍ර එන්ටප්‍රයිසස් ගැන.. කේ
තමා ඒකෙ උරුමක්කාරයා.. ඔයා මේ ෆීල්ඩ් එකේ ඉස්සරහ
යන්න බලාපොරොත්තු වෙනව නම් කේවීගෙන් ගොඩක් උද
ගන්ඩ පුළුවන් වෙයි.."

ඇත්තටම මෝක්ෂා නිරූපිකාවක ලෙස ඉහළට යන්නට හීන
මැව්වාය. ඇගේ හිතේ මුලින් තිබුණේ නිළියක වෙන ආසාව
එහෙත් එය ලෙහෙසියෙන් ඉටු නොවන්නක් බව දුටු විට
නිරූපිකාවක වන්නට තීරණය කළාය.

"ආ.. මට කියන්න අමතක උනා.. කේවී ගෙයි, මගෙයි අදහස
තියෙනවා මෙගා ටෙලියක් කරන්න.. ඔයා දැන්ම කේවීව ෂේ
කරගත්තොත් ඔයාටත් චාන්ස් එකක් ගන්න බැරි වෙන්නෑ.."

මෝක්ෂාට දැනුණේ අදහාගත නොහැකි සතුටකි. ජනප්‍රි
වෙන්නට මෝක්ෂාගේ යටි සිතේ වූ ආසාව දැන උන්නේ ඇය
පමණි. ගෙවල්වල මිනිසුන් තමා ගැන කතා කරනවාට, තවපිල්ව
ප්‍රධාන මාතෘකාව තමා වෙනවාට, පාරක තොටකදී තමාව දුටුවි
මිනිසුන් ඇවිත් වට කරගන්නවාට මෝක්ෂා ආසා කළාය. ඇ
එහෙම ජීවිතයක් ගැන හීන මැව්වාය.

"මහන්සිද බබා..?"

ඡායාරූප ගැනීම අතරමග කෙටි විවේකයේදී මෝක්ෂා පැමි





කෙවින්ට නුදුරේ වූ දිගු බංකුවේ හිඳ ගත්තාය. කෙවින් එහෙම
[illegible] මෝක්ෂා පැත්තට ඉරියව්ව වෙනස් කරගෙනය.

"ටිකක් විතර.."

මෝක්ෂා නැලවිණ.

"අර නිල් පාට වතුරෙ බැහැගෙන ඔයා ඉන්නකොට මට
හිතුණා ඇත්තටම මේ නම් කිඳුරියක්ද කියලා.. ඔයා ඒ තරම්
ලස්සනයි මිකී.."

කෙවින් කීවේය. කෙල්ලන්ට හුරතල් බස් කියන්නට ඔහුට
කිසිඳු වෙහෙසක් දරන්නට උවමනා කළේ නැත. පුරුද්දෙන්ම ඒ
වගේ වචන නිතරම අළුත් කෙල්ලන් වෙනුවෙන්ම ඔහුගේ දිවග
රැඳී තිබිණ. මෝක්ෂා උවමනාවෙන්ම කෙවින්ගේ දැලේ
පැටලුණාය. ඇයටත් උවමනා යා යුතු දුරට කෙවින් ඉණිමග තර
කළේය. දවස අවසානයේදී මෝක්ෂාත්, කෙවිනුත් උන්නේ ආත්ම
ගාණක් එකට උන්නා සේ ළං වෙලාය.

"හවස මොකද කරන්නෙ..?"

මෝක්ෂා වෙතින් විහිදෙන නැවුම් සුවඳ තෘෂ්ණාවෙන් දරමින්
කෙවින් ඇ අසල දැවටිණ.

"මාරියෝ මට ඉන්න තැනක් හොයල තියෙන්නෙ කිව්වා..
ඉතින් කාලා බීලා නිදාගන්න හිතාගෙන ඉන්නෙ.."

තමාට ආයේමත් ගෙදර යාමක් ගැන හිතන්න බැරිය. තාත්තා
කොහොමවත් තමාව ගෙදරට වද්දාගන්නේ නැතිබව මෝක්ෂාට
විශ්වාසය. ඇරත් ගෙදරින් එළියට බැස්සේ ආයිමත් ගෙදරට පය
තබන බලාපොරොත්තුවෙන් නොවේ.

"මාරියෝ කොහෙද මිකීව නතර කරන්න හිතාන ඉන්නෙ..?"

කෙවින්, මාරියෝගෙන් ඇසුවේය. අතට ආ කිරිල්ලිය පැන
යන්නට පෙර කොටුකර ගත යුතුය.



The Reader's Place

"ප්‍රින්සි අක්කගෙ ලොප් එකේ.."

"ප්‍රින්සි අක්කා හොඳ ගෑනි.. ඒත් නීති වැඩී.."

කෙවින් කීවේය.

"කේවිට පුළුවන් නම් මිකීට ලිෆ්ට් එකක් දෙන්න.. දෙන්නා අඳුරගන්නත් එක්ක හොඳනෙ.."

මාරියෝ, කෙවින් දෙස හෙලූ රහස් බැල්ම මෝක්ෂා දුටුවේ නැත.

"වයි නොට්.. අයි කැන් ඩූ දැට්.."

කෙවින් ඉස්සර විය. මෝක්ෂා ඒ පස්සේ ගියේ ඇඳුම් පැළඳුම් රැගත් ලොකු ලෙදර් බෑගය කරේ එල්ලාගෙනය.

"නගින්න.."

කෙවින් කාරයේ දොර හැරියේය. කෙවින්ගේ කාරයට නැගගත් මෝක්ෂාට පුදුම හිතිණ. ඈ ඒ තරම් සුව පහසු කාරයකට කවදාවත් නැග තිබුණේ නැත.

"මොකද බයවෙලා වගේ..?"

රිය පණ ගන්වා ගන්නා අතරේ කෙවින් ඇසුවේය.

"පොඩි බයක් හිතේ තියෙනවා.."

මෝක්ෂා ඇත්තම කීවාය.

"ඒ මොකද..?"

"මට කොළඹ ජීවිතේට පුරුදු වෙන්න පුළුවන් වෙයිද කියලා.. මීට කලින් මං දෙපාරකට වඩා කොළඹ ඇවිත් නෑ.. ඒ ආවෙත් ගෙදර අය එක්ක.."

"රියලි.. එහෙනම් ටිකක් වැඩේ අමාරුවෙයි.. කොහෙද ගම..?"



The Reader's Place



කෙවින් හිස මදක් මෝක්ෂා පැත්තට බර කොට ඇසුවේය.

"[illegible].."

[illegible]පෙරුම වතු යාය අයිති තාත්තාට බවක් මෝක්ෂා [illegible] නැත.

"අම්මා, තාත්තා කැමතිද මිකී මොඩලින් කරනවට..?"

"[illegible] නෑ.."

"එහෙනං මේ ඇවිත් තියෙන්නෙ තනි කැමැත්තට.."

"ඔව්.. මං හිතන්නෑ තාත්තා ආයෙමත් මට ගෙදර පස් [illegible] ඉඩක් දෙයි කියලා.."

ඒ ටික කියද්දි මෝක්ෂාගේ දෙනෙත් සියුම් කඳුළු පටලයකින් [illegible]. සිහින සැබෑ කරගන්නට හිතා මේ ගමන ආවාට [illegible] ගෙදර අය අමතක කරන්න බැරිය. හිත යට දරුණු [illegible] දැනෙන්නේ ඒ නිසාය.

"සොරි වොරි බබා.. ඔයා බයවෙන්නෙපා.. ඔයාට මං ඉන්නවා.."

කෙවින් අනවසරයෙන් මෝක්ෂාගේ උකුළ මත වූ අත මිරිකා [illegible]. සියුම් හිරිවැටීමක් සිරුර කලබල කර පැතිර ගියද මෝක්ෂා [illegible] සිනහවකින් උහුලා දරාගත්තාය.

"මං ඔයාව නම්බ වන් මොඩල් කෙනෙක් කරල තමා පස්ස බලන්නෙ.. මං ඔයාට පොරොන්දු වෙනවා මිකී.. මං ඔයාගෙ අනාගතේ හදලා දෙනවා.."

මෝක්ෂාගේ හදවතට දැනුණේ මේ යැයි කිව නොහැකි [illegible]. ඒ සතුට මත්තේ ආගන්තුක කෙවින් කෙරේ අපමණ බැඳීමක් ද තිබිණි.

"මෙතන තමයි තැන.."

කෙවින්ගේ කාරය ගුණසිංහපුරයට ආසන්නයේ තැනක නතර විය. දෑස ඉදිරිපිට පෙනෙන තට්ටු බිල්ඩිම දෙස මෝක්‍ෂා බැලුවේ දෑස ලොකු කරගෙනය. බිල්ඩිම ඉදිරිපිටත් පාරත් අතර ඒ හැටි පරතරයක් නැත. ඒ කුඩා ඉඩකඩේත් ළමෝ රංචුවක් ක්‍රිකට් ගසති. ටිකක් එහායින් උකුණන් බලමින් ගෑනු නඩයක් ඕපාදූපයේය. ඉස්සරහම කැල්ලේ ජනෙල් පලු දෙකක් ඇර දමා තිබේ. ඒ අස්සෙන් මෝක්‍ෂාට පේන්නේ ටොපි බෝතල් කීපයක්, කෙසෙල් කැනක්, තරාදියක් එල්ලූ කඩයක සලකුණුය.

"අප්පට හුඩු.. මේ අපේ කෙවින් බොස්නෙ.."

කඩ කැල්ලෙන් මතුව ආ තරබාරු ගැහැනියක් කාරයට එබිණ. ශරීරයට වඩා විශාල වූ ඇගේ පයෝදර දිගු ගවුමේ පැටලී තෙරපී සිරවී ඉදිරියට දිගුව තිබිණි.

The Reader's Place

"කොහොමද ප්‍රින්සි අක්කා..?"

කතාබහ යන විදිහෙන් මෝක්‍ෂාට පේන්නේ බොහෝ කාලයක සිට කෙවිනුත්, ප්‍රින්සි අක්කාත් අතර ළඟ ඇඳුනුම්කමක් තිබෙන බවය.

"මාරියෝ කියන්න ඇතිනෙ.. අලුතින් කෙනෙක් එනවා කියලා..?"

කෙවින් කීවේ මෝක්‍ෂා දෙස බලාය. සැණින් ප්‍රින්සි අක්කාගේ සියුම් ඇස් පරීක්‍ෂාව මෝක්‍ෂා දෙසට එල්ලවිය. මෝක්‍ෂා කෙරේ දැක්වූ එකම නෙත් බැල්මෙන් ඇ මේ පරිසරයට, මේ මිනිස්සුන්ට ආගන්තුක බව ප්‍රින්සි වටහා ගත්තාය.

"මාරියෝ විස්තරේ නම් කිව්වා.."

ප්‍රින්සි අක්කා ඇකිලුණ මුහුණින් යටිතොල පෙරලුවාය.





"ඒ උනාට ඇඩ්වාන්ස් එකක් ගෙව්වෙ නෑනෙ.. මං ඒත් කිව්වා දැන ඇඳුනුම්කම්වලට විතරක් වැඩ කරන්න අමාරුයි කියලා."

ප්‍රින්සිගේ ජීවිතයේ මූලික පරමාර්ථය මුදල් ඉපයීමය. බල්ලො මරා හෝ සල්ලි සෙවීම ජීවිත දර්ශනය කරගත් ඇ ගැන කෙවින් හොඳට දැන උන්නාය.

"ආ.."

කෙවින් පසුම්බිය දිග හැර කහපාට නෝට්ටුවක් ප්‍රින්සිට දික් කළේ මෝක්‍ෂා කිසිවක් හිතන්නටත් පෙරය.

"මං දන්නවා අපේ කෙවින් මහත්තයා ගෙනත් ඇරලන ළමෙක් නම් අපට පාඩුවක් නෑ කියලා.."

ප්‍රින්සිගේ කටින් එළියට විසිවුණ ඒ වචනවල ලොකු කතාවක් තිබිණි. කෙවින්ගේ බියපත් ඇස් මෝක්‍ෂා දෙසට විහිදුණේ ඒ බව ඇයටත් දැනුණාදෝ බියෙනි. එහෙත් මෝක්‍ෂා උන්නේ ඒ කිසිවක් වටහාගත හැකි නිරවුල් මනසකින් නොවේ. අලුත් පරිසරය හා ආගන්තුක මිනිසුන් ඇගේ සිත නොසන්සුන් කර තිබිණ.

"එහෙනං මෝක්‍ෂා බහින්න.. හෙටත් ෂූට් එකක් තියෙනවා කිව්වනෙ.. උදේ නවය වෙද්දි මං එන්නං ඔයාව ගන්න.."

කෙවින් කීවේය. මෝක්‍ෂා තීකරු වූවාය. කෙවින්ගේ සැප පහසු වාහනය පාරේ නොපෙනී යද්දි මෝක්‍ෂාගේ හිතට දැනුණේ මහා හුදකලාවකි.

"යං.. මං කාමරේ පෙන්නන්නං.."

ප්‍රින්සි අක්කා ඉස්සර විය. නාඳුනන ඇස් බොහොමයකට හමුවෙමින් මෝක්‍ෂා ඒ අඳුරු පටු කොරිඩෝවේ ඇ පසුපසින් ගමන් කළාය.

"ඕං මේකයි තැන.. කෑම බීම ඕන්නං අපි දෙනවා.. නූඩ්ල් පැකට් එකේ, පෙනඩෝල් පෙත්තෙ ඉඳන් පෑඩ් පැකට් එක යනකන් කෙල්ලෙකුට ඕන අඩුම කුඩුම ඔක්කොම මගෙ කඩේ තියෙනවා.. ඒවා මගෙන් ගන්න පුළුවන්.."

දෙවන මහලේ තුන්වන කාමරය මෝක්ෂා නමට ඇරදී ප්‍රින් අක්කා කීවාය. මෝක්ෂා කාමරයට ඇතුළු විය. පටු ඇඳක්, තු රාමුවේ කණ්ණාඩි මේසයක් තිබූ කාමරය මුසල පාටය. ඇහැ පේන තැනක කුණු කන්දල් කිසිවක් නැතත් අපිරිසිදු පාට කාමරයටම අල්ලා තිබූ නාන කාමරයත් ඉතාමත් කුඩාය. මෝක්ෂා ගෙදර සිහිවුණේ නිකම්මය. 'මේවා ගෑනු ළමයින්ට සුදුසු තැ නෙමේ' අම්මා හෝ තාත්තා ළඟ පාත උන්නා නම් එහෙම කිය ඇත. ඇයටත් නොදැනීම මෝක්ෂා වෙතින් බර සුසුමක් ගිලිහිණ

* * * * * * * * * *

The Reader's Place

සස්මිතගේ හිත තියවා ගැනීමේ හැකියාව ශික්ෂාට තිබිණ ඒකියාව බාරගෙන ගත කළ මාස කීපයට සස්මිත යනු කො වාගේ පිරිමියෙක්දැයි ශික්ෂා හොඳින් හඳුනාගෙන තිබිණ ආඩම්බරකමට - සැහැල්ලුවට - දඟකාරකමින් ජීවත්වූ සස්මිතගේ ලෝකයට මේ තින්න ඇත්ත බර වැඩිය. ශික්ෂා යැයි කියාගෙන මෝක්ෂා අක්කාට අපමණ ආදරය කෙරූ සස්මිතට මේ ඒවටී දරාගන්න අමාරුය.

'අක්කා නැති ගෙදර කනත්ත වගේ පාලුයි.. මට විතර නෙමේ.. අම්මිටයි, තාත්තිටයි දෙන්නටත් එහෙම දැනෙනවා ඇති..'

නිහැඬියාව රජ කළ ගෙයි එහා මෙහා ඇවිදිමින් ශික්ෂා සිතුවාය. අම්මා කෑම බීම හැදුවේ පුරුද්දට වගේය. ඒ ඇස් පැය විසි හතරේම කඳුළින් පිරී තිබිණි. තාත්තා කන්තෝරු කාමරය ඇතුලේ දවසම හිරවී සිටියේ උවමනාවෙනි. කළුව ගිය ඒ මුහුණ පුරා වේදනාවක සලකුණුය.





'...ක්කට මෙහෙම නොකර ඉන්නයි තිබ්බෙ.. එයා අපට ...නෙ කොච්චර හින්දරක්ද..?' මෝක්ෂාට සිතිණ. ඒ සැණින් ඇයට ...න සස්මිත සිහිවිය. ගෙදර අයට ඇත්තේ අක්කා නැති පාළුව ... ඒත් සස්මිතට අක්කා අතින් ඒවටීමට ලක්වීමේ වේදනාවද ... ඒ හිත හැදෙන්නට එක වචනයක් කතා කරන්නට තිබුණා ... යැයි ශික්ෂාට සිතුණි. ගවුමට උඩින් රෝස පාට ස්විටරය ... ශික්ෂා පාරට බැස්සේ උන් හිටි හැටියේය. අක්කා කියා තිබූ ...වල හැටියට සස්මිත ෆැක්ටරියට යන්නේ මේ පාරෙන් මේ ...වේලාවටය. ශික්ෂා සිතුවා හරිය. තේ යාය මැදින් වැටුණු පාරේ ... දුරක් යන්න නොවිණ. සස්මිතගේ බයිසිකලයේ කුටු කුටු ... ඇයට ඇසිණි.

'ඒ සස්මිතම තමයි' පාරේ කොනින් මතුව ඉදිරියට ආ සස්මිතගේ ... පැදිය ශික්ෂා ළඟ නතර විය. පුරුද්දට වාගේ හෙල්මටය ... අතට ගත්තත් සස්මිතගේ දෑස් තිබුණේ අනන්තයට පිවිසුණ ... මේ තරම් ඉක්මනට ශික්ෂා හමුවීමට උවමනාවක්වත්, ...මක්වත් සස්මිතට නොවිණ. ඒත් දෛවය හැමදාමත් මේ ... ජීවිතයට උරුම කළේ අනපේක්ෂිත දේවල්මය.

"සස්මිත.."

ශික්ෂා කතා කළේ ගැහෙන හඬකිනි. සස්මිත පළමු වතාවට ශික්ෂාගේ නෙත් දෙස කෙලින් බැලුවේය. ඒ පිරිමි ඇස්වල හෝ ...ණේ වෙනදා දැක පුරුදු දඟකාරී ඉරියව්ව නැතිබව ශික්ෂා ...වාය.

"අක්කා ගෙදරින් ගිහින්.."

ශික්ෂාගේ හඬ හැඬුම්බරය.

"දන්නවා.."

සස්මිත කීවේ අහක බලාගෙනය. මෝක්ෂා තමාව ඒවටූ එක ...කය. ඈ තුළ ජනප්‍රිය වෙන්නට තිබූ ආශාව තවත් පැත්තකය.

මේ කොයිවිදිහෙන් බැලුවත් මෝක්ෂා යනු තමාගේ ජීවිතයට, තමාගේ සිතුම් පැතුම්වලට ගැලපෙන කෙල්ලක නොවේ. මේ තිත්ත ඇත්ත මීට කලින් තේරුම් ගන්නට බැරිවීම ගැන සස්මිත තමා ගැනම කලකිරිණ.

"කවුද කිව්වෙ..?"

ශික්ෂා ඇසුවේ පුදුමයෙනි.

"ඔය වත්තෙ හැමෝම කියන්නෙ.."

සස්මිත කීවේ ගාණකට නැතුවය

"හැමෝම කියනවා..? මොනාද..?"

"ලොකු මහත්තයගෙ ලොකු දුව ගෙදරින් තරහවෙලා ගිහිල්ලා කියලා.."

ශික්ෂාගේ ඇස් ලොකු විය. මෙතෙක් ඈ හිතා උන්නේ මේ ආරංචිය තවමත් ගෙදරින් පිට ගිහින් නැත කියාය. අලුත් ආරංචිවලට තටු තියෙනවායි කියන්නේ නිකමට නොවේ.

"මං හිතුවෙ සස්මිතට මේ ආරංචිය අහල ටිකක් හරි දුක හිතෙයි කියලා.."

ශික්ෂා ඇත්තම කීවාය.

"කා ගැනද..?"

සස්මිත ඇසුවේය.

"අක්කා ගැන.."

"එයා ගැන නෙමේ දුක්වෙන්න බයවෙන්න ඕන.. එයා වගේ ඉන්න රටේ ලෝකෙ අනික් මිනිස්සු ගැන.. පුරුද්දට වංචා කරන අයට කොහෙ ගියත් හරියන්නෑ.."



The Reader's Place



සස්මිතගේ කටහඬේ දැඩි වේදනාවක් තිබිණ.

"සස්මිත, අක්කට ශාප කරනවද..?"

ශික්ෂා ඇසුවේ වේදනාවෙනි.

"අනේ නෑ.. ඇත්තම කිව්වොත් මට එයාට සාප කරන්නවත් හිත හදාගන්න බෑ.."

සස්මිත බිඳුණු හඬින් කීවේය.

"මං දන්නවා.. අක්කා, සස්මිතට කළේ සමාව දෙන්න පුළුවන් වරදක් නෙමේ.. ඒත් අක්කා වෙනුවෙන් මං සස්මිතගෙන් සමාව ඉල්ලනවා.. පුළුවන් නම් අපිට සමාව දෙන්න සස්මිත.."

ශික්ෂාගේ වචන පැටලිණ. නෙත කඳුළු පිරිණ.

"ශික්ෂා.."

සස්මිතගේ ඇස් කෙලින්ම ශික්ෂාගේ ඇස් මතට පතිත විය.

"ඔයා මගෙන් සමාව ඉල්ලන්නෙ ඇයි..? මගෙ අතින් නොදැනුවත්ව හරි ඔයාගෙ ජීවිතේට උනේ ලේසි පාසු වරදක් නෙමේ.. මං ඉන්නෙ මට සමාවෙන්න ශික්ෂා කියල කියන්නවත් හිත හදාගන්න බැරි තත්වෙක.. එහෙම එකේ ඔයා මගෙන් සමාව ඉල්ලන්නෙ ඇයි ශික්ෂා..?"

'මේ සමාව ඉල්ලීමේ තේරුම ශික්ෂා තමා ගැන හිතනවා හිතන එක නොවේද..? තමා රැවටුණ එක ගැන ඇය දුක්වෙනවා හිතන එක නොවේද..? මේ මොහොතේත් තමන්ගේ පිරිමි හිතේ දැල්වෙන ගින්දර ගැන ශික්ෂා හොඳින් දැන උන්නා කියන එක නොවේද..?' සස්මිතට සිතිණ.

"ඔයා උවමනාවෙන් මට වරදක් කරල නෑ කියලා මං දන්නවා සස්මිත.."

ශික්ෂා බිම බලාගෙන කීවාය.

"ඒත් දෙයියනේ.. මං මෝක්ෂා එක්ක එකතුවෙලා ඔයාට කරපු වෙනස්කම්.. නොදැන හරි කරපු ඒ දේවල් අමතක කරන්නෙ කොහොමද..?"

සස්මිත කතා කළේ හිතේ උතුරා පිටාර යන වේදනාවකුත් එක්කමය.

"මං නොදැන කළාට ඇත්ත ඔයා දැනගෙන උන්නා ශික්ෂා.. මට මතකයි අපි ඇඳුම් ගන්න ටවුන් ගිය දවස.. මං මෝක්ෂාට ළංවෙලා ආදරේ කළේ ඒ ඔයා කියලා හිතාගෙන.. අපි පස්සෙන් හැම තැනටම ආව ඔයා දිහා ඇහැක් ඇරල බැලුවෙ නැත්තෙ ඔයා මෝක්ෂා කියල හිතාගෙන.. මං ඇත්ත නොදැන උන්නට ඔයා ඇත්ත දැනගෙන උන්නා ශික්ෂා.. මං ඔයා කියල හිතාගෙන අක්කව තුරුල් කර ගනිද්දි.. හාදු රකිද්දි.. ඇයි ඔයා සද්ද නැතුව හිටියෙ..? ඇයි ඔයා මට ඇත්ත කිව්වෙ නැත්තෙ..?"

ශික්ෂාගේ බියපත් නෙත් සස්මිතගේ මුහුණට වැටිණ.

"ඇයි ඔයා අක්කට ඔන හැටියකට මාව රවට්ටන්න ඉඩදීල නිශ්ශබ්දව හිටියෙ..?"

මෙතෙක් අසන්නට හිතේ පුල පුලා හිටි ඒ ප්‍රශ්නය සස්මිත සෘජුව ඇසුවේය.

"ඒ මගේ අක්කා සස්මිත.. මං කොහොමද අක්කව පාවලා දෙන්නෙ..?"

ශික්ෂා වේදනාවෙන් කීවාය.

"එයා සෙල්ලම් කළේ මගෙ ජීවිතේ එක්ක විතරක් නෙමේ.. මං එයාට ආදරේ උනේ ඔයා කියලා හිතලා කියලා එයා හොඳටම දන්නවා.. එයා මගෙ ආදරේ ගන්න මං ළඟ ඔයා විදියට රඟපෑවා..





ඔයා තේරුම් ගන්න.. එයා සෙල්ලම් කළේ අපි දෙන්නගෙම ජීවිත එක්ක.."

සස්මිතගේ වචනවල වේදනාවක් සේම කෝපයක්ද තිබිණි. මෝක්ෂාගේ වංචාකාරී හැසිරීම ගැන වේදනා විඳින ගිහින්ම ඒ වංචාවන් උහුලා දරා දුක් විඳි ශික්ෂාගේ නිහඬබව ගැන සස්මිත කෝප ගත්තේය.

"මං පුළුවන් තරම් අක්කට තේරුම් කරල දෙන්න හැදුවා සස්මිත.. ඔයා හිතන්නෙ මේ හැමදේම බල බලා මං සතුටින් හිටියා කියලද..? ශික්ෂා කියල ඔයා අක්කට කතා කරන හැම පාරකම මං දුක් වින්දා.. ශික්ෂා කියල අක්කට කතා කර කරා මෝක්ෂා කියල ඔයා මට රිද්දපු හැම සැරේකම මං මැරි මැරී උන්නා.. ඒත් අක්කා ඔයාට ආස කරද්දි.. මං කොහොමද ඉස්සරහට ඇහැල ඒ ශික්ෂා නෙමේ මමයි ශික්ෂා කියල කියන්නෙ සස්මිත..? මට ඒක කරන්න මගෙ හිත හදාගන්න බෑ.."

ශික්ෂා තේරුම් කළාය. තේ කුඩා පිටේ බැඳගත් ගැහැනු කීප දෙනෙක් තේ පැල අතරින් වැටුණු අඩි පාරේ පල්ලම් බසී. ඔවුන් හැඳ සිටි සාරිවල දීප්තිමත් වර්ණ ඉතා දුරට පවා පෙනිණ.

"මං දැන් හැමදාම හිතන්නෙ මොනා ගැනද කියල ඔයා දන්නවද ශික්ෂා..?"

සස්මිත කෙළින් ඇසුවේය. ඒ ඇස් දෙස බැලූ ශික්ෂා කිසිත් නොකීවාය.

"මං හැමදාම හිතන්නෙ එදා ඉස්සරෝම වැඩ බාරගන්න මේ බයිසිකලේ නුවරට ආපු දවසින් ජීවිතේ ආයිමත් පටන් ගන්න පුළුවන් නම් කියලා.. එහෙම උනා නම් මං කීයටවත් මෝක්ෂාට රැවටෙන්න ඉඩක් තියාගන්නෑ.. එක පාරක් නෙමේ.. දෙපාරක් මං එයාට රැවටුණා.. ආයෙ පාරක් ස්ටේට් එකට ආ දවසින් ජීවිතේ පටන් ගන්න පුළුවන් උනා නම් එහෙනම් මං ඇත්තටම ආදරේ

කරන්න පටන් ගන්නෙ ශික්ෂාට.. මං හොයපු ආදරේ - මං ආස කරපු ආදරේ අවංකවම විඳින්න එහෙම උනා නම් මට පුළුවන් වෙනවා.."

ශික්ෂාට දැනුණේ හිත පත්ල බරකින් පිරුණා සේය. සස්මිත මේ නොකියා කියන්නේ තමාට තාමත් ආදරේ බව නොවේද..?

"ඒත් මං දන්නවා මං ඒ තරම් වාසනාවන්ත නෑ කියලා.."

යතුරුපැදිය පණ ගන්වා ගත් සස්මිත දුරට ඇදුණේ ශික්ෂාට යන්නම්වත් නොකියාය. ඒත් ඔහු ඉතිරි කර ගිය සිතුවිල්ලේ බර ශික්ෂාගේ හදවතට දරාගන්න බැරි තරමට දැනිණි. සතුටු වෙන්නද, දුක් වෙන්නද කියා තෝරා බේරා ගන්නට බැරි පුදුම හැඟීමක ශික්ෂා සිරව උන්නාය.

* * * * * * * * * *

The Reader's Place







# 06

"මං ඔයාට බඩුවක් ගෙනාවා.."

පසුවදා ප්‍රින්සි අක්කාගේ ලොප් එකෙන් මෝක්ෂාව කාරයට නංවාගත් කෙවින් කීවේය. ඔවුන් උන්නේ ඡායාරූප ගැනීමට නියමිතව තිබුණ තරුපහේ හෝටලය දක්වා ගමන් කරමින්ය.

"මොකවද..?"

කෙවින් දිගු කළ හතරැස් පෙට්ටිය අතට ගනිමින් මෝක්ෂා ඇහුවාය. ඈ එය දිග හැරියේ කුතුහලයෙනි. තිරය ඇඟිල්ලෙන් පිරිමැද ක්‍රියාකරවීමේ හැකි අලුත්ම මාදිලියේ ජංගම දුරකතනයක් ඒ තුළය.

"මොබයිල් එකක්.."

මෝක්ෂාගේ මුහුණ මලක් සේ පිපිණ.

"මෙහෙ ඉඳලා මොඩලින් කරන්න හිතනව නම් ඔයාට අංක එකට ඕන කරන්නේ ඕක.."

කෙවින් කීවේ ලොකු හපන්කමක් කළ ගානටය. මෝක්ෂා, කෙවින් දෙස ඇස් උස්සා බැලුවේ ඒ හපන්කම අගය කරන්නා සේය.

"මොඩලින් කරන අයගෙ ගොඩක් ඩීල්ස් සිද්ධ වෙන්නෙ ෆෝන් එකෙන්.. බලන්නකො ඔයාට ඉස්සරහට ඕක නැතුවම බැරිවෙයි.. ඔයාගෙ ෆෝන් එකට ඉවරයක් නෑ කියන්නෙ ඔයාටත් ඉවරයක් නැතුව වැඩ හම්බවෙනවා කියන එක.."

කෙවින් විස්තර කළේය. ඔහු තමට හිතේ ඇති හැඟීම තවත් වැඩිවෙනවා මෝක්ෂාට දැනිණ. ඔහු මේ තරමට තමා ගැන, තමාගේ යහපත ගැන හිතනවා නොවේද..? ඇත්තටම කෙවින් උදව් කරන්නට ඉදිරිපත් නොවී නම් කොළඹ ජීවිතය තමාට මීටත් වඩා අමාරුවෙනවා ස්ථිරය.

"ඔයාට කොහොම ස්තුති කරන්නද කියලා මට තේරෙන්නෙ නෑ.."

The Reader's Place

මෝක්ෂාගේ කටහඬේ තරමක වේදනාවක්ද තිබිණ.

"අත්‍යාවශ්‍යම කෙනෙකුට ඇරෙන්න නම්බ එක දෙන්න එපා.. විශේෂයෙන්ම ඔයාට කරදරයක් වෙයි කියලා හිතෙන කාටවත් නම්බ එක දෙන්න එපා.."

කෙවින් ආයේම කීවේය. මාරියෝ මේ දෙදෙනාගේ පැමිණීම බලාපොරොත්තුව වෝටර්ස් එජ් හි රැඳී උන්නේය. අගනුවරම නමුත් ඉතා නිසල, රමණීය ස්වභාවික පරිසරයක පිහිටි ඒ දැවැන්ත හෝටලය දුටු ගමන් මෝක්ෂාගේ හිත පැහැර ගත්තේය.

"ඇයි..?"

කාරයෙන් බැස පුදුමයෙන් වාගේ වටපිට බලන මෝක්ෂා ළඟට කිට්ටු වූ කෙවින් ඇසුවේය.

"හරිම ලස්සනයි.. දැක්ක ගමන් ආසාවෙ බෑ.."





මෝක්ෂා ඇත්තම කීවාය.

"මාත් කැමතියි මෙතන්ට.. කොච්චර ආවත් එපා වෙන්නෑ.."

කෙවින් කීවේය.

"ඔයා මේකට නිතර එනවද කේවි.. මොකටද එන්නෙ..?"

මෝක්ෂා ඇසුවාය.

"ත්.. නෑ.. මේ.. අපේ බිස්නස් මීටින් තියෙන්නෙත් මේකෙම තමා.. ඒකයි.."

ඒ උත්තරය දෙන අතර කෙවින් තරමක් කලබල ගතියක් පෑවේය.

"මාරියෝ අද මොනාටද ෂූට් කරන්නෙ..?"

වහා මාරියෝ වෙතට යමින් කෙවින් ඇසුවේ ඒ කලබලය සඟවන්නය.

"අද තියෙන ලොකුම වැඩේ නිව් ඉයර් කැලැන්ඩර්ස්වලට ෆොටෝස් ටික ගන්න එක.. තව අර ෆේස් වොෂ් පේපර් ඇඩ් එකටත් ෆොටෝස් ගන්න ඕනෙ.."

මාරියෝ කීවේය. ඔහුගේ සහායට තව දෙදෙනෙකි. එක් අයෙක් අවුරුදු විසි දෙකක තුනක වයසක උපකරණ සපයන්නාය. ඔහු උදව්කරුවාද ඔහුමය. අනෙක් තැනැත්තිය රූපලාවන්‍ය ශිල්පිනියකි. ඒ මෝක්ෂා හැඩ වැඩ කරන්නය.

පින්තූර ගැනීම ඇරඹිණ. පළමුවෙන්ම අලුත් අවුරුදු දින දර්ශනවලට ඡායාරූප ගැනීමය. මෝක්ෂාට අලංකාර රෙදි හැට්ට ඇන්දවා කොට කොණ්ඩයට බොරු කොණ්ඩයක් යාකොට ගෙලට බැඳ හැඳ පැළඳ එළියට ආ කළ කෙවින් බලා උන්නේ අදහාගන්න බැරිවය.

"මොකද බොස්..? කොහොමද මගෙ තෝරා ගැනීම..?"

මාරියෝ, කෙවින්ට ඇහැක් ඉගිකොට කීවේය.

"මාවලස්.. මට නම් අදහාගන්න බෑ.."

කෙවින් ඇත්තටම සතුටට පත්ව උන්නේය. වෙළඳ දැන්වීම් ආයතනයක හිමිකරුවෙකු වූ කෙවින් නිතර මේ ක්ෂේත්‍රය තුළ ගැවසුණේ නැතිවග හැබෑය. එහෙත් ඔහුගේ ඇස නියම රස දැන උන්නේය. මෝක්ෂා තුළින් පළමුවරට දකින මේ වාම්, සොඳුරු බවට නිරූපණ ක්ෂේත්‍රය තුළ ඉතා ඉහළ වටිනාකමක් ලැබිය හැකි බව කෙවින් දැන උන්නේය.

ඡායාරූප ගැනීම ඇරඹිණ. පැයක් පමණ එකදිගට මෝක්ෂාගේ ඡායාරූප ගත් මාරියෝ ඉඩ ලද විට ඇය හා කතාවට වැටිණ.

"කොහොමද අපේ කේවී..?"

මාරියෝ ඇසුවේය.

"අනේ මාරියෝ.. එයා මේ තරම් හොඳ කෙනෙක් කියල මං කීයටවත් හිතුවෙ නෑ..."

මෝක්ෂා හිතට දැනෙන ඇත්ත කීවාය.

"මං කීයටවත් මිකීට නරකක් වෙන දෙයක් කරනවද..? මේ කොළඹ ජීවත්වෙලා මොඩලින් කරන්න හිතනව නම් ඔය වගේ ලොකු අතක තල්ලුවක් අනිවාර්‍යයෙන් කෙල්ලෙකුට ඕන.. නැත්තං ඉතිං වෙන්නෙ ගෙනාපු දේවලුත් නැති කරන් දවසින් දෙකින් ආපහු ගමට යන්න.. මට නම් කියන්න තියෙන්නෙ මෙච්චරයි.. අතට ආව කුරුල්ලා අතෑරගන්න එපා.."

මාරියෝ කීවේ අවවාදයක අයුරිනි. මේ වනවිටත් මෝක්ෂා ඒ කරුණු අවබෝධ කරගෙන උන්නාය. තමා කොච්චර ලස්සන උනත් මේ ක්ෂේත්‍රය තුළදී ලැබිය යුතු අනුග්‍රහය, රැකවරණය ඇත්තේ





කෙවින් ළඟය. ඒ නිසා ඔහුගේ හිත නොරිදා ඔහු හා බැඳුණු මිත්‍රත්වය ඉදිරියටත් රැක ගන්නට ඇ හිතට ගත්තාය.

"හරි.. චේන්ජ් කරන් එන්න ඊළඟ ෂූට් එකට.."

මාරියෝගේ හඬට අවනත වූ මෝක්ෂා ඉවත ගියේ දුරින් උන් කෙවින්ට මෘදු හිනාවක් පායා.

* * * * * * * * * *

තමාගේ දෑතින් ඉන්දවා රැක බලා ගත් ගෙමිදුල දෙස ශික්ෂා බලා උන්නාය. ගැහැණු චරිතයක් වී ද අක්කා තුළ තිබුණේ පුරුෂාකාර ගතිගුණය. අක්කා කවදාවත් ශික්ෂාට මල් පැළයක් ඉන්දවන්න උපකාරයක් කළේ නැත. ඒත් ඇ පිපුණු මල්වලට ආසා කළාය. අක්කා නැති ගෙදර මහ්කෝටම වඩා පාළුවක් හිතකමක් තමාට බව ශික්ෂාට හිතිණ.

"ට්‍රිං... ට්‍රිං... ට්‍රිං.."

නිවසේ දුරකතනය නාදවේ. ශික්ෂා අක්කා ගැන මතකයෙන් මිදිණ. දින ගණනකට පස්සේ තාත්තා ෆැක්ටරිය පැත්තේ ගිහින්ය. අම්මා විශ්ව නාදන්ලාගේ ගෙදරය. අම්මා තමා එක්ක, තාත්තා එක්ක නොකියා මේ ගෙදරදී හංගා රකින දුක විශ්වනාදන් ගෙදරදී නිදහසේ එළියට දානවා ඇත. ශික්ෂා පැමිණ රිසීවරය කණට ගත්තාය.

"හෙලෝ.."

එහා පස මිනිත්තුවක දෙකක නිහැඩියාවකය.

"නංගෝ.."

මෝක්ෂා කතා කළේ කවදාවත් නැති තරම් සන්සුන් හඬකිනි.

"අක්කා.."



The Reader's Place

ශිෂාට පුදුමය. ඔක්කෝටම වඩා සතුටුය. ඒ හැම එකකටම වඩා දුකය. හිතේ මේ හැඟීම් හැම එකම පිරී තිබිණ.

"ගෙදර කවුරුත් නැද්ද..?"

"නෑ අක්කා.. තාත්ති ෆැක්ටරි එකේ.. අම්මා විශ්ව නාදන් අංකල්ලගෙ ගෙදර ගිහින්.."

ශිෂා කිවාය.

"අක්කි කොහෙද ඉන්නෙ..? ඇයි අක්කි මේ වගේ දරුණු තීරණයක් ගත්තෙ..? අක්කි කොහොමද අම්මිව, තාත්තිව, මාව දාලා යන්න හිත හදාගත්තෙ..?"

ශිෂා ඇසුවාය. අන්තිම වචන ටික පිටවෙද්දී ශිෂාගේ නෙත පිරිණ. සිත බරවිණ. කටහඬ බොඳව ගියේ ඒ හින්දාය.

The Reader's Place

"වෙච්ච දේවල් ගැන දැන් කතා කරලා වැඩක් නෑ නංගෝ.. මගෙ ජීවිතේ ගැන හිතලා.. මගෙ අනාගතේ ගැන හිතලා මං තීරණයක් ගත්තා.. කවදාවත් ඔය බිත්ති හතර අස්සෙ හිරවෙලා ඉඳලා මට මගේ අනාගතේ හදාගන්න බෑ.."

"ප්ලීස් අක්කි... දැන්වත් ගෙදර එන්න.. අම්මියි, තාත්තියි සමාව දෙයි.. ඔයා ගෙදර එන්න අක්කි.."

ශිෂාගේ හිතේ බලාපොරොත්තුවක් පණ ගැසුවේය.

"මං ඉස්සරහට තිබ්බෙ ආපහු පස්සට ගන්න පුළුවන් අඩියක් නෙමේ නංගෝ.. මේ දවස් දෙක තුනට මං කොච්චර දේවල් කරාද කියලා ඔයාට හිතාගන්නවත් බැරිවෙයි.. කවද හරි මං මොබිලින්වලින් නම්බ වන් වෙනවා.."

ශිෂාට නොදැනීම හිතේ බර සුසුමකින් පිටවිය. අක්කා තාමත් එහෙමය. ගෙදරින් ඈත් වුණා කියා ඇ තුළ දුකක් නැත. ආදරය කරන අය ළඟ නෑ කියා පාළුවක්ද නැත. දන්නා කියන කිසිවෙක්





ළඟ නැති රටක ජීවත්වන්න බයක්ද නැත. ආයේ ගෙදර එන්නැයි අක්කාට කියා ඵලක් නැත.

"කොහොමද සස්මිතට එහෙම..?"

මෝක්ෂා හිතට වද දෙන දෙය කෙළින්ම ඇසුවාය. කොළඹ ජීවත් වුණාට, එදිනෙදා වැඩ ටික කරගෙන ගියාට ඇයට සස්මිත සිහි නොවුණ දවසක් නැති තරම්ය. තමා ආදරය නොකළ බව ඇත්තය. ඒත් සස්මිත තමාට අවංකවම ආදරය කළේය. ටික දවසකට උනත් මහ හුඟාක් ආදරය දුන්නේය. ඒ තරම් ආදරයක් විඳ තමාට පමණක් නොවේ වෙන ඕනෑම කෙල්ලෙකුට උනත් පහසුවෙන් අමතක කර දැමිය නොහැකි බව මෝක්ෂා දැන උන්නාය.

"සස්මිත හොඳින් ඉන්නවද නංගෝ..?"

"සස්මිත පව් අක්කි.."

ශිෂාගේ කටහඬ පවා වෙවුලිණ.

"ඒ කොල්ලා මාර දුකක් විඳිනවා.. මට හිතෙන්නෙ අක්කි ඔය හැමදේම අමතක කරලා සස්මිතට අවංකවම ආදරේ උනා නම් හරි කියලා.. තාත්ති උනත් මුලින් විරුද්ධ වෙලා පස්සෙ හරි සස්මිතට කැමති වෙයි.. තාත්තිත් කියන්නෙ සස්මිතගෙ හොඳමයි.. එච්චර හොඳ කොල්ලෙකුට ඇයි අක්කි මෙහෙම කළේ..?"

ශිෂා වේදනාවෙන් ඇසුවාය.

"සස්මිත ගැළපෙන්නෙ මට නෙමේ නංගි.. ඔයාට.."

ශිෂාට දැනුණේ ඇඟ පත පවා පණ නැතිව යනවා වගේය.

"අක්කි.."

"ඔව් නංගි.. සස්මිත වගේ අහිංසක, ගුණ යහපත් කොල්ලෙක් ගැළපෙන්නෙ ඔයා වගේ කෙනෙකුට.. සස්මිතව ආශ්‍රය කරපු ටික

දවසට උනත් මම ඒ කොල්ලගෙ හිත කියෙව්වා.. එයාට තියෙන්නෙ ඔයාට වගේ ගතිගුණ නංගෝ.."

අක්කා නොකීවත් ඇත්ත එයම බව ශික්ෂා දැන උන්නාය. ශික්ෂාගේ ඇස්වල පිරුණු කඳුළු ඉතිරී කම්බුල් හරහා ගැලුවේය.

"මට කිසි දෙයක් හිතාගන්න බෑ අක්කි.."

ශික්ෂා ඉකිගසමින් කීවාය.

"සස්මිත ගැන හොයා බලන්න නංගි.. මං දන්නවා මගෙ අතින් එයාට උනේ ලොකු වරදක්.. පුළුවන් තරම් එයාට ළංවෙලා හිත හදන්න නංගි.."

මෝක්ෂා කීවාය. ශික්ෂා ඉකිබින්දා විතරය. කෙවින් රැගෙන දුන් ජංගම දුරකථනයෙන් ගෙදරට කතා කර අවසන මෝක්ෂා මොහොතක් නිසලව උන්නාය. ගෙදර සිහි නොවුණා නොවේ. දවස පුරා කොයි තරම් කාර්යබහුලව උන්නත් සියල්ල ආපාවෙන් කළත්, ප්‍රින්සි අක්කාගේ නවාතැනට පය තියන හැම රැයකම ආපහු ගෙදර දුවන්නට නොසිතුණා නොවේ. ඒත් මෝක්ෂා හිත හයිය කර ගත්තාය. මේ ඉදිරියට තැබූ පය ආපස්සට ඇද ගන්නා අදහසක් ඈ තුළ කොහොමත් නොවිණි.

* * * * * * * * * *

සැමියාගේ කමිසයක කැඩුණු බොත්තමක් පිළිසකර කරමින් රෝෂණී වැරැන්ඩාවේ හිඳ උන්නාය. දොළ පාර පැත්තේ ඇවිද මිදුල හරහා ආ ශික්ෂා අම්මා ළඟ නතර විය.

"අම්මි.."

ශික්ෂා කතා කළේ සන්සුන්වය. ඇගේ දිගටි සුන්දර මුහුණ දකින වාරයක් පාසා රෝෂණීගේ හිත පත්තුවේ. මේ තමාගේ ජීවිතයේ එක් භාගයකි. අනික් භාගය අද කොහේ ගියාද නැත. අම්මා කෙනෙකුට අතපත ගා ලේකිරි කරදී හදා උස් මහත් කළ





දියණියක ඇස් මානයෙන් ඉවතට විසිව යාම මේ තරම් වේදනාවක් කියා රෝෂණීට මින් පෙර කවදාවත් දැනී නොතිබිණ.

"දැන්වත් ඔය ගොම්මන් වෙලාවට ඇළ පාරවල් ළඟ ගැවසෙන එක නතර කරන්න දෝණි.."

රෝෂණී කීවේ අමනාපයෙන් නොවේ. වේදනාවෙනි. ඉතිරිව ඉන්නා එක දූ සිගිත්තත් අහිමිවේ යැයි බිය දැන් රෝෂණීට අන් කවරදාටත් වඩා හොඳට දැනේ.

"මාත් නැතිවෙයි කියල අම්මිට බයද..?"

ශික්ෂා, අම්මාගේ හිත හැඳිනගෙන සේ කීවාය. රෝෂණී, ශික්ෂාගේ මුහුණ බැලුවේ ඇස් ලොකු කරගෙනය.

"මං කවදාවත් අම්මිව දාලා යන්නෑ අම්මි.."

ශික්ෂා කීවාය.

"උස් මහත් කරපු දරුවෙක් මහ පොළව ගිල්ලා වගේ අතුරුදහන් වෙලා යන එක අම්මා කෙනෙකුට කොයි තරම් වේදනාවක් ද කියලා දරුවො දන්නෑ.. වෙනදා පුරුද්දට කනවා බොනවා තමා.. ඒත් මේ උගුරෙන් පහළට යන මොන දේකටවත් ඇතුළෙ තියෙන ගින්න නිවන්න බෑ.."

රෝෂණී ඇස්වල කඳුළු පුරවාගෙන කීවාය. දැවිල්ල ගත්තේ ශික්ෂාගේ පපුවය.

"අක්කි මට කතා කළා අම්මි.."

අක්කා ගැන ආරංචියක් නොමැතිවීම අම්මාගේ හිතට වේදනාවක් බව ශික්ෂාට තේරිණ.

"කතා කළා..? කවදද..?"

රෝෂණී කලබලයෙන් ඇසුවාය.

"ඊයෙ.."

"ඉතිං මට කිව්වෙ නැත්තෙ..?"

"අක්කි ගැන කතා කරන එක අම්මිට වේදනාවක් වෙයි කියල මං හිතුවෙ.."

යිෂා තමාගේ අතපසුවීම අඳුනාගෙන උන්නාය.

"අක්කි කතා කළේ සතුටින්.. එයාට එහේ ගොඩක් හොඳයි කියල තමා තේරුණේ.."

"පිස්සු වැඩ.. ඔය ඔක්කොම අතෑරලා ගෙදර එන්න කිව්වෙ නැද්ද..? තාත්ති තරහට කෑගැහුවට කවදාවත් දරුවෙකුට අහක් උස්සන්නෑ.. ඇයි අක්කිට ගෙදර එන්න කිව්වෙ නැත්තෙ..?"

"මං කිව්වා.. අම්මි හිතන්නෙ මට අක්කිව ඕන්නෑ කියලද..? එදා ඉපදුන දවසෙ ඉඳල උන්නෙ මා එක්ක.. එය ගෙදරින් පැනල ගිය දවස වෙනකන් අපි පැය විසි හතරම උන්නෙ එකට.. අම්මිට තාත්තිට වඩා අක්කි නැති අඩුව දැනෙන්නෙ මට අම්මි.."

යිෂාගෙ නෙතින් කඳුළු ඉතිරිණ.

"දෝණී.."

රෝෂණී මැහුම් පැත්තක තබා නැගිට දියණියගේ උරහිසට අතක් තැබුවාය.

"අක්කි දැන්ම ගෙදර එන්නෑ අම්මි.. එයා කිව්වෙ පටන් ගත්තු ගමන ආපහු හැරෙන්න බෑ කියලා.."

යිෂා හඬාගෙනම රෝෂණීගේ උරහිසේ එල්ලිණ.

"අකීකරු දරුවා.. අපි එයාට කොච්චර ආදරේද කියලා එයා දන්නෙ නෑ.. එයාට තාම සහෝදරීගෙ, දෙමාපියන්ගෙ ආදරේ තේරුන්නෑ.."





රෝෂණීගේ කටහඬේ ගිත උපන් වේදනාබර කෝපයක් තැවරී තිබිණ. ඇ බාල දියණියගේ හිස අත ගෑවේ යිෂා තුවා කළ සිටම සහෝදරියට වඩා තමන්ගේ දෙමව්පියන් ගැන, පවුල ගැන, ගෙදර ගැන හිතූ දරුවෙකු බව සිහිපත් කරමිනි.

* * * * * * * * * *

මෝක්ෂා හිතින් දහස් වතාවක් ගෙවීගිය දවස් කීපයට කෙවින් හා සස්මිතව සසඳන්නට ඇත. රූපය අතින් බැලුවත් කෙවින්, සස්මිතට වඩා ඉස්සරහින්ය. සස්මිත කඩවසම් බව හැබෑය. නමුත් කෙවින්ගේ බාහිර රූපයේ ඊට වඩා බැබළීමක් තිබිණ. ඔහු අඳින පළඳින විටිනා කියන දේවලත්, අලුත් තාලයට හිසකේ පීරන රටාවත්, ළඟින් විහිදෙන විලවුන් සුගන්ධයත් ආකර්ෂණීයය. කතාබහ, ගමන බිමන පවා රටාවකටය. මෝක්ෂාගේ හිතින් සස්මිත කෙරේ යම් බැඳීමක් විණිද ඒ බැඳීමත් ඉවත පා කර හරින්නට කෙවින්ගේ මේ ආකර්ෂණීය ගතිපැවතුම් හේතුවක්ව තිබිණ.

"හවස මොකද කරන්නෙ..?"

කෙවින්, මෝක්ෂාගෙන් ඇසුවේ දින ගණනක් අහන්නට පුළ පුලා උන් ප්‍රශ්නයකි. මෝක්ෂා කාන්තා පත්තරයක පින්තූර කතාවකට ඡායාරූප ගැනීම අවසන් කොට උන්නාය. දවස නිමුණේ ගෙවෙන්නට ආසන්නවය.

"ලොජ් එකට ගිහින් නිදාගන්නවා.."

මෝක්ෂා කීවාය.

"අයියෝ බබා.. ඔයත් හරියට මොන්ටිසෝරි පැටියෙක් වගේනෙ.. වැඩ ඉවර වෙච්ච ගමන් හැමදාම ඒ කාමරේට රිංගන්න ඕනද..? ගෑනු ළමේකුට.. ඔයා වගේ තරුණ ළමේකුට හවසට කරන්න කොයි තරම් දේවල් තියෙනවද..? ආව දවසෙ ඉඳලා වැඩ කළා මිසක්.. ඔයා තාම හරියට මේ කොළඹ ලස්සනවත් දැක්කෙ නැතෙ.."

කෙවින් උන්නේ මෝක්ෂාගේ කෙහෙරැළි අතැඟිලිවල පටලා ගනිමිනි.

"මං නාම මෙහෙ කවුරුවත් දන්නැනෙ කේව්.."

මෝක්ෂා දුක්බරව කීවාය. ඇත්තටම තමා තවමත් මේ ක්ෂේත්‍රයට පය තිබ්බා විතරය. හදිසියකට රැයක් පහන් කරන්නවත් දන්නා කියන තැනක් නැත. හදිසියකට බෙහෙත් ටිකක් ගන්න දොස්තර කෙනෙක් හම්බවෙන්න යන්නවත් ළඟ කෙනෙකු නැත.

"වෙන කවුරුවත් ඔයාට මොකටද බබා.. මං ඉන්නෙ.. ඔයා කිසි දේකට බයවෙන්න එපා.. හැමදේටම මං ඉන්නවනේ.. අපි රෑට ක්ලබ් එක පැත්තෙ ගිහින් ෆන් එකක් අරගමු.. මොකද ඔයා කියන්නෙ..?"

The Reader's Place

කෙවින් ඇසුවේය.

"අනේ මන්දා.."

මෝක්ෂා දෙපැත්තට ඇද්දාය. ඇගේ සිත ආශාවත් බයත් අතර නතරව තිබිණි.

"ඔන්න ඉතිං මට ගණින් උස්සනවා.. මං හිතා උන්නෙ මගෙ යාළුවො සෙට් එකට ඔයාව ඉන්ට්‍රඩියුස් කරල දෙන්න.. බැයි නම් කමක් නෑ.. ඒ කියන්නෙ ඔයාට මාව විශ්වාස නෑ කියන එකනෙ.."

කෙවින් මුහුණට දුක්බර බවක් ආරූඪ කර ගත්තේය.

"මං එන්නංකො.."

මෝක්ෂා දෙවරක් හිතුවේ නැත. කෙවින්ගේ හිත රිදවන්නට බැරිකමක් මෝක්ෂාගේ හිතට දැනිණ.

"මාරියෝ.."

කෙවින් ඇරුණකොට මෝක්ෂාට දුකට සැපට දෙකට හිටිය





හිතවතා මාරියෝය. මෝක්ෂා, මාරියෝ ළඟට ගියේ තමා කරන්නේ හරිදේමදැයි තේරුම් කරගන්න බැරිවය.

"යස් ඩාලිං.."

මාරියෝ උන්නේ දුලිප් එක්ක කතාවකය. දුලිප්, මාරියෝගේ අත් උදව්කරුවාය. තවමත් අවුරුදු දහ අටක්, විස්සක් වයස දුලිප් පෙනුමින් බොහෝ සියුමැලිය. කෙසග සිරුර, ගමන බිමන, කතාබහ නැකම් තිබේ රූබර ගැහැණු චරිතයකට මිස යෞවනයෙකුගේ හැසිරීමකට නොවේ.

"කෙවින් හවස මට ඇවිදින්න යන්න කතා කළා.."

මෝක්ෂා කීවාය.

"රියලි.. වට් අ සප්‍රයිස්.. මයි කන්ග්‍රැජුලේෂන්ස් ඩියර්.."

මාරියෝ, මෝක්ෂා වැළඳ කම්මුලක් සිප කීවාය. සමීපතම යෙහෙළියක තමා වැළඳ දෙන හාදුවකට වඩා වැඩි යමක් ඒ ස්පර්ශයෙන් මෝක්ෂාට නොවිණ.

"ඒක ඒ තරම් සතුටුවෙන්න දෙයක්ද..?"

නොහිතාම මෝක්ෂාට ඇසිණ.

"අයියෝ මෝඩ කෙල්ල..මේ බලන්නකො දුලී.. මේ කෙල්ලට කෙවින් හවස ඇවිදින්න යන්න කතා කරලත් මෙකී ඒකෙ තියෙන ලක් එක දන්නෑ.."

මාරියෝ, දුලිප්වත් කතාවට හවුල් කර ගත්තේය.

"කෙවින් විජේන්ද්‍ර කිව්වම ලේසිපාසු කෙනෙක් කියලද හිතේ.. විජේන්ද්‍ර ග්‍රෑප් එකේ උරුමක්කාරයා.."

දුලිප් ඇස් නටවා කීවේය.

"ඒක නේන්නං... මෝක්‍ෂා දන්නවද කෙවින් වගේ විසි කරන්න සල්ලි තියෙන හැන්ඩ්සම් ලුක් එකක් තියෙන කොල්ලෙක්ගෙ කරේ එල්ලෙන්න බලාගෙන කොච්චර කෙල්ලො පොර කනවද කියලා.. ඌ ඔය ඔයා වගේ කැරතුණාට මේ මොඩ්ලින් කරන කෙල්ලො කී දෙනෙක් කේවිගෙ ඇස් දෙක අල්ල ගන්න දඟලනවද..?"

මාරියෝ තේරුම් කළේය.

"කොහොමත් මං හවස එන්නං කියල කේවිට පොරොන්දු උනා.."

මෝක්‍ෂා කීවාය.

"ගුඩ් ගර්ල්.. ඔයා දැන් පය ගහල තියෙන ෆීල්ඩ් එකේ හැටියට ඔයාට හැඩ ගැහෙන්න වෙනව මිකී.."

The Reader's Place

මාරියෝ කීවේය. මාරියෝ කියන්නේ ඇත්ත බව මෝක්‍ෂා තේරුම් ගෙන උන්නාය. මේ ටික දවසකට කෙවින්ගෙන් ලැබුණේ අඩුවෙන් තක්සේරු කළ හැකි සහායක් උපකාරණයක් නොවේ. කොයි පැත්තෙන් බැලුවත් කෙවින්ව තරහා කරගෙන බැරිය. මාරියෝ කියන්නා වාගේ කෙවින් තරම් සල්ලිකාර, හැඩකාර කොල්ලෙකුගේ අතේ එල්ලී සමාජය ඉදිරියට යන්නට ආසා නොකරන කෙල්ලෙක් වේ යැයි හිතන්න අමාරුය. අනෙක් අතට මේ වන විට මෝක්‍ෂාගේ හිත තිබුණේ ඈ ළඟ නොවේ. ඈ තාමත් ඒ බව නොදැන උන්නාට ඇගේ හිත තිබුණේ කෙවින් විජේන්ද්‍ර ළඟය.

* * * * * * * * * *

මෝක්‍ෂා අත්පටි රහිත ඉතා කෙටි ගවුමකින් රාත්‍රී කාලය සඳහා සැරසුණාය. රතු පැහැති ඒ ගවුම වාගේ අලුත් පන්නයේ ඇඳුම් පැළඳුම් දැන් මෝක්‍ෂාට ඕනෑ තරමය. නිරූපණ ක්ෂේත්‍රයේ ඈ උපයන හැම සතයම අත දිග හැර සිරුර හැඩ කරන





රූපලාවන්‍යාගාරවලටත්, දකින දකින ඇඳුම් ආයිත්තම්වලටත් නිදහසේ වියදම් කළාය.

පොරොන්දු වූ වේලාවට හරියටම කෙවින්ගේ කාරය ප්‍රින්සි අක්කාගේ ලොජ් එක ඉදිරිපිට නතර විය. ලැසි ගමනින් පැමිණ කෙවින්ගේ කාරයට ගොඩවූ මෝක්‍ෂා දෙස ප්‍රින්සි බැලුවේ යටැසිනි.

"යූ ආ සෝ බියුටිෆුල් මිකී.. අයි ලව් යූ.."

කෙවින් කීවේ මෝක්‍ෂාගේ කම්මුලක හාදුවක් තවරමිනි. මෝක්‍ෂා ගැස්සී ගියාය. ඒ අන්තිමට කී වචන තුන කෙවින්ගේ ජීවිතය තුළ උදේට හවසට කරන සුබ පැතීමක් තරමට සාමාන්‍ය දෙයක්ව තිබුණ බව මෝක්‍ෂා නොදැන උන්නාය. ඈ හිතුවේ බලාපොරොත්තු උන විදිහමට කෙවින් තමාට ආදරය කරන බවය.

"අපේ කෙල්ලො කොල්ලො ටික ඔයාගෙ ලස්සන දැකලා ඉරිසියාවෙ පැලෙයි.. උන් බලයි ඔයාව මඩවන්න.. උන් මං ගැන කියන මුකුත් ඔයා සීරියස්ලි ගන්නෙපා බබා.."

සුදු දිගු දෙපා නිරුවත්ව හිඳ ඉන්නා මෝක්‍ෂා දෙස අනුරාගී බැල්මක් හෙලා කෙවින් කීවේය. ඔහු මෝක්‍ෂාව රැගෙන ගියේ සුපිරි පන්තියේ රාත්‍රී සමාජ ශාලාවක් වෙතය. කෙවින් විජේන්ද්‍රව ඉතා උණුසුම්ව පිළිගත් සෙස්සෝ මෝක්‍ෂා දෙස බැලුවේ විමසුම් ඇස්වලිනි.

"මෙ මිකී.. මොඩ්ලින් ෆීල්ඩ් එකේ පායපු නිව් ස්ටාර්.. හැබැයි නිව් ස්ටාර් කවද හරි සුපර්ස්ටා වෙනවා ෂුවර්.."

කෙවින්, මෝක්‍ෂාව අඳුන්වා දුන්නේ ආඩම්බරයෙනි. වට කරගෙන අතට අත දුන් හැම පිරිමි ඇහැකම ගිජු බවකුත්, විවිධ ඇඳුමින් සැරසී උන් හැම ගැහැණු ඇහැකම ඉරිසියාවකුත් මෝක්‍ෂා පැහැදිලිව දුටුවාය.

"ඔයා මොනාද බොන්නෙ බබා..? වයින් ටිකක්..? රම් ටිකක්..? මොනා උනත් කමක් නෑ කියන්න..?"

විස්කි වීදුරුවක් අතට ගනිමින් කෙවින් ඇසුවේය. මෝක්ෂාට කෙවින්ගේ හැසිරීම ගැනවත් ඔහු ඇසූ ප්‍රශ්නය ගැනවත් අමුත්තක් නොතිබිණි. මේ ඔහු උපන්දා සිට හැදුණු වැඩුණු ක්‍රමයයි. ඒ සමාජ ක්‍රමයට මේවා අලුත් දේ නොවේ.

"මුකුත් එපා කේවී.."

ඇත්තටම මෝක්ෂා ඒ වනතුරුත් මත්වන කිසිවක් තොලගා නොතිබිණ. තමාට තමාගේ පාලනය නැතුව යාවියි බියෙන් මෝක්ෂා නුහුරු බිමකට කට තබන්නට බය වූවාය.

"අයියෝ බබා.. රම්, වයින් කියන්නෙ ලේඩීස් ඩ්‍රින්ක්ස්නේ.. ඔයාට පේනවද මේ අපේ කෙල්ලො විස්කි පවා බොනවා.."

කෙවින් කීවේ ඇත්තය. සැම කෙනෙකුගේම වාගේ අත්වල මධුවිත පිරි වීදුරුය. මෝක්ෂා ඉදිරිපිට උන්නේ ඇ බොහෝ විට ටෙලි නාට්‍යවල වෙළඳ දැන්වීම්වල නිතර දැක පුරුදු යුවතියන්ගේ මුහුණුය. ඔවුන් මෙන් හැඩ ගැහෙන්නට මෝක්ෂා තුළ අකමැත්තක් නොවිණ. තිබුණේ නුහුරු බවක් පමණි. කුඩා කළ සිට තාත්තාගේ නීති රීති එක්ක වැඩුණු මෝක්ෂාට ගෙදරින් නිදහස්ව ඉගිල ගියද මේ ආගන්තුක සමාජය එකවරම පැන වැළඳ ගන්නට නුහුරු ගතියක් හිතට දැනිණි.

"එහෙනම් යංද ඩාන්ස් කරන්න..?"

කෙවින් ආයෙම ඇසුවේය. වේග රිද්ම ගීයකට අනුව බොහෝ පිරිසක් එක්ව නටති.

"ඔයා යන්න කේවී.. මං මෙහෙන් ඉන්නං.."

කෙවින් බල කරන්නට ගියේ නැත. ඊට වඩා ඇයව පොළඹවා ගන්නා ක්‍රමය කෙවින් දැන උන්නේය. මේ රැය ගෙවෙන්නට පෙර මෝක්ෂා ප්‍රතික්ෂේප කළ මේ සියල්ල තමාගේ කැමැත්තෙන්ම වැළඳ ගන්නා බව කෙවින්ට විශ්වාසය. මත්පැන් වීදුරුව තොල





ගාමින් යුවතියන් රැනක් මැදට ගිය කෙවින් උන් තුරුළ කරගෙන නැටුවේය. ඇත්තටම කෙවින් බලාපොරොත්තු වූ ලෙසම මෝක්ෂාගේ හිතේ ඉරිසියාවක් ඉපදිණ. කෙවින් වටා රඟන කෙල්ලන් දෙස ඇ බැලුවේ ඒ ඉරිසියාව ඇස්වල තවරාගෙනය.

"මිකී.."

මෝක්ෂා ඒ හඬට හැරී බැලුවාය. කොටම කොට කලිසමක් හැඳගත් රුවැති කෙල්ලක් මෝක්ෂා ළඟය. ඇගේ අතේ වොඩ්කා වීදුරුවකි.

"මං ජෙසී..."

ජෙසී, මෝක්ෂා දෙසට අත දිගු කළාය. ජෙසීගේ අතට අත දුන්නද ජෙසී බොහෝ වේලාවක් තිස්සේ තමා දෙස බලා උන් බවක් මෝක්ෂා දැන උන්නේ නැත. ඒත් ජෙසී, මෝක්ෂාට කිට්ටු වූයේ ඇගේ ඉරියව් හැම එකම හොඳින් නිරීක්ෂණය කර අහවරවූ විටය.

"මිකී, කේවිගෙ කවුද..?"

ජෙසී සාජුව ඇසුවාය.

"මං එයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්.."

මෝක්ෂා ආඩම්බරයෙන් කීවාය. සෙස්සන්ට තමාව මිකී කියා හඳුන්වා දුන්නා මිසක කෙවින් තමාත්, මෝක්ෂාත් අතර ඇති නෑකමක් ගැන කාටවත් කීවේ නැත. ඒත් ඔහු කාරයට නැගි මොහොතේම කම්බුලක් සිප අයි ලව් යූ කීවේය. මෝක්ෂා හිතා උන්නේ ඒ එකම වාක්‍යය තමන්ට කෙවින්ගේ ලෝකය තුළ පෙම්වතියකට හිමි සියලු හිමිකම් පවරා දුන් බවය.

"ඔයා එයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලගෙන් එක්කෙනෙක් විතරයි මිකී.. කෙවින්ට ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලා ඕන තරම්.."



The Reader's Place

යුවතිය තට කොණකින් හිනැහී කීවාය.

"කෙවින්ට කොච්චර ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලා හිටියත් මට කමක් නෑ.. එයා මට අයි ලව් යූ කියල ඉවරයි.."

මෝක්ෂා ආඩම්බරයෙන් කීවාය.

"කෙවි වගේ කොල්ලෙකුට අයි ලව් යූ කියන එක උදේට කවුරු හරි මූණට හම්බ වුණහම ගුඩ් මෝනින් කියන එක තරම් සාමාන්‍ය දෙයක් කියලා මිකී දන්නවද..?"

ජෙසී අනුකම්පාවෙන් වගේ කීවාය. මෝක්ෂාගේ හිත රිදුණි.

"මොනවා කිව්වත් කලත් එයා කවද හරි මාව මැරි කරයි.."

කෙවින්ව අයිති කර ගැනීමේ පැතුමක් මෝක්ෂා තුළ තිබිණ. ඒ හින්දා ඇය නිර්භයව කීවාය.

"ඇත්තට.. මං ඔයාට විෂ් කරනවා.. ඒත් මිකී, කෙව්ව අයිති කර ගන්න නම් ඔහොම පැත්තකට වෙලා බලා ඉඳලා බෑ.. පේනවනෙ කී දෙනෙක් කෙව්ව අයිති කරගන්න පොරකනවද කියලා.. අනික කෙවීට මැච්වෙන්නෙ එයත් එක්ක කරට කර ගන්න පුළුවන් කෙල්ලෙක්.."

මෝක්ෂාට ඒ අවවාදය දී ජෙසී පිරිස අතර අතුරුදන් විණ. මෝක්ෂාගේ හිතට ඒ අවවාද ටික හොඳින් ගැලපිණ. වහා කෙවින් වටකොට උන් කෙල්ලන්ව අතරට ගිය මෝක්ෂා ඔහු අත තිබූ මත්පැන් වීදුරුව එක හුස්මට ගිල දමා නටන්නට පටන් ගත්තාය. මෝක්ෂාගේ මේ ප්‍රතිචාරය කෙවින් බලාපොරොත්තු වුවත් වුණත් මේ තරම් ඉක්මණට එය සිදුවේ යැයි ඔහු නොසිතුවේය.

"මං හිතුවට වඩා ඔයා ෆෝවර්ඩ් කෙල්ලෙක් මිකී.."

මෝක්ෂාගේ කණට කොට කියූ කෙවින් ඇගේ බඳ හරහා අතක් යවා තුරුළු කොට ගත්තේය. මෝක්ෂාට දැනුණේ හැම



The Reader's Place



යුවතියකගේම දැස ඉදිරිපිට තමා ජයගත් බවය. මත්පැන් ගත් පළමු දවස උනත් වීදුරුව එක දෙක වී මෝක්ෂා බමන මතින් ශරීරයේත් ලේයත්, සංගීතයත් මෝරා ආවෙත් එකවිට වගේය.

"මිකී.. ඔයාට වැඩී ඩාලි.. මටත් ටිකක් වැඩි.. අද අපි මෙහෙ කොහෙ හරි නතරවෙමු.."

කෙවින් කීවේය. මෝක්ෂා අවනත විය. කෙවින්ගේ ඇගේ එකී හෝටල් කාමරයකට රිංගා ගන්නා විට මෝක්ෂා පසුවූයේ අලුතුම ලොවකය. ඒ ලොවේ රජු කෙවින් වූ අතර තමා ඔහුගේ අග රැජිණ බව ඇය විශ්වාස කළාය.

* * * * * * * * * *

රාජිත වරුසප්පෙරුම උන්නේ හිතේ නොසන්සුන්කමෙනි. කරදර එන්නේ එකපිට එකය. එහෙන් ගෙදර දරුවාගේ ප්‍රශ්නයයි. අනෙක් පැත්තෙන් දැන් ෆැක්ටරියේ ප්‍රශ්නයකි. රාජිත උදේ නැගිට්ට වෙලාවේ සිද කාර්යාල කාමරයට රිංගා ගෙන දස අතේ කල්පනාවකය.

"ජයි.."

රෝෂණී තේ කෝප්පයකුත් හදාගෙන රාජිතට ළංවිය. ශික්ෂා උන්නේ වැරණ්ඩාවේ පොතක් බලමිනි. ඇයට අම්මා, තාත්තා දෙන්නා පෙනුණා විතරක්ම නොවේ ඔවුන්ගේ කතාබහ ද හොඳටම ඇසිණි.

"උදේ නැගිට්ට වෙලාවෙ ඉඳලා කල්පනාව.. දැන් ඉතින් ඕක අමතක කරලා හිත හදාගන්න අනේ.. අපේ දරුවා උනත් ගෙදරින් ගියේ එයාගෙ ඕනකමටනේ.."

රෝෂණී කීවාය. කෙලින් නොකීවාට මෝක්ෂා ගෙදරින් හිතුවක්කාරයට පිටව යාම ගැන සැමියා වද වේදනා විඳිනැයි රෝෂණී අනුමාන කළාය. ඈ වද වූයේ සැමියාගේ ශරීර සනීපය

ගැනය. ඕනෑවට වඩා කල්පනා කරන්නට ගිහින් සැමියා හෘදයාබාධයක් හදාගන්නට පුළුවන.

"කෙහෙල්මල.. ගිය එකා යකාට ගියාවෙ.. මට ඒ ගැන ප්‍රශ්නයක් නෑ.. මං මේ වදවෙන්නෙ ෆැක්ටරි එක ගැන.."

රාජිත කීවේ නුරුස්නා හඬිණි.

"ඇයි ෆැක්ටරි එකේ තියෙන ප්‍රශ්නෙ මොකක්ද..?"

රෝෂණී පුදුමයෙන් ඇසුවාය. බල බලා සිටිය පොතේ පිටුවෙන් ඇස් මුදාගත් ශික්ෂාත් තාත්තා දෙස බැලුවේ පුදුමයෙනි.

"තාම නම් ප්‍රශ්නයක් නෑ.. ඒත් මට හිතෙන්නෙ හෙට අනිද්දා මට ඒක මැනේජ් කරන එකත් ලොකු ප්‍රශ්නයක් වෙයි.."

රාජිත කීවේය.

"ඇයි අනේ..?"

රෝෂණී කුතුහලයෙනි.

"සස්මිත රස්සාවෙන් අස්වෙන්න හදනවා.."

"නැහ්..!"

රෝෂණීගේ ඇස් උඩ ගියේය. කට ඇරිණි. ඊටත් වඩා සසලව ගියේ ශික්ෂාය. සස්මිත ඒ වාගේ තීරණයක් ගනීවියි ඇ කොහොමවත් හිතුවේ නැත.

"මොකද මේ හිටපු ගමන්..?"

රෝෂණී, සැමියාගෙන් ඇසුවේ පහව නොගිය පුදුමයෙනි.

"ඒක තමා මටත් හිතාගන්න බැරි.. ඇහුවට කෙලින් හේතුවක් කියන්නෙත් නෑ.. හැබැයි දැන් ටික දවසක ඉඳලා ඉන්නෙ ලොකු හිතේ අමාරුවකින් කියල පේනවා.."





රාජිත කීවේය.

ශික්ෂාගේ හිත පත්තු විය. සස්මිතගේ හිත කියවන්නට දන්නේ නම් තාත්තා හැබෑවටම දුකට පත්වෙනු නියතය.

"ඉතිං ඇයි මේ ගහෙන් ගෙඩි එන්න වගේ හදිසියෙම ඒ ළමයා අස්වෙන්නෙ..?"

රෝෂණී කතා කළෙත් කම්පාවෙනි.

"ඒකම තමා මටත් හිතාගන්න බැරි.."

"ඇයි ඔයා ඒ ළමයගෙන් අහල බැලුවෙ නැද්ද..?"

"ඇහුවට කෙලින් උත්තරයක් දුන්නෙ නෑ.."

"කරදර එනකොට එන්නෙ එකපිට.."

රෝෂණී කීවේ රාජිතගේ හිත කියෙව්වා සේය. ඕනෑම අවස්ථාවක බිරියට තමන්ගේ හිතේ තත්වය අවබෝධ කර ගන්නට පුළුවන්කම තිබිණි. රාජිත බිරිය දෙස බැලුවේ ගෞරවය පෙරදැරි කරගත් දයාවකිනි.

The Reader's Place

"සස්මිත මං හිතන්නෙ පෙර ආත්මෙක අපේම කෙනෙක් කියලා.. වැඩ බාර අරන් ගෙවිල ගිය මාස ගාණට එයා ෆැක්ටරි එක නග්ගලා ගත්තා.. කවදාවත් එයා මේ දේවල් පිට ඒවා කියල හිතුවෙ නෑ.. හැමදේම කළේ තමන්ගෙ දෙයක් රැක බලාගන්න තරම් පරිස්සමින්.. ඇත්තටම සස්මිත ඒ වැඩ කරපු විදිහට මං හිතුවෙ එයා රිටය වෙන වයස වෙනකම් අපේ එස්ටේට් එකේ වැඩ කරයි කියලයි.. දැන් හදිසියෙම ගෙදර යන්න හදද්දි මට කිසි දෙයක් හිතාගන්න බෑ.."

තාත්තාගේ මේ වචනවල තිබූ වේදනාව ශික්ෂාට දැනිණ. 'සස්මිත මම හිතන්නෙ පෙර ආත්මෙක අපේම කෙනෙක් කියලා..' තාත්තාගේ මේ වචන ඔක්කෝටම වඩා ශික්ෂාගේ හිතට තදින් කා වැදිණ. ඇගේ උගුර සිරවුණේ හිතේ දුකටය.

'මං ඔයාට යන්න දෙන්නෑ සස්මිත.. මං දන්නවා ඔයාගෙ බිඳිච්ච හිත හදන්න මට බැරිවෙයි.. ඒත් අඩුම තරමෙ ඒ වේදනාව අඩු වෙනකම්වත් මං ඔයාට යන්න දෙන්නෙ නැහැ..' ශික්‍ෂා තීරණයකට ආවාය. මේ තීරණය ගන්නට ඇගේ හිත තුළ සස්මිත කෙරේ වූ ආදරය සේම ඔවුන්ගේ ජීවිත වටා පැටලී ඇති තත්වයත් හේතු විය.

'සස්මිත වගේ අවංක කොල්ලෙක් ගැළපෙන්නෙ ඔයා වගේ අහිංසක කෙල්ලෙකුට නංගි..' අක්කා මෝක්‍ෂාගේ මේ වචනද ශික්‍ෂාට අමතක නැත. 'තාත්තා හිතුවා හරි.. සස්මිත අපේම කෙනෙක්.. එයා අයිති මෙහෙට.. වරුසප්පෙරුම එස්ටේට් එකට.. වරුසප්පෙරුම ෆැමිලි එකට..' ශික්‍ෂා තීරණය කළාය. ඒ තීරණය ඇගේ සිත් දුක වසා සියුම් සතුටක් ඉහිරෙව්වේය.

* * * * * * * * * *

රැකියාව ලබා වරුසප්පෙරුම එස්ටේට් එකට ආවේ ජීවිතය අලුතින් පටන් ගන්නය. එහෙත් සස්මිත බොහොමට ඔහු ප්‍රාර්ථනා කළ තරම් ජීවිතය කාරුණික නොවිණ. බිඳුණු හිතින් රැකියාව අවංකව කරන්නට තවදුරටත් සස්මිතට හිත හදාගන්න අපහසුය. ඔක්කෝටම වඩා ශික්‍ෂාගේ මූහුණ දැක දැක ඇයට ආදරය කළ හිතින් මෝක්‍ෂා කළ රැවටීම සිහිපත් කර කරා මේ පරිසරයේ ජීවත්වෙන එකත් අමාරුය. සස්මිත රැකියාවෙන් අස්වී යළි ගමට යන්නට තීරණය කළේ ඒ හින්දා මිසක හිතේ කැමැත්තෙන් නොවේ. ඇත්තටම ඔහුට වෙන කරන්න දෙයක් නොතිබිණ.

"සස්මිත මහත්තයා.."

චන්දන කාමරයට එබිණ. සස්මිත උන්නේ ඇඳේ හාන්සිවී සිවිලිම දිහා බලා කල්පනාවකය.

"මහත්තයව හම්බවෙන්න කෙනෙක් ඇවිත්.."

"කවුද..?"





සස්මිත ඇඳුවේ කලබලයෙනි. අමුත්තකු එතත් එන්නේ ෆැක්ටරියටය. නිල නිවසට කිසිවෙක් ඒ යැයි හිතන්න අමාරුය.

"කවුද චන්දන..?"

සස්මිත නැවත වරක් ඇහුවේ චන්දන පිළිතුරක් දෙන්නට මොවූ නිසාය.

"ගිහින් බලන්නකො.."

හිස නටවා කියා චන්දන පෑ අමුතු හිනාවේ තේරුමක් සස්මිතට නොවිණ. වේලාව සවස හතය. පරිසරය අඳුරේ ගිලෙමින් තිබිණ. මේ වාගේ වෙලාවක මූණ ගැහෙන්නට එන අමුත්තා කවුද..? සරමට උඩින් ටී ෂර්ටයක් අඳිමින් සස්මිත ගෙයින් එළියට බැස්සෙ කුතුහලයෙනි.

"ම්.. මොකා..!"

සස්මිතට අඳුනාගන්නත් අමාරුය. ශික්‍ෂා - රාජිත වරුසප්පෙරුමගේ දියණිය මිදුලේ ගල් බංකුව මත හිඳගෙනය.

"ශික්‍ෂා.."

සස්මිතගේ හඬින් ශික්‍ෂා කල්පනාවෙන් මිදිණ. එහෙත් කෙලින් සස්මිතගේ දෑස දෙස  බලන්නට බැරි ගතියක් ශික්‍ෂා තුළ තිබිණ.

"කරදරයක් කළා නම් සමාවෙන්න සස්මිත.. මට ටිකක් කතා කරන්න ඕනෑ.. ඒකයි ගෙදෙට්ට හොරෙන් ඇළ පාරෙන් මෙහාට ආවෙ.."

ශික්‍ෂා සෙමින් කීවාය.

"ඒකට කමක් නෑ ශික්‍ෂා.. අපි කතා කරමු.."

සස්මිත ගල් බංකුවේ මෙහා කෙලවරට බරවිය.



The Reader's Place

"තාත්තිගෙන් ආරංචි උනා ඔයා අස්වෙලා ගමට යන්න හදනවා කියලා.."

ශික්‍ෂා ගෙල ඇලකර සස්මිත දෙස බැලුවාය.

"ඔව්.."

සස්මිත කීවේ අහක බලාගෙනය. හැඟීමක් නැති ගානටය.

"ඇයි සස්මිත එහෙම තීරණයක් ගත්තෙ..?"

"ඔයා මගෙ තත්ත්වය හොඳටම දන්නවා ශික්‍ෂා.. තවත් මට හිත එකඟ කරන් මෙහෙ රස්සාව කරන්න බෑ.."

"වෙච්ච දේවල්වලින් ඔයා ලොකු වේදනාවක් වින්ද කියලා මං දන්නවා සස්මිත.. ඒත් මං ඔයාට වඩා වේදනාවක් වින්දා.. හැමදේම අමතක කරලා හිත හදාගන්න මට පුළුවන් නම් ඔයාට බැරි ඇයි..?"

ශික්‍ෂාගේ කටහඬ වෙව්ලුවාය.

"මං එදත් ඔයාට කිව්වෙ.. හැමදේම අමතක කරලා හිත හදාගන්න මාත් කැමතියි කියලා.. එදා වැඩ බාර ගන්න ඉස්සරෝම මේ පාර දිගේ ආව හැනින් ජීවිතේ ආපහු පටන් ගන්න පුළුවන් නම් මං කැමති කියලා.."

සස්මිත කතා කළේත් වේදනාවෙනි. රැකියාව හැර යන්න තීරණය ගත්තේ හිතේ කැමැත්තෙන් නොවේ. වෙන කරන්න දෙයක් නැති කමටය. ගමට නොවේ කොහේට ගියත් ශික්‍ෂාට බැඳුණු සිත ගලවා ගන්නා එක අමාරු බවක් සස්මිත හොඳින් තේරුම් ගෙන උන්නේය.

"ඉතිං ඇයි එහෙම කරන්නෙ නැත්තෙ..? ඇයි ජීවිතේ අලුතින් පටන් ගන්නෙ නැත්තෙ..?"

"ශික්‍ෂා.."





සස්මිත. ශික්‍ෂා දෙස බැලුවේ පුදුමයෙනි.

"ඔයාට පුළුවන් එදා පළවෙනියට වැඩ බාරගත්ත දවසෙ ඉඳලා ජීවිතේ අලුතින් පටන් ගන්න.. හැමදේම අමතක කරලා අද පළවෙනි දවස කියලා ජීවිතේ පටන් ගන්න.."

ශික්‍ෂා තේරුම් කළාය.

"ප්ලීස් ශික්‍ෂා.. තේරුම් ගන්න.. ඒ ටික මට කරන්න පුළුවන්.. ඒත් මං කොහොමද ඔයා කියල හිතාගෙන මෝක්‍ෂාට ආදරේ කරලා ඒවටුණ හිත ආපහු මුලට ගෙනියන්නෙ.. මං කිව්වෙ මට ආපහු මේ එස්ටේට් එකට ආව දවසින් ජීවිතේ පටන් ගන්න පුළුවන් නම් මං තෝර ගන්නෙ ඔයාව කියලා.. මං ආදරේ කරන්න පටන් ගන්නෙ ඔයාට කියලා.."

සස්මිත හිතේ වේදනාවට කෑගැවේය.

"ඉතිං ඇයි එහෙම කරන්නෙ නැත්තෙ..? ඇයි හැමදේම අමතක කරලා ඔයා මේ වත්තට ආව පළවෙනි දවස කියලා හිතාගෙන මට ආදරේ කරන්නෙ නැත්තෙ සස්මිත..?"

ශික්‍ෂාත් කියාගෙන ගියාය. සස්මිත ගල් ගැසිණ.

"ශි.. ක්‍ෂා.."

ඈ මේ තරම් නිර්භයව කතා කරාවි ඔහු කවදාවත් හිතුවේ නැත.

"ඔයාට එහෙම කරන්න පුළුවන් සස්මිත.. මට ඔච්චරම ආදරේ නම් ඇයි ඔයා දැන්වත් ඒ ආදරේ මට දෙන්නැත්තෙ..?"

ශික්‍ෂා ඇස්වල කඳුළු පුරවාගෙන සෙමින් ඇසුවාය.

"ශික්‍ෂා.."

සස්මිත. ශික්‍ෂාගේ හිස මත අතක් තැබුවේ දෙවරක් නොසිතාය.



The Reader's Place

"මාව තනි කරන්නෙපා සස්මිත.."

ශික්ෂා, සස්මිතගේ පපුවට තුරුළු වූයේත් දෙවරක් නොහිතාය. ඇගේ දෑසින් කඳුළු කඩා වැටිණ.

"වෙච්ච හැමදේම අපි අමතක කරමු සස්මිත.."

ශික්ෂා කීවාය.

"ම.. මං ඔයාට ආදරෙයි ශික්ෂා.."

සස්මිත කීවේ දෙනෙත් තෙත් කරගෙනය. කතාබහ ඇහෙන මානෙක නොවුණත් දුර හිඳන් මේ දෙදෙනා දෙස බලා උන් චන්දන සියල්ල තේරුම් ගත්තේ ඉතා ඉක්මනටය.

* * * * * * * * * *



The Reader's Place





# 07

"මොකද අම්මෙ කාලෙකට පස්සෙ තාත්තා හරි සතුටින් ඉන්නවා වගේ පේන්නෙ..?"

ශික්ෂා ඇසුවේ කුස්සියේදීය. රෝෂණී, දියණිය දෙස බැලුවේ සතුට උතුරන දෑසිනි.

"අර ළමයා දිගටම මෙහේ රස්සාව කරන්න කැමති වෙලා තියෙන්නෙ..?"

"අර ළමයා කිව්වෙ..?"

අම්මා 'අර ළමයා' කීවේ සස්මිතට බව දැන දැනම ශික්ෂා ඇසුවාය.

"සස්මිත.."

රෝෂණී කීවේ ඒදාගත් ව්‍යංජනය ලිපට කරමිනි. ශික්ෂාගේ හිතට සතුටක් දැනිණ. ඒ හපන්කම කළේ තමා බව ඇයට අමතක

නැත. අක්කා නිසා තැලුණ තාත්තාගේ හිත මේ තරමින්වත් සතුටින් තියන්නට හැකිවීම ගැන ශික්ෂා සතුටු වූවාය.

"අම්මා.."

ශික්ෂා කුඩා මේසයේ පුටුවක් පස්සට කර වාඩිවිය.

"මොකෝ ළමයො..?"

රෝෂණී දිගටම බෝංචි කරල් ටික කඩන අතරේ ඇසුවාය.

"අක්කි ගෙදරට කතා කරපු බව අම්මි, තාත්තිට කිව්වද..?"

ශික්ෂා හෙමිහිට ඇසුවාය. රෝෂණීගේ අත අතරමග නතර විය. ඈ දියණියගේ මුහුණ බැලුවේ ළපටි බෝංචි කරලක් අතේ තියාගෙනය.

"ඇත්තටම මෙච්චර දවසක් මට ඔය ටික කියාගන්න විදිහක් නැතුව මං හරියට දුක් වින්දා දුව.. ඔයාල දන්නවනෙ මේ ගෙදර කිසි දෙයක් තාත්තාට හංගලා මට පුරුද්දක් නෑ කියලා.. ඒත් අක්කා ගෙදරින් ගිය එකට තාත්තා තරහෙන් උන්නෙ.. මලයි කියලා ආරංචියක් ආවත් එයාට කියන්න එපා කියල තමා මට කියල තිබ්බෙ.. සස්මිත ආයෙ රස්සාවට කැමති උනා කියල ඊයෙ හවස තාත්ති උන්නෙ හුගක් සතුටින්.. ඒ හින්දා ඊ නිදාගන්න ගිහින් මං තාත්තිට අක්කි මෙහාට කතා කරපු බව කිව්වා.."

"ඉතිං..?"

ශික්ෂාට උවමනා කලේ තාත්තාගේ ප්‍රතිචාරය දැනගන්නය.

"ඔහේ අහගෙන උන්නා.. මං හිතුවෙ මට බනී කියලා.. ඒත් මුකුත් කිව්වෙ නෑ.. අඩුම තරමෙ ඒ ගැන වෙන මොනවත් ඇහුවෙත් නෑ.."

රෝෂණී කීවාය.



The Reader's Place



"ඒ කියන්නෙ තාත්ති දැන් කූල් වවුන් කියලා අම්මි.. අක්කි ගැන ආයෙ මුකුත් අමුතුවෙන් ඇහුවෙ නැතුවට කමක් නෑ.. අක්කි ගැන කියද්දි අම්මිගෙ ඇගට කඩන් පැන්නෙ නැති ටිකම ඇති.. මට නම් හරි හැපී.."

ශික්ෂා කීවේ අවංක සතුටකිනි.

"මට නම් හිතට සතුටක් එන්නෙ ඒ තාත්තයි, දුවයි ආපහු එකට මේ ගෙදර ඉන්නවා දැක්ක දවසට තමයි.."

රෝෂණී සුසුමක් හෙලුවාය.

"ඒ දවස වැඩි ඈතක නෑ අම්මි.."

ශික්ෂා, අම්මාගේ කාරේ එල්ලුණේ එහෙම කියාගෙනය. ශික්ෂාගේ හිතේත් මහා ලොකුවට ඒ ඕනෑකම තිබිණ. මේ පුංචි පවුල ආයේ එකතුවෙනවා දකින්නට ඈ හුගාක් ආසා කළාය.

'කොහොම හරි මං ආයෙ අක්කිව මේ ගෙදෙට්ට ගෙනල්ලා තාත්තිගෙන් සමාව අරන් දෙනවා..' ශික්ෂා එක හිතින් හිතා ගත්තාය. ඇයට තිබූ ලොකුම ගැටලුව නම් මේ කිසිවක් සැලසුම් කර ගැනීමට අක්කා ගෙදරට කතා නොකිරීමය. එදා හදිසියේ කතා කළා මිස අක්කා එයාගේ දුරකථන අංකයක් ගෙදරට දුන්නේ නැත. ගෙදරට එන දුරකතන ඇමතුම්වල අංක බලා ගැනීමේ ක්‍රමයක්ද නැත. ශික්ෂා දවස ගෙව්වේ කොයි මොහොතක හෝ මෝක්ෂා යළි ගෙදරට කතා කරාවීයි ලොකු පැතුමක් හිතේ තියාගෙනය,

* * * * * * * * * *

දොළ පාරේ දිය සීතල බව හැබෑය. එහෙත් ඒ සීතල ශික්ෂාට නොදැනිණ. හිත ආදරය කළ රුවට තුරුලුව උන් ශික්ෂාට දැනුණේ සස්මිතගේ උණුසුම මිස, දොළ පාරේ සීතල නොවේ. ඉවක් ලද විටක දොළ පාර ළඟදී හමුව සැදෑව ගෙවන මේ යුවල දැන් දොළ පාර අවට රෝස පඳුරුවලටත් හොඳට පුරුදුය.

"සස්මිත.."

නිහැඬියාව බින්දේ ශිකෂාය.

"ම්.."

සස්මිත, ශිකෂාව කර වටා අත යවා තුරුලු කරගත් ගමන් දුරින් පෙනෙන තේ කඳු දෙස ඔහේ බලා උන්නේය.

"මොනාද කල්පනා කරන්නෙ..?"

ශිකෂා ඇසුවාය. තමා උන්නේ බර කල්පනාවක බව සස්මිතට තේරෙන්නේ දැන්ය.

"නෑ මං මේ කල්පනා කළේ අපේ සම්බන්ධෙ ඔයාලගෙ ගෙදරට ආරංචි වෙච්ච දවසක රාජිත සර් මොන වගේ තීරණයක් ගනියිද කියලා.."

සස්මිත මහානාම හිත පෙලූ කරුණ හෙළි කළේය.

"තාත්තා කැමති වෙයි.."

ශිකෂා කීවාය.

"ඔයා කොහොමද එහෙම විශ්වාසෙටම කියන්නෙ..?"

සස්මිත පුදුමව ඇසුවේය.

"මං අපේ තාත්ති ගැන හොඳට දන්නවා සස්මිත.. අම්මිව කසාද බැන්ද දවසෙ ඉඳලා තාත්ති ආස කරල තියෙන්නෙ පුතෙකුට.. අක්කියි, මායි ලැබෙන්න ඉන්නකොටත් තාත්ති හිතලා තියෙන්නෙ එයාට පුතෙක් ලැබෙයි කියලා.. තාත්ති අපිට ආදරේ තමයි.. ඒත් පුතෙක් ගැන එයාගෙ හිතේ තියෙන ආසාව තාම තියෙනවා.."

ශිකෂා තේරුම් කළාය.





"මං එයා යටතෙ, එයාගෙ වත්තෙ වැඩ කරන සේවකයෙක්.. ඔයා හිතනවද සේවකයෙකුට පුතෙකුට වගේ ආදරේ වෙයි කියලා.."

"ඒකට නව හේතු තියෙනවා සස්මිත.. අපේ වත්ත මේ තත්ත්වයට ගත්තෙ ඔයාගෙ මහන්සියෙන්.. ඔයා මේ වත්ත බලාගත්තෙ තමන්ගෙම දෙයක් විදිහට.. තාත්ති ඔයා ගැන හරියට හොඳ කියනවා.. මේ තරම් වත්තට කැපවුණු කෙනෙක් මේ වත්තට ඕන කියලා තාත්ති දන්නවා.. ඉතිං ඔය වගේ කෙනෙක් බෑණා කරගන්න තාත්ති අකමැති වෙන්නෑ.."

ශිකෂා කීවාය. සස්මිත, ශිකෂාගේ මුහුණ දෙස කෙලින් බැලුවේය.

"ශිකෂා.."

"ම්.."

"එතකොට ඔයත් මට කැමති වුණේ ඒ විදිහට හිතලද..?"

"ඒ කිව්වෙ..?"

"මං මේ රස්සාවෙන අස්වෙලා යන්න හදන වෙලාවෙ මාව හොයන් ඇවිල්ලා, මට ආදරෙයි කියල තහර කරගත්තෙ ඔයාලගෙ එස්ටේට් එකට මාව නැතුව බැරි හින්දද..?"

සස්මිත පැහැදිලිව ඇසුවේය.

"ඔව්.."

ශිකෂා කීවාය.

"හත්.."

සස්මිත, ශිකෂාව කෝපයෙන් ඉවතට කර නැගිට්ටේය.

"සස්මිත.."

ශික්‍ෂා වහා සස්මිතගේ අතේ එල්ලිණ. ඇය එහෙම නොකරන්නට සස්මිත අඩියට දෙකට දොළ පාර මාරුවී නිල නිවසට යනවා සිකුරුය.

"ඔයාව අපේ එස්ටේට් එකට ඕනේ.. ඒක ඇත්ත සස්මිත.. ඒත් මං ඔයාට කැමති වුණේ ඒ කාරණාව හින්දම නෙමෙ.."

ශික්‍ෂා වහා කීවාය.

"අවංකවම මං ඔයාට ආදරේ කරපු හින්දා.."

සස්මිතගේ ඇස්වල තිබුණේ ඒ වචන විශ්වාස නොකරන බැල්මකි.

"තාත්ති හදිසියේවත් අකමැති උනා කියලා හිතන්න.. එහෙම උනොත් මං ඔයා ඇරෙන්න වෙන කාවවත් බඳින්නෙ නෑ කියන තීරණේක ඉන්නවා.. ඔයාට ආදරේ නොකළ නම් මං එහෙම තීරණයක් ගනීද..? වත්ත ගැන විතරක් හිතලා ඔයාට කැමති උනා නම් මං ඒ වගේ තීරණයක් ගන්නෙ කොහොමද..?"

ශික්‍ෂා බැගෑපත්ව කීවාය. සස්මිත යළි ශික්‍ෂා ළඟින් හිඳ ගත්තේ සුසුමක් හෙළාය.

"තරහ ගියාද..?"

ශික්‍ෂා ආදරයෙන් ඇසුවාය.

"නෑ බය හිතුණා.."

"ඇයි..?"

"මං තුන්වෙනි පාරටත් මේ රාජිත මහත්තයාගෙ යක්‍ෂ කෙල්ලන්ට අහු උනාද කියලා හිතුණා.."

"යක්‍ෂ කෙල්ලො..?"





ශික්‍ෂා මුහුණ රතු කරගත්තාය.

"ඔව්.."

සස්මිතගේ මුහුණ හිනාවකින් ඔප වැටිණ.

"එහෙමද අපි ගැන හිතන්නෙ..?"

"නැතුව වෙන කොහොම හිතන්නද..? කුවේණිටත් අපේ රටේ කෙල්ලන්ගෙ දුර නෑකමක් තියෙනවනේ.. ඉතිං හිටපු ගමන් කුවේණිගෙ ගති මතුවෙනවා.."

සස්මිත ඇගට පතට නොදැනී කිවේය.

"අනේ යන්න.."

බොරුවට ගස්සා අහක බලමින් ශික්‍ෂා කීවාය. සස්මිතට මහ හඬින් හිනාවක් ගියේ ඇගේ ඒ ගැහැනු හැසිරීමට ඔහු බොහෝ ආසා කළ නිසාය.

* * * * * * * * * *

රාජිත වරුසප්පෙරුම උන්නේ සති අග පත්තරය දිග හැරගෙනය. ශික්‍ෂා අලංකාර ගෙවත්තේ යකඩ ඔන්චිල්ලාවේ හිඳගෙන පොතක් දිග හැරගෙන උන්නාය. රෝෂණී ගෙතුළ වැඩ අහවර කරමින් සැමියා අසල පුටුවකට බර විය.

"මේ සතියෙ පත්තරේද..?"

ඈ සැමියාගෙන් ඇසුවාය.

"හ්ම්.."

රාජිත උත්තර දුන්නේ දිගටම පත්තරේ ඇස රඳවාගෙනය.

"මට දෙන්නකො ඔකෙ පොඩි පත්තරේ.."

රෝෂණී සැමියාගෙන් අතිරේකය ඉල්ලා ගත්තාය. එහි මුල්පිටුව දුටු ගමන් රෝෂණීගේ අත පය පවා පණ නැතුව ගියාය.

"අනේ ජයි.."

රෝෂණීට කෑගැසිණ.

"මේ බලන්ඩකෝ.. මේ බලන්ඩකෝ.."

අම්මා කලබලයෙන් කෑගැසූ හඬට ශික්ෂාත් විනාඩියෙන් එතනය. දැන් තුන්දෙනාම මුල් පිටුවට එබීගෙනය.

"දෙයියනේ අක්කි.."

ශික්ෂාට කියවිණ. මෝක්ෂාගේ රුවින් අතිරේකයේ මුල් පිටුව සැකසී තිබිණ. ගීන් පටි යෙදූ හැට්ටය ඇ නැමී උන් අයුරින් සුසුදු ළමැද පවා නිරුවත් කොට පෙන්විය. කළු පාට ලොකු අව් කණ්ණාඩියෙන් දෙනෙත වැසී තිබූ නිසා අක්කාගේ මුහුණේ වූ හැඟීම් ශික්ෂාට පැහැදිලි නොවිණ. එහෙත් සිය සොයුරිය වෙන කවරදාටත් වඩා රූපත් බව ශික්ෂා අවබෝධ කර ගත්තාය.

"ශික්.. මොනාද මේ ඇඳගෙන ඉන්න ඇඳුම්..? මෙ ටිකත් නැතුව හිටිය නම් තමා හොඳ.."

පළමු වෙඩිමුරය තිබ්බේ රාජිනය.

"ගෑනු දරුවො රටේ ලෝකෙ ඉස්සරහ මෙහෙම හැසිරෙනකොට අම්මටයි. අවනම්බුව.. මිනිස්සු කියන්නෙ අම්මා දරුවන්ව හරියට හදල නෑ කියලා.."

රෝෂණී හැඬුම්බරව කීවාය.

"කළු විදුරු කැලි දෙකකින් ඇස් දෙක වහගෙන අනිත් හරිය ඔක්කොම එළියෙ දාගෙන.. ඇස් දෙක විතරක් වහගත්තම හරි කියල හිතේ.. මෙහෙම දරුවෙක් හැදුවට වඩා හොඳයි නිකම් හිටියනම්.."





රාජින, රෝෂණී අතින් පත්තර පිටුව උදුරාගෙන කෑලිවලට ඉරා දැමූවේය. රෝෂණී ගෙට දිව්වේ හඬාගෙනය. ඇස්වල කඳුළු පිරුණත් හිතේ දුක හිර කරගත් ශික්ෂා අම්මා පස්සේ ගෙට රිංගා ගත්තාය.

* * * * * * * * * *

මෝක්ෂා වරුසප්පෙරුමගේ රුව පත්තරයෙන් රූපවාහිනියෙන් දකින්න ලැබෙන වාර ගණන වැඩිවිය. කෙවින්ට අයත් දැන්වීම් ආයතනයේ හොඳම නිරූපණ ශිල්පිනය මෝක්ෂා වූවාය. ඒ සියල්ලටම වඩා කෙවින් හා මෝක්ෂා අතර සම්බන්ධය නිල නොලත් අඹුසැමියන් ලෙස මුහුකුරා ගිය එකක් විය.

මෝක්ෂා උන්නේ සතුටිනි. ඇ හිතුවේ ගෙදරින් එළියට බැස ආ ගමන ඇය සාර්ථකව ජයගත් බවය. කෙවින් විජේන්ද්‍ර අතින් ඉඳුල්ව ගිය ජීවිතය ඔහුට ඕනෑ වෙලාවට ඔහු පාවිච්චියට ගත් වග හැබෑය. එහෙත් ඒ හැම වරෙකම මෝක්ෂා, කෙවින් වෙතට ගියේ සිය කැමැත්තෙනි. කෙවින් නිසා ලද සැප පහසු ජනප්‍රිය ජීවිතය නිසා කෙවින් අතින් නැතුව ගිය ගැහැනුකම ගැන හැඟීමක් මෝක්ෂාට නොවිණ.

"මොනාද ඔච්චර හැරී හැරී බලන්නෙ..?"

කණ්ණාඩිය ඉදිරිපිට යට ඇඳුමින් හිඳගෙන හැඩ බලන මෝක්ෂාගෙන් කෙවින් ඇසුවේය. කෙවින් උන්නේ මෝක්ෂා වෙතින් උණුසුම්ව ගිය යහනේ තවමත් පෙරළීගෙනය.

"ෆිගර් එක අවුට් ඔෆ් ෂේප් ද කියලා බැලුවෙ කේව්.. මේ දවස් ටිකට මං පුට්ටක් මහත් වෙලාද මන්දා.."

මෝක්ෂා, කෙවින් දෙසට හැරිණ.

"පිස්සුද..? ඔයා තාම ස්ලිම් ෆිගර් ඩියර්.. ඉස්සර හිටපු ගානම තමා.."



The Reader's Place

කෙවින් කීවේය.

"සුවර්ද..?"

මෝක්ෂා සැකයෙන් ඇසුවාය.

"සුවර් නැත්තෙ මොකද ඔයි..? තමුසෙව ඇඳුම් නැතුව තුරුල් කරගන්න මට කියන්න බැයිද තමුසෙගෙ ඇගේ මිමම..?"

කෙවින් කීවේය.

"කේවි.. මං කියල තියෙනවා මට තමුසෙ, ඔයි වගේ වචනවලින් කතා කරන්න එපා කියලා.. මං ආස නෑ.."

මෝක්ෂා මුහුණ ඇඹුල් කරගත්තාය. අවශ්‍යතාවයට ළඟට ඇද තුරුල් කරගත්තාට කෙවින් දැන් ඉස්සර තරම් තමාට ආදරේවත්, ගෞරවයක්වත් නැතැයි මෝක්ෂාට හිතිණ.

"මං තමුසෙට කුණුහරුපෙන් කතා කළාද..? ඔවා සිංහල භාෂාවෙ වචන.. මං හදපුවා නෙමේ.."

නිරුවතින් නැගිට නාන කාමරයට රිංගා ගන්නා අතරේ කෙවින් කීවේය. මෝක්ෂාගේ හිත රිදිණ. ඈ රිදුණ හිතින්ම යහන මත හිඳගත්තාය. කෙවින් ඇඟපත හෝදා තුවායක් ඉණ වටා දවටාගෙන ආපසු කාමරයට එනතුරුත් මෝක්ෂා ඇඳමත හිඳගත් ගමන්ය.

"මොකද මේ බුම්මගෙන..?"

කෙවින් තෙත අතින් මෝක්ෂාගේ මුහුණ අතගෑවාය.

"ඔයා දැන් ඉස්සර වගේ මට ආදරේ නෑ කේවි.."

මෝක්ෂා ඇස්වල කඳුළු පුරවාගෙන කීවාය.

"ඔන්න ඉතින් නුරතලේ.. මට පෙන්නන්ඩ බැරි ඔය ගෑනුන්ගෙ නහයෙන් ඇඬිල්ල තමා.."





කෙවින් කෝපයෙන් කීවාය. ගැහැනියකගේ කඳුළකට උණුකළ හැකි සිතක් කෙවින්ට නොවිණ. මෝක්ෂා නෙතමතින් ගිලිහුණ කඳුළු වැල් අත්ලෙන් පිස දැමුවාය.

"දැන් ඔය විකාර හිත හිතා ඉන්නැතුව නෙක්ස්ට් මන්ත් තියෙන මිස් වර්ජින් ගර්ල් ඉවෙන්ට් එකට ලෑස්ති වෙනවා.."

කෙවින් කීවේ මෝක්ෂාගේ අවධානය වෙනතක යොමු කරවන්නය.

"මං හිතන්නෑ මට ඒක කරන්න පුළුවන් වෙයි කියලා.."

මෝක්ෂා කීවාය.

"ඇයි බැරි..?"

"ඒකෙ රූල්ස් වැඩි.. අනික මං කොහෙවත් වර්ක් කරන කෙනෙක් නෙමේනෙ.."

මෝක්ෂා කීවාය.

"මේ.. ඒකෙ රූල්ස් ගැන මං බලාගන්නං.. තමුසෙ තරගෙට ලෑස්තිවෙනවා... එහෙන් මෙහෙන් සල්ලි ටිකක් විසි කළහම ඔය කොයි නීතියත් සල්ලිවලට යටයි.. අනික ජජ්මන්ට් එකත් මං දන්න කට්ටියක්.. මට ලේසියෙන්ම වැඩේ ගොඩ දාන්න පුළුවන්.."

මෝක්ෂාගේ හිතේ දෙගිඩියාව නැතිවිය. කෙවින් ගැන ඇගේ හිතේ උපන්නේ ලොකු ආඩම්බරයකි. කෙවින් කොහොම හැසිරුණත් ඔහු තමන්ව ඉදිරියට යවන්නට දිනවන්නට ලොකු කැප කිරීමක් කළේය. මෝක්ෂාට කවදාවත් කෙවින් වෙතින් ලද මේ සහයෝගය අමතක කරන්න බැරිය. මෝක්ෂා අලුත උපන් ආදරබර හිනාවක් මුහුණේ තවරාගෙන කෙවින් දෙස බැලුවේය.

"අන්න ඔහොම හිනාවෙලා ඉන්නවකො ඔයි.. මූණ එල්ලගෙන ඉන්නවා දකිනකොට මටත් මළ පනිනවා.."



The Reader's Place

කෙටියෙන් කීවේ මෝක්ෂාව තුරුලට ගන්නා අතරය.

* * * * * * * * * *

හිටිහැටියේ ගෙදරින් ගිය මෝක්ෂාව ගෙදර උදවියට දකින්නට ලැබෙන වාර ගණන වැඩිවිය. පත්තරයක, රූපවාහිනී දැන්වීමක, පෝස්ටරයක ඇගේ රුව නිතර දක්නට ලැබිණ. ඈ ජනප්‍රිය වූ තරමටම මාධ්‍ය මගින් ඈ ගැන ප්‍රචාරය කළ කටකතා ප්‍රමාණය ද වැඩිවිය. වරක් මොකක්දෝ රූ රැජිණ තරගයකින් ඇය පළමු තැන ලබා තිබිණි.

"මිකී.. අම්මා තාත්තා දාපු නමත් වෙනස් කරගෙන.. විකාර.."

එදා රාජිත කෝපයෙන් කෑගැහුවේය. මේ හිතුවක්කාර දරුවා නිසා ගෙදර සාමය බිඳී යන බව රෝෂණීට වැටහිණ. ශික්ෂා කිහිප වරක් අක්කාව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකයක් සොයා ගන්නට උත්සාහ දැරුවද එය ද සාර්ථක නොවිණ. දුකින් වේදනාවෙන් බුම්මාගෙන ඉන්නා අම්මා, තාත්තා එක්ක ගෙදර ගත කළ කාලය ද ඉතා වෙහෙසකරව තිබිණ. ශික්ෂාට තිබුණ ලොකුම සතුට, සැනසීම වූයේ සමහර දිනක ඇළපාර ළඟදී සස්මිතව මුණගැසීමය.

"අක්කා නිසා ගෙදර හරි ප්‍රශ්න.."

ශික්ෂා, සස්මිත ළඟ හිත නිදහස් කර ගන්නට උත්සාහ කළාය.

"මාත් දැක්කා පත්තරේක මුල් පිටුවක ඇඟ පෙන්නගෙන උන්නා.."

සස්මිතත්, මෝක්ෂාගේ පෙරළිය හොඳින් දැක තිබිණ.

"අම්මයි, තාත්තියි ඉන්නෙ ලොකු හිතේ අමාරුවකින් සස්මිත.. ඒගොල්ල හිතන්නෙ අක්කා ඒගොල්ලන්ට කරන්න පුළුවන් ලොකුම ලැජ්ජාවත් කළා කියලා.."





"මෝක්ෂා ලැජ්ජා කළේ අම්මා තාත්තට විතරක් නෙමේ.. එයා ලොකුම ලැජ්ජාව කළේ ඔයාට.."

සස්මිත එහා කීවාය. ශික්ෂා ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

"ඇයි ඒ..?"

"එයාටයි, ඔයාටයි වෙන් කරලා අඳුරගන්න පුළුවන් කාටද ශික්ෂා..? එයා ඔහොම ඇඟ පෙන්නගෙන ඉන්නකොට ඔයා කොහොමද පාරෙ බැහැලා යන්නෙ..? මිනිස්සු හිතන්නෙ ඒ ඔයා කියලා.."

සස්මිත කීවේ දෙමව්පියන්ට පවා නොපෙනුණ ඇත්තකි. ශික්ෂා වෙව්ලා ගියාය. ඇත්තය. ළඟම ඥාතීන්ට පවා හඳුනා ගන්නට බැරිව ගිය සොයුරියන් දෙදෙනාව පිට සමාජය වෙන්කර ගන්නේ කොහොමද..?

"ශික්ෂා.."

නිහඬවම ශික්ෂා, සස්මිත දෙස බැලුවේය. ඒ ඇස්වල තිබූ කඳුළු දුටු සස්මිතගේ හිත අනුකම්පාවෙන් පිරිණ.

"ඒ ගැන හිතල දුක්වෙන්න එපා ශික්ෂා.. මුළු ලෝකෙටම ඔයා කවුද කියලා අඳුරගන්න බැරි උනත් මම ඔයා කවුද කියලා දන්නවා.. ඔයාගෙ හිත ගැන දන්නවා.."

සස්මිත කීවේය. ශික්ෂා කිසිත් නොකියාම ඔහුගේ උරහිසට හිස බර කළාය. මේ කරදර කාලය ඉක්මණට ගෙවී හැම කෙනෙකුගේම හිතට සහනයක් ලැබෙන දවසක් උදාවෙනවා නම් කියා ශික්ෂාට හිතිණ.

රෝෂණී ගල් වැටිය ළඟට ආවේ බාල දියණිය සොයාය. ගෙදර කරන්නට කියා ලොකු දෙයක් නොවූ තැන දියණිය හා මොහොතක් ගත කරන්නට ඈ හිතුවාය. එහෙත් ගල් වැටියෙන්



The Reader's Place

පහළට එබුණ රෝෂණී දුටුවේ ඇය කවදාවත් දකින්නට ප්‍රාර්ථනා කළ දෙයක් නොවේ.

"දෙයියනේ.."

ඇල පාරට කකුල් ඔබාගෙන ගල්පොත්ත මත වාඩිවී උන් තරුණ ජෝඩුව රෝෂණී දුටුවාය.

"සස්මිතයි, අපේ ළමයයි.."

රෝෂණීගේ ඇඟපත පණ නැතුව ගියා වගේ දැනිණ. ගිසා උන්නේ සස්මිතගේ උරහිසට හිස තියාගෙනය. ලංවී ඉන්නා හැටියට මේක අද ඊයේ ඇතිවුණු සම්බන්ධයක් නොවෙයි රෝෂණීට වැටහිණ. ඇගේ කකුල් දෙකත් හිටිවැටී පණ නැතුව ගිය ගානය. රෝෂණී සෙමින් සෙමින් ආපහු ගේ දිහාවට ගැටුවේ තමා ගල්වැටියෙන් පහළට පෙරළේවියි බියක් දැනුණ නිසාය.

"රෝෂණී.."

නින්දෙන් ඇවිදින්නා වාගේ අත ගගා පැමිණ පුටුවට කඩා වැටුණ බිරිඳ දෙස රාජිත බැලුවේ පුදුමයෙනි.

"ප්‍රෙෂර් වැඩිවෙලාද..?"

බිරිඳට මෙතුවක් ඉහෙන් බහින තරමේ රෝගයක් නොවූ බව රාජිතට අමතක විය.

"රෝෂණී ඇයි..? මොකද උනේ..? සනීප නැද්ද..?"

රාජිත ප්‍රශ්න වැලක් අහන ගමන් රෝෂණීගේ උරහිසට අතක් තැබුවාය. ගෙදර බිරින්දෑගේ අසනීපයක් ළඟදී ඇයටත් වඩා අසරණ වන්නේ සැමියාය. එකපාරම කළ යුත්තක් කොහොමත් පිරිමින්ට හිතාගන්න අමාරුය. රෝෂණීගේ ඇස්වලින් කඳුළු පිටට පැන්නේය.

"රෝෂණී ඇයි මේ..?"





"අපි ඉවරයි ඒයි.. අනේ මගෙ නම් හිත වාවන්නෙ නෑ.."

රෝෂණී ඉකිහඬින් කීවාය.

"ඔය ඇඬිල්ල නතර කරලා මොකද මේ කියලා මට කියල ඉන්නවද..?"

රාජිත තරමක් කෝපගෙන තිබිණි. රෝෂණී ඇලපාර ළඟදී දුටු දසුන රාජිතට විස්තර කළේය. එහෙත් පුදුමය නම් රාජිත වෙතින් ඇය බලාපොරොත්තු වූ තරමේ වෙනසක්, කලබලයක් දකින්නට නොලැබීමය.

"අපි දැන් මොකද කරන්නෙ ඒයි..?"

රෝෂණී අසරණ හඬින් ඇසුවාය.

"අපට කරන්න කියලා කිසි දෙයක් ඉතුරු වෙලා නෑ රෝෂණී.. ඒ දෙන්නම එයාලට කැමති දේවල් කරගෙන ඉවරයි.."

රාජිත කලකිරීමෙන් කීවේය.

"එහෙම කියලා සද්ද නැතුවම ඉන්නද හදන්නෙ..?"

"අපි විරුද්ධ උනොත් ඒගොල්ල හිතුවක්කාර වෙනවා.. දැන් ජේන්නැද්ද එක්කෙනෙක් කැමති වුණ දේට විරුද්ධ වෙලා එයා කරපු දේ.. මට දැන් හිතෙනවා අපි එදා මෝෂාට කැමති දෙයක් කරගන්න අවසර දුන්නා නම් ඉවරයි කියලා.. එහෙම උනා නම් අඩු තරමේ අපිට ඒ ළමයගෙ ජීවිතේ පාලනය කරන්නවත් තිබ්බා.. දැන් ඒකත් නෑ.."

පහුගිය දවස් ගානකම තමන්ගේ හිතට වද දුන් අදහස රාජිත එළියට දැම්මේය.

"ඔයා ඔය කියන දේ මාත් හිතුවා රාජිත.. අපි ගෙදර ඉඳන් කරන දෙයක් කරන්න අවසර දුන්නා නම් ඒක අඩු තරමේ ගෑනු ළමෙක් විදිහට එයාගෙ ආරක්ෂාවටයි, ගෞරවයටයි හොඳවෙන්න

The Reader's Place

තිබ්බා.. දැන් ඒ ළමයා විහින් නන්නත්තාර වෙලා.. අපිත් ඒකට වගකියන්න ඕන.."

"මේ කාරණේට විරුද්ධ වෙලා ගෙදර ඉන්න දරුවගෙත් ජීවිතේ අඳුරු කරන්න මට බෑ රෝෂණී.. අනික සස්මිත කියන්නෙ නරක මිනිහෙක් නෙමේ.."

"ඒක නම් එහෙම තමා.."

රෝෂණී ඒ තර්කය එක හිතින් පිළිගත්තාය.

"මං සස්මිතගෙ ගතිගුණ ගැන හොඳට හොයල බලලා තියෙනවා.. එයා නිතරම බලන්නෙ තමන්ට වගේම අනුන්ටත් යහපතක් වෙන දෙයක් කරන්න.. ඇත්තම කතාව නම් අපේ එස්ටේට් එක සස්මිත තරම් හොඳට බලා කියාගන්න කෙනෙක් අපට කවදාවත් හොයාගන්න ලැබෙන්නෙ නෑ.."

The Reader's Place

සියල්ල සාවධානව අසා සිටි රෝෂණී සද්ද නැගෙන්නට සුසුමක් හෙළුවාය.

"දැන් එතකොට ඔයාගෙ තීරණේ ඒ දෙන්නට කැමැත්ත දෙන්නද..?"

ඈ පසුව ඇසුවාය.

"ඔව්.. හැබැයි දැන්ම කලබල වෙලා දෙපැත්ත කතා කරලා තීරණ අරගෙන මේ මඟුල කරන්න යන්න ඕන්නෑ.. අපි ඒ දෙන්නට ඒ දෙන්නව අඳුනගන්න ඉඩ දෙමු.."

රාජිත කතා කළේ හැම දෙයක් ගැනම හොඳින් හිතාබලා ඉන් පස්සේය.

"ඊත් ඒ දෙන්නා ඔහොම තැන් තැන්වල හම්බවෙන එක හොඳ දෙයක් නෙමේ.."





"ඒක මං දන්නවා රෝෂණී.. මං ඒ ගැන ඒ දෙන්නට කෙලින්ම කතා කරන්නං.."

රාජිත කීවේය. රෝෂණීට දැනුණේ හිත සැහැල්ලුව ගිය බවකි. අද කාලේ හැදෙන ළමයින් විශ්වාස කරන්නට බැරිය. අම්මා තාත්තා ළඟ හැදුණත් විශ්වාස කරන්නේ හදිසියේ අඳුනා ගත් පිටස්තරයෙකුගේ වචනයයි. උන්නේ ඇස් දෙක වාගේ දරුවන් දෙන්නෙක් පමණි. වැඩිමලා පවුලට නැතිවිය. දෙවනියාත් නැති කරන්නට බැරිය. ඒ හින්දා කොයි පැත්තත් බේරාගෙන සැමියා ගත් තීරණය හොඳය කියා රෝෂණීට හිතිණි.

* * * * * * * * * *

කන්ද උඩට බයිසිකලය පදවාගෙනා සස්මිත මහානාම, වරුසප්පෙරුම ගෙදර මිදුලේ බයිසිකලය නතර කරවිය. හදිසියේම පැමිණ හමුවන්නැයි රාජිත වරුසප්පෙරුම, සස්මිතට චන්දන අත පණිවිඩයක් එවා තිබිණි. උන් හිටිහැටියේ ගෙන්වාගන්න තරම් උවමනාවක් ගැන සස්මිතට කල්පනා නොවේ. රාජකාරීමය දෙයක් නම් කාර්යාලයේදී කතාබහ කර විසඳා ගන්න පුළුවන. මෙහෙම ගෙදරට එන්න කියන්නේ නැත. සස්මිත බයිසිකලයෙන් බැස්සේ දෙගිඩියාවෙනි.

"ආ.. මේ ළමයනෙ.. එන්න ගෙට.."

බයිසිකලයේ හඬට මහ දොරින් එබුණ රෝෂණී, සස්මිතට ආරාධනා කළාය.

"සස්මිත.. ඉඳගන්න.."

ගෙට ගොඩවූ සස්මිතට කීවේ රාජිතය.

"උදේ ඔෆිස් එක පැත්තෙ යන්න ඇති.."

"ඔව් සර්.. ගියා.. එතකොට තමා චන්දන කිව්වෙ සර් මට

ගෙදරට ඇවිත් හම්බවෙන්න කිව්වා කියලා.. ඒ රවුම මං එහෙම්මම මෙහෙ ආවා.."

සස්මිත කීවේය.

"ඒක හොඳයි.."

රාජිතත්, සස්මිත ඉදිරි පුටුවේ හරිබරි ගැසී වාඩිවිය.

"මං සස්මිතට මෙහෙම ගෙදෙට්ට එන්න කිව්වෙ ඔෆිස් එකේදී පර්සනලි දේවල් කතා කරන්න බැරි හින්දා.."

රාජිත, සස්මිතට එහෙම කියා බිරිය දෙස බැලුවේය.

"ඔයා දුවවත් එක්කරන් එන්ඩකො.."

රෝෂණී ගෙතුළට වැදුණ. සස්මිතගේ හදවත වේගයෙන් ගැහෙන්නට පටන් ගත්තේය. දැන් මේ විදිහට කතාබහ කරන්නට යන්නෙත් කොයි වාගේ කාරණයක්ද කියා අනුමානයක් සස්මිතගේ හිතේ ඇතිවිය.

ශික්ෂා ආවේ පුදුමයෙනි. සස්මිතගේ මුහුණ දෙස ඈ බැලුවේ ගින්දරෙනි. තාත්තාත්, අම්මාත් මෙතෙක් කිසි දෙයක් ගැන ඇහුවේ නැත. එහෙත් ගෙවී ගිය දින දෙකේ ඔවුන්ගේ හැසිරීමේ පැහැදිලි වෙනසක් ඇයට දැනී තිබිණි. විශේෂයෙන් නිතරම කල්පනා කරමින් උන් අම්මා අවශ්‍යම දෙයකට මිස ශික්ෂා එක්ක කතා කළේ නැත.

"මං මේ දෙන්නම එකට තියල අහන්නෙ.. දැන් දෙන්නා අනාගතේ ගැන මොනවද තීරණය කරන් ඉන්නෙ..?"

සස්මිතට හීන් දාඩිය දැම්මේය. ශික්ෂා ඊටත් වඩා අසරණය. ඈ දිගටම බිමට ඇස් අතුල්ලා උන්නේ ඇස් දෙක උස්සා බලන්නවත් දහිරියක් නැතුවය.

"සර්.. මේ.. මේ.."





සස්මිත ගොත ගැසුවේය. රාජිත කෙලින් සස්මිතගේ ඇස් දෙස බැලුවේය.

"සර් මේ මොකක්ද අහන්නෙ කියල මට පැහැදිලි නෑ.."

සස්මිත කීවේ හිතට දැනෙන ඇත්ත අදහාගන්න බැරිවය.

"අපට රහසින් ඔය දෙන්නගෙ සම්බන්ධයක් තියෙන බව අපි දන්නවා.. මේ අහන්නෙ ඒ ගැන.."

රාජිත කෙලින් කීවේය.

"සර් මේ.. මේ.. ඒක.."

"ඇයි සස්මිත හදන්නෙ එහෙම දෙයක් නෑ කියල කියන්නද..?"

"නෑ සර්.. මං පිළිගන්නවා අපි අතර එහෙම දෙයක් තියෙනවා කියලා.."

සස්මිත ඇත්තම කීවේය. ඔහු තමා ඉදිරිපිට නියම මහත්මයෙකු සේ ඇත්ත කෙලින්ම කතාකොට තිබේ. ඒ හින්දා ඇත්ත කතා කරන්නට තමාටත් යුතුකමක් තිබේ යැයි සස්මිත හිතුවිය.

"බොහොම හොඳයි.. මං කැමතී ඇත්ත කතා කරනවට.. තරුණ ගැනු ළමේකුයි, පිරිමි ළමේකුයි, නිතර ඇහැට පේන්න හිටියම ඔය වගේ දේවල් වෙනවා කියලා අපි දන්නවා.."

රාජිත කීවේය.

"මට සමාවෙන්න සර්.."

සස්මිත පැහැදිලිව කීවේය.

"නෑ සස්මිත.. සමාව ඉල්ලන්න තරම් දෙයක් නෙමේ.. සස්මිත ගැන මං දන්නවා.. මං හිතනවා සස්මිත මගෙ දරුවට ගැළපෙනවා කියලා.. මං මේ ගෙන්නුවෙ බය කරලා, තර්ජනය කරලා ඔය



The Reader's Place

සම්බන්ධෙ නතර කරන්න කියන්න නෙමේ.. ඔගොල්ල දෙන්නම දැන් ඉන්නෙ එහෙම අපට බල කරන්න පුළුවන් වයසක නෙමේ කියලා මං දන්නවා.."

සස්මිත වරක් හිස හරවා ශික්ෂා දෙස බැලුවේය. ඇගේ දෑස්වලින් කඳුළු වැටෙමින් තිබිණ.

"මං කියන්නෙ කිසි දේකට හදිසි වෙන්න එපා කියලා.. ඔක්කොටම කලින් දෙන්නට දෙන්නා අඳුනගන්න බලන්න.."

රාජිත කීවේය. ශික්ෂා ඉකි ගසමින් රාජිත ළඟ බිම දණ ගසා ඒ උකුලේ හිස තියා ගත්තාය.

"සුදුසු වෙලාව, සුදුසු දවස ආවම අපි දෙපැත්ත කතා කරලා අපේ යුතුකම කරන්නං.. ඒ දවස වෙනකන් ඔය දෙන්නා අපට ලැජ්ජාවක් වෙන විදිහට අතන මෙතන මුණ ගැහෙන්න ලැස්ති වෙන්න එපා.. සස්මිතට මීට පස්සෙ මේ ගෙදරට ඇවිත් ශික්ෂාව හම්බවෙන්න පුළුවන්.."

රාජිත කීවේය.

"බොහොම ස්තුතියි සර්.."

සස්මිතටත් දැනුණේ දෙනෙත් තෙත්ව ගිය බවය. මේ ප්‍රශ්නය මේ තරම් ඉක්මණට විසඳේයැයි ඔහු හිතුවේ නැත. මේ තරම් යහපත්ව විසඳේ යැයි ඔහු කවදාවත් හිතුවේ නැත. සියල්ල හොඳ විදිහට සිද්ධ වුණේ රාජිතගේ ඇති බුද්ධිමත්කමත්, ගුණවත්කමත් නිසාය. දෑස ඉදිරිපිට ඉන්නා ඒ යහපත් පුද්ගලයා ගැන අනුපමේය වූ භක්තියකින් සිත පිරී යනවා සස්මිතට දැනිණ.

* * * * * * * * * *

කෙවින් සහ ඔහුත් එක්ක පා තැබූ අලුත් ලොවේදී මෝක්ෂාට ගෙදරත්, අම්මාත් තාත්තා, නංගීත් අමතකව තිබිණි. කෙවින්ට





ඉදන්නට සිදුවූ පිවිතුරු බව ගැනවත්, ආදරය ගැනත් මෝක්ෂා කිසිවක පසුතැවිලි නොවුණාය. ඇයට කෙවින් අත දිග හැර වියදම් කළේය. ඈ ගැන හොයා බැලුවේය. මෝක්ෂා හිතා උන්නේ කෙවින් මේ විදිහට සලකන්නේ තමාට විතරක් කියාය. ඒත් කෙවින්ගේ මුදලින් නඩත්තු වන තවත් ගැහැනුන් ඉන්නා බව ඇය අවබෝධ කරගත්තේ බොහෝ පමා වෙලාය.

"මං මේ කේලමක් කියනවා නෙමේ මිකී.. මං මේක කියන්නෙ ඔයාගෙම හොඳට.. ඊයෙ කෙවි අර අලුතෙන් ආව ටෙලි ඇක්ට්‍රස්. කවුද දුලී ඒකිගෙන නම...?"

මාරියෝ ආරංචිය ගෙනාවේ දුලින් ද එකතු කරගෙනය.

"සෙනෙල්යා.."

දුලින් මතක් කළේය.

"රායිට්.. සෙනෙල්යා.. ඒකිපත් දාගෙන හතරෙ කණුව ළඟින් කා එකේ පිඹල ගියා.. වෙලාව සික්ස් තර්ටි විතර ඇති.."

ඒ කතාව ඇත්ත වෙන්න පුළුවන්ය. ඊයේ රෑයේ කෙවින් හදිසි වැඩක් නිසා තමාට එන්නට වෙන්නේ නැයි මෝක්ෂාට කල් තියා දන්වා තිබිණි. ඔය කියන වෙලාවෙන් පසුව එක දිගට කෙවින්ගේ දුරකතනය තිබ්බෙත් ක්‍රියා විරහිතකරය. එසේ නම් කෙවින් ඊයේ රෑය ගෙවන්න ඇත්තේ සෙනෙල්යා එක්කද..? ඒ අදහස මෝක්ෂාගේ හිතට ගිනි ඇවිලවීය. ඇයට කෙවින් කරන ඕනෑ දෙයක් උහුලන්නට පුළුවන. කෙවින් මත්පැන් පානය කරන එක, සමාජ ශාලාවල රාත්‍රිය ගත කරන එක, හිතුමතේට සල්ලි නාස්ති කරන එක... ඔය කොයිදේත් ඇයට උහුලන්නට පුළුවන. ඒත් ඇයට දරාගන්නට බැරි කෙවින් වෙනත් යුවතියකට තමාට වඩා ළංවෙන එකය. වේදනාවෙන්, කෝපයෙන් පිච්චි පිච්චි උන් මෝක්ෂා අන්තිමට කෙවින්ට ඇමතුමක් ගත්තාය.

"හෙලෝ මයි ස්වීටී.."

කෙවින්ගේ වාචූ කතාබහ මෝක්ෂාට දැන් හොඳට හුරුය. ඔහු මෙහෙම කතා කරන්නේ තමාව රවටා නලවා ගන්න ඕනෑවිටය. නැත්නම් අනික් හැම වෙලාවේම කතා කරන්නෙ ඔයි, තමුසෙ, අයිසෙ වාගේ දෙකයි පනහේ භාෂාවකිනි.

"කෙවි... කවුද ඔයාගෙ කාරෙකේ ගිය කෙල්ල..?"

මෝක්ෂා ප්‍රශ්නය කෙලින් ඇසුවාය.

"කෙල්ලෙක්..? ඊයෙ මගෙ කාරෙකේ ගියා..? මං හිතන්නෙ කවුරු හරි ඔයාට බොරුවක් කියලා.."

තමා හුගාක් පුදුමයට පත්වූ බව හඟවන්නට කෙවින් උත්සාහ කළේය. ඒත් ඒ හඬින්ම ඔහු උත්සාහ කරන්නේ තමාට බොරු කියා රවටන්න බව මෝක්ෂා තේරුම් ගත්තාය.

"මට කවුරුවත් බොරු කිව්වෙ නෑ.. මං මේ කතා කරන්නෙ මගෙ ඇස් දෙකටම දැක්ක දේ..? ඔයා කාවද කාරෙකේ දාගෙන ඊයෙ හවස හතරෙ කණුව ළඟින් පියඹලා ගියේ..?"

මෝක්ෂා සියල්ල තමා ඇස් දෙකට දුටු බවට රඟපෑවාය. ඇත්ත දැන ගැනීමට එහෙම කළ යුතු බව ඈ හිතුවාය.

"ආ.. ඒ.. මේ.. මේ.. අපේ දුරින් නෑදෑයො වෙන කෙනෙක්.. අම්මලගෙ වදේට මං ඒයාපෝට් එකට ඇරලුවා.."

"කේවී.."

මෝක්ෂාට කෑගැසිණ. ඇගේ මුළු ශරීරයම වෙව්ලන්නට වූවාය. කෙවින් බොරු කියන්නේ දැන දැනය.

"මට බොරු කියන්න එපා කේවී.. මං ඇත්ත දන්නවා.. ඔයා ගියෙ සෙනෙල්යා එක්ක.. මොකක්ද ඔයාගෙයි, ඒයාගෙයි තියෙන නෑකම..?"





මෝක්ෂා ඇසුවාය. කෙවින් තත්පර කීපයක් නිහඬව උන්නේය. ඒ කතා කරගන්නට දෙයක් නැතුවා සේය.

"මොකක්ද ඒකිගෙයි, ඔයාගෙයි තියෙන සම්බන්ධෙ..?"

මෝක්ෂා වියරු වැටී උන්නාය.

"මිකී.. මිකී.. මොකද මේ..? මට ඕන තරම් ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලා ඉන්නවා කියලා ඔයා හොඳටම දන්නවනෙ.. මට කවුරුවත් නීති දානවට මං කැමති නෑ.. ඔයා අන්න ඒක මතක තියාගන්න.."

කෙවින් දුරකතනය විසන්ධි කළේය. මෝක්ෂා ගල්ගැසිණ. ඇයට දැඩි අසරණ බවක් දැනිණ. ගෙදරින් ඇවිත් කාලයක් ගතවිණි ද මේ තරම් තනිකමක් කවදාවත් මෝක්ෂාට දැනී නැත. ඇයට ගෙදර සිහිවිණ. තමාගේය කියන්නට කිසිවෙකුත් ඈ ළඟ නෑ නොවේද කියා සිතිණ. මෝක්ෂා දෙවරක් නොහිතා ගෙදරට ඇමතුමක් ගත්තාය. ඇයට වේදනාවට පත් සිත සනසා ගන්න එබාකර තිබිණ. ඇගේ යහපතට හෝ අයහපතට රිසීවරය කණට ගත්තේ රෝෂණීය.

"අම්මා.."

මවගේ කටහඬ සැණින් හඳුනාගත් මෝක්ෂා කතා කළේ මඳක් වකිතයෙනි. තමා කළ දේ හැටියට අම්මා කොහොම සළකාවිද කියන්න බැරිය.

මෝක්ෂාගේ කටහඬ අසා රෝෂණී තුළ ඇතිවූයේ තදබල කලබලයකි. කතා කරන්නද එපාද කියා තෝරා බේරගන්න නොහැකිව රෝෂණී මොහොතක් ගල් ගැසී උන්නාය. අමනාපයක් සිදු කර හිතුවක්කාරීව පවුලෙන් පිටයිය දරුවා ගැන හිත තුළ තරමක කෝපයක් තිබූ බව ඇත්තය. එහෙත් ඒ කෝපය පරදා දරු දුක ඉස්මතු විය.

"මෝක්ෂා..."



The Reader's Place

රෝෂණී කතා කළේ හැඬුම්බර හඬකිනි.

"කොහොමද අම්මා..?"

සරල විදිහට කතාබහ පටන් ගන්නට මෝක්ෂාට උවමනා කර තිබිණ.

"මොකක්ද දරුවෝ මේ නටන නාඩගමේ තේරුම..?"

රෝෂණී ඇසුවාය.

"සොරි අම්මා.. මං මගෙ ජීවිතේ මට ඕන විදිහට හදාගත්තා.. අම්මල දකිනවා ඇතිනෙ මං කොච්චර ජනප්‍රිය වෙලාද කියලා..? ගෙදරට හිරවෙලා හිටිය නම් මට කවදාවත් මං හිතපු විදිහට ජීවිතේ හදාගන්න ලැබෙන්නෑ.."

මෝක්ෂා තේරුම් කරවන්න උත්සාහ කළාය.

"මොකක්ද ඔය ජීවිතේ තේරුම..? තාත්තා ඉන්නෙ සැහෙන්න තරහින්.. අපි කවදාවත් හිතුවෙ නෑ ඔයාට අපිව අමතක කරලා ජීවත්වෙන්න පුළුවන් කියලා.."

"කවුද කිව්වෙ මං ගෙදර අයව අමතක කරලා කියලා.. එහෙනම් මෙහෙම කතා කරනවද අම්මි..? ඔයාලනේ මා ගැන හොයන්නෙ බලන්නෙ නැතුව ඉන්න තීරණය කළේ.. තාත්ති සුවර් එකටම අම්මිටයි, නංගිටයි කියල ඇති මා එක්ක කතා කරන්නවත්, මා ගැන හොයන්නවත් එපා කියලා.."

"ඔයා තාත්ති ගැන දන්නවා.. එයා එපා කියන දෙයක් කළොත් හොයන්නෙ බලන්නෙ නෑ.."

රෝෂණී කීවේ වේදනාවෙනි.

"තාත්ති දැන්වත් අපේ කැමැත්තට තීරණ ගන්න හිතන්න ඕන අම්මා.. නැත්තං නංගිටත් වෙන්නෙ තාත්ති කැමති දේවල් කරන්න ගිහින් එයාගෙ ජීවිතේ සතුට නැති කරගන්න.. කවදාවත්





නංගිගෙ ජීවිතේ ගැන තීරණයක් ගන්නකොට මං නම් හිතන්නෑ තාත්ති නංගිගෙ කැමැත්ත ගැන අහයි කියලා.."

"ඔයා හිතන විදිහ වැරදි මෝක්ෂා.."

රෝෂණී කීවාය. දැන් ඇයට සැමියා වෙනුවෙන් සැමියාගේ පැත්ත ගන්නට හේතුවක් තිබෙයි.

"තාත්ති, නංගිගෙ අනාගතය ගැන තීරණය කරලා ඉවරයි.. හැබැයි ඒ තාත්තිගෙ කැමැත්තට නෙමේ.. සම්පූර්ණයෙන්ම නංගිගෙ කැමැත්තට.."

රෝෂණී, සස්මිත හා ශික්ෂා අතර වන සම්බන්ධය ගැනත්, ඒ දෙදෙනාගේ කැමැත්තට රාජිත අවසර දුන් ආකාරයත් විස්තර කළාය.

"නංගිටයි, සස්මිතටයි තාත්ති කැමැත්ත දුන්නා..!"

මෝක්ෂාට අදහාගන්නත් අමාරුය. ශික්ෂා හා සස්මිත අතර සම්බන්ධයක් ඇතිවීම ඇයට පුදුමයක් නොවේ. තමා මැදිහත් නොවුණා නම් එය සිදුවන්නේ මීට බොහොමයක් කලිනි. ඇයට පුදුමය නම් තාත්තා මේ සම්බන්ධයට කැමති වීමය.

"තාත්තිට ඕනෙත් එයාගෙ දරුවන්ට යහපතක් කරන්න.. සස්මිත නරක ළමයෙක් නෙමේ.. එයා ශික්ෂා එක්ක හොඳින් ජීවත්වෙයි කියල අපට විශ්වාසයි.. තාත්ති කැමති වුණේ ඒකයි.."

රෝෂණී තේරුම් කළාය.

"නංගි මට වඩා වාසනාවන්තයි.."

නොහිතාම මෝක්ෂාට කියවිණ.

"තාත්ති හැම වෙලාවෙම හිතන්නෙ ඔයාගෙත් යහපත මෝක්ෂා.. එයාට ඔය දෙන්නම එයාගෙ දරුවො.. ඔයාට උනත් ඉස්සරහට



The Reader's Place

කෙරෙන්න ඔන පුතුකම් තාත්ති කරයි.. ගෙදර ඇවිත් තාත්තිගෙන් සමාව ගන්න.."

රෝෂණී කීවාය. ඇගේ කුරුළු කූඩුව නැවත එක්වෙනවා දකින්නට රෝෂණී පෙරුම් පිරුවාය.

"තාත්ති මට සමාව දෙයි කියලා මං හිතන්නෑ අම්මි.."

මෝක්‍ෂා වේදනාවෙන් කීවාය. අම්මා, තාත්තා, සහෝදරී ළඟක නැති අඩුව ඇයට අද තරම් හොඳට වෙන කවරදාකවත් දැනී නැත.

"අපි තාත්තිව කැමති කරගන්නං.."

රෝෂණී, දියණියට අලුත් බලාපොරොත්තුවක් දුන්නාය.

මෝක්‍ෂා ගෙදර යන්න එන්න පටන් ගත්තොත් තවදුරටත් හිතුවක්කාර තීරණ ගැනීමෙන් වළක්වා ගන්නට පුළුවන. රෝෂණී පිළිවරය තබා කල්පනා කළාය. ගෙදර යහපත, පවුලේ අයගේ යහපත වෙනුවෙන් පතිනියක විදිහට තමාට ගත හැකි ඕනෑම තීරණයක් ගැනීමට රෝෂණීගේ හිතේ දහිරිය තිබිණ. ඒ හින්දා ඇ මේ ගැන රාජිතත් එක්ක කෙළින්ම කතාබහ කළාය.

"එයාට දැන්ද ගෙදර මතක් වුණේ..? මෙච්චර කල් අපි උන්නද මළාද හෙව්වෙ නෑ.."

රාජිත පළමු වෙඩිමුරය පත්තු කළේය.

"ඒ ඉතිං බයටනෙ අනේ.. ඔයා මොකුත් කියන්නැත්තං එයා ගෙදර එයි.."

"නටන්න පුළුවන් නාඩගම් ඔක්කොම නටලා... අන්තිමට ගෙදර එන්න අහනවා.. මං කිව්වනෙ එයාව මගෙ මරණෙටවත් එපා.."

"එහෙම කියන්න එපා ඒයි.. මොනා උනත් ඒ අපේ දරුවනෙ..





මේ වෙලාවෙ අපි ඒ දරුවට ගෙදර දොර වැහුවොත් කොහේ කියල යන්නද..?"

රෝෂණී හඬා දොඩා වැළපී මෝක්‍ෂා ගෙදර ගෙන්වා ගන්නට රාජිතගේ කැමැත්ත ගන්න හැදුවත් එය හරිගියේ නැත. කොයි තරම් තේරුම් කරවන්න උත්සාහ කෙරුවත් රාජිත තේරුම්ගත් බවක් පෙනුණේද නැත. රෝෂණී හිතූ හැටියට රාජිත සියල්ල තේරුම් ගත්තත් - මෝක්‍ෂා ගෙදර එනවාට යටිහිතේ අකමැත්තක් නැතත් එය කෙළින් පෙන්වන්නට කැමති නොවිණි.

"අපි සස්මිතටවත් කියල බලමුද අම්මි, තාත්ති එක්ක කතා කරන්න කියලා.."

ශික්‍ෂා යෝජනා කළාය. අක්කා යළි ගෙදර එනවා දකින්නට ලොකු ශීනයක් ඇගේ සිත තුළ තිබිණ.

"සමහර විට සස්මිත ළමයා කතා කළා නම් කැමතිවෙයි තමා.."

රෝෂණීත් බලාපොරොත්තු සහගතව කීවාය.

* * * * * * * * * *

The Reader's Place



# 08

රාජිත පුතෙකුට ආසා කළේ බැඳපු දා සිටය. කවදාක හෝ තමාගේ ජීවිතයේත්, පවුලේත්, ව්‍යාපාරවලත් දුක සැප කතා කර බෙදා හදාගෙන ජීවත්වීමට මිතුරෙකු වාගේ තරුණ පුතෙකු ගැන හීනයක් රාජිත තුළ තිබිණ. දියණියන් දෙදෙනාට පමණක් සීමාවූ දරුඵල සම්පත්තිය නිසා යටපත් වූ ඒ හීනය නැවත මතුව ආවේ සස්මිත මහානාම නිසාය. සස්මිත කාර්යශූරය. කඩවසම්ය. ගුණගරුකය. ඔහු වතු යායේ සෑම ලොකු කුඩා දෙයම හොයා බලා කළේය. ඉදිරි පියවර ගැන සස්මිත නිතරම රාජිත සමග සාකච්ඡා කළේය. මේ සෑම විටකම රාජිතගේ හදවත රාජිතට කීවේ 'අනේ මේ වගේ පුතෙක් මටත් හිටියා නම්' කියාය. ශික්ෂා හා සස්මිත අතර සම්බන්ධයක් වන බව දැන රාජිත කලබල නොවුණේත්, දුරට දිගට හිතා ඔවුන්ට කැමැත්ත දුන්නේත් ඒ නිසාමය. මෝක්ෂාට ගෙදර එන්න රාජිතගේ අවසරය ලබා දෙන්නැයි ශික්ෂා, සස්මිතගෙන් ඉල්ලුවේ රාජිත තුළ සස්මිත කෙරේ වූ මේ ආකල්පය හොඳින් අවබෝධ කරගෙන උන් හින්දාය.

"මං සර්ගෙ පෞද්ගලික ජීවිතේට ඇඟිලි ගහනවා කියලා වරදවා හිතන්න එපා.. මං මේ දේවල් කියන්නෙ පුංචි යෝජනාවක්



The Reader's Place



ඒදිහට.. මෝක්ෂාට සමාව දීලා ගෙදරට බාරගන්න එක හොඳයි කියලයි මට හිතෙන්නෙ සර්.."

සස්මිත, රාජිත හමුවී කීවේය.

"මං හිතා ඉන්නෙ ඔය දරුවා මළා කියලා.. මට දැන් ඉන්නෙ එක කෙල්ලයි සස්මිත.."

රාජිත, සස්මිත ළඟදී උනත් පහසුවෙන් උණුවුණේ නැත.

"ඒත් දරුවන්ට, දෙමව්පියන්ව අමතක වෙන්නැ වගේ, අම්මා තාත්තා දෙන්නටත් කවදාවත් මළත් තමන්ගෙ ලෙයින් උපන් දරුවෙක්ව අමතක කරන්න බෑ නේද සර්..?"

"මෝක්ෂා ගෙදරින් ගිහින් මගෙ නම කැත කළා.. එස්ටේට් එකේ උන් කිව්වෙ වරුසප්පෙරුම්කාරයගෙ ලොකු කෙල්ල තරහවෙලා ගෙදරින් ගිහින් කියලා.. ඒ ගිහිල්ලත් කළේ හොඳ දේවල්ද..? අතන මෙතන එළියෙ දාගෙන ප්‍රසිද්ධියෙ දැඟලුවා.."

"අපි මෝක්ෂා කරපු වැරදිවලට දැන් සමාව දුන්නෙ නැත්තං ඉස්සරහට මීට වඩා ලොකු දේවල් කරන්න පුළුවන් සර්.. ඒත් අවනම්බුව එන්නෙ මුළු පවුලටමයි. එයාව දැන් ගෙදරට ගත්තොත් අඩුම තරමෙ ඉස්සරහට එයා ගන්න තීරණයකට හරි බලපෑමක් කරන්න පුළුවන් නේද..?"

සස්මිත කියන්නේ හැබෑ බව රාජිතට තේරුම් යයි. මළායි හිතාගත්තා කීවාට ඇත්තටම එහෙම සිදුවුණේ නැතිබව රාජිත දනී. ඇත්තම කතාව නම් මෝක්ෂා ගෙදර උන්නාටත් වඩා ඇ ගෙදරින් ගිය දා සිට ඇ තමාට හිතේ තිබූ දරු දුක ඇවිස්සී තිබීමයි.

"මං දන්නෑ.. සස්මිතලට හොඳයි කියල හිතෙන දෙයක් කරන්න.. කොහොමත් ගෙයි ඇතුලෙ ඉන්න අනික් දෙන්නගෙ කැමැත්තටත් මං ඉඩ දෙන්න ඕනනෙ.. මට එපා උනත් මගෙ නෝනට එයාගෙ කුසින් වදාපු දරුවව ඕනේ.. මගෙ දරුවට එයා එක්ක එකට අම්මගෙ කුසින් හැල්ලු වෙච්චි සහෝදරී ඕනේ..

මේවා මට නොතේරුණා නෙමේ සස්මිත.. මගෙ අකමැත්ත නෑ ඕගොල්ල කතා කරලා හොඳ දෙයක් කරන්න.."

රාජිත කැමැත්ත දුන්නේ එහෙමය. ශික්ෂාත්, රෝෂණීත් සතුටු වූවාය. බොහෝ කලකින් දකින සොඳුරිය පිළිගැනීමට ශික්ෂා මග බලා උන්නාය. රෝෂණීත් වැඩිමල් දියණිය ආසා කරන කෑම හදාගෙන පෙරමග බලා උන්නාය. උදේ සිට බලාපොරොත්තු වූ නමුත් මෝක්ෂා ගෙදර ආවේ කළුවර වැටෙද්දීය.

"ඇයි අක්කි පරක්කු උනේ..?"

මෝක්ෂා බදා වැළඳ ශික්ෂා ඇසුවාය.

"දවසම ගොටෝ ෂූට් එකක් තිබ්බා.. ඉවර වෙච්ච ගමන් කැබ් එකක් හයර් කරන් ආවෙ.."

මෝක්ෂා කීවාය.

"තාත්තට කතා කරල හිටියනං.."

රෝෂණී. දියණියට කීවාය. රාජිත උන්නේ කාර්යාල කාමරයට පිංගාගෙනය. මෝක්ෂා එහි දොරින් එබුණේ ගැහෙන හදවතිනි.

"තාත්ති.."

රාජිත කතා කලේ නැත. ඇත්තටම කුමක් කියන්නදැයි තෝරා බේරා ගන්නට රාජිතට බැරිවිය. මෝක්ෂා බයෙන් බයෙන් නමුත් රාජිත ළඟ වැද වැටිණ.

"මට සමාවෙන්න තාත්ති.."

මෝක්ෂාට හැඩිණ.

"හ්ම්.."

රාජිත ඒ හිස මත අත තැබුවේ අහක බලාගෙනය. මෝක්ෂා නැගිට කාමරයෙන් පිටව යනතුරුත් රාජිත ඇ දෙස බැලුවේ





නැත. තාත්තාගේ හැටි මෝක්ෂා දැන සිටියාය. අම්මාගේත්, නංගීගේත් වදයට තමා ගෙදරට ගෙන්නා ගන්න කැමති වුණාට ඔහු ලෙහෙසියෙන් පරාජය බාර ගන්නා චරිතයක් නොවේ. කොහොම උනත් රාත්‍රී කෑම මේසයේදී පේම ඉන්පසුවත් කාලයකට පසු එකතු වූ අම්මාත්, දියණියන් දෙදෙනාත් සතුටින් ඉන්නවා රාජිත දුටුවේය.

"ඉතිං.. ඉතිං.. දැන් කියමු බලන්න අලුත් විස්තර..?"

නිදියහනේදී මෝක්ෂා, ශික්ෂාව තුරුළු කොට ගනිමින් කීවාය.

"අලුත් විස්තර..? ඒ මොනවද..?"

එහෙම කීවත් අක්කා අහන්නේ කුමක්දැයි ශික්ෂා දැන උන්නාය.

"ඔන්න ඉතිං මටත් කොලේ වහනවා.. මට අම්මා කිව්වා ඔක්කොම.. මොකද බයද මං සස්මිතව ආයිත් අල්ල ගනී කියලා..?"

මෝක්ෂා හිනැහී ඇසුවාය.

"අනේ එහෙම නෙමේ අක්කි.."

"මොකද සස්මිත කියන්නෙ..? තාමත් මා ගැන තරහින් ඇත්තෙ නේද..?"

"නෑ අක්කි.. එයා ඉන්නෙ දැන් ඒ සේරම හිතින් අමතක කරලා.."

"සස්මිත මට සමාව දුන්නත් ලේසියෙන් මට බුරුලක් පෙන්නන එකක් නෑ නංගි.. එයාට තියෙන්නෙත් අපේ තාත්තිගෙ ගතිගුණ.. කොහොම උනත් එයාට ගැළපෙන කෙල්ල තමා ඔයා.. මට හරි සතුටුයි ඔය දෙන්නගෙ සම්බන්ධෙට තාත්ති කැමතිවෙච්ච එක.."



The Reader's Place

මෝක්‍ෂා කීවාය. ඒ කටහඬේ තරමක දුක්බර බවක් තැවරී තිබිණ.

"අපි හෙට සස්මිතව හම්බවෙමු අක්කි.. මට ඕනෙ ඔය දෙන්නා සහෝදරයො, යාළුවො වගේ ඉන්නවා දකින්න.."

මෝක්‍ෂා කීවාය.

"මට හෙට සස්මිතව හම්බවෙන්න බැරිවෙයි නංගි.. පාන්දරින්ම පිටත්වෙන්න ඕන.."

"අයියෝ.. මං හිතුවෙ ඔයා සතියක්වත් ගෙදර ඉඳී කියලා.."

ශික්‍ෂා පුදුමයෙනුත්, දුකෙනුත් හඬ ගෑවාය.

"මං උදේන්ම යන්න ඕන නංගි.. හෙට බාරගත්තු වැඩ ගොඩක් තියෙනවා.."

"මොනාද අක්කි.."

ශික්‍ෂා පෙරැත්ත කළාය.

"මොනා කරන්නද ළමයෝ.. මේ දවස්වල මං ගොඩක් බිසී.. ඔයාට ඇත්තටම තේරුම් ගන්න අමාරුයි මොඩලින් කරනකොට ජීවිතේ කොහොමද කියලා.."

තවදුරටත් පෙරැත්ත කිරීමෙන් ඵලක් නැතිබව ශික්‍ෂාට තේරිණ. අක්කිගේ ඇති වරද ඕකය. තමා ගැන විතරක් සිතීමය. අනුන් ගැන මොහොතකටවත් නොසිතීමය. මේ හිතුවක්කාරකම, මුරණ්ඩුකම තාමත් අක්කා ළඟින් ඉවත්ව් නැත. ශික්‍ෂාට නොදැනීම ඇගේ මුවින් සුසුමක් ගිලිහිණ.

* * * * * * * * *

පසුදා උදේන්ම අවදි වූ මෝක්‍ෂා හනික ආපසු ගමනට සූදානම් වූවාය. ළා රෝස පැහැය තැවරූ කම්බුල් දෙස මෝක්‍ෂා නැවත





වරක් කැඩපතට එබී බැලුවාය. ඇත්තය. මේ පිහිටා ඇති ලස්සන ලේසියෙන් කෙල්ලකගේ රූපයක දකින්න ලැබෙන ලස්සනකුත් නොවේ. මෝක්‍ෂා ඒ බව හොඳින් දැන උන්නාය. අම්මා, තාත්තා තදින් විරුද්ධ වෙද්දීත් මෝක්‍ෂා නිරූපිකාවක වීමට තීරණය කළේ ඒ හින්දාම නොවේ. පහසුවෙන් ජනප්‍රිය වීමටත්, පහසුවෙන් මුදල් ඉපයීමටත් එය මාර්ගය බව තීරණය කළ නිසාය.

ගිය මාසේ කොණ්ඩය අලුත්ම රටාවට කපා සම්පූර්ණයෙන්ම තඹ පාට ගැන්වූ නිසා දැන් නම් දකින ඕනෑම කෙනෙකුට ශික්‍ෂා හෝ මෝක්‍ෂා වෙන්කර ගත හැකිය. වෙනකක් තබා ගෙදරින් පිටව ගොස් ගෙවිගිය මාස ගාණට මෝක්‍ෂාගේ හමේ පැහැයත්, මුහුණත් ශික්‍ෂාගේ මුහුණට වඩා වෙනස්ව ගොස් තිබේ. තවදුරටත් ශික්‍ෂා, මෝක්‍ෂා දෙදෙනා සොයුරියන් මිස නිවුන්නුන් ලෙසම හිතන්නට මොහොතක් දෙකක් විමසා බලන්නට සිදුවෙන තරම්ය.

"අක්කි.."

මෝක්‍ෂා ඒ හඬට කැඩපතින් ඇස් මුදා බැලුවාය. නිල් පාට රාත්‍රී නිදන ඇඳුමින් සැරසුණ නංගී - ශික්‍ෂා නිදිගැට කඩමින් බලා උන්නාය.

"අක්කි.. ඔයා ලෑස්තිවෙන්නෙ යන්නද..?"

ශික්‍ෂා ගීන් හඬින් ඇසුවාය.

"ඔව්.. අද ටෙන් තර්ටි වෙද්දි මං කොළඹ ඉන්න ඕන.."

මෝක්‍ෂා අත් බෑගය කරට දාගත්තාය.

"ඉතිං මෙ දැන්..? මේ මහ පාන්දර යන්නෙ..?"

තාමත් හරියට බිමට එළිය වැටී නැත. ශික්‍ෂා ඇසුවේ ඒ නිසාය.

"අම්මි හරි තාත්ති හරි නැගිට්ටොත් බර බරේ දායි.. මට



The Reader's Place

ලේසියෙන් ගැලවිලා යන්න ලැබෙන්නෑ ඩාලිං... ඒ දෙන්නා නැගිටින්න කලින් යන්නෝන.."

මෝක්ෂා හදිසියෙන් කීවාය.

"මං එහෙනං යනවා පැටියෝ.. බායි.."

මෝක්ෂා ඒ කලබලයෙන්ම නැගණියගේ කම්බුල් සිප කාමරයෙන් පිටවූවාය. ඒ අඩි උස සපත්තු දෙක අතේ අරන්ය. අඩි හඬින් අම්මාට හෝ තාත්තාට අහුවෙන්න පුළුවන. ශික්ෂා තවත් මොහොතක් ඇඳේ හිඳ උන්නාය. අක්කාගේ චරිතය ගැන ශික්ෂාට මොකවත්ම තේරුම් ගන්න අමාරුය. ගෙදරත්, අම්මාත් තාත්තාත් ලෝකය කොට උන් ශික්ෂාට ගෙදරින් පිටත ලෝකයේ අක්කා මේ හොයන, ඇය ලබන සතුට මොකක්දැයි නොතේරේ.

ශික්ෂා හෙමිහිට කුස්සියට ගියාය. අම්මා රතුහාල් පිටි ඉදිආප්ප මිරිකන්නීය. ගෑස් ලිප මත පුදුපාට අල හොද්දක් උතුරන්නීය.

"අම්මා අද ඉදිආප්පද..?"

රෝෂණී බාල දියණියගේ හඬට හිස හරවා බැලුවාය.

"ඔව් දූ.. අක්කි ආසනේ ඉදිආප්පවලට.. මං ඉදිආප්පයි, එයා ආසා විදිහට අල කරි එකකුයි හැදුවා.. කාලෙකින්නේ ගෙදර ඉන්නෙ.. ඔය එක එක තැන්වල ගියාට මේ වගේ කටට රසට දෙයක් කන්න ලැබෙන්නෑනෙ.."

රෝෂණී කියාගෙන ගියාය. ශික්ෂාට අම්මා ගැන දුක හිතිණ. අම්මා, අක්කාට කොයි තරම් ආදරේද..? අක්කා පිටුපාන්නේ ගෙදරින් ලැබෙන ඒ උතුම් ආදරයට නොවේද..?

"කෝ අක්කි නිදිද දූ..? දැන්ම නැගිට්ටොත් උණුවෙන්ම ඉදිආප්ප ටිකක් කන්න පුළුවන්.."

රෝෂණී අල හොද්ද ලිපෙන් බෑවාය.





"අම්මී..."

අක්කා ගෙදරින් පිටවුණා කියා අම්මාගේ මුහුණට එකපාරටම කියාගන්නේ කොහොමදැයි ශික්ෂාට හිතාගන්න බැරිය.

"ඇයි ළමයෝ..?"

"අක්කි ගියා අම්මී.."

ශික්ෂා හෙමිහිට කීවාය.

"මොකක්..!"

ගැස්සී හැරී බැලූ රෝෂිණීගේ අත තිබූ හැන්ද ශබ්ද නගා බිම වැටිණ.

"එයාට අද වැඩක් තියෙනවා කියලා දැන් ටිකකට කලින් ගියා.."

The Reader's Place

ශික්ෂා ඒ ටික කීවේ අම්මාගේ ඇස් මගහැර බිම බලාගෙනය. අම්මාගේ ආදරයට පිටුපා අක්කා පුරවා ගන්නා පව අක්කාට නොතේරුණාට ශික්ෂාට හොඳ හැටි තේරිණි.

"මැදෑ.. මං පාන්දර කීයෙ ඉඳලද මේ මහන්සි වෙන්නෙ..? මං හිතුවෙ අදවත් ගෙදර ඉඳී කියලා.. අඩුම තරමෙ යන තැනක් දෙමව්පියන්ට කියලවත් යන්න වටිනවනෙ.. මොකට හැදුවද මේ වගේ දරුවෙක්..?"

රෝෂණී කෝපයෙන් කියාගෙන ගියාය. ඇගේ හිතට තරහාය. ඊට වඩා දුකය.

"අම්මා.."

ශික්ෂා අම්මාගේ උරහිස මත අත තැබුවාය. වැටෙන්නට බලාගෙන අම්මාගේ ඇස්මත එල්ලී තියෙන රවුම් කඳුළු බිඳු දෙක ශික්ෂා හොඳ හැටි දුටුවාය.

"අපට අන්තිමට ඉතුරු වෙන්නෙ ඔයා විතරයි පුතේ.."

රෝෂණී හඬාගෙන බාල දියණියව තුරුළු කර ගත්තාය.

* * * * * * * * *

සස්මිත කාර්යාලයට යන්න පෙරාතුව වරුසප්පෙරුම බංගලාවට ආවේය. ඒ ශික්ෂා දැක ගන්නය. ශික්ෂාට, සස්මිතගේ බයිසිකලයේ හඬ ඇසිණ. ඈ දොරින් එළියට බැස බයිසිකලය ළඟට ගියේ අඩියට දෙකටය.

"ගුඩ් මෝනින්.."

ශික්ෂා හිනැහී කීවාය. ඇස් පුංචි කර ඈ හිනාවෙද්දි මොන තරම් සිරියාවක්දැයි සස්මිතට හිතිණ. තමාගේ ලෝකයේ ඇති ආලෝකය මේ සිනාවම නොවේදැයි ඔහු සිතුවේය.

"ඇයි අමුතු විදිහට බලන්නෙ..?"

සස්මිතගේ ඇස්මත දිළිසුන ආදරය ශික්ෂාට දරන්නට අමාරු තරමය.

"මගෙ ජීවිතේට පණක් දුන්නෙ ඔය හිනාව නේද කියල කල්පනා වුණා.."

සස්මිත ඇත්තම කීවේය. ශික්ෂාගේ හිතට තද ලැජ්ජාවක් දැනිණ. තැඹිලිපාට රෝස පඳුර ළඟට කිට්ටු වූ ශික්ෂා උස් අත්තක හොඳින් පිපුණු මලක් අතගාන්න වූවාය. ඒ මලේ සිනිඳු පෙති පහස ඇගේ අතැඟිලි වලට දැනිණ.

"ඇයි ලැජ්ජද..?"

සස්මිත, ශික්ෂාගේ හිත හඳුනාගෙන තිබිණ. ඔහු ආශා වුණේත් ශික්ෂා තුළ නිතර පෙනුණ මේ ලැජ්ජාශීලී ගතියටය. මේ නැවුම් බවටය. දැන් ඒ අමිල වස්තුවේ හිමිකාරයා තමා බව හිතද්දි දැනෙන සතුට දරාගන්නත් බැරි තරමය.





"මට හරි පුදුමයි වෙලාවකට අපි දෙන්නට රාජිත සර් හැමතිවුණා කියල හිතෙනකොට.."

සස්මිත බයිසිකලයෙන් බැස ශික්ෂා ළඟට කිට්ටු විය.

"ඇයි..?"

ශික්ෂා හෙමින් ඇසුවාය. ඇගේ ගැවී නොගැවී හිටගත් සස්මිතගේ ළඟින් අපූරු සුවඳක් ශික්ෂාට දැනිණ.

"මගෙ ගමේ ගත කරපු ජීවිතේ මතක් කරන්න හිතෙන්නෙ නැති තරම් දුක හිතෙන කාලයක් ශික්ෂා.. මට ගොඩක් ප්‍රශ්න තිබ්බා.. ඒවායින් මං ගොඩක් විඳෙව්වා.. සැපක් සතුටක් ඇහැපේන තැනක තිබ්බෙ නෑ.. මට හිතුණෙම ජීවත්වුණා ඇති කියලා.. ඒත් මං මළේ නෑ.. අන්තිමට මං හිතාගත්තා මේ ප්‍රශ්න ඔක්කොටම කවදු හරි මූණ දීලා දිනනවා කියලා.."

ශික්ෂා, සස්මිත කියන්නක් අසා උන්නේ අදහාගන්න බැරිවය. ශික්ෂා හැමදාමත් සස්මිතව දුටුවේ සැහැල්ලුවෙන්, විනෝදයෙන් ජීවිතය ගත කරන තරුණයෙකු ලෙසටය. එතුයාගේ වැඩ බාරගත් දා සිට සස්මිත හැසිරුණේත් සතුටින් සෙල්ලකාරීව නොවේද..? අක්කා නිසා පහුගිය කාලේ වේදනාවට පත්ව උන්නත් සස්මිතට මේ තරම් දුක හිතෙන අතීතයක් තිබෙ යැයි ශික්ෂාට නොහිතිණ.

"මං ගමින් මෙහෙ ආවෙ ඇත්තටම මට ටික කාලෙකට හරි මටව නිදහස් කරගන්න ඕන හින්දා.. මෙහෙදිත් මුල් කාලෙදි මෝක්ෂා හින්දා ප්‍රශ්න ඇතිවුණහම මට මාවම එපා උනා.. මං කවදාවත් සතුටින් ඉන්න පින් කරල නැද්ද හිතුණා.."

සස්මිත වේදනාවෙන් කීවේය. ඒ පිරිමි ඇස්මත ඒ වේදනාව ශික්ෂා පැහැදිලිව දුටුවාය.

"සස්මිත.."

ශික්ෂා හෙමිහිට සස්මිතගේ අතක් අල්ලා ගත්තාය. වැළඹියෙන්



The Reader's Place

පහළ අත දිගට වැවුණ රෝම ශිෂාගේ දිගු ඇඟිලිවලට හසුවිය. සස්මිත කඩවසම්ය. එහි කතා දෙකක් නැත. ඒත් සාමාන්‍ය තරුණයකුටත් වඩා ඔහුගේ පපුවේත්, දෑත දෙපයේත් රෝම වැවී තිබිණි. ශිෂා මේ දේහ ලක්ෂණයටත් බොහෝ ආසා වූවාය.

"ඔය දේවල් කියන එක වේදනාවක් නම්.. ඒවා කියන්න එපා.."

ශිෂා කීවාය. සස්මිතට ආදරය කළ හිතින් ඔහු චුට්ටක්වත් වේදනා විඳිනවා දකින්නට ශිෂාට ඕනෑ නොවිණ.

"නෑ මැණික.. ඔයා මේවා දැනගන්න ඕනේ.."

සස්මිත තමන්ගේ අත මත තිබූ ශිෂාගේ ඇඟිලි අල්ලා ගත්තේය. ඒ සිහින් ඇඟිලිවල සීතල පහස ඔහුට හොඳින් දැනිණ.

"ඒත් ඒවා මතක් කරන එක ඔයාට වේදනාවක්නෙ.."

"ඔයා මේවා දැනගත්තම මාව තේරුම් ගන්න ලේසිවෙයි ශිෂා.."

"මං ඔයාව තේරුම් අරන් ඉන්නෙ.."

"කොච්චරක්ද..?"

සස්මිත ඒ පියකරු ඇස් මතට එබිණ.

"ඔයා හිතනවට වඩා සස්මිත.."

"කවදාවත් මට නැතිවෙන එකක් නැද්ද..?"

"නෑ.."

"මාව අමතක වෙන එකක් නැද්ද..?"

"නෑ.."





"මට රිද්දන එකක් නැද්ද..?"

"නෑ සස්මිත.. කවදාවත් නෑ.. ඔයාට වගේම මටත් ඔයාව ඕනේ.. දැනෙනවද මගෙ ඇඟිලි ගැහෙන හැටි.."

ශිෂා ඇසුවේ සස්මිත අල්ලා උන් අත දෙස බලාය.

"හ්ම්.. ඇයි ඒ..?"

"දරාගන්න බැරිව.. ඔයාගෙ උණුහුම, ආදරේ, ආරක්ෂාව මට ඒ තරම් වටිනවා.."

ශිෂා ඇස්වල කඳුළු පුරවාගෙන කීවාය. සස්මිතට තවත් දරාගන්න අමාරුය. හිත උතුරන ආදරේ ඇගේ හැම ස්නායුවම බලගන්වා ශක්තිය දී තමාටත් තමා වලංගු නැති ගානය. වටපිට බලා සැණින් ශිෂා ඇද තුරුළට ගත් සස්මිත ඇගේ රෝස තොල් සෙමින් සිප ගත්තේය. ශිෂා හිරි වැටී ගියාය. ඒත් ඒ උණුසුමින්, ස්පර්ශයෙන් ඈ පණ ලැබුවාය. ජීවිතය මේ තරමම සොඳුරුවේ යැයි ඈ කවදාවත් හිතා නොතිබිණ.

"තරහද..?"

තාමත් කෙළින් හිස ඔසවා බලන්නට ශක්තිය නැතුව ඉන්නා ශිෂාගෙන්, සස්මිත ඇසුවේය.

"තරහ වෙනව නම් තරහවෙන්න තිබුණෙ අද නෙමේ.."

ශිෂා කීවාය. ඈ මේ කියන්නේ කවදා ගැනදැයි සස්මිතට මතකය. එදා අක්කාත්, නංගීත් එකතුව තමා රවටන්න උත්සාහ කළ දවසක රැයේ මේ විදිහටම මේ මොළොක් තොල්පෙති බලෙන් සිප ගත්තා සස්මිතට මතකය. සස්මිතගේ මුහුණේ අපූරු සිනාවක් මතුවෙනවා ශිෂා දුටුවාය.

"කවුද දන්නෙ එහෙම කළාට තරහා වෙන්නෑ කියලා.. කලින් දැනන් උන්න නම් එදා ලේසියෙන් අතාරින්නෑ.."

සස්මින කීවේ සිනාසෙන අතරේය.

"හරි නරකයි.."

ශික්ෂා, සස්මිනගේ සවිමත් පපුතුරට තට්ටුවක්දා ඒ සිනාවට හවුල් විය.

"අක්කා උදෙන්ම ගියා.."

ශික්ෂා උන් හිටි හැටියේ මතක් වී කීවාය.

"මං දැක්කා හෝල්ට් එකේ ඉන්නවා.."

සස්මින කීවේය. ඒ මුහුණින් සිනාව අතුරුදහන් විය.

"මොකද අක්කව දැක්කම හිතුණේ..?"

ශික්ෂා ඇසුවාය.

"පෙනුම ගොඩක් වෙනස්වෙලා.. ඒකට නම් මට හරි සතුටුයි.."

"ඇයි ඒ..?"

"දැන් නිවුන්නු උනාට ඔයයි, එයයි අතරේ පැහැදිලි වෙනසක් තියෙනවා.. එයා ජීවත්වෙන විදිහ බලද්දි ඒ වෙනස ඔයාගෙ නම්බුවට, ගෞරවයට හොඳයි ශික්ෂා.."

"ඒ තරම් මා ගැන හිතනවද..?"

"තමන් කසාද බඳින ගෑනිගෙ ගෞරවය ගැන හිතන්නැත්තෙ කවුද..? රට වටේම කෙල්ලන්ට ලව් කරන කොල්ලො පවා කසාද බඳින්න යනකොට බඳින කෙල්ලගෙ ගෞරවය ගැන හිතනවා.. ඉතිං මං හිතන එක පුදුමයක්ද..? මට ආදරේ කියන්නෙ වන්දනාවක් ශික්ෂා.. ඔයා උනත් ඒ ආදරේට පව් කරනවට මං කැමති නෑ.."

සස්මින කීවේය. ශික්ෂාට හීල්ලිණ. ඉස්සර සස්මින, අක්කාට යටවී ඇයට ආදරය කළ කාලේ ඔවුන් පස්සෙ යන ශික්ෂාට මේ





ඉව දැනී තිබිණ. සස්මින ආදරය වන්දනාවක් කර ගිහන කොල්ලෙකු බව තේරී තිබිණ. ඇ ඒ හැඟීමට ආශා කළාය. සස්මින ගැන ලොකු ගෞරවයක් හිත තුළ ඇතිවෙන්නට ඒ හඳුනා ගැනීම ලොකු හේතුවක්ම විය.

"ගිහින් එන්නං.. හොඳටම පරක්කු උනා.. මෙ දවස්වල අලුත් එකවුන්ටන් කෙනෙක් ගන්න ඉන්ටවිව් කරනවා.."

සස්මින කලබලයෙන් බයිසිකලයට ගොඩවන අතරේ කීවේය.

"තාත්ති, අම්මිත් එක්ක කියනවා මං අහගෙන.. රිටයඅ වෙච්ච ක්ලාක් කෙනෙක් වගේ නම් ගොඩක් හොඳයි කිව්වෙ.."

ශික්ෂා කීවාය.

"ඔව් ඉතිං.. එහෙම අයට ලොකු එක්ස්පීරියන්ස් එකක් තියෙනවානෙ.."

සස්මින බයිසිකලය පණ ගන්වා ගත්තේය.

"තෙරුවන් සරණයි.."

ශික්ෂා ආදරය තැවරුන හිනාවකින් කීවාය.

"මං ආදරෙයි මැණික.."

සස්මින කීවේ බයිසිකලය පල්ලමට ගන්නා අතරේය. ශික්ෂාට දැනුණේ දරාගන්න බැරි තරම් ආදරයක් ජීවිතය වසා ඉතිර පැතිර තිබෙන බවය.

* * * * * * * * * *

කම්කරුවන්ට සැලකීම අතින් වරුසප්පෙරුම වතු යාය ඉතා හොඳ නමක් දිනාගෙන තිබිණ. නියමිත දිනයට පඩි ගෙවීම, අතිකාල දීමනා, දිරි දීමනා, උත්සව අත්තිකාරම් ආදිය නොමඳව ලබාදීම නිසා රාජිතගේ ෆැක්ට්රිය හා කාර්යාලය රැකියාවක් කරන්නට හොඳ තැනක් ලෙස පළාතේ ප්‍රසිද්ධව තිබිණ. කලින් වැඩ කළ

විගණකාධිකාරීවරයා විශ්‍රාම ගැනීමෙන් පසුව රාජිත පත්තරේට දැන්වීමක් දැම්මෙ වඩා හොඳ පළපුරුද්දක් ඇති කෙනෙකු තෝරා ගන්නය. දින දෙකක් තිස්සේ සම්මුඛ පරීක්ෂණය සඳහා බොහෝ පිරිසක් රාජිතගේ කාර්යාලයට ආවෝය. රාජිත අයදුම්කරුවන් සමඟ සාමුව කතාබහ කලේ හිතට හරියන කෙනා තෝරා ගන්නය.

"ඊළඟ.."

චන්දනගේ ඇමතුම් හඬින් කාර්යාල කුටියට ආවේ අවුරුදු පනහක පමණ පිරිමියෙකි.

"ඉඳගන්න.."

රාජිත කීවේ කරුණාබර පෙනුමැති වැඩිහිටියා දෙස හොඳින් බලාය. ඔහුගේ සුදුසුකම් ලිපිගොනුව ගෙන බලන අතරින් පතර රාජිත ප්‍රශ්න කීපයක් ඇසුවේය. කලින් වැඩ කර ඇත්තේ කොළඹ නගරය ආසන්නයේය. සෙත්සිරිපායේ, සංස්කෘතික අමාත්‍යාංශයේ ලියන්නෙකුව ඉඳ ඇත. එකම දියණිය විවාපත්ව නුවර පදිංචියට ආ නිසා නියි වයසට කලින් විශ්‍රාමයට සමුදී ඔහුගේ දියණිය සමඟ නුවර පදිංචියට පැමිණ තිබේ. මේ විස්තරවලට අනුව මෙ තනතුරට ගැළපෙන පුද්ගලයා මොහු බව රාජිත සිතුවේය.

"එක්ස්කියුස් මී සර්.."

සස්මිත වීදුරු දොරින් ඇතුළට එබුණේ හදිසියේය.

"සස්මිත.."

රාජිත සේම අමුත්තාත් හැරී බැලුවේය. සස්මිත දුටු ගමන් ඒ මුහුණ වෙනස් විය. සස්මිතගේ මුහුණින් කලබලව ගියේය. මොහොතකින් අමුත්තාගේ මුහුණේ අපූරු හිනාවක් මතුවිය.

"මහත්තයා මෙහෙද වැඩ..?"

අමුත්තා, සස්මිතගෙන් ඇහුවේ බොහෝ කලක සිට දැන හඳුනන කෙනෙකු මුණ ගැහුණ තරම් සතුටකිනි.





"ආ.. මෙ.. ම.. ව්.."

සස්මිතගේ මුහුණේ සතුටක් නොවිණ. ඔහු ඇතුළත ඇතිව තිබූ කලබල ගතිය වසා ගන්නට උත්සාහ කළ බවක් රාජිතට පෙනිණ.

"දෙන්නා අඳුනනවද..?"

රාජිත ඇසුවේය.

"ආ... ම..ව්.. සර්.."

සස්මිත, අමුත්තාට පෙර වහා කීවේය. රාජිත ඊට වඩා යමක් ඒ ගැන සස්මිත කියාවී හිතූ නමුත් සස්මිත තවදුරටත් ඒ ගැන කතා කරන්නට සූදානම් නොවිණ.

"සර්.. මං ආවෙ ෆැක්ටරි එකේ ප්‍රශ්නයක් ගැන කතා කරන්න.."

සස්මිත කීවේය.

"මිස්ට රණවක.. එළියෙන් ඉඳගෙන ඉන්න.. මං ආයෙ කතා කරන්නං.."

රාජිත අර පුද්ගලයාට කීවේය. ඔහු ඒ වචනයට කීකරු විය. කාමරය තුළ ඉතිරි වුණේ සස්මිතත්, රාජිතත් විතරයි. තේ කම්හලේ කම්කරුවන්ගේ උදෑසන ආහාරය සැපයීම ගැන රාජිතත්, සස්මිතත් සාකච්ඡා කළහ.

"සස්මිත, රණවක ගැන හොඳට දන්නවද..?"

සාකච්ඡාව අවසානයේ රාජිත ඇසුවේය.

"එහෙමට ඇඳුනුම්කමක් නෑ සර්.. ඇයි..?"

"නෑ මට හිතෙනවා මේ පෝස්ට් එකට ගැළපෙනම කෙනා රණවක කියල.."

"එහෙමද..?"

රාජිත බලාපොරොත්තු වූ සතුට හෝ උනන්දුව සස්මිතගේ ඒ වචනවල නොවිණ. ඔහුගේ මුහුණේත් නොවිණ.

"ඇයි සස්මිත කැමති නැද්ද රණවකට මේ ජොබ් එක දෙනවට..?"

රාජිත කෙළින්ම ඇසුවේය.

"නෑ සර්.. මං හිතුවෙ සර් මීට වඩා තරුණ කෙනෙකුට මේ අවස්ථාව දෙයි කියලා.. රණවක තව අවුරුදු පහක් හයක් යද්දි කොහොමත් රිටයඅ වෙයි.. එතකොට අපි ආයෙත් කෙනෙක්ව හොයන්න එපායැ.."

සස්මිත කීවේය.

"ඒකත් ඇත්ත තමා.."

රාජිත හිතුවේය. ගෙදර ගැන, පවුල ගැන තීරණ තමන්ගේ තනි කැමැත්තට ගත්තාට දැන් කම්හලේත්, කාර්යාලයේත් තීරණ ගනිද්දි සස්මිතගේ අදහස්වලට ඔහුගේත් කැමැත්තට ඉඩදීම රාජිතගේ සිරිතය. රාජිත වහා චන්දනට කතා කළේය.

"චන්දන අර එළියෙ ඉඳගෙන ඉන්න මහත්තයට මේ ෆයිල් එක දීල කියන්න අපි පස්සෙ ඕන උනොත් දන්වන්නං කියලා.."

රණවකගේ ලිපිගොනුව චන්දන අතට දී රාජිත කීවේය. සස්මිතගේ මුහුණ එළිය වැටිණ. ඒ මුහුණ පුරා ඇඳුණ සැනසුම සැහැල්ලුව ඉතා පැහැදිලිව රාජිත දුටුවේය.

"මාත් එහෙනම් ෆැක්ට්‍රි එක පැත්තෙ ගිහින් එන්නං සර්.."

ඊට මොහොතකට පස්සේ සස්මිතත්, රාජිත ළඟින් ඉවත් විය.

"සර්.."





චන්දන ආයෙමත් රාජිතගේ කුටියට එබුණේ සස්මිත පිටව ගියායින් පස්සේය.

"අර මනුස්සයා ගියාද චන්දන..?"

රාජිත ඇසුවේය.

"ඔව් සර්.. ඒත්.. මේ.. මේ.."

චන්දන යමක් කියන්න උත්සාහ කළේය.

"ඇයි..?"

"නෑ සර්.. ඊළඟට මං කේලමක් කිව්වා වෙයිද දන්නෑ.."

චන්දන අදිමදි කළේය.

"කේලම් කියලා හිතුවොත් අපි කතා කරන කොයිකත් කේලම් තමා මනුස්සයෝ.. එහෙම බැලුවොත් එහෙම වෙන එකත් නියා ඊට අහන නිවුස් ටිකත් රටේ තොටේ කේලම් තමා.. බය නැතුව කියනවා.."

රාජිත කීවේය.

"අර මනුස්සයා මහ පුදුම කතාවක් කිව්වනෙ සර්.."

"කොයි මනුස්සයද..? රණවකද..?"

"ඔව් සර්.."

"මොනාද කිව්වෙ..?"

"සර් උවමනා උනොත් පස්සෙ දන්වල එවන්නං කියලා කිව්වම ඒ මනුස්සයගෙ මූණ කළු උනා.. ටික වෙලාවක් මගෙ මූණ දිහා බලා ඉඳලා, එක එක්කෙනාගෙ රහස් එළිවෙයි කියල බයේ මට මේ රස්සාව නැති කරයි කියලා මට හිතුණා කිව්වා.."

චන්දන කීවේය. රාජිත අන්දමන්ද විය. රණවක කියූ දෙයෙහි



The Reader's Place

අගක් මුලක් රාජිතට නොතේරිණ. එහෙත් ඔහු ඒ තේරවිල්ල කීවේ සස්මිතට බව රාජිතට තේරිණ. 'හෙළිවේ යැයි බයේ රකින රහස් මොනවාද..?' රාජිත සිතුවේය. රණවකට රස්සාව දෙනවාට සස්මිත අකමැති විය. ඔහු අකමැති බවක් නොපෙන්නුවා නම් ඇත්තටම රස්සාව හිමි වන්නේ රණවකටය. තමා රණවකට රස්සාව නොදෙන බවට තීරණය කළ පසුව හා එය එන්දනට දැනුම් දුන් විට සස්මිතගේ මුහුණේ ඇඳුන පැහැදිලි වෙනස රාජිතට මතකය.

"කෝ දැන් ඔය මනුස්සයා..?"

රාජිත ඇසුවේය.

"ඔය එළියට බැහැල ගියේ..?"

රාජිත කලබලයෙන් නැගිට්ටේය. මේ අවුල දැන්ම ලිහාගත යුතුය. කලබලයෙන් ජීප් රියට නැගුණ ඔහු එය පාරට ගත්තේය. පාරේ මඳ දුරක් යද්දී රණවක බිම බලාගෙන හන්දිය දෙසට ඇවිද යනවා රාජිත දුටුවේය.

"බ්රාස්.."

රාජිත, රණවක ළඟ රිය නතර කළේය.

"මිස්ට රණවක.. යං මං හන්දියෙන් බස්සන්නං.."

රාජිත කිසිදු වෙනසක් නොපෙන්නා කීවේය. රණවක ගල් ගැසී රාජිතගේ මුහුණ දෙස මොහොතක් බලා උන්නේ අදහා ගන්න බැරිවය.

"සර්.."

"නගින්න.. මං මේ ගෙදර යන ගමන්.."

රාජිත වෙනසක් නොපෙන්නා කීවේය. රණවක ඉදිරි අසුනට ගොඩවුණේ මොහොතක් කල්පනා කරය. රටතොට තොරතුරු ටිකක් කතා කර රාජිත වැදගත් කාරණයට බැස්සේය.





"අපේ සුපිරින්ටෙන්ඩන් සස්මිත මහානාමව, රණවක දන්නෙ කොහොමද..?"

"ඒ දවස්වල අපේ ගෙදර එනවනෙ.."

"ඒ කිව්වෙ රණවකගෙ ඥාතියෙක්ද..?"

"අපෝ නෑ.. අපේ දුව කාලයක් ගෙදර මොන්ටිසෝරි එකක් කළානෙ.. සස්මිතගෙ දරුවත් ඉගෙන ගත්තෙ ඒකෙ.."

"සස්මිතගෙ දරුවා..!"

එවර නම් හිතේ ඇතිවූ කලබලය හංගා ගන්නට රාජිතට අපහසු විය. ඔහු තුළ ඇතිවූ දෙදරවීම, කම්පනය ඒ මුහුණින් හොඳින් පෙනිණ.

"සස්මිතට දරුවෙක් ඉන්නවද..?"

රාජිත එහා ඇසුවේය.

"ඇයි මිනිහා නෑ කිව්වද..?"

රණවක සැකයෙන් ඇස් කුඩා කළේය.

"නෑ එහෙම නෙමේ.. අපි පෞද්ගලික විස්තර දන්නෙ නැනෙ.. ඒකයි.."

රාජිත හිතේ කලබලය හංගා නැන්පත් වන්නට උත්සාහ කළේය.

"හරි අපූරු කෙලි පැටියා.. හොඳට ඉගෙන ගත්තා.. අම්මා නැති නිසාද මන්දා.. අපේ දුවට ගොඩක් එකතු උනා.."

රණවක විස්තර කළේය.

"අම්මා නෑ..?"

"ඔව්.. දරුවා ලැබෙන්න ගිහින් අම්මා නැතිවෙලා තියෙන්නෙ.."



The Reader's Place

"ඇත්තද..?"

"දුව දරුවට ගොඩක් ආදරෙන් උන්නෙ.. ඒත් උන් හිටිගමන් මෙගොල්ල ගැන ආරංචියක් නැතුව ගියා.. දරුවා මොන්ටිසෝරි ආවෙත් නෑ.."

"ඉතිං ගෙදෙට්ට ගිහින් හොයල බැලුවෙ නැද්ද..?"

"ගෙවල් දොරවල් තියෙන තැනක් අපි හරියටම දැනගෙන උන්නෙ නෑ.. ළමයි වීසි ගාණක් දුව ළඟ ඉගෙන ගත්තා.. එක ළමයෙක් නැති උනා කියලා විස්තර හොයන්න යන්නෙ නැනෙ මහත්තයො.. ඔය ඊට පස්සෙ මං අද තමා එයාව දැක්කෙ.."

රණවක කීවේය. සස්මිත නමට හදවතේ ඉහළම තැනක තිබූ ගෞරවය මුසු හැඟීම පුපුරා යනු රාජිතට දැනිණ. මේ ආරංචිය හිතේ ඇති කළ කම්පනය කළ යුත්තක් නිවැරැදිව තෝරා බේරා ගන්නට බැරි තරමට රාජිතව අපරණ කළේය. රණවකව බස් නැවතුමෙන් බැස්සවූ රාජිත කෙලින්ම ගෙදර ගියේය.

'සස්මිත මහා නින්දිත විදිහට අපිව රැවැට්ටුවා..' රාජිතගේ හිතේ පළමුව මතුවුණේ සස්මිත කෙරේ කෝපයකුත්, තරහකුත්ය. 'මිනිහා අපිව ගොනාට ඇන්දුවා.. අපෙත් වැරැද්ද.. කවුද කියලා හොයල බලන්නෙ නැතුව මගුල් තුලා යෝජනා කළා.. ඉතිං කවුද දන්නෙ සාන්තුවරයා වගේ ඉන්නකොට මෙහෙම විසකුරු සතෙක් කියලා..'

ආව ගමන් රාජිත කාර්යාල කාමරයට රිංගාගෙන බර කල්පනාවක ඉන්නවා රෝෂණී දැක්කාය.

"තේ එකක් ගේන්නද..?"

මේ තේ බොන වෙලාවක් නොවේ. එය දැනගෙනත් රෝෂණී සැමියාට කිව්වු වුණේ සැමියාගේ නොසන්සුන්කමට හේතුව දැන ගන්නය.





"පස්සෙ බොමු.. මං හදිසි වැඩක්.."

රාජිත, බිරිඳට පේන්න අත ළඟ තිබූ ලිපි ගොනුවක් පෙරලා ගත්තේය. රෝෂණීගේ හෙවනැල්ල කාමරය දොරින් පිටව ගිය පසු ඔහු නැවත කල්පනාවට වැටිණ.

'කොහොමද මං මේක මේගොල්ලන්ට කියන්නෙ..? ශික්ෂාගේ හිත හදන්නෙ කොහොමද..? තාම මේ වගේ දෙයක් දරාගන්න පුළුවන් වයසක නෙමේ ශික්ෂා ඉන්නෙ.. ඒත් මේ යෝධයා අපිව රැවැට්ටුවා කියල තේරුණාම එයා හිත හදාගනියි. ගෑනි මැරිල නිසා සද්ද නැතුව මේ කසාදෙත් කරන්න හිතාගෙන ඇති.. එව්ව කොහෙද..? ළමයෙක් ඉන්න මිනිහෙකුට මගෙ දරුවෙක් දෙන්න තරම් මං පාතට වැටිලා නෑ. දරුවෙක් දෙනවා තියා මං ළඟ රස්සාවක්වත් මෙහෙම බොරුකාරයෙක්ට දෙන්න වටින්නෑ. ඔව්.. මං මිනිහව පන්නනවා.. ඉස්සෙල්ලා මෙහෙට ගෙන්නලා ශික්ෂා ඉස්සරහ පිට ඇන්න වමාරවලා මිනිහව දොට්ට දානවා..'

රාජිත තීරණය කළේය. ඔහුගේ ඇඟ ගිණිගෙන තිබිණ. ඔහු උන්නේ ආවේශයෙන් වගේය. නීතිගරුක පුද්ගලයෙකු වූ රාජිත වරුසප්පෙරුම කවදත් වංචාව බොරුව ඉවසුවේ නැත. මේ තරම් විශ්වාස කළ කෙනෙක් අතින් එහෙම දෙයක් ඔහු කවදාවත් බලාපොරොත්තු නොවිණ.

"වන්දනා.. සස්මිත මහත්තයට වහාම අපේ ගෙදෙරට ඇවිත් යන්න කියනවා.."

කාර්යාලයට ඇමතුමක් ගෙන රාජිත කීවේය.

* * * * * * * * * *

The Reader's Place

# 09



**ශික්ෂා** උන්නේ පියාසලන සතුටක් හිතේ තුරුළු කරගෙනය. ඉතිං තවත් දෙවියන් බුදුන්ගෙන් ඉල්ලන්න දෙයක් ඇයට නොවිණ. ආසාවෙන් මේ ජීවිතය තුළදී ඇ පැතූ යමක්වේද එය ඉටුවී අවසානය. සස්මිත කොතන උන්නත් දවස පුරා ඇයට දැනෙන්නේ ඔහු ඇ ළඟම ඉන්නා සේය.

'මගෙ පළවෙනි ආදරේ ඔයා සස්මිත.. ඉස්කෝලෙ යන කාලෙදිවත් මට කොල්ලෙක් ගැන ඔහොම හිතිලා නෑ.. අක්කිට නම් පොඩි පොඩි එෆෙයාස් දෙක තුනක්ම තිබ්බා.. ඒත් මට හැමදාම හිතුණේ ආදරේ කියන දේ එහෙම බෙදාගන්න බෑ කියලා.. හදවතට.. හදවතේ ඇතුළට මට දැනෙන දෙයක් ලැබුණේ ඔයාගෙන්.. ඒ හැඟීම ආදරේ කියන්න මං විශ්වාස කරනවා.. ඒ ආදරේ ජීවිතේ පුරාම විඳින්න ඔයාටයි මටයි අපේ ගෙදරින් කැමැත්ත ලැබුණ එක කොච්චර දෙයක්ද..?'

ඇඳේ පෙරළී ශික්ෂා සස්මිත ගැන හිතුවාය. අක්කා කොළඹ ගිය අලුත ශික්ෂාට පාළුවේ බැරිය. සස්මිත ආදරෙයි කී දවසේ සිට





ඒ පාළුව කොහේ ගියාද නැත. ජීවිතයක් ජීවත් කරවන්න තරම් බලයක් ආදරයකට කොහොම ආවාද..? ඇඳේ පෙරළී උන් ශික්ෂාට හදිසියේම සස්මිතගේ බයිසිකලයේ හඬ ඇසිණ.

'ඒ සස්මිත.. ඒත් මේ වෙලාවෙ..?' කොයි තරම් වාහන හඬවල් ගොඩක් මැද්දේ උනත් ඇයට පහසුවෙන් සස්මිතගේ බයිසිකලයේ හඬ වෙන්කර ගන්නට පුළුවන. සස්මිතට ආදරය කළ තරමට ඇය ඔහුගේ හුස්ම වැටෙන හඬ පවා ලෙයට බද්ධ කරගෙන හඳුනාගෙන තිබිණ. ශික්ෂා වහා ඇඳෙන් නැගිට සාලයට ආවාය. සස්මිත සාලයට ඇතුළු විය. තාත්තා සෙටියේ ඉඳගෙන ඉන්නවා ශික්ෂා දුටුවාය. බැලූ බැල්මට ඒ මුහුණ අඳුරුව තිබෙනවා ඇයට පෙනිණ.

"ෆැක්ට්‍රියෙ ප්‍රශ්නයක්ද අම්මා..?"

The Reader's Place

ශික්ෂා උච්චස්සර බරව උන් අම්මාගේ උරිස්සේ එල්ලී සෙමින් ඇසුවාය. රෝෂණී දියණිය දෙස බලා යටිතොළ පෙරළුවේ තමා කිසිවක් නොදන්නා බව අඟවන්නය.

"සර්.."

සස්මිත, රාජිත ඉදිරිපිට හිටගත්තේ රෝෂණී දෙසත්, ශික්ෂා දෙසත් වරක් බලාය.

"මට සස්මිතගෙන් පැහැදිලිව දෙයක් දැනගන්න තියෙනවා.."

රාජිත කෙලින් කීවේය. සස්මිතගේ හිත ගැහෙන්නට විය. හිනැහෙන්නට හැදූ හැම පාරකම ජීවිතය ඔහුව හැඬෙව්වේය. මේ සුදානම් ආයෙමත් වතාවක් ඉරණම තමාගේ අහිංසක ජීවිතයට කුරිරු වන්නද..? සැකයක් සස්මිතගේ හිතේ ඉපදිණ.

"සස්මිත අද ඉන්ටවිව් එකට ආපු රණවකව අඳුනන්නෙ කොහොමද කියලා මං හොයා ගත්තා.. රණවකගෙ දුවගෙ මොන්ටිසෝරි එකට සස්මිත දරුවෙක් අරන් ආව ගියා.. ඒ දරුවගෙ අම්මා මැරිලා.. ඒත් තාත්තා ජීවතුන් අතර ඉන්නවා.. ඒ දරුවගෙ තාත්තා සස්මිත.."

රාජිත කීවේ සස්මිතට විතරක් නොවේ. ශිෂාටත්. රෝෂණීටත් ඇහෙන්නය.

"හපොයි..!"

රෝෂණීට කියවිණ.

"නෑ.."

ශිෂා අතින් කට වහ ගත්තාය.

"සස්මිත මං අහපු දේට උත්තර ඕනෙ.. මං කිව්වෙ බොරුද..? ඇත්තද..?"

රාජිත තරමක් හඬ වැඩිකොට ඇසුවේය. සස්මිතට බැලුණේ ශිෂා දෙසය. ඇස් ලොකු කරගෙන ඈ බයවී සස්මිත දෙස බලා උන්නාය. ජීවිතයේ තමා මේ තරම් අසරණ වූ මොහොතක් නැති බව සස්මිතට විශ්වාසය. සස්මිත කතා කළේ සෙමිනි. ඇහෙන නැහෙන ගාණටය.

"ඇත්ත.."

සස්මිත කීවේය.

"පටාස්.."

සස්මිතට දැනුණේ මුහුණින් ගිනි පුපුරු විසිවෙන බවය. රාජිත අත දිග හැර ගැසූ පහරින් විසිවී ගිය සස්මිත ටීපෝව පෙරළාගෙන බිම ඇද වැටිණ.

"උඹ පාහර බල්ලෙක්.."

රාජිත, සස්මිතගේ කොලරයෙන් අල්ලා උස්සා ගත්තේය. සස්මිත පණ කළදක් නැති පරඬැලක් සේ එහෙට මෙහෙට විසිවුණා ඇත්තය.

"උඹට මං සැලකුවෙ මගෙම පුතෙකුට වගේ.. මං උඹට





කොච්චර විශ්වාස කළාද..? ඒ විශ්වාසෙ නිසා මගෙ දරුවවත් මං උඹට බාර දෙන්න හැදුවෙ මිනිහෝ.. උඹ මහ ජරා මිනිහෙක්.."

රාජිත කෑගැවේය. කොයි තරම් කෑගැහුවත්, පහර දුන්නත් ඔහුගේ හිතට මදිය. සස්මිත සියලු වැරදි පිළිගෙන බිම බලාගෙන උන්නා මිස හිස එසෙව්වේ නැත.

"මගෙ වරද.. මගෙ වරද.. කිසිම හොයල බැලිල්ලක් නැතුව උඹට මේ ගෙදර දොර ඇරපු එක.. උඹ. කන්න දුන්න අත හපා කෑවා.. බල්ලා.."

සස්මිතගේ නෙත් කඳුළින් තෙත් විය. කිසිවක් නැවත හරිගස්සන්නට උත්සාහ කර ඵලක් නැත. කිසිවකට සමාව ඉල්ලීමෙන්ද ඵලක් නැත. මේ මොහොතේ කිසිවක් පැහැදිලි කරන්නට උත්සාහ කිරීම තවත් දුකට වේදනාවට පත්වීමක් විතරය. ශිෂා ඇහිපිය ගැසුවේ නැත. ඇගේ අතපය දරදඬු විය. හදවතින්ම සස්මිතට ආදරය කළ තරමට මේ තරම් මහා වේදනාවක් දරාගන්නට ඇය දැන උන්නේ නැත.

"අම්මාහ්..!"

රෝෂණී අල්ලා නොගන්නට ශිෂා බිම ඇද වැටෙනවා සිකුරුය.

"දුවේ.. අනේ ඒයි.."

කෑගසා හඬාගෙන රෝෂනී. සිහිසුන්ව ගිය දියණිය තුරුළු කර ගත්තාය. සස්මිතට වාවාගන්න අමාරුය. ශිෂාට මෙය ලේසි පහසු වේදනාවක් වන්නේ නැත. අම්මා. තාත්තා ළඟ.. ගෙදර ලෝකය කොට ඇතිදැඩි වුණු ඒ අහිංසකාවියට මේ ගින්දර උහුලන්නට අමාරුය.

"ශි..ෂා.."

සස්මිත අඩියක් පෙරට තිබ්බේය. රාජිත, සස්මිතට වඩා ඉස්සර

විය. ඔහු සස්මිතගේ මග හරස්කොට, සිටගෙන ඒ මුහුණට දබරැඟිල්ල දිගු කළේය.

"බලාගෙනයි.. ආයෙ එකපාරක් හරි ඔය කටින් මගෙ දරුවගෙ නම කිව්වොත් බලාගෙනයි.. මගෙ දරුවට උඹ වගේ මිනිහෙක් ඕන්නෑ මිනිහෝ.. උඹ වගේ එකෙක් ඒ දරුවගෙ ඇස් දෙකට පේන්නවත් එන්න නරකයි.. මේ දැන්ම.. මේ දැන්ම උඹ මේ වත්තෙන් පිට වෙන්න ඕනෙ.. මං උඹව මෙහෙම පණපිටින් අත ඇරින්නෙ දවසක් හරි උඹ මේ ගෙදරට වද්දගත්ත හින්දා.. ආයෙ කවදාවත් අපේ ඇස්වලට පේන්න මෙහෙ එන්න එපා.. පලයං.. බැහැපං ගෙයින් එළියට.."

රාජිත ගිගිරුවේය. අම්මා තුරුලේ සිහිසුන්ව ඉන්නා ශික්ෂා දිහා අවසන් වතාවටත් බලා සස්මිත ගෙයින් එළියට බැස්සේය. ඔහු බයිසිකලය ළඟට ආවේ හීනෙන් ඇවිදින්නා වාගේය.

'ශික්ෂා මගෙ රත්තරං.. මං ඔයාට වරදක් කළේ නෑ මගෙ පූටි කෙල්ලෙ.. ඒත් හැම දෙයක්ම කැරකෙන්නෙ මගෙ අවාසනාවට.. අනේ මං මැරිලවත් යනව නම්..' වෙව්ලන ඇඟිලිවලින් බයිසිකලය පාරට ගනිද්දි සස්මිතගේ ඇස්වලින් හෝ ගා කඳුළු වැටිණ. වෙව්ල වෙව්ලා හෙමිහිට බයිසිකලය පාරේ මඳ දුරක් පදවාගෙන ආ සස්මිත පාර අයිනට කොට එය නවතා හැඩලයේ හිස ගසා ඉකිබිඳ හැඬුවේය.

'මේ කිසි දෙයක් මට ඕන වුණ දේවල් නෙමේ ශික්ෂා.. අඩු වයසින් මට දරුවෙකුට තාත්තා වෙන්න වුණා.. ඒ මං කවදාවත් බලාපොරොත්තු උන දෙයක් නෙමේ.. මං කොහොම ද ඔයාට හැම දෙයක්ම තේරුම් කරවන්නේ.. මං ආදරේ කළේ ඔයාට ශික්ෂා..' සස්මිත ඉකි ගැසුවේය.

'උඹ ආයෙ කවදාවත් අපේ ඇස්වලට පේන්න එන්න එපා.. කන්න දීපු අත හපා කාපු බල්ලා..' රාජිතගේ කටහඬ සස්මිතගේ හදවතේ දෝංකාර දුන්නේය.





'ඇත්ත.. මට සැලකුවෙ පුතෙකුට වගේ.. මට ඔහොම බැනල මදි සර්.. දෙපතුළ අල්ලලා වැඳලා සමාව ගන්න පුළුවන්කම තිබුන නම් මං ඒකත් කරනවා.. ඒත් මට එහෙම කරන්නවත් අවසර නෑ.. මං යනවා සර්.. මේ හැම දෙයක්ම දාලා යන්න යනවා.. මෙහෙන් ආයෙ කවදාවත් ඔයාලගෙ ඇහැට දකින්නවත් බැරි දුරකට යනවා..' සස්මිත තීරණය කළේය. ඔහු බයිසිකලය පණ ගන්වා ගත්තේ ඒ තීරණය අනුව ක්‍රියාත්මක වෙන්න එක හිත් හිතාගෙනය.

* * * * * * * * * *

ශික්ෂාගේ ජීවිතය දුහුවිලි බවට පත්ව තිබිණ. ආදරයේ ගින්නෙන් දැවුණු ඇගේ ආත්මය අළුවී දූවිලිවී ගිය බව ඇත්තය. දින ගණනක් තිස්සේ ශික්ෂා බලාගත් අත බලාගෙන උන්නාය. ඈ ඉකිබිඳ විලාප තිබ්බේ නැත. ඒත් දකින කොයි මොහොතේත් ඇගේ ඇස් ඉදිමී රතුවී කඳුළු පිරී තිබිණ.

"නොකා නොබී බලාගත් අත බලාගෙන හුල්ලනවා.. මෙහෙම ගියොත් මේ දරුවට මොනවා වෙයිද දන්නෑ.."

ශික්ෂාගේ ජීවිතය ගැන වඩාත් බිය ගත්තේ රෝෂණීය. කුඩා කළ සිටම ඇය ශික්ෂාගේ මෘදු මොළොක් හිත ගැන දැන උන්නාය. මෝක්ෂා මෙන් නොව ඉතාම කුඩා දුකක් උනත් දරාගන්නට ශික්ෂා දැන උන්නේ නැත.

"එයාට එයාගෙ පාඩුවෙ ඉන්ඩ අරින්ඩ.. ඔහොම අඬලා දුක්වෙලා ඇතිවෙන දවසක් එයි.."

රාජිත, බිරියට අවවාද කළේය.

"කවුද දෙයියනේ හිතුවෙ අර කොල්ලා මගෙ කෙල්ලට මෙහෙම අපරාධයක් කරයි කියලා.. මේ අහිංසක දරුවා කොහොම දරාගන්නද..? මටත් වෙලාවකට උහුල ගන්න අමාරුයි.."

රෝෂණී කඳුළු ඉනූ නෙත මිරිකා හැරියාය.



The Reader's Place

"එදාම ඒකා මෙහෙන් ගිහින්.. එහෙම වෙච්ච එක හොඳයි.. නැත්නම් මගෙ අතින් මොනා වෙයිද දන්නෑ.."

රංජිත කීවේය.

"ඔයා හිතන්නෙ ඒකා හිත හදා ගනී කියලද..? මෝෂා වගේ කෙනෙක් ගැන.. මේ ළමයා හැමදේම කරන්නෙ ජීවිතෙන්ම තමා.."

රෝෂණී හැඬුණාය.

"බලමුකෝ.."

රංජිත දිග සුසුමක් හෙළුවේය. ඔහු මෙන් සියල්ල කාලයාට බාරදී උනුලා ඉන්නට රෝෂණීට නොහැකිය. මෝෂා හෙලන සුසුමක පවා තිබුණු ගින්දර ඈ හඳුනා ගත්තාය. මහ රැයට පවා නැගිට බලන විට දියණිය ඇඳේ හිඳගෙන කල්පනාවය. ඇයට රැයට නින්ද යන්නේ නැත. බඩගිනි වෙන්නේ නැත. කතා කරන්නේ නැත. දියණියට මේ වේදනාවෙන් ගොඩ එන්නට උදව් කළ යුතු බව දැන උන්නත් රෝෂණීට එය කළ යුතු ආකාර කල්පනා නොවිණ. අන්තිමේදී දිගට දුරට හිතා ඈ සියල්ල මෝෂාට කියන්න තීරණය කළාය.

"මොනා උනත් එයා මෝෂාගෙ සහෝදරී. එයට එක මොහොතක වඩින් පළියට ආව අදන්නා.. එයාවත් කතා කළොත් මෝෂාගෙ හිතේ දුක ටිකක් හරි එළියට යයි.."

සියල්ලටම වඩා භයානක සිතක සිඳින් නොකියා හැඳ වේදනාවක්ම හිතේ හිර කරගෙන ඉන්නා එකය. රෝෂණී, මෝෂාගේ ජංගම දුරකථනයට ඇමතුමක් ගත්තාය.

අම්මාගේ ඇමතුම ලැබෙන විට මෝෂා කාමරයෙන් පිට යන්නට ලැස්ති වුණි. රෝෂණී වැඩිමල් දියණියට ගෙදර සිදුවූ දෙය ඉක්මණින් පිළිවෙලින් කීවාය.





"සස්මිත කලින් බැඳපු කෙනෙක්.. සස්මිතට දුවෙකුත් ඉන්නවා.."

මෝෂාට කෑගැසිණ. මෙය විය හැකිද..? මෝෂාට එය සිහිසෙන් විශ්වාස කරන්නට බැරිය. ඇයට සස්මිතගේ කටවසම් අහිංසක මුහුණ මතක් විය.

'සස්මිතගෙ ලස්සන මූණෙ ඒ සිනිකඩට යටින් තිබුණෙ අවංකකමක්.. කෙල්ලො රවටන්න ගන්නා ආඩම්බරකාර අවංකකමක්. ඒ අවංකකම බොරුවක් වෙන්න බෑ.. එයා දිහා බලන ඕන කෙනෙකුට තේරෙනවා ඒ අවංකකම එන්නෙ එයාගෙ හදවතින්ම කියලා.. ඒ තරම් පිරිසිදු හිතක් සස්මිතට තියෙන්නෙ.. සස්මිත බොරුවක් කරයි කියල හිතන්න බෑ.. අම්මලට වැරදුණාවත්ද..?' මෝෂා හිතුවාය.

"එය ආරංචිය ඇත්තම කියලා විශ්වාසද අම්මා..?"

"ඔයාටත් පිළිගන්න අමාරුයි නේද..? අපටත් එහෙම තමා.. මේක අහපු වෙලාවෙ අපට අදහාගන්න බැරිවුණා.. සස්මිතගෙන් තාත්ති මේ කතාව ඇහුවෙ නැතිවයි, මායි ඉස්සරහපිටදිමයි.. එයා ඒ කතාව ඇත්ත කියලා පිළිගත්තම අපිට කුසම වැලුණේ නෑ.."

රෝෂණී කීවාය.

"සස්මිත ඒ කතාව ඇත්ත කියලා පිළිගත්තද..?"

මෝෂා හුස්මෙන් ඇසුවාය.

"ඔව්.."

"දෙවියනේ..!"

මෝෂා බර සුසුමක් හෙළුවාය.

"මගෙ අහිංසක කෙල්ල මේ මිනිහට රැවටුණා.."



The Reader's Place

රෝෂණී කීවාය. මෝක්ෂා ගැස්සිණ. නැත. ශික්ෂා රැවටුණායි හිතනවා නම් ඊට පළමුව රැවටුණේ තමාය. සස්මිත නංගිට ආදරය කරන්නට පෙර නංගියි සිතා තමාට ආදරය කළ හැටි මෝක්ෂාට සිහිවිය.

'මං හිතාගෙන උන්නෙ නංගියි, මායි සස්මිතව රැවැට්ටුවා කියලා.. ඒත් බලාගෙන යද්දි වෙලා තියෙන්නෙ ඒකෙ අනික.. අපි දෙන්නම ඒ කොල්ලට රැවටිලා.. ඒත් එහෙම වෙන්න පුළුවන්ද..?' මෝක්ෂාට තේරුණේ මේ විස්තර අසා ඇගේ ලෝකයත් උඩු යටිකුරු වූ බවය.

"නංගිට කොහොමද..?"

මෝක්ෂා නංගි ගැන හොඳින්ම දැන උන්නාය. ඈ අහිංසකය. හිත සියුමැලි වැඩිය. මේ තරම් ගින්දරක් ඈ කොහොම දරාගන්න ඇතිද..? මෝක්ෂාට හිතාගන්නත් බැරිය.

"අනේ ඒක තේරෙන්නෑ දුවේ.. මේ දරුවා බලාගත් අත බලාගෙන හුල්ලනවා මිසක් කතාවක් බහක් නැ.. කෑගහලා අඬලා හරි හිතේ දුක ඉවර කරනව නම් අපට බයක් නෑ.. මට බය මෙහෙම හිතේ හැමදේම හිර කරන් ඉඳලා අන්තිමට හොඳ කරගන්න බැරි ලෙඩක් හදාගනියි කියලා.."

රෝෂණී දුක කීවාය.

"නංගිට කතා කරන්න අම්මා.."

මෝක්ෂා වේදනාවෙන් කීවාය. හරි නම් මේ වෙලාවේ තමා සිටිය යුත්තේ ඈ ළඟය. ඇයත්, තමාත් මව්කුස පවා සමගියෙන් බෙදා හදාගත්තා නොවේද..? ඉතින් ඇගේ සතුට සැපත සේම සියලු දුක් වේදනාත් බෙදා ගැනීම තමාගේ යුතුකම විදිහට මෝක්ෂා හිතුවාය.

රිසීවරය පසෙක තබා ගෙට ගිය රෝෂණී ශික්ෂාව එකතු





කරගෙන ආවාය. ශික්ෂා රිසීවරය කණට ගත්තේ ඇස් දෙකේ කඳුළු පිටාර ගලද්දීය.

"අ..ක්..කි.."

"නං..ගෝ.."

"ජීවිතේ ඉවර උනා අක්කි.."

ශික්ෂාට කියාගත හැකිවුණේ එච්චරය. මහා හයියෙන් විලාපදී ඈ හැඬුවාය. අම්මා, තාත්තා ළඟදී හිර කරගෙන උන් මහා දුක, ලෝකයා ඉදිරිපිටදී හංගා රැකි මහා දුක තමන්ගේ නිවුන් සහෝදරිය ළඟදී ඉවුරු තලා ගැලුවේය.

"ඇයි මට මෙ..හෙ..ම උනේ අක්කි..? ඇයි..? මොක..ක්ද.. මං කරපු වරද..? කොහොමද සස්මිත මට එහෙම කළේ..?"

ශික්ෂා ඉකිගසමින් කීවාය.

"නංගෝ.. ඔයා හැමදේම අමතක කරන්න ඕන නංගි.. සස්මිතවත් ඔයා අමතක කරන්න ඕන.."

මෝක්ෂා කීවාය.

"මං කොහොමද එයාව අමතක කරන්..නෙ අ..ක්..කි..? එයා නැතුව මට.. මො..හොතක්වත් ඉන්න බෑනේ.. එ..යා නැති අනාගතයක් ගැ..න.. කොහොමද හිතන්නෙ..?"

ශික්ෂා අසරණ හඬින් කීවාය.

"ඔයා වගේ අහිංසක කෙල්ලෙකුට මේ කරපු වංචාවට සස්මිතට හොඳක් වෙන්නෑ නංගි.."

මෝක්ෂාගේ ඇස්වලින් කඳුළු ගලා යමින් තිබිණ.

"එයාට සාප කරන්න එපා අක්..කි.. මේක මගෙ ලැබීම.. මං.. මං.. මහා පව්කාරියක්.. කවදාවත් සතුට උරුම නෑ.. හදවතින්ම



The Reader's Place

සතුටු වෙන්න හදපු හැම පාර..ක..ම ජීවි..තේ මට උරුම කළේ දුක.. දුක විතරමයි.."

"ආදරයක් හින්දා ජීවිතේ විනාශ කරගන්න එපා නංගි.. ඔයා හොඳ කෙනෙක්.. ඔයාට ලස්සන අනාගතයක් ලැබෙනවා.."

"මා..ත් හිතුවෙ එහෙම තමා.. අක්..කි.. සස්මිතව බැඳගෙන.. එයාගෙ දරුවො හ..දාගෙන.. ලස්සනට ඉන්න.. හොඳින් ඉ..න්..න.. කෝ.. දැන් ඒ හීන කෝ..? මට මේ මොකද උනේ අක්කි..? තොයි ආත්..මෙ..ක කරපු පවක්ද මේ..? කවුරු කරපු සාපයක්ද මේ..? ම..ට පටිසන් දුන්නෙ..?"

ශික්ෂා දුක කියෙව්වාය. ඒ දුක අහන් ඉන්න තරම් ශක්තියක් මෝක්ෂාට නොවිණ. නංගි තමට ආත්මය පතුලේ තිබූ හැඟීම හදවත පාරනු මෝක්ෂාට දැනුණි. සමුගන්නේ නැතුවම මෝක්ෂා පිළිවරය තැබුවාය. නංගීට විතරක් නොවේ. තමාටත් මේ තිත්ත ඇත්ත දරාගන්නට අමාරු බවක් මෝක්ෂාට දැනිණ. කලින් යොදාගෙන තිබූ කිරිපිටි වෙළඳ දැන්වීමේ රූගත කිරීම් සඳහා ගියත් මෝක්ෂා උන්නේ හදවතේ ගින්දරෙනි. ඇයට මේ ප්‍රශ්නය කාට හෝ කියන්නට උවමනා විය. ඒත් කෙවි උන්නේත් රටින් පිටය. හදිසියේම දවස් දෙකක් ව්‍යාපාරික කටයුත්තකට රටින් පිටවන බව කෙවින් දන්වා තිබිණ.

'කමක් නෑ.. අද හවස කෙවි ලංකාවට එයිනෙ.. ආවහම මං මේ විස්තරේ එයාට කියනවා.. සස්මිත දැන දැන කරපු මේ වරදට එයාට දඬුවමක් දෙන්නම ඕනේ.. කෙවි මට උදව් කරයි..' මෝක්ෂා හිතුවාය. මෝක්ෂා ඇතුළු ශිල්පීන් කණ්ඩායම දහවල් ආහාරය සඳහා ගියේ අගනුවරින් ඔබ්බෙන් පිහිටි නිසංසල හෝටලයකටය. කෑම බීම රහට ගුණට පෙනුමට තිබුණ බව ඇත්තය. ඒත් කිසිවක් කෑමට තරම් පිරියක් මෝක්ෂා තුළ නොවිණ. පලතුරු දීසියකින් සෑහීමකට පත්වූ මෝක්ෂා කණ්ඩායමේ අනික් තට්ටිය කෑම ගන්නා තුරු වෙරළේ ඇවිදින්නට ගියාය.





මුහුදු තීරය සුදු වැල්ලෙන් ද පැහැදිලි නිල් දියෙන්ද යුතුය. දුව ඇවිත් දෙපා සිඹින වැල්ල දකිද්දී හිතෙන්නේම වතුරට පනින්නය. මෝක්ෂා සෙමින් සෙමින් ඉදිරියට ගියාය. හෝටලයටම වෙන්වුණ නිසාදෝ වෙරළ තීරයේ මේ හරිය පාළුය. නිසංසලය. හෝලවයේ තවාතැන් ගත් කීප දෙනෙක් හැරුණු විට වැඩි සෙනගක් වෙරළේ නැත. හදිසියේම හෝටලයේ සිට වෙරළට ආ යුවළක් වෙත මෝක්ෂාගේ අවධානය යොමු විය.

"දෙ..යි...ය..නේ.."

මෝක්ෂාට දැනුණේ තමන්ගේම ඇස් තමාව රවටන බවකි. මේ ඇත්තක් නොවේයි ඇයට කීප වරක් හිතිණ. එහෙත් ජීවිතයම කළඹමින් හදවත සසල කරමින් ඒ ඇත්ත නෙත ඉදිරිපිට සිදුවෙමින් තිබිණ. රට හැර ගියායි කී කෙවින් කෙල්ලක් එක්ක තාන ඇඳුමින් හෝටලයෙන් එළියට පැමිණ වෙරළට ආවේය.

ජෝඩුව රැල්ල පාගමින් ගිලෙමින් පිහිනමින් සතුටුවෙන හැටි මෝක්ෂා බලාගෙනය. කෙවින් සමඟ හුරතල්වන මේ රූමත් කෙල්ල මෝක්ෂා දන්නීය. ඈ සෙනෙල්යාය. වරක් දෙවරක් සෙනෙල්යාව තුරුළට ඇදගත් කෙවින් ඇගේ නිතඹ මිරිකනවා මෝක්ෂා බලාගෙනය.

'කෙවින් හැමදාමත් මාව රැවැට්ටුවා..' මෝක්ෂා ගිනිගත් ඇසින් මේ දෙදෙනා දෙස මොහොතක් බලා සිට ඊළඟට කෙලින්ම ඔවුන් දෙදෙනා ඉදිරියට ගියාය.

"මෝක්ෂා..!"

කෙවින්, මෝක්ෂා දෙස බැලුවේ කිසිවක් හිතාගන්න පවා බැරිවය. ඔහුගේ හිත තුළ ඇතිවූ කැළඹීම ඒ මුහුණින් ඉතා හොඳට පෙනිණ.

"මෝක්ෂා මෙහේ..?"

හරි තරම් මෝෂා කෑගැසිය යුතුය. බැනිය යුතුය. රණ්ඩු කළ යුතුය. ඒ තරම් ආවේගයක් සුළියක් වාගේ කැරකි කැරකී හිත පත්ලේ තිබිණ. ඒත් වචනයක්වත් කටින් පිට කරගන්නට ශක්තියක් මෝෂාට නොවිණ. තවත් මොහොතක්වත් පමා නොවූ මෝෂා වේගවත් ගමනින් සෙවල පීරයෙන් ඉවත් වූවාය.

* * * * * * * * * *

මෝෂා උන්නේ හදබල කලකිරීමකිනි. කෙවින් තමාට ද්‍රෝහී විය. මෝෂා ඇ සතු පිවිතුරු බව පවා කෙවින්ට පූජා කළේ ඔහු ගැන ලොකු බලාපොරොත්තුවක් හිත තුළ තිබූ නිසාය. මේ නිරූපිකාවක ලෙස ගෙවන ජීවිතය තුළදී වරදේ බැඳෙන්නට මෝෂාට ලැබෙන අවස්ථාව වැඩිය. රූපය ලස්සන නිසාත්, ජනප්‍රිය භාවයත්, දඟකාරකමත් නිසා මෝෂාට පිරිමින්ගෙන් ලැබෙන ආරාධනා ආයාචනා ද බොහෝය. එහෙත් මෝෂා කොයි තරම් පිරිමින්ව ඇසුරු කරන්නට ලැබුණත් කෙවින් සමග මිස වෙන කෙනෙකු සමග කායික සම්බන්ධයක් තියාගත්තේ නැත. ඒ තරම් කැපවීමක් ඔහු වෙනුවෙන් කරද්දී ඔහුගේ මේ හැසිරීම මෝෂාට දරාගන්නට බැරිවිය.

'මං ගෙදෙට්ට නිතුවක්කාර වෙලා පිරිමියෙකුට අනුවෙලා ජීවිතේ විනාශ කරගත්තා.. නංගී ගෙදරට කීකරු වෙලා ඉඳලත් කොහෙද යන පිරිමියෙකුට රැවටුණා.. ඒත් නංගී මං වගේ හිතෙන වටිනා දේක් සල්ලිකාරයට දෙන්න තරම් මෝඩ වෙන්න නැතුව ඇති කියලා මට හොඳටම විශ්වාසයි.. පලාත්කොට පිරිමි ඔක්කොම එකයි.. ඔක්කොම හොරුකාරයෝ..' මෝෂා කාමරය තුළට වී කල්පනා කළාය. කෙවින් සෙනෙල්යා හා මුහුදෙ නාන්න ගිය දිනට පසුව දැන් දින දෙකක් ගෙවී ගිහින් ඉවරය. ගතව ගිය දින දෙකම මෝෂා ප්‍රින්සි අක්කාගේ ලොජ් එකේ කාමරයටම වී උන්නාය.

"චක්.. චක්.. චක්.."



The Reader's Place



මෝෂා ඇඳෙන් බැස්සේ දොරට තට්ටු කරන හඬටය. තෙගෝරිට ප්‍රින්සි අක්කා විය යුතුයි ඇ සිතුවත් ඇරුණු දොර ඉදිරිපිට වූයේ කෙවින්ය.

"මිසී.."

කෙවින් කාමරයට ඇතුළු වූණේ මෝෂාව තුරුළු කරගන්නට උත්සාහ කරමිනි. මෝෂා, කෙවින්ගේ අත ගසා දමා පැත්තකට වූවාය.

"මොකද මේ..? හරියට පොඩි ළමයි සෙල්ලම් බඩුවලට රණ්ඩු කරනවා වගේ.."

කෙවින් ආදරණීය හඬකින් කතා කළේය. දින දෙකකට පෙර සෙනෙල්යා එක්ක මුහුදු වෙරළේදී ඇහැටම දැක්කේ ඔහු ද කියා හිතෙන තරමට ඔහු සියල්ල මග හැර මෝෂා ඉදිරිපිට රඟපෑවේය.

"සෙල්ලම් බඩු..? ඔව් මට තේරෙනවා තාමත් ඔයාට සෙල්ලම් බඩුවක් කියලා.. ඒකනේ මට මෙහෙම කරන්නෙ.."

මෝෂා කෑගැවුවාය.

"හරි.. ඔයා මොකද මට කරන්න කියන්නෙ..?"

කෙවින් ඇසුවේය.

"මං මගෙ ජීවිතේ වටිනාම දේක් දුන්නෙ ඔයාට.. ඇයි ඔයා මට ද්‍රෝහී උනේ කෙවින්.. මං විශ්වාස කළා ඔයා මා එක්ක විතරක් එහෙම ඉඳී කියලා.. ඒත් ඔයා දකින දකින කෙල්ලො එක්ක සම්බන්ධ වෙන කෙනෙක් කියල මං කවදාවත් හිතුවෙ නෑ.."

මෝෂා හයියෙන් හයියෙන් කීවාය.

"නැතිනැටි මිනිස්සු තියෙනවා වතුර විතරක් බිව්වට, තියෙන මිනිහෙක් එහෙම කරන්නෑ මිසී.. මට හොඳට සල්ලි තියෙනවා,

මං තවත් හොඳට හම්බ කරනවා.. අත දිග ඇරල වියදම් කරල සැප ගන්ඩ පුලුවන්කම තියෙද්දි මං මොකටද නැතිබැරි මිනිහෙක් වගේ ජීවත්වෙන්නෙ..?"

කෙවින් කීවේ ලොකු ආඩම්බරයකිනි. මෝක්ෂාට දැනුණේ කම්බුල් පහරක් වැදුණ ගාණටය. කෙවින් ගැනියෙක්, පිරිමියෙක් අතර ඇතිවන සම්බන්ධය මේ තරම් සැහැල්ලු කොට හිතන පිරිමියෙකැයි ඇ කිසිවිටෙක නොසිතුවාය.

"ඔයා ඔය කරන වැඩේම මටත් කරන්න පුළුවන් කෙවින්.. ඔයා හිතන්නෙ අවස්ථාව තියෙන්නෙ ඔයාට විතරයි කියලද..? නෑ.. මටත් ඕන තරම් අය එක්ක එහෙම ඉන්න පුළුවන්.. ඒත් මං අදටත් එහෙම උන්නේ ඔයා එක්ක විතරයි.. ඇයි ඔයාට එහෙම බැරි..?"

මෝක්ෂා කෙළින්ම ඇසුවාය.

The Reader's Place

"මට නම් එහෙම ඉන්න බෑ මිකී.. අනික ඔයා උනත් එහෙම ඉදී කියල මං හිතුවෙ නෑ.. ඇත්තටම මං ඔයාගෙන් ඒ වගේ දෙයක් බලාපොරොත්තු උනේ නෑ.. තරුණ කාලෙ හැමදාම තියෙන්නෙ නෑ.. ඒ හින්දා ඒ ටික කාලෙ සතුටින් ඉන්න ඕනේ.. ඔයාටත් මං කියන්නෙ හිතට විලංගු දාගෙන දුක් විඳින්නෙ නැතුව.. කැමති කෙනෙක්ව ආශ්‍රය කරලා සතුටින් ඉන්න.."

මෝක්ෂා හීතියෙන් ගල්ගැහිණ. තමා ආදරය කළ, ඒ ආදරය නිසාම විශ්වාස කළ, ඒ විශ්වාසය නිසාම ජීවිතයම පිදූ පිරිමියාගෙන් ඇ කවදාවත් මේ වගේ හැසිරීමක් බලාපොරොත්තු නොවිණ.

"මං කැමති නෑ මට කවුරුවත් නීති දානවට.. ඔයා උනත්.. මං ඔයාට නීති දාන්නෙත් නෑ.. වෙන ගර්ල්ස්ලා එක්ක ගියාට මං ඔයාට අඩුවක් කරන්නෙ නැනෙ මිකී.. ඔයා ගැන හොයල බලනවා.. අඩුවක් තිබ්බොත් කරල දෙනවා.. ඔයාට ඕන කියන වෙලාවට ඔයත් එක්ක ඉන්නවා.."





කෙවින් පැහැදිලි කළේ හරිම සන්සුන්වය. මෝක්ෂාගේ හිතට ඇත්තටම දැනුණේ හද කලකිරීමකි. දරුණු වේදනාවකි.

"කරුණාකරල යන්න.."

මෝක්ෂා හිත දවන කලකිරීමෙන් කීවාය.

"වට්..?"

කෙවින්ට අදහා ගන්නත් අමාරු උනා වාගේය.

"මට මගේ පාඩුවෙ ඉන්න ඉඩ දීලා යන්න කෙව්.."

මෝක්ෂා නැවත කීවාය. කෙවින් ඊට එහා වචනයක්වත් කතා කළේ නැත. දැන් ඔහොම එලවා ගත්තාට.. ආයෙමත් ඕනෑවී කතා කරන බව ඔහු විශ්වාස කළේය. ඒ විශ්වාසය නිසාම කෙවින් වහා කාමරයෙන් එළියට බැස්සේය.

"මොකද මේ සද්දෙ..? අනික් කාමරවල ඉන්න උන් කණින් ඇහිලා ඉන්නෙ නැද්ද..?"

කැගසාගෙන කාමරයට ආවේ ප්‍රින්සි අක්කාය.

"මොකක්ද දැන් කෙවින් මහත්තයට කෑගහලා එලවගන්න තරම් දෙයක් උනේ..?"

මෝක්ෂාගේ හිතේ ප්‍රින්සි අක්කා ගැනත් උපන්නේ කෝපයකි. ඇ තමාගේ නවාතැනේ ඉන්නා හැම කෙනෙකුගේම ජීවිතවලට ඇඟිලි ගසන්නීය. රහසේ ගමනක් බිමනක් යන්නවත් ඇගෙන් ඉඩක් නැත.

"මේ ඈත ගම්වලින් කොළඹ එන මෝඩ කෙල්ලො තමන්ට උදව්වක් ගන්න තියෙන මිනිස්සුන්වත් තරහ කර ගන්නවා.. දෙන දෙයක් බාර අරන් තමන්ගෙ වැඩේ කරගන්න දන්නෑ.."

ප්‍රින්සි අක්කා ආයෙම කීවාය. ඇ මේ ඇනුම් පද කියන්නේ

නමාට බව මෝක්ෂාට විශ්වාසය. සමහර විට කෙවින්, ප්‍රින්සි අක්කාට සියල්ල විස්තර කර යන්නට ඇත.

"පිරිමි හිතන්නෙ දකින දකින සැරේට පාවිච්චි කරන්න අපි සෙල්ලම් බඩු කියල.."

මෝක්ෂා කීවාය.

"බල්ලො හොඳයි කියල හිතෙන හැම තැනටම කකුල උස්සනවා කියල දන්නෙ නැතුවද ආවෙ..?"

ප්‍රින්සි අක්කා ඇහුවේ උපහාසයක් මුහුණේ තියාගෙනය.

"කුකුල් මස් දවස ගානෙ කන්ඩ හම්බවෙන එකා උනත් දම්වැල ලිහුවොත් ජරාවත් කනවා.. ඒක බල්ලගෙ ගතිය.. අපි දැනගන්ඩ ඕන උගෙ දම්වැල කොච්චර දිගට තිබ්බම ඇන්ද කියලා.."

The Reader's Place

ප්‍රින්සි අක්කා ඒ ටික කීවේ මෝක්ෂා ගැන අනුකම්පා හිතුණ ගානටය.

'ඔව්.. වරද මගෙ තමා.. මමයි මුල වරද්ද ගත්තෙ.. කෙවින් කවදාවත් මට බඳිනවා කියලා පොරොන්දුවක් දීල නෑ.. එයා එක්ක එහෙම කතාබහක් කරලා පිළිවෙලක් කරගන්නැතුව නිකම්ම ඇඳට ගොඩවෙච්ච එක මගෙ වරද..' ප්‍රින්සි අක්කා පිටව ගිය පසුත් මෝක්ෂා දිගටම කල්පනා කළාය.

'දැන් ඉතිං මට කෙවින්ගෙන් තොර ලෝකයක් ගැන හිතන්න බෑ.. එයා මාව මගාරින්න හැදුවට මං එයාට එහෙම ලේසියෙන් ගැලවෙන්න ඉඩක් දෙන්නෙ නෑ..' මෝක්ෂා හිතුවාය. කෙවින් යනු මෝක්ෂා දැන් ජීවත්වන සමාජය තුළ ලොකු බලයක් නමක් තියෙන කෙනෙකි. මෝක්ෂාට උනත් බාහිර කරදරවලින් බේරී මේ තරම් දුරට සාර්ථකව ඉදිරියට එන්න හැකිවුණේ කෙවින්ගේ ශක්තිය නිසාය.

'මට කේවි නැතුව බෑ.. මං මාරියෝට කතා කරනවා.. මුලින්ම





මට කෙවිව අඳුන්වලා දුන්නෙත් මාරියෝනෙ.. දැන් උනත් කරන්න ඕන මොනවද කියලා මට මාරියෝ පැහැදිලි කරයි..' කෙවින් නිසා ලැබුණු කිසිවක් අහිමි කරගන්න බැරිය. මේ ප්‍රශ්නයට උදව්වක් ලබා ගත හැකි කෙනා මාරියෝම බව මෝක්ෂා සිතුවාය. ඈ මාරියෝ සොයා ගියේ ඒ නිසාය.

"මං ඕක උඹට මුලින්ම කිව්වනෙ මිකී.. ඔය රසල්යා කියන බඩ්ඩ එක්ක කේවි නටන්ඩ පටන් ගත්ත අලුතම මං උඹට ඔක්කොම කිව්වා.. උඹ ගණන් ගත්තෙ නෑ.. වැඩේ දුර දිග යනකන් බබා පාට් ගිටියා.. කොල්ලා කොටු කරගන්න උඹ දැනගන්න ඕනේ.. කොහෙද..? උෟත් එක්ක ක්ලබ් ගානේ නැටුවා මිසක් උඹට මෙලෝ සිහියක් තිබ්බෙ නැනෙ.."

විස්තරය අසා මාරියෝ, මෝක්ෂාට දොස් කීවේය.

"හරි.. හරි.. මාරියෝ.. මං වැරදි.. මට වැරදුණා.. මං ඒක පිළිගන්නවා.. දැන්වත් මට වරද හදාගන්න උදව් කරනවද..? මට කියනවකො මොකද මේකට කරන්නෙ කියලා..?"

මෝක්ෂා සන්සුන් හඬින් ඇසුවාය.

"කරන්න තියෙන්නෙ එක දෙයයි.. දැන්වත් කෙවින්ව දෙමව්පියො ළඟට [illegible] යන්න ක්‍රමයක් හිතපං.."

මාරියෝ කීවේය.

"මේ අපේ ගෙදර..?"

මෝක්ෂාට අදහාගන්න අමාරුය.

"නැත්තං ඉතිං අපේ ගෙදර එක්ක ගිහින් හරියනවද..? උෟව බැඳගන්න ඕන උඹටනෙ.."

"ඒත් ඉතිං..."

මෝක්ෂා දෙපැත්තට ඇද්දාය.

"ඇයි බැරිද..? එහෙනං කරන්න තියෙන්නෙ කේව් ගැන තියෙන අදහස අත්අරින එක.. ඌ ඉතිං බඹරා වගේ නිදහසේ මලින් මලට පියඹලා යයි.."

"නෑ මාරියෝ.. මං කොහොමද මේ හිටපු ගමන් කේව් ගැන ගෙදරට කියන්නෙ..? අනිත මං ගෙදෙට්ට කියූ පළියට කේව් මා එක්ක ගෙදර යන්න එයි කියල හිතනවද..?"

මෝක්‍ෂා ගෙදරත් එක්ක යළි කතාබහක් ඇති කර ගත්තේ ළඟදීය. ඒත් තාමත් තාත්තා තමා එක්ක හරියට මූණ දී කතා කරන්නේ නැත. එහෙම එකේ ගහෙන් ගෙඩි එන්නා වාගේ මේ කාරණය ගෙදරට කියන්නේ කොහොමද කියා මෝක්‍ෂා හිතුවාය.

"ඔය දෙකම කෙරෙන විදිහක් මං කියන්නං.. අපේ ඊළඟ ෆොටෝ ෂූට් එක මං උඹලගෙ ගෙවල් ළඟට දාගන්නං.. එතකොට කේව්ට අකමැත්තෙන් හරි ගෙදර යන්න එන්න වෙනවා.. එකපාරටම අම්මලගෙ ඔළුවට කේව් ගැන මුකුත් දාන්න ඕන්නෑ.. අපි මුලින්ම දෙගොල්ල අඳුරගන්න ඉඩ දෙමු.."

මාරියෝගේ අදහස හොඳ බව මෝක්‍ෂා හිතුවාය. ඒ විදිහට කෙවින්ව කොටු කර ගත හැකි වෙතැයි ඈ විශ්වාස කළාය.

* * * * * * * * * *

සස්මිත නික්ම ගොස් මාසයක් ගෙවිණ. ඒ කටහඬ, ඒ රූපය කවදාවත් හදවතින් මැකී යන්නේ නැතැයි ශික්‍ෂාට හිතිණ. හිත ඇතුළේ සස්මිතගේ මතකය වසා තියාගෙන මෝක්‍ෂා පිටතින් සන්සුන්ව උන්නාය. අම්මාට, තාත්තාට දුකක් දෙන්න බැරිය. සිද්ධූ කිසිවක් කිසිදාකවත් අමතක නොවේ. ඒත් සියල්ල සදහට අමතක කළා සේ ඈ ගෙදරදී හැසිරුණාය.

"අක්කි එනව කිව්වෙ එයාගෙ ටීම් එකත් එක්කනෙ.. කීදෙනෙක් එනවද කියලා අහන්නත් බැරිවුණා.. තාත්ති කියන්නෙ කොහොමත් ඔය කැමරා කණ්ඩායමක දහයක් දොළහක් ඉන්නවා කියලා.. දවස්





තුනක් විතර නතර වෙනවා කිව්වනෙ.. මං උදව්වට ගෑනු දෙන්නෙකුට එන්ඩ කිව්වා දුව.. නැත්තං කොහොමද වෙලාවට කෑම බීම ටික දෙන්නෙ.."

රෝෂණී කීවාය. අක්කා ගෙදර එන එක ශික්‍ෂාට සතුටකි. පාළුවේ ගතව යන ජීවිතයට එහෙමවත් සතුටක් ලැබෙන එක ලොකු දෙයකි. අම්මා වද වුණේ ආගන්තුක සත්කාරය ගැනය.

"මාත් උදව් වෙන්නං අම්මී.. කොහොම හරි ටික ටික අක්කි ගෙදර එන එක කොච්චර දෙයක්ද..?"

ශික්‍ෂා කීවාය.

"හ්ම්.. තාත්ති උනත් දැන් ඉස්සර තරමම අකමැත්තක් පෙන්නන්නෙ නෑ.."

තාත්තාගේ කැමැත්ත අරන් දුන් පුද්ගලයා ශික්‍ෂාට සැණින් මතකයට ආවේය. අක්කාත් - තාත්තාත් අතර බිඳුනු සබඳකම යළි පැස්සුණේ සස්මිත නිසාය. සස්මිත ඒ උදව්ව කළේ අවංකවම බව ශික්‍ෂාට විශ්වාසය. ඔය කියන තරම් රැවටීමක්, වංචාවක් කළා නම් සස්මිත අර තරම් යහපත් දේ මේ පවුලට ඉටු කළේ කොහොමදැයි ශික්‍ෂාට නොතේරේ. 'සමහර විට අපි හිතන තරම් එයා වංචාකාරයෙක් නෙමෙ වෙන්ඩ ඇති.. ඒත්.. දැන් ඒ කිසි දෙයක් ගැන හිතල වැඩක්නෑ..' ශික්‍ෂා බරැති සුසුමක් නිදහස් කළාය.

* * * * * * * * * *

මෝක්‍ෂා, මාරියෝ, කෙවින් ඇතුළු කණ්ඩායමේ අට දෙනා නියමිත දවසේ වරුසප්පෙරුම නිවසට ගොඩ වූහ. වරුසප්පෙරුම යුවළ සියළු හිත් අමනාපකම් අමතක කොට අමුත්තන්ට සලකන්නට මහත්සි වූහ.

"තාත්ති.. මේ කෙවින් විජේන්ද්‍ර... විජේන්ද්‍ර ගෲප් එකේ ඕනර්.."

මෝක්‍ෂා දෙමාපියන්ට කෙවින්ව අඳුන්වා දුන්නේ ආඩම්බරයෙනි.

එහෙත් කෙවින් හා තමා අතර වූ විශේෂ සම්බන්ධය ගැන කිසිවක්ම ඇ නොකීවාය. සමාජය ගැන මොන විදිහේ ආකල්ප දැරුවත් බාහිර හැසිරීම අතින් කෙවින් අයත් වූයේ 'වැදගත්' කියන කොටසටය. ඒ නිසා මේ කඩවසම්, සල්ලිකාර, එහෙත් බොහෝ නිහතමානී වූ තරුණයාට වරුසප්පෙරුම දෙමහල්ලෝ ඇලුම් කළහ.

ශික්ෂා අමුත්තන් අතරට ආවේ ඊටත් බොහෝ වේලාවකට පස්සේය. සුරඟනක් සේ අහිංසකාවියගේ රූපය සන්සුන් හැසිරීම අමුත්තන් හැමගේ නෙත් ඇද ගත්තේය.

"මේ අපේ අම්මිගෙයි, තාත්තිගෙයි හුරතලී.. මගෙ නංගී ශික්ෂා.."

මෝක්ෂා කීවාය. කෙවින්ට, ශික්ෂා කෙරෙන් ඇස් අහකට ගන්නට අමතකව තිබිණ. ශික්ෂා රූපත් බව හැබෑය. එහෙත් කෙවින්ගේ හිත ඇදුණේ ඇගේ අහිංසකකමටය. නැහැපත්කමටය. සියල්ලටම වඩා ඇගේ නිහඬ හැසිරීම, තුළ බාහිරට පේන තේජවන්තකමක් තිබිණ.

මෝක්ෂා සමාජශීලීය. නිවුන් සහෝදරිය උනත් ශික්ෂා හාත්පසින්ම ඊයට වඩා වෙනස් එකියක බව කෙවින් ඇතුළු අමුත්තන් වහා වටහා ගත්හ. අක්කාත්, අක්කාගේ අමුත්තන් කීපදෙනාත් ගෙදර ගත කළ දින දෙක තුළත් ඈ වැඩිපුරම ගැවසුණේ අම්මාගේ පසුපසමය.

වරුසප්පෙරුම පවුල ළඟදී කොයි තරම් වැදගත්ව හැසිරුණත් ශික්ෂා වෙත ඇස් ඇදෙන එක නතර කරගන්නට කෙවින්ට නොහැකි විය. කාගෙත් ඇස් වසා මිදුලේදී මොහොතකට ශික්ෂා තනි කරගන්නට බොහෝ උත්සාහ දරා කෙවින්ට හැකි විය.

"නංගී ආස නැද්ද මොඩලින් කරන්න..? අක්ක වගේ ජනප්‍රිය වෙන්න..? ගොඩක් සල්ලි හොයන්න..?"

කෙවින්, ශික්ෂාගෙන් ඇසුවේය.





"නෑ.."

බිම බලාගෙන ශික්ෂා කෙටියෙන් උත්තරයක් දුන්නාය.

"ඇයි ඒ...?"

කෙවින්ට පුදුමය. මේ වාගේ අවස්ථාවක් සාප්පුවම 'එපා' කියන කෙල්ලක මේ මුණ ගැසුණාමය.

"මට ඒවයින් සතුටුවෙන්න බැරි නිසා.. මගෙ සතුට තියෙන්නෙ ගෙදර.."

කෙටියෙන් කියා ශික්ෂා ගෙට රිංගා ගත්තේ කෙවින්ට හිතන්නට බොහෝ දේ ඉතිරිකොට තබාය. සමාජශීලී කෙල්ලන් බොහෝ ගණනක් කෙවින් ඉතාම ළඟින් ඇසුරු කර තිබිණ. මෝක්ෂා ඒ අතරින් එක කෙල්ලක පමණි. එහෙත් පළමු වතාවට මෝක්ෂාගේ ගෙදරට ගොඩවූ මොහොතේ කෙවින් පුදුමයට පත්විය. මෝක්ෂා මේ තරම් ධනවත් පවුලක බව කෙවින් කිසිවිටක නොසිතුවේය. අනික ඇය මේ තරම් වැදගත් දෙමාපියන් දෙදෙනෙකුගේ දරුවෙකු ලෙස ඔහු කවදාවත් නොහිතුවේය. කෙල්ලෙක් තනියම ගෙදරකින් පැන යන්නේ එක්කෝ අගහිඟකම් නිසාය. නැත්නම් ගෙදරින් කරදර නිසාය. මෝක්ෂා මේ දෙවර්ගයටම අයිති නොවිණ. කවදාක හෝ මේ දේපල සියල්ල උරුම වන්නේ ඇයටත් ශික්ෂාටත්ය. සියලු සැප සම්පත් මැද හැදී වැඩුණු මෝක්ෂා ගෙදරින් තනි කැමැත්තට පිටව යන්නට ඇත්තේ ඇගේ හිතුවක්කාරකමටම මිස වෙන කිසිදු හේතුවක් නිසා නොවේ.

මෝක්ෂාගේ වර්ගයේ කෙල්ලන් බොහෝ ගණනක් ඉතා ළඟින් ඇසුරු කොට තිබිණි ද, විවාහයට ගැළපෙන්නේ ශික්ෂා වැනි කෙල්ලකැයි කෙවින් සිතුවේය. ඇය නැවුම්ය. රුවැතිය. ගෙදරින් තොර ලොවක් නැත. පිරිමියා ලෝකය පුරාම ඇවිද ගෙට ආවත් බිරිය ඒ ගෙයත්, පවුලත් ලෝකයම කරගත් ගැහැනියක විය යුතු බව කෙවින්ගේ අදහස විය. තමාගේ බිරිය තමාගේ දරුවන්ගේ



The Reader's Place

අම්මා විය යුත්තේ ඇයම බව කෙවින් තීරණය කළේය.

කෙවින්ගේ ඇස් බැල්මෙන් ශික්ෂා කැළඹිණ. ජීවිතයේ දෙවන ආදරයකට ඉඩක් නැතැයි සිතුවිල්ලක් තිබිණ. නමුත් මේ ආගන්තුක ජෙන්තුකාර පිරිමියා නිතර තමා වටා දැවටෙන්නට උත්සාහ දරන්නේ ඇයිදැයි ඈ අවබෝධ කරගෙන උන්නාය.

"කවුද අක්කි අර කෙවි කියන අයියා..?"

ඈ අක්කාගෙන් ඇසුවේ ඒ නිසාය.

"ආ.. එයාද..? එයා හරි හැන්ඩ්සම්නේ..?"

සතුටින් ඉතිරී ගිය මුහුණින් මෝක්ෂා කීවාය.

"ලස්සන වගේම තමා එයා බරකාරයා.. සල්ලි උල්පතක්.. උරුමක්කාරි වෙනකෙනා හරි ලකී.. අපි බලමුකෝ පුළුවන් උනොත් එයාව අපේ පවුලටම අයිති කරගන්න.."

The Reader's Place

අමුතු හිනාවක් මුහුණේ තියාගෙන අක්කා අන්තිමට කී දෙය ශික්ෂාට නොතේරිණ. ඈ ඒ නොතේරුණ දේ ගැන වැඩිදුරට හාර අවුස්සා බලන්නට නොගියාය.

* * * * * * * * * *

දින තුනක් වරුසප්පෙරුම බංගලාවේ ගත කර මෝක්ෂා ඇතුළු පිරිස පිටව යන විට වරුසප්පෙරුම දෙමහල්ලන් හා මේ කණ්ඩායම අතර හද බැඳීමක් ඇතිව තිබිණ. විශේෂයෙන් කෙවින්ගේ හැසිරීමත්, උවමනාවත් නිසා ඔහු ඒ දෙදෙනාගේ හිත් තුළ හද බැඳීමක් ඇති කරන්නට සමත් වූයේය.

"ආයෙ වෙලාවක කට්ටියම එන්න.. නිදහසේ බත් කටක් කාලා ඇවිදලා කරලා යන්න.."





රාජිත පිටවෙන්නට මොහොතකට පෙර සියල්ලන්ටම පොදුවේ කීවේය.

"එනවා.. එනවා.. අපි ළඟදිම ආයෙමත් එනවා අන්කල්.."

කෙවින් වහා කීවේය. මෝක්ෂාත්, මාරියෝත් මුහුණින් මුහුණ බලාගත්හ. ඔවුන් දෙදෙනා මේ ගමන සූදානම් කළේ යම් අරමුණක් නිසාවෙන් ද ඒ අරමුණ සාර්ථකව ඉෂ්ට වී තිබෙනවා දෙදෙනාටම තේරිණ. මෝක්ෂාගේ මුහුණේ තෘප්තිමත් සිනා රැල්ලක් නැවරිණ.

* * * * * * * * * *

# 10



The Reader's Place

**සති** දෙකක් නිසොල්මනේ ගෙවිණ. ඊළඟ සතියේ කෙවින්ගේ දෙමාපියන්, කෙවින්ගේ අදහසකට අනුව මංගල යෝජනාවක් ගෙන ශික්ෂා බලන්නට ආවෝය. කෙවින් සෙල්ලක්කාරයෙකි. ගත කළේ කිසිදු බරක් පතලක් ඇති ජීවිතයක් නොවේ. දෙමාපියන් ඒ බව දැන උන්හ. ශික්ෂාගේ අහිංසක, සුන්දර මුහුණත්, හැසිරීමත් දුටු විට කෙවින් තමන්ගේ සෙල්ලක්කාර ජීවිතය විවාහයකට කොටු කරන්නට තීරණය කිරීමේ පුදුමයක් නැතැයි මවුන්ට හිතිණ.

"අපේ පුතා මේ තරම් ඉක්මණට මැරේජ් ලයිෆ් එකක් ගැන හිතයි කියල අපි හිතුවෙ නෑ.. මිස්ට වරුසප්පෙරුමල බයවෙන්න එපා.. අපි ඔයාලගෙ දුවව අපේම දුවෙක් වගේ බලාගන්නං.."

කෙවින්ගේ පියා කීවේය.

"මිස්ට විජේන්ද්‍රලා වැදගත් විදිහට කෙලින්ම ඇවිත් මේ





ගැන අහපු එක ගැන අපි සතුටු වෙනවා.. අපිට ටිකක් කල් දෙන්න.. දුව එක්කත් කතා කරලා අපි උත්තරයක් දෙන්නං.."

රාජිත කීවේය.

ශික්ෂාගේ හදවත හඬා වැටිණ. ඒ හදවත මත්තේ තවමත් සස්මිත ජීවමානව උන් නිසාය. හැමදාමත් මැරුණු අතීතය ගැන හිත හිතා වැලපි වැළපී හිඳින්නට තමාට කොහෙත්ම ඉඩ නොලැබෙන බව ශික්ෂා දැන උන්නාය. සස්මිතට ආදරය කළ හිතින් වෙන පිරිමියෙකු තමන්ගේ ස්වාමි පුරුෂයා විදිහට ජීවිතයට බාර ගන්නට සිදුවෙන බව ශික්ෂා දැන උන්නාය. ඒත් ඒ දෙය මේ තරම් ඉක්මනට සිදුවේ යැයි ශික්ෂා නොසිතුවාය.

අම්මාත්, තාත්තාත් කෙවින්ට අකමැති වන්නේ නැත. පහුගිය දවස්වල ඒ දෙන්නා නොයෙක් වර බොහොම පැහැදීමෙන් කෙවින් ගැන කතා කරනවා ශික්ෂා බලාගෙනය.

"මට නම් මේ වෙච්ච දේ හිතාගන්න බෑ.."

ආගන්තුක සත්කාර විඳ, දැන් හැඳුනුම්කම් ඇති කරගෙන විජේන්ද්‍ර දෙමහල්ලන් නිවසින් පිටව ගිය පසු රෝෂණී කීවාය. ඈ හිත උපන් සතුට හංගන්නට දැන උන්නේ නැත.

"එකපාරක් හොඳයි කියලා මනුස්සයෙක්ව විශ්වාස කරලා අපි අමාරුවෙ වැටුණා.. මේ පාර මොනා වෙයිද කියල මං කල්පනා කළේ.. මොනා කළත්, කොච්චර හොඳට හැසිරුණත් අද කාලෙ පිරිමි විශ්වාස කරන්න බෑ රෝෂණී.."

රාජිත දෙපැත්තටම නැතුව කීවාය. පුතෙකු සේ විශ්වාස කළ ගෞරවය කළ සස්මිත විශ්වාසය පළුදු කළ හිතේ ආයිමත් වෙන තරුණයෙකු ගැන විශ්වාසයක් ඇති කර ගන්නා එක ලෙහෙසි නැත.

"ඇයි අනේ කොච්චර වාසනාවක්ද මේ අපේ කරපිටට කඩන්

වැදුණේ.. මොකෝ එක පාරක් ය්වපුණා කියලා අපි සදහටම අපේ දරුවව තනිකඩව තියන් ඉන්නද..?"

රෝෂණී කියන්නේ ඇත්ත යැයි රාජිනට හිතිණ. කවදා නමුත් සස්මිතව අමතක කර ශික්‍ෂාව වෙනත් තරුණයෙකුට විවාහ කර දෙන්නට සිදුවේ. කෙවින් උගත්ය. හැසිරීම හොඳය. ධනය, බලය, කුලය ඕනෑවටත් වඩා පවුලට ගැළපේ. ඉතිං ශික්‍ෂාට මෙයිටත් වඩා සුදුසු සහකරුවෙකු සොයා ගන්න ලේසියෙන් බැරිවෙන බව රාජිනට සිහිවිය.

"මෝක්‍ෂා තාමත් තනිකඩ එකේ අපි ශික්‍ෂාව බන්දල දුන්නම ඒ ළමයා මොනාක්කත් හිතයිද මන්දා..?"

හරි නම් පළමුව විවාහයක් සෙවිය යුත්තේ මෝක්‍ෂාටය. ඒ ගැන කල්පනාවී රාජින කීවේය.

"පිස්සුද අනේ.. මං හිතන්නෙ මෝක්‍ෂා දැනුවත්ව තමා මේ යෝජනාව ආවෙ.."

රෝෂණී කීවාය.

"ඇයි ඒ..?"

"නෑ මෝක්‍ෂා ආව වෙලාවෙ ඉඳලම කිව්වෙ කෙවින්ගෙ හොඳමයි.. කීප විටක් කුස්සියෙදි මා එක්ක කිව්වා ඒවගේ කෙනෙක් පවුලකට බන්දගන්න තියෙනව නම් වාසනාවක් අම්මා කියලා.. ඒ වෙලාවේ මං ඒ වචන එච්චර ගණන් ගත්තෙ නෑ.. ඒත් දැන් මට හිතෙනවා මෝක්‍ෂා එහෙම කියන්න ඇත්තෙ කෙවින්ට අපේ හිත් කැමති කරවගන්න කියලා.. කවුද දන්නෙ කෙවින් පුතා අපෙන් අහන්න කලින් මෝක්‍ෂාට මේ ගැන කිව්වද කියලා.. මෝක්‍ෂා කියන්නැති කෙලින්ම අම්මා තාත්තා එක්ක කතා කරන්න දෙමව්පියො යවන්න කියලා.."





රෝෂණී ඇගේ ගැහැනු සිතට දැනුණු සිතුවිලි පැහැදිලි කළාය. බිරිය කියන විදිහත් වෙන්න බැරි නැත කියා රාජිනට හිතිණ.

"කොහොම උනත් ඔයා ඉස්සර වෙලාම මෝක්‍ෂා එක්ක මේ ගැන කතා කරලා ඉන්නකො.."

රාජින කීවේය. අම්මාගේත්, තාත්තාගේත් කතාව අහගෙන උන් ශික්‍ෂාට හිතුණේ අම්මා හරිය කියාය.

'අපි බලමුකො එයාව අපේ පවුලටම අයිති කර ගන්න පුළුවන්ද කියලා..' අක්කා එදා කීවා ශික්‍ෂාට මතකය. මේ වචනවල තේරුම එදා නොතේරුණාට ශික්‍ෂාට අද තේරේ. කෙවින්, මෝක්‍ෂාගේ හිතවතෙකි. ඔහු මේ ගෙදරට ආවේ මෝක්‍ෂා අක්කාගේ ඇඳුනුම්කම නිසාය. ඉතිං අක්කාට රහසින් කෙවින් තමාට මංගල යෝජනාවක් එවාවීයි කොහෙත්ම හිතන්න බැරිය. මේ ගැන කෙවින් මුලින්ම කියන්න ඇත්තේ අක්කාටය.

ශික්‍ෂා සුසුමක් හෙළුවාය. හිත ඇතුළේ උන් සස්මිතගේ රුව ශික්‍ෂාගේ ඥෙනත බොඳ කළේය.

'මට ඔයාව දුකක් නොදී බලාගන්න පුළුවන්.. මේ ගෙදරදී විඳපු සැප ඒ විදිහටම දෙන්න බැරි උනත් මං ඔයාට අඩුවක් කරන්නෑ ශික්‍ෂා.. අපි දෙන්නට පුළුවන් අපේ පවුල ලස්සනට හදාගන්න.. මුළු ජීවිතේ පුරාම ගොඩක් ආදරෙන් ඉන්න පුළුවන් ජීවිතයක් මං ඔයාට දෙනවා..' සස්මිත දුන් පොරොන්දුව ශික්‍ෂාට සිහිවිය. ඔහුට බැඳුණේ, ආදරය කළේ කිසිදාක වෙන පිරිමියෙකුගේ බිරිය වන්නට හිතා නොවේ. එහෙත් දෛවය ඒ තරම් සාධාරණ නොවන බව දැන් ශික්‍ෂා තේරුම් අරන් ඉවරය.

* * * * * * * * * *

දවසේ රැගත කිරීම් හමාරකොට කාමරයට ආ මෝක්‍ෂා රාත්‍රී සාදයට යන්නට සූදානම් වූවාය. අගනුවර ප්‍රධාන පෙළේ හෝටලයක නිළියකගේ විවාහ මංගලෝත්සවයක් පැවැත්විණ.



The Reader's Place

මෝක්ෂාට හා කෙවින්ට ආරාධනා ලැබී තිබිණ. තව මොහොතකින් මෝක්ෂාව රැගෙන යාමට කෙවින්ගේ වාහනය ප්‍රින්සි අක්කාගේ තවාතැන්පොළ ළඟට එනවා ඇත.

'ගෙදර ගිහින් ආවයින් පස්සෙ කෙවින් හරි හොඳයි.. කාලෙකින් වෙන කෙල්ලෙක් එක්ක ගියා කියලා ආරංචියකුත් නෑ.. මාව උනත් ඩ්‍රොප් කරලා යනවා මිසක් මා එක්ක නිදා ගන්න උවමනාවකුත් නෑ.. වෙලාවකට මටම පුදුමයි..' මෝක්ෂා කැඩපතට එබී වත්පුණු තවරන ගමන් සිතුවාය. හැමදේම හොඳම විදිහට විසඳේවියි සියුම් බලාපොරොත්තුවක් ඇගේ සිතේ තිබිණ. අම්මාගේ ඇමතුම මෝක්ෂාට ලැබුණේ හැඳ පැළඳ අවසන් වෙද්දීය.

"දුවේ.."

කවදාවත් නැති සතුටක් අම්මාගේ කටහඬේ තැවරී තිබෙනවා මෝක්ෂාට දැනිණ.

"අම්මි.."

"ඔයා නම් හරි කෙනා තමා.."

රෝෂණී කතාබහ පටන් ගත්තේ ආදරණීය තෝක්කාඩුවකිනි.

"ඇයි අම්මි..?"

"ඇයි තමා.. ඇයි ළමයෝ ඔයාවත් මේ බවක් කලින් අපට කිව්වෙ නැත්තෙ..? ඒ මනුස්සයො ගෙදෙට්ට එනකම්ම අපි මේ ගැන මුකුත්ම දන්නෑ.."

"මොකක්ද අම්මි..?"

මෝක්ෂාට, අම්මා කියන කිසිවක් එකවරටම කල්පනා නොවිණ.

"විජේන්ද්‍රලා ජෝඩුව.. අර කෙවින් පුතාගෙ අම්මයි, තාත්තයි මංගල යෝජනාවක් අරගෙන අපේ ගෙදර ආවා.."





මෝක්ෂාට අදහාගන්නත් අමාරුය. එහෙම දෙයක් කරන බවක් හීනෙකටවත් කෙවින්, මෝක්ෂාට කිවේ නැත. සමහර විට තමා පුදුම කරන්න හිතාගෙන කෙවින් තමාට රහසේ එහෙම කළා වෙන්නට පුළුවන.

'මාරියෝ කිව්වෙ ඇත්ත.. ගෙදර එක්ක ගියහම කෙවින් සම්පූර්ණයෙන්ම වෙනස් උනා.. එකාතකින් අපේ පවුලෙ තත්ත්වය දැක්කම කෙවින්ට හිතෙන්න ඇති මාව එයාට ගැළපෙනවා කියලා.. තාත්තා වරුසප්පෙරුම එස්ටේට් එකේ අයිතිකාරයා කියලා මං කවදාවත් කියල නැතෙ.. එයාට තේරෙන්න ඇති මෙහෙම හිතුවක්කාරෙට ආවට මං වැදගත් පවුලක ළමයෙක් කියලා..' මෝක්ෂාට හිතිණ.

කෙවින් තමාගෙන් විවාහ වෙන්න කැමැතිද කියා තාමත් අසා නැත. එහෙම නොකර ඔහු කෙලින්ම තමාගේ දෙමාපියන් එක්ක මේ ගැන කතා කරන්න ඔහුගේ දෙමාපියන් යැව්වේය.

'කෙවින් දන්නවා මං එයාට ආදරෙයි කියලා..' මෝක්ෂාගේ හිතේ කෙවින් ගැන ලොකු ආදරයක්, බැඳීමක් ඇතිවිය.

"ඒ අය ඇවිත් තිබුණෙ කෙවින් පුතාගෙ උවමනාවට.."

රෝෂණී දියණියට කීවාය.

"මේ තරම් ඉක්මණට එයා අම්මලව අපේ ගෙදෙට්ට එවයි කියලා මං හිතුවෙ නෑ අම්මි.."

මෝක්ෂාට හිතේ සතුට වහගෙන කෝල බවක් දැනිණ.

"ඉතිං මොනාද අම්මි උනේ..? තාත්ති කෙවින්ට කැමති උනාද..?"

"අකමැති වෙලා කොහොමද ළමයෝ..? කෙවින් පුතාගෙ තියෙන වැදගත්කමටනේ නංගි ගැන කැමැත්ත තිබ්බත් ඒ ගැන



The Reader's Place

නංගිගෙන්වත් වචනයක්වත් අහන්නෙ නැතුව කෙලින්ම අම්මලව ගෙදරට එව්වෙ.."

"අම්..මා..හ්..!"

මෝක්ෂාට දැනුණේ තමන්ගේ ලෝකය උඩු යටිකුරු වන බවය.

"තාත්ති උඩින් කැමතී.. නංගි තමා ටිකක් හිත හදාගන්න බැරිව ඉන්නෙ.. අර සිද්ධිය වෙලත් තාම ඒ හැටි කාලයක් නැනෙ.. කවදා හිටියත් නංගිට වෙන කෙනෙක් බඳින්නම වෙනවනෙ.. ඒකයි අපි හිතුවෙ නංගිව කොහොම හරි මේ කටයුත්තට කැමති කරවගන්න ඕන කියලා.."

මෝක්ෂාට, අම්මාගේ වචන ඇහුණේ හීනෙන් වාගේය.

"ඒගොල්ල කෙලින්ම කිව්වද අම්මි, කෙවින් නංගිට කැමතියි කිව්වා කියලා..?"

මෝක්ෂාට මෙහි ඇත්ත නැත්ත හරියටම ගළපා ගන්නට උවමනා විණ.

"නැත්තං.. කෙවින් කියල තියෙනවා මෙහෙ ආව පළවෙනි දවසෙම නංගිව දැක්ක ගමන් එයාට හිතුණලු කවද හරි එයාට ගැළපෙන්නෙ නංගිව තමා කියලා.."

මෝක්ෂාගේ ආත්මය ගිනි ගත්තේය. ලොකු වරදක් සිදුවී තිබේ. නැත.. කෙවින් ලොකු වරදක් කර තිබේ. එය නිවැරදි කරන්නේ කොහොමද..?

'හොඳයි බලමුකො..'

කෙවින්ගේ රැවටිලිකාර චරිතය මෝක්ෂාට තේරෙන්නේ දැන්ය. තමා සමග යහන් ගතවීත් නැගණිය බිරිඳ කරගන්නට තමාට රහසේ ගෙදරට කපුවෙකු යවන්නට ඔහු හිත හදාගත්තේ කොහොමද..?





'හොඳයි බලමුකො' මෝක්ෂා ද්වේශයෙන් සිතුවාය. තමාගේ පහස ලැබ ප්‍රයෝජනය ගෙන පැත්තකට කර නංගීත් එක්ක යහපත් පවුල් ජීවිතයක් ගත කරන්නට ඔහු හිතනවා ඇත.

'මං එයත් එක්ක මේක බේරගන්නංකො..' මෝක්ෂා හිතුවාය. අම්මා අහන දෙයට එහෙන් මෙහෙන් උත්තර දී ඇය කතාබහ හමාර කළාය.

මෝක්ෂාගේ හදවත ගිනිගෙන තිබිණ. ගැහැනියක සමග යහන් ගතවූ පිරිමියෙකුට ඒ ගැහැනියට මීට වඩා ලොකු වරදක්, අවමානයක්, අසාධාරණයක් කරන්න බැරිය. කෙවින් මේ කර ඇත්තේ ඇයට කරන්න පුළුවන් ලොකුම වරදය. මහා ආත්මානුකම්පාවක් මෝක්ෂාට දැනිණ. පෙම් කරන තැනින් කොන් කිරීමට ලක්වූ විට මුළු ලෝකයම එදිරිව ගියාසේ දැනෙන බව මෝක්ෂා දන්නේ දැන්ය. කෙවින්ගේ කාරයේ හෝන් හඬ දෙවන වරටත් ශබ්දවද්දී මෝක්ෂා එළියට ආවාය.

"අද නම් පාටි එකේ ඔක්කොම කොල්ලො ටික මට ඉරිසියාකරයි.. ගෙදර ඇවිත් මිරිස් ගෝනියක් විතර පුච්ච ගන්න වෙනවා.. මේ වගේ ලස්සන හුරුබුහුටි කෙල්ලෙක් ළඟ තියන් යනකොට කාටද ආස හිතෙන්නෙ නැත්තෙ..? ඔයා අද මාර ලස්සනයි මිකී.."

මෝක්ෂා රියට ගොඩවෙද්දි කෙවින් කීවේය.

'රැවටිලිකාරයා' මෝක්ෂාගේ හිත කෑගැහුවේය. ඒත් ඈ ඒ වචන ටික කටින් එළියට දාන්නට ඉස්සර නොවිණ.

'මං අද මෙයත් එක්ක මේකෙ දෙකින් එකක් බේරගන්නවා..' මෝක්ෂා හදවතේ ගැඹුරුම තැනින් හිතුවාය. තීරණය කළාය.

"මිකී.. වට්ස් රෝන් විත් යූ.. ඇයි කතා නැත්තෙ..?"



The Reader's Place

"කේවි.. මං ඔයත් එක්ක වැදගත් දෙයක් කතා කරන්න හිටියේ.."

මෝක්ෂා බොහොම ඉවසිල්ලේ කීවාය.

"මොකක්ද බබා..?"

"අපි දැන් මෙහෙම හිටියා ඇති කියල මට හිතෙන්නෙ.. අපි දෙන්නා දැන් මැරේජ් ලයිෆ් එකක් ගැනත් හිතන්න ඕන කාලේ.."

ඔහු කටයුතු කරන්නේ බොහෝ කපටි විදිහටය. ඔහු අයිති කර ගැනීමට - කොටු කර ගැනීමට තමාත් සූක්ෂම විය යුතු බව මෝක්ෂාට තේරිණ.

"ආ.. ඒ...ක...ද.. මේ...?"

කෙවින් තුළ ඇතිවූ තිගැස්ම කලබලය ඔහුගේ ඉරියව් කෙරේ හොඳ අවධානයෙන් උන් මෝක්ෂාට පෙනිණ. එකපාරටම කෙවින්ට කතා කරන්නට වචන හොයා ගන්නත් අමාරු විය.

"ඒකට තව කල් තියෙනවා බබා.."

කෙවින් සරල වෙන්නට උත්සාහ දැරුවේය.

"දැන්ම ඕවා ඔළුවට දාගන්නැතුව මේ කාලෙ අපි හොඳට එන්ජෝයි කරල ඉන්නෝන.."

කෙවින් කීවේ හිනැහීගෙනය.

"ඒකද ඔයාගෙ අම්මලව මගෙ නංගි ගැන ප්‍රපෝස් කරල අපේ ගෙදෙට්ට යැව්වෙ..?"

තවදුරටත් සියල්ල ඉවසා දරා ගන්නට මෝක්ෂාට හැකි නොවිණ. ඇගේ ඉවසීම රතු ඉර පැන තිබිණ. කෙවින් පුදුමයෙන් මෝක්ෂා දෙස බලා උන්නේය.





"ඇයි කටට වචන එන්නැද්ද..? බොරුකාරයා.. මාව රවට්ටලා.. මගෙන් ප්‍රයෝජන අරන් මගෙ නංගිව බැඳගන්න නේද කල්පනාව..?"

මෝක්ෂා වියරු වැටී උන්නාය. ඈ කෑගැසුවේ ඇත්තටම පිස්සියක සේය.

"මිකී.. මං කවදාවත් ඔයාව බඳිනවා කියලා පොරොන්දු වෙලා නෑ.."

කෙවින් කෝපයෙන් කෑගැසුවේය. මෝක්ෂා ගල් ගැසිණ. ඇත්තය. එකට ජීවත් උනත් මේ තාක් මේ දෙදෙනා විවාහයක් ගැන කතාකොට නොතිබිණ.

"මං එක්ක එකට හිටියේ.. මාව විනාශ කළේ බඳින්න අදහසක් නැතුවද..?"

මෝක්ෂා මොර දුන්නාය. කෙවින්ගේ උරහිසට පහර දුන්නාය. කෙවින්ට රිය පාලනය කර ගැනීම පවා අසීරු විය.

"ඔය කිසි දෙයක් මගෙ තනි කැමැත්තට වුණේ නෑ.. හැමදේම උනේ තමුසෙගෙත් කැමැත්තෙන් මිකී.. බඳින්න අදහසක් නැතුව, පිරිමියෙක් එක්ක ඇඳට ගොඩවෙන්න කලින් තමුන් ඒවා කල්පනා කරන්නෝන.. මට, මං කැමති කෙනෙක් බඳින්න නිදහස තියෙනවා තේරුණාද..?"

"මොකක්ද උඹ කිව්වෙ..?"

මෝක්ෂා, කෙවින්ගේ ගෙලේ එල්ලිණ. කෙවින් එක අතකින් මෝක්ෂාව ඉවතට තල්ලු කළේය. ඇගේ හිස වේගයෙන් රියේ වැදිණ. ඊළඟ තත්පරයේ වියරු වැටී උන් මෝක්ෂා, කෙවින් වෙත පැන ඔහුගේ මුහුණ සූරන්නත්, පහර දෙන්නත් වූවාය. කෙවින්ගේ අතින් සුක්කානම අත් හැරිණ. ඔහු මෝක්ෂා හා පොර බැදුවේය. පාලනයකින් තොර රිය පාරෙන් ඉවතට පැන පාර අයිනේ වූ තාප්පයක වේගයෙන් හැප්පිණ.



The Reader's Place

"දඩාහ්...!"

"අම්මෝහ්..!"

මෝක්ෂාටවත්, කෙවින්ටවත් ඉන් එහා කිසිවක් මතකයේ නොවිණ.

* * * * * * * * * *

සමහර විට දෛවය හැසිරෙන්නේ පුදුම සහගත අයුරින්ය. ඉරණම විසඳෙන විදිහ කොහොමවත් කලින් හිතාගන්න බැරිය. මෝක්ෂා හදිසි අනතුරකට ලක්වූ පුවත වරුසප්පෙරුම බංගලාව තුළ ඇති කළේ ද එවැනි තැති ගැන්මකි. රෝෂණීත්, රාජිතත්, ශික්ෂාත් ආරංචියට රෝහල වෙත ආවේ ගින්දරකින් දැවෙමිනි. ඒ වන විටත් මෝක්ෂාවත්, කෙවින්වත් කොළඹට මාරු කර යවා තිබිණ.

"කොළඹ යවල තියෙන්නෙ අමාරු හින්දා.. අපිත් කෙළින්ම කොළඹ යං.."

රාජිත වාහනය කොළඹ නුවර ප්‍රධාන මාර්ගයට ගත්තේය. ශික්ෂාත්, රෝෂණීත් උන්නේ අඬා වැටෙමිනි.

"මට නම් මේ වෙලා තියෙන දේ අදහ ගන්න බෑ රාජිත.."

රෝෂණී කීවාය.

"මෙතන අපි නොදන්න දෙයක් තියෙනවා රෝෂණී.. ඒ මහ රෑ කෙවින්, මෝක්ෂා එක්ක තනියම කාරෙකක කොහෙද ගියේ කියලයි මං මේ කල්පනා කළේ..?"

හදිසි අවස්ථාවේ උනත් රාජිත හිතට දැනෙන පැනය හෙළි කළේය. තාත්තා කී සැකයම ශික්ෂාගේ හිතේත් ඇතිවී තිබිණ. කොච්චරවාත් වෙන්නේ ම හදවත කලඹන දේමය. අවාසනාවන්ත





කිසිම දෙයක් ආයේ කණට අහන්න ලැබෙන්න එපායි ඈ සිතින් පැතුවාය.

"ඊයෙ රෑ නුවරින් මෙහාට ට්‍රාන්සර් කරපු පේෂන්ට්ලගෙ විස්තර දැනගන්න පුළුවන්ද..?"

කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු ඒකකයට ගිය සැණින් රාජිත විමසා බැලුවේය.

"ඔය කියන්නෙ කාර් එක්සිඩන්ට් එකෙන් ගෙනාව කපල් එක නේද..?"

වෛද්‍යවරයා ඇසුවේය.

"ඔව් ඩොක්ට.."

"ගෑනු ළමයට නම් එච්චරම ප්‍රශ්නයක් නෑ.. දැන් එයා අවධානම් අවස්ථාව පහු කරල තියෙන්නෙ.. ඉක්මණටම ICU එකෙන් වෝඩ් එකට දාන්න පුළුවන් වෙයි.. පිරිමි ළමයගෙ කතුලක් අපට අයින් කරන්න සිද්ධ වුණා.."

වෛද්‍යවරයා සෙමින් පැහැදිලි කළේය.

"අයියෝ..!"

කෙවින්ගේ තත්වය අසා වරුසප්පෙරුම යුවළ කණගාටු වූයේ හැබෑවටමය. ශික්ෂාගේ හිත තුළ ද වේදනාවක් ඇතිවිය. තරුණ ජීවිතයකට අතක් පයක් නැතුව යනවා කියන්නේ ලේසි පහසු දෙයක් නොවේ.

"ඒ අපේ දුව ඩොක්ට.. අපට බැරිද ලෙඩාව බලන්ඩ..?"

රෝෂණී නෙත් මත කඳුළු ඉස්සර කරගෙන ඇසුවාය.

"තව ටිකක් ඉන්න.. ලොකු ඩොක්ට ආවම වෝඩ් එකට දායි.."

වෛද්‍යවරයා කාරුණික හඬකින් කීවේය. තවත් පැයකට විතර පස්සෙ මෝක්ෂාව හදිසි අනතුරු ඒකකයෙන් වාට්ටුවකට මාරු කෙරිණ. ශිෂාත්, අම්මා තාත්තා දෙන්නාත් මෝක්ෂා ළඟට ගියේ කලබලයෙනි.

"අක්කේ.."

ශිෂා සොයුරියගේ හිස අත ගෑවාය. මෝක්ෂාගේ නළලත්, එක් අතකුත් වෙලා දමා තිබිණ. කකුලේත් ගෙල පහළිනුත් බෙහෙත් ප්ලාස්තර අලවා තිබේ. තැන තැන සීරුණු සලකුණුය. ඇ මේ ඉන්නා විදිහෙන් සිදුවූ අනතුර ලේසි පහසු දෙයක් නොවන බව කාටත් වැටහිණ.

"මොකක්ද පුතේ මේ උනේ..?"

රෝෂණී, මෝක්ෂාගේ අතක් අල්ලා ගත්තාය.

"මට සමාවෙන්න අම්මී.."

මෝක්ෂා කතා කළේ හඬමිනි. මේ කතාබහ වේදනාකාරය. එහෙත් කවුරුවත් කිසිවක් හංගා පලක් නැත. දුක්බර උනත්, වේදනා සහගත උනත් ඇත්ත එළිකළ යුතු යැයි මෝක්ෂා සිතුවාය.

"ඔයගොල්ලො පුළුවන් නම් මට සමාවෙන්න.. වැරදි පාරෙ ගියහම මෙහෙම වෙනවා.. කෙවින් මගෙ ජීවිතේ විනාශ කළා අම්මෙ.. ඒකට එයාට විතරක් දොස් කියන්න බෑ.. හැමදේම උනේ මගෙ කැමැත්තෙන්.."

මෝක්ෂා කීවාය. රාජිතට හිතුණේ තමා අනුමාන කළ දේ හරිය කියාය. ශිෂාත්, රෝෂණීත් හඬා වැටුණේ උණු කඳුළු වගුරුවමිනි.

"මාත් එක්ක සම්බන්ධයක් තියෙන අතරෙම කෙවින්, නංගිව බඳින්න හැදුවා.. අපි වාහනේදි ඒකට රණ්ඩු කළා.. මොනා කළත්





මට කෙවින්ව අමතක කරන්න බෑ.. කෝ තාත්ති දැන් කෙවින්..? එයාට මොකද..?"

මෝක්ෂා උන්නේ කෙවින් ගැන තොරතුරක් දැන ගන්නා පිපාසාවෙනි. තමාගේ ජීවිතය බේරුණේත් අනූනවයෙනි. කෙවින් රිය පැදවූ කෙනාය. ඉතින් කෙවින්ගේ තත්ත්වය මීටත් වඩා නරක විය යුතුය.

"එයා අයි සී යූ එකේ ඉන්නෙ.."

රාජිත උත්තර දුන්නේ අහක බලාගෙනය. ඊට වඩා කිසි දෙයක් කෙවින් ගැන හෙළි කරන්නට ඔහු කැමති නොවිණ. ඒත් මෝක්ෂාගෙන් ගැලවිල්ලක් නොවිණ.

"අනේ තාත්ති.. මට ඇත්ත කියන්න.. කෙවින්ට මොකද උනේ..? අනේ එයාට මොකද උනේ..?"

"කෙවින්ගෙ කකුලක් කපන්න සිද්ධ වෙලා.."

සඟවන්නම බැරි තැන රාජිත කීවේය.

"අයියෝ.. මං කෙවින්ට එහෙම දෙයක් කරන්න හිතුවෙ නෑ දෙයියනේ.. මේ මොකක්ද උනේ..?"

මෝක්ෂා විලාප දුන්නාය. තමා කෙවින්ට මේ තරම් ආදරය කර ඇති බවත් මෝක්ෂාට දැනෙන්නේ දැන්ය. තමා නිසා ඔහු විපතට පත්වුණ බව, අසරණ වුණ බව මෝක්ෂාට දරාගන්නට බැරිවිය.

"එයා මට ආදරේ කළේ නැතුවට.. මං එයාට ආදරේ කළා.."

මෝක්ෂා අඬන්නට වූවාය.

"අඬන්නෙපා රත්තරං.."

රෝෂණීත්, ශිෂාත් මෝක්ෂාව වැළඳගත්හ.

"ඔය ලෙඩාව වෙහෙස කරන්න එපා.. දැන් ඔය කට්ටිය කරුණාකරල ගිහින් හෙට එන්න.. ලෙඩාට ගොඩක් විවේකය අවශ්‍යයි.."

වාට්ටුව බාර ප්‍රධාන හෙදිය කෑගෑවාය.

"අපි හෙට උදෙන්ම එන්නං.."

රෝෂණිත්, ශික්ෂාත් මෝක්ෂා තනිකර රාජිත පස්සේ ගියේ කැමැත්තෙන් නොවේ.

"මොකද ඒයි අපි කරන්නෙ..?"

රෝෂණි කල්පනාබරව උන් සැමියාට ළංවිය.

"ඒකම තමා මාත් මේ කල්පනා කළේ.. අපට ආයෙ නුවර ගිහින් එන්න තරම් කාලයක් නෑ.. හෙට උදේ වෙනකන් මෙහෙ කොහෙ හරි නතර වෙන්න තිබ්බ නම්.."

The Reader's Place

රාජිත කීවේය.

"ඇයි රාජිත.. අපි නිශ්ශංකලාගෙ ගෙදර යංකො.. ළමයි පොඩි කාලෙ ගියාට පස්සෙ ගියෙත් නැනෙ.."

රෝෂණී ළඟ පාත පදිංචිව සිටින රාජිතගේ දුර ඥාතියෙකු සිහිපත් කළේය. ශික්ෂාට හා මෝක්ෂාට වයස අවුරුදු හත අට වෙනතුරුත් වරුසප්පෙරුමලා, නිශ්ශංකලාගේ ගෙදර ආ ගිය අතර කාර්යබහුල වීම හා නුවර හා කොළඹ අතර දුර ප්‍රශ්නය නිසා ඒ සබඳකම් කාලයත් එක්ක තරමක් ඈත් විය.

"මේ වෙලාවේ හදිසියෙම අපි යන එක ඒ මිනිස්සුන්ට කරදරයක් වෙයිද දන්නෑ රෝෂණී.."

රාජිත දෙපැත්තට ඇද්දේය.

"කරදරයක් වෙලා තියෙන වෙලාවක එහෙම හිතයිද..?"





රෝෂණී කීවාය. රාජිත, නිශ්ශංකලාගේ ගෙදර යන්න තීරණය කළේ වෙන කරන්න දෙයක් නැතිකමටය. ඒත් නිශ්ශංකත්, බිරියත් වරුසප්පෙරුම පවුලේ අයව පිළිගත්තේ මහා ඉහළිනි. ඔවුන්ට සිදුවූ කරදරය අසා නිශ්ශංකලා ඇත්තටම දුක් වූහ.

"බයවෙන්නෙපා රාජිත.. අපි ළමයව ඉක්මණට සනීප කරගමු.."

නිශ්ශංක කීවේය. ඔහුගේ බිරිය ගංගාත්, රෝෂණීගේ හිත හැදුවාය. මේ යුවළට උන්නේ එකම පුතෙකි. වැඩිදුර අධ්‍යාපනය සඳහා ඔහු එංගලන්තයට ගොස් තිබූ නිසා දෙමහල්ලන් උන්නේ තනිවමය. ගෙදරට වැඩටත්, ඉදුම් පිහුම්වලටත් යුවළක් උන්න හන්දා නිශ්ශංකටත්, ගංගාටත් වරුසප්පෙරුම තුන්දෙනා සමඟ රාත්‍රී කෑම සූදානම් වනතුරු කතා කර කරා ඉන්නට නිදහස තිබිණ. සාලයට රොක්වූ පිරිස ආගිය තොරතුරු බොහෝවක් කතාබහ කළහ.

ඇර දමා තිබූ ගේට්ටුවෙන් යතුරු පැදියක් වත්තට ඇතුළු කෙරුණේ මේ අතරමය. ඒ යතුරු පැදියේ හඬට ශික්ෂා වෙව්ලා ගියාය. ඇගේ සිත අතීතයට ගියේ විදුලියක් සේය. සස්මිතගේ බයිසිකලයේ හඬත් මේ වාගේමය. එදවස වාහන දාහක් අතරින් උනත් ඇයට සස්මිතගේ බයිසිකලයේ හඬ පැහැදිලිව වෙන්කර ගන්න පුළුවන්කම තිබිණ.

නිශ්ශංකලාගේ මිදුලේ නතර වූ බයිසිකලයෙන් බැහැගත් පුද්ගලයා හෙල්මටය ගිසින් මිදුණේය. ගේ ඇතුළේ හිඳ සිටියත් ඇර දමා තිබූ ජනේලයෙන් එළිය හොඳින් පෙනුණි. ශික්ෂා වෙව්ලා ගියාය.

"ස...ස්.. මි..ත.."

ශික්ෂා විශ්වාස කරන්නේ කොහොම...? කහ පාට ලයිට් එළිය මැද මිදුලේ හිටගෙන උන්නේ සස්මිතය. ලිපි ගොනුවක් අතින්

ගෙන හෙමින් හෙමින් නිවසේ මහ දොර වෙතට ආ සස්මිතගේ හඬ ඊළඟට ඇසිණ.

"අන්කල්.. අන්කල්.."

ඒ හඬ හීනෙන් සේ අසාගෙන ශික්ෂා දැවෙමින් හිඳ උන්නාය.

"ආ... එන්න පුතා.."

රාජිතත් එක්ක කතාබහක පැටලී උන් නිශ්ශංක උද්යෝගය සැඟවු පුටු ඇන්දට හේත්තු කරමින් කීවේය. සස්මිතගේ රුව සාලයට ඇතුළු විය. ඔහුගේ ඇස් පළමුව විසිවුණේ දෑස ලොකු කර බලා ඉන්නා ශික්ෂා වෙතටය. ඊළඟට රාජිත හා රෝෂණී වෙතටය. ආයිමත් ශික්ෂා වෙතටය. ඒ මුහුණෙන් පෙනුණේ ආත්මය ඇතුළේ ඇතිව තිබූ කම්පනයමය.

'මේ ඇත්තටම සස්මිතද..? නැත්නං වෙන කවුරුවත්ද..? මගෙ හිතේ තාමත් සස්මිත ගැන හැඟීමක් තියෙන හින්දා වෙන කෙනෙක්ව ඒ වගේ පේනවද..?' ශික්ෂා හිතුවාය. ඇ අම්මාත්, තාත්තාත් දෙස බැලුවේ ඒ හැඟීම නිසාමය. රෝෂණීත්, රාජිතත් ඇහි පිල්ලමක්වත් නොහෙලා මේ රුව දෙස බලාගත් ගමන්ය. වැරදෙන්නට විදිහක් නැත. මේ සස්මිතමය. අම්මාත්, තාත්තාත් බයවී බලා ඉන්නේ ඒ නිසා බව ශික්ෂාට විශ්වාසය.

"ඉතිං පුතා.."

නිශ්ශංක මහතා සස්මිතට කතා කළේ බොහෝ කරුණාවෙනි.

"ආ... මේ.. මේ.."

සස්මිතටත් ආ කාරණයත් අමතකව තිබිණ.

"මෙතන මගෙ ඕනයි කිව්ව ඩීටේල්ස් ඔක්කොම තියෙනවා අංකල්.. ප්‍රදීපට ෆැක්ස් කරලා බලන්නකො.."

සස්මිත ලිපිගොණුව නිශ්ශංකට බාර දුන්නේය.





"හොඳයි පුතා.. මං හෙටම යවන්නම්.. පුතා ඊයෙත් කතා කරලා ඇහුවා ඔයා විස්තර ටික ගෙනත් දුන්නද කියලා.."

නිශ්ශංක මහතා කීවේය.

"තැන්ක් යූ අන්කල්.. එහෙනං මං ගිහින් එන්නං.."

සස්මිත, නිශ්ශංක මහතාට කීවේය. පිටව යන්නට පෙර ඒ ඇස් ආයිමත් වතාවක් අමුත්තන් තිදෙනා වෙතට යොමු විය. ඇත්තටම ඒ ඇස් දෙක නතර වූයේ ශික්ෂා ළඟය. ශික්ෂා වෙව්ලා ගියාය. සස්මිතට තවමත් ආදරය කරන හිතින් ඒ බැල්ම දරාගන්නට ඇයට නොහැකි විය. ශික්ෂා බිම බලා ගත්තේ ඇස්වලට කඳුළු පුරවාගෙනය.

"අපේ පුතාගෙ යාළුවෙක්.. එහෙ ජොබ් එකක් තියෙනවා කියලා පුතා කිව්වා.. දැන් මේ ළමයා එතෙන්ට යන්න ට්‍රයි කරන්නෙ.."

නිශ්ශංක මහතා විස්තර කළේය.

"මං මිනිහව දන්නවා.."

රාජිත නොසඟවා කීවේය. සමහරවිට සස්මිත තමාව රැවටුවා සේ නිශ්ශංකවත් රවටනවා වෙන්නට පුළුවන. රාජිත සිතුවේ එහෙමය.

"ඇත්තට.. හරිම හොඳ හාදයා නේද..?"

නිශ්ශංක මහතා කීවේය.

"එහෙනං නිශ්ශංක මිනිහා ගැන හරියටම දන්නෑ මං හිතන්නෙ.."

කට කොණකින් හිනැහී රාජිත, බිරිය දෙස ද බැලුවේය.

"මං මොකද නොදන්නෙ..? පොඩි කාලෙ ඉඳල මේ අහල

පහල හැදිච්ච මනුස්සයව.. අපේ පුතාලගෙ පන්තිවලමනෙ ඉගෙන ගත්තෙ.."

නිශ්ශංක මහතාත් හිනැහී කීවේය.

"එහෙනං මිනිහා බැඳල කියලත් නිශ්ශංක දන්නවා ඇතිනෙ..."

රාජිත කීවේය.

"බැඳලා..! මෙ අපේ සස්මිත..? ඒක නම් වැරදීමක්..."

නිශ්ශංක කීවේය. ශික්ෂාගේ හදවත වේගයෙන් ගැහිණ.

"මං හිතුවා නිශ්ශංකවත් රවට්ටලා ඇති කියලා.. මිනිහගෙ වයිෆ් මැරිලා.. දරුවෙකුත් ඉන්නවා.."

රාජිත හෙළි කළේය.

"ආ.. මෙ රාජිත කියන්නෙ ඒ කතාව ගැනද..? බලන කොට මිනිස්සුන්ගෙ හොඳ පැතිරෙනවා වෙනුවට ඊට වඩා ඉක්මණට නරක පැතිරෙනවා කියන එක ඇත්තනෙ.. කට කතාවලට නුවරය කොළඹය කියලා වෙනසක් නෑ නේද..?"

එවර කතා කළේ නිශ්ශංකගේ බිරිය ගංගාය.

"ඒ කිව්වෙ..?"

රෝෂණීත් කතාවට හවුල් විය.

"ඒක ටිකක් දිග කතාවක්.. කෑම ටික හැදෙනකන් ඇහැරිලා ඉන්නත් එක්ක එහෙනං අපි ඒ කතාව කියන්නංකො.."

නිශ්ශංක පුටුවේ හරි ගැසිණ.

"ඔය සස්මිතගෙ තාත්තා නැතිවෙනකොට සස්මිතට අවුරුදු හතක් අටක් ඇති.. අක්කට අවුරුදු දහයක් දොළහක් ඇති.. සස්මිතගෙ





අම්මා ටිච කෙනෙක්.. මහත්තයා නැතිවුණා කියල නෑ.. එයා දරුවො දෙන්නට හොඳට ඉගැන්නුවා.. දරුවොත් කාගෙන්වත් වචනයක් අහන්නැතුව ඉගෙනගෙන හොඳට හැදුණා.. මේ පැත්තෙ ඉස්සර වෙලාම කැම්පස් ගියෙ සස්මිතගෙ අක්කා ජයමිණී.. බලන්න ලස්සන දැරිවි.. ඒ ලස්සනම තමා ඒ ළමයට අවාසනාවට හිටියෙ.."

නිශ්ශංක මහතා කතාව මදකට නතර කළේය.

"ඒ කිව්වෙ..?"

රෝෂණී උන්නේ කතාවේ ඉතිරිය දැන ගන්නා නොඉවසිල්ලෙනි. ඒ උවමනාවම රාජිතටත්, ශික්ෂාටත් තිබිණි.

"ජයමිණී ලස්සන හින්දා කොල්ලන්ගෙන් බේරිලා ඉන්න බැරි උනා.."

එවර කතාව ආරම්භ කළේ ගංගාය.

"මෙ පැත්තෙ ඉන්න පාතාල චණ්ඩියෙක් ජයමිණී පස්සෙන් ඇවිත් මෙ ළමයව යාළු කරගන්න හරියට කරදර කළා.. ඒත් ඒ ළමයගෙ හිතේ කැමැත්තක් තිබ්බෙ නෑ.. තාත්තාත් නැති ගෙදර ජයමිණීට ආරක්ෂාව මදි උනා.. සස්මිතත් උසස් පෙළ කරලා කැම්පස් යන්න බලාගෙන උන්නෙ. එයාට අර පාතාලෙ චණ්ඩියගෙ ගෝලයො එක්ක තනියම හැප්පෙන්න බෑ.. ඔය චණ්ඩියා ඒ දවස්වල හිටපු ජනාධිපතිගෙ බොඩිගාඩ් කෙනෙක්ලු.. ඒ හින්දා මිනිහට දේශපාලන බලයත් තිබ්බා.. මට තාම මතකයි සස්මිත ඒ දවස්වල මෙහෙ ඇවිත් අපේ පුතා එක්ක ඔය කරදර ගැන කියනවා.. සස්මිත මෙහෙ ආවෙ ගියෙ පාඩම් කරන්න... ඒත් පස්සෙ පස්සෙ සස්මිත, පුතා එක්ක අර චණ්ඩි ගැන කතා කළේ හරිම තරහින්.. මොකක්ද අනේ ඒ මිනිහගෙ නම..?"

ගංගා, සැමියා දෙස බැලුවාය.

"බාලා නේද..?"

නිශ්ශංක කීවේත් අවමානයටය.

"අන්න හරි.. බාලා තමයි.. සස්මිත දවසක් පුතා එක්ක අඩ අඩා කිව්වා, ඔක්කොම තියෙද්දි බාලාව මරලා හිරේ යන්න හිතෙනවා කියලා.. එතකොටවත් අක්කට නිදහසේ එයාගෙ අනාගතේ හදාගන්න ඉඩ ලැබෙයිනෙ කියලා.."

ශික්‍ෂාගේ හිතේ සස්මිත නමට ඇවිලෙමින් තිබූ ගින්නට පිදුරු වැටුණ ගාණය. කණින් අහන මේ වචනයක් වචනයක් ගානේ හිතේ ගින්න වැඩිවෙනවා ඇයට දැනිණ.

"කොහොම හරි ඔය කාලෙදි ප්‍රචාරයක් ගියා ජයමිණී බාලා එක්ක පැනලා ගියා කියලා.. අපිත් හිතුවා අන්තිමට ජීවිතේ බේරගන්න ඒ ළමයා ඒ වගේ තීරණයක් ගන්න ඇති කියලා.. ඒත් ඇත්ත කතාව ආරංචි වෙලා තිබුණෙ ඊට පස්සෙ.. ජයමිණීව බාලා පැහැරගෙන ගිහින් අනවර කරලා ළඟ තියාගෙන ඉඳල තිබ්බා.. අවුරුද්දක් විතර යනකන් ජයමිණී ගැන ආරංචියක් ලැබුණෙ නෑ.. සස්මිතගෙ ඉගෙනීම කඩාකප්පල් වුණා.. එයා අක්කා හොය හොයා හැම තැනම ගියා.. බාලගෙ මිනිස්සු එක්ක රණ්ඩු කළා.. ගුටි කෑවා.. සස්මිතගෙ අම්මත් නිතර නිතර අසනීප වුණා.."

ගංගා විස්තර කළාය.

"අවුරුද්දකට විතර පස්සෙ ජයමිණී ආයෙම ගෙදර ආවා.."

නිශ්ශංක කතාව යළි ආරම්භ කළේය.

"එතකොට දරුවෙක් ලැබෙන්න ඔන්න මෙන්න.. අර කලින් තිබ්බ ලස්සන කොහෙ ගියාද නෑ.. කෙට්ටු වෙලා.. දුර්වල වෙලා.. හංගාගෙන ඉඳපු තැනින් පැනල ඇවිත් තිබුණෙ.. සස්මිතටත් තේරුණා අක්කව ගෙදර තියාගන්න බෑ කියලා.."

"මට මතකයි සස්මිත පිස්සෙක් වගේ මෙහෙ දුවගෙන ආව





හැටි.. ටික දවසකට අක්කව හංගලා තියාගන්න පුළුවන්ද කියලා ඇහුවෙ මගෙන්.."

ගංගා කීවාය.

"මාත් අම්මා කෙනෙක්.. දුවෙක් හිටියෙ නැතත් දරු දුක මං අඳුරනවා.. මං ජයමිණීව බාර ගත්තා.. ඒ ළමයා ළමයෙක් ලැබෙන්න පුළුවන් තත්ත්වයක නෙමේ, ජීවත් වෙන්නවත් බැරි තත්වයක උන්නෙ.. හිර කරන් ඉන්නකොට මේ ළමයා හරියට කෑමක් බීමක් අරගෙන තිබ්බෙ නෑ.. මෙහෙ ගෙනල්ලා දවස් තුන යනකොට ජයමිණීට දරුවා ලැබෙන්න අමාරු වෙලා හොස්පිටල් ගෙනිච්චා.."

කතාව අතර මැදින් ශික්‍ෂා අම්මා දෙසත්, තාත්තා දෙසත් බැලුවේය. ඒ දෙදෙනාම ගල් ගැහුණ ගානය. පුදුම වෙන්නට දෙයක් නැත. නිතර හිනාවෙන් සැහැල්ලුවෙන් වැඩ කළ සස්මිතගේ ජීවිතය පසුබිමේ මේ වාගේ අඳුරු පැතිකඩක් වේ යැයි ඔවුන් හීනෙකින්වත් නොහිතන්නට ඇත.

"දුවෙක් ලැබුණා.. ඒත් දරුවා ලැබෙනකොට ජයමිණීගෙ ජීවිතේ නැතිවුණා.."

ගංගා වේදනාවෙන් කීවාය.

"ඉතිං ඔච්චර දෙයක් වෙනකන් මේ මිනිස්සු නීතියෙ පිහිටක් ඉල්ලුවෙ නැද්ද..?"

රාජිත ඇසුවේය.

"නීතිය.. හහ්.. නීතියද..? නීතිය තිබ්බෙත් බාලාගෙ පැත්තෙ තමා.. පොලීසිය උනත් මිනිහට බයයි.. ඉතිං කාට කියන්නද..?"

නිශ්ශංක කීවේය.

"ඉතිං ඊට පස්සෙ මොකද උනේ..?"

රෝෂණී නොඉවසිල්ලෙන් ඇසුවාය.

"දරුවා ලැබිලා ටික කාලයක් යනකන් බාලාගෙන් සස්මිතලට කරදරයක් තිබ්බෙ නෑ.. ජයමිණී මැරුණ නිසා වෙන්නැති.. ප්‍රශ්න ආයෙ පටන් ගත්තෙ දරුවා හුරතල් වයසට එනකොට.."

නිශ්ශංක කීවේය.

"අම්මත් නැතුව සස්මිතයි, එයාගෙ අම්මයි මේ දරුවා හදන්න සෑහෙන්න මහන්සි උනා.. දරුවා සස්මිතගෙ අම්මට අම්මෙ කිව්වා.. තාත්තා කිව්වෙ සස්මිතට.."

ශික්‍ෂාගෙ නෙතින් කඳුළක් ගිලිහිණ. ඈ ඒ කඳුළ රහසේ පිස දැමුවාය.

"මන්න ඔය කොහෙද ඈතක මොන්ටිසෝරි එකකට තමා සස්මිත, දුවව දාලා ඉගැන්නුවෙ.. සස්මිතට තාත්තා කියන නිසා කවුරුත් හිතුවෙ ඒ සස්මිතගෙ දරුවා කියලා.. අනත කෙනෙකුට දුවගෙ අම්මා, දුව ලැබෙන්න ගිහින් නැති උනා කියලා කිව්වා මිසක් සස්මිත කවදාවත් ඒ අක්කගෙ ළමයා.. අක්කා මැරිලා කියලා කිව්වෙ නෑ.. එයා ඒ තරමට ඒ දරුවාට ආදරෙයි.."

ගංගා විස්තර කළාය. රෝෂණීට, ශික්‍ෂා දෙස බැලුණේ නිකම්මය. දියණියගේ නෙතින් පිට පනින කඳුළු රෝෂණීට පුදුමයක් නොවිණ. රෝෂණීගේ ඇස්වලටත් කඳුළු පිරෙමින් තිබිණ.

"ළමයා මොන්ටිසෝරි යන වයස එනකොට බාලට දරු තැක්කුමක් ආවා.. දරුවා ඉල්ලලා සස්මිතලට කරදර කරන්න පටන් ගත්තා.."

නිශ්ශංක මහතා කීවේය.

"හපොයි..!"

රෝෂණීට කියැවිණ.





"කරදරවලින් බේරෙන්නම බැරි තැන සස්මිතලා මෙහෙ ගෙවල් දොරවල් දාලා උන් හිටි ගමන් වෙන කොහෙද පළාතක ගෙයක් කුලියට අරන් ගිහින් ජීවත් වුණා.. අවුම තරමෙ ළමයා ඉගෙන ගන්න මොන්ටිසෝරියටවත් කියල ගිහින් තිබ්බෙ නෑ.."

රාජිතට, රණවක මහතා සිහිවිය. ඔහු කීවේ ඔහු දැන උන් සත්‍ය තොරතුරු නොවේද..?

"ආණ්ඩුව මාරු උනා.. අලුත් ජනාධිපතිගෙ හමුදාව පාතාලෙ කට්ටිය හොය හොයා මැරුවා.. බාලයි, එයාගෙ ගෝලයො රොත්තයි මරල දාලා හිටියෙ එකම තැනකදී.. සස්මිතලා ආපහු ගමට ආවෙ ඊට පස්සෙ.. ඒ ඇවිල්ලත් මෙහෙ උන්නෙ ආච්චි අම්මයි මිණිබිරියි විතරයි.. සස්මිත කොහෙ හරි කාලයක් ජොබ් එකක් කරා මා හිතන්නෙ.. දැන් ආයිමත් ඇවිත් කොහොම හරි රට යන්නයි බලන්නෙ.."

නිශ්ශංක මහතා දීර්ඝ කතාවට ඉවරයක් කළේ එහෙමය.

"ඔය කතාවෙ ඉතුරු හරිය අපි දන්නවා නිශ්ශංක.."

රාජිත කතාව ආරම්භ කළේය. මෙතාක් ඇත්ත විස්තර එළිදරව් කළ හිතවතාට තමන් දන්නා දෙය හංගන එක හොඳ නැත.

"සස්මිත මගෙ එස්ටේට් එකේ සුපරින්ටෙන්ඩන් විදිහට උන්නා.. මිනිහා එතනින් ආවෙ මාසෙකට විතර කලින්.. ඔය ආරංචි හින්දා අපි රැවටුණා.. අපි ඇත්තටම හිතුවෙ සස්මිත අපට බොරු කළා කියලා.. නැත්තං සස්මිතට අපේ මේ දුවව බන්දලා දීලා, සස්මිතව අපේ පවුලට ගාවගන්න අදහසක් අපට තිබ්බා.."

රාජිත ඇත්ත කතාව කීවේය.

"අනේ කොච්චර දෙයක්ද..? අපේ මෙයා නිතරම කියනවා මේ කොල්ලට දෙන්න අපි ළඟ කෙල්ලෙක් නැනෙ කියලා.."

ගංගා සතුටින් කීවාය.

"ඔක්කොමත් හරි.. දැන් මේ ලොකු ළමයා කරගත්තු දේත් හරි.. ඔක්කොටම කලින් අපි මේ කරදරේ ඉවරයක් කරන්න ඕන.."

රාජිත කීවේ රෝහලේ ඉන්නා මෝක්ෂා සිහිකොටය. ශික්ෂාගේ හදවතේ තිබුණේ මේ යැයි පැහැදිලි කළ නොහැකි වේදනාවකි.

'එයා අහිංසක වෙලත් ඒ අහිංසකකම ඔප්පු කරන්න එයා පොඩ්ඩක්වත් මහන්සි උනේ නෑ.. වරදක් නොකර බැණුම් අහනකොට.. තාත්තිගෙ කම්බුල් පාරක් කනකොට.. කොච්චර වේදනාවක් එයාට දැනෙන්න ඇත්ද..? අනේ සස්මිත පුළුවන් නම් අපට සමාවෙන්න..' ශික්ෂාගේ යටි හිත කෑගැවාය. එකම එක වරක් සස්මිත හමුවී ඒ දෙපා සිඹ හෝ සමාව ගන්නට තිබුණා නම් කියා ශික්ෂාට හිතිණ.

* * * * * * * * * *

The Reader's Place

පසුදා උදේ පිරිස රෝහලට ගියේ නිශ්ශංක මහතාගේ වෑන් රියෙනි. නිශ්ශංක - ගංගා යුවළත්, වරුසප්පෙරුම යුවළ හා ශික්ෂාත් මෝක්ෂාගේ වාට්ටුවට එන අතරමගදී ඔවුනට විජේන්ද්‍ර යුවළ මුණ ගැසිණ.

"මිස්ට වරුසප්පෙරුම.."

කෙවින්ගේ පියා රාජිතගේ අතක් අල්ලා ගත්තේය.

"අයැම් සෝ සොරි මිස්ට වරුසප්පෙරුම.. මෙතන ගොඩක් පැටලිච්ච කතාවක් තියෙන්නෙ.. ඇත්තටම අපට මේ පැටලිච්ච තැන ලිහල දුන්නෙ මාරියෝ.. කෙවින්ගෙයි, මෝක්ෂාගෙයි අතරෙ බොහොම දුර දිග ගිය සම්බන්ධයක් තිබ්බා කියලා අපි දැන ගත්තෙ මාරියෝගෙන්.."

කෙවින්ගේ පියා පසුතැවිල්ලෙන් කීවේය.





"අපිත් ඔය කතාව දැනගත්තෙ ඊයෙ මිස්ට විජේන්ද්‍ර.. මෝක්ෂා වෝඩ් එකට ආව වෙලාවෙම අපට ඇත්ත විස්තරේ කිව්වෙ.."

රාජිතත් කීවේය.

"කෙවින් කලේ හරිම කැත වැඩක්.. අපි කීයටවත් එයා කරපු දේ හරියි කියන්නෙ නෑ.. මෝක්ෂා එක්ක එහෙම සම්බන්ධයක් තියෙද්දි එයා අනිත් ළමයා ගැන ප්‍රපෝස් කරලා අපිව එහෙට යැව්ව එක හරිම වැරදී.. අපේ පුතාට වෙච්ච දේ ගැන අපට හරිම වේදනායි.. පිරිමියෙක්ට කකුලක් නැතිවෙනවා කියන්නෙ ලේසි පාසු දෙයක් නෙමේ.. ඒත් මං මිස්ට වරුසප්පෙරුමට පොරොන්දු වෙනවා.. ඔයාලට අපෙන් වෙන්න ඕන යුතුකමක් තියෙනවා නම් අපි කරනවා."

විජේන්ද්‍ර කීවේය.

"කෙවින්ට වෙච්ච දේට ඇත්තටම අපටත් කණගාටුයි.. මෝක්ෂා උනත් ඒ වගේ දෙයක් බලාපොරොත්තු වෙලා නෑ.. කොහොමද දැන් කෙවින්ට..?"

රාජිත ඇසුවේය. දරුවන්ගේ වැරදිවලට දෙමව්පියන්ට දඬුවම් කිරීමත්, දෙමව්පියන්ගේ වැරදිවලට දරුවන්ට දඬුවම් කිරීමත් සාධාරණ නොවන බව රාජිත දැන උන්නේය.

"අද වෝඩ් එකට දාල තියෙනවා.. හෙට දිහා විතර ඩිස්චාජ් කරයි මා හිතේ.."

කෙවින්ගේ අම්මා කීවේය.

"හොඳයි අපි ආයෙත් හම්බවෙමුකෝ.."

රාජිත විජේන්ද්‍ර යුවළගෙන් සමුගත්තේය. ඔවුන් මෝක්ෂාගේ වාට්ටුවට එනවිට මෝක්ෂාගේ ටිකට් කපා තිබිණ.

"මට කෙවින්ව බලන්න ඕන තාත්ති.."

වාට්ටුවෙන් එළියට ආ මෝක්ෂා කී පළමු වචන පෙළ එයයි.

"දැන්වත් ඒ ඔක්කොම අමතක කරනවා මෝක්ෂා.. අපි කියන දෙයක් අහල ජීවිතේ හදාගන්න බලනවා.."

රාජිත කීවේ සැරෙනි.

"මං ආයෙ කවදාවත් තාත්තිලා කියන දේකට පිටින් යන්නෑ තාත්ති.. මං පොරොන්දු වෙනවා.. මං මොඩලින් කරන එකත් නතර කරනවා.. ඒත් මට කෙවින්ව අමතක කරන්න කියන්න එපා තාත්ති.."

මෝක්ෂා හඬමින් කීවාය.

"තමන්ට ආදරේ නැති මිනිහෙක් මත්තෙ මැරෙන්න එපා දූව.."

රෝෂණී කීවාය.

"එයා මට ආදරේ නැතුවට මං එයාට ඇත්තටම ආදරේ කලා අම්මී.. මට එයා නැතුව ඉන්න බෑ.."

මෝක්ෂාගේ කඳුළු ශික්ෂාගේ නෙත්වලටත් කඳුළු බෝ කළේය. අක්කා ආදරය නමින් විඳවන්නේත් තමා විඳෙව්වා සේම ගින්දරක් නොවේද..?

"තාත්ති.."

ශික්ෂා, රාජිතගේ අතකින් මෘදුව අල්ලා ගත්තිය. දියණිය දෙස බැලූ රාජිත ඒ කඳුළු පිරුණු ඇස් මත වූ ඉල්ලීම හඳුනා ගත්තේය.

"හොඳයි.. අපි මිනිහවත් බලන්න යං.."

රාජිත ඉස්සර විය. කෙවින්ගේ යහන දෙපස විජේන්ද්‍ර යුවළත් උන්හ. කකුලක් අහිමිව ඇඳේ ඉන්නා කෙවින් දුටු ගමන් මෝක්ෂා දුවගොස් කෙවින්ව බදා ගත්තේ කෑගසා හඬමිනි.





"අනේ කෙවින්.. මට සමාවෙන්න.. මං ඔයාට මේ වගේ දෙයක් කරන්න හිතුවෙ නෑ.."

මෝක්ෂා හඬමින් කීවාය.

"ඔයා මට කරපු දෙයක් නෑ මිකී.. මේ මං කරපු දේවල්වලට දෙවියො මට දුන්න දඬුවම.. දැන් කොච්චර සල්ලි තිබ්බත් මං අබ්බගාතයෙක්.."

කෙවින් කීවේය. හිස ඔසවා කෙවින් දෙස බැලූ මෝක්ෂා ඒ පිරිමි ඇස් මත විසුල කඳුළු කැට දුටුවාය. වෙන කවරදාකවත් දැක නැති ආගන්තුක අසරණ බවක් කෙවින්ගේ ඇස් මතය.

"ඔයා මට එදා හිටපු කෙවින්මයි.. මගෙ හිතේ ඔයා ගැන තිබ්බ ආදරේ වෙනසක් නෑ කෙවින්.."

මෝක්ෂා කීවාය.

"මට ඇත්ත තේරුම් ගන්න මේ තරම් පරක්කු උනා මිකී.. ඇහැට පෙනි පෙනීත් ඔයා මට ආදරේ බව දැන දැනත් මං ඒක පිළිගත්තෙ නැති නිසා ජීවිතේ මට දඬුවම් කරලා ඔයාගෙ ආදරේ ඇත්ත කියලා පිළිගන්න ඉඩ හදල දුන්නා.."

කෙවින් කීවේ මෝක්ෂාගේ හිස මත අතක් තියාය.

"මං හිතන්නෙ එහෙනං ළඟදීම ඒපැත්තෙ මගුලක් තියෙයි වගේ රාජිත.. ඔන්න ආරාධනා කළොත් අපිත් නොවැරදීම එනවා.."

නිශ්ශංක කීවේ සියලු දෙනාගේම වේදනාබර මුහුණුවලට සැහැල්ලුවත්, සිනාවත් එකතු කරගෙනය.

"කෙවින් ඩිස්චාජ් කළහම අපි එහේ එනවා මිස්ට වරුසප්පෙරුම.. නවත් කල් දාන්නෙ නැතුවම මේවා පිළිවෙලක් කරල දාමු.. දැන් ඉතිං කෙවින්ව බලාගන්න එයාට අපි වගේ ආදරේ කරන කෙනෙක්



The Reader's Place

ළඟ ඉන්න ඕනේ.. මං හිතනවා මෝක්ෂා, කෙවින්ව හොඳට බලාගනියි.."

කෙවින්ගේ පියා කීවේය. මෝක්ෂාගේ හිත ඇතුළේ උපන් සතුට ඇගේ හිතේ ඇති තෘප්තිය කියා පෑවේය. ඇ හිතින් විඳි මේ සතුට දෙගුණ වූයේ ආපසු ගමනේදී වෑන් රථයේදී නංගි වෙතින් සස්මිතගේ ඇත්ත තොරතුරු අසා දැනගෙනය.

"සස්මිත එක්ක ඉස්සෙල්ලම කතා කරපු දවසේ මං සස්මිත ළඟ ලොකු අවංකකමක් දැක්කා නංගි.. අම්මලා කොච්චර කිව්වත් ඇත්තටම සස්මිත වංචාකාරයෙක් වෙන්න බෑ කියන සිතුවිල්ල මගෙ යටි හිතේ තිබ්බා.."

සියල්ල අසා හිඳ මෝක්ෂා කීවාය.

"කෙලින්ම ගෙදෙට්ටද..?"

The Reader's Place

ගෙවල් ආසන්නයේදී රිය පැදවූ නිශ්ශංක මහතා යාබද අසුනේ උන් රාජිත වරුසප්පෙරුමගෙන් ඇසුවේය.

"නෑ නිශ්ශංක.. මගෙ අතින් වෙන්න ඕන ලොකු යුතුකමක් තියෙනවා.."

රාජිත කීවේය.

"මං ඕක කියයි කියලා හිතුවා.."

නිශ්ශංකගේ මූණ පුරා සිනාවක් ඇඳිණ. මේ කතාබහ අසා උන් ශික්ෂාට දැනුණේ තමන්ගේ හදවත වෙන කවරදාටත් වඩා ගැහෙන බවය.

* * * * * * * * * *

අක්කරයක පමණ වූ සරුසාර ගෙවත්තක් මැදිකොට පිහිටි සස්මිතගේ තනි මහලේ සුවිසල් ගෙය ඉදිරිපිට නිශ්ශංක මහතාගේ රිය නතරවෙන හඬට එබී බැලුවේ සස්මිතගේ අම්මාය.





"නිශ්ශංක මහත්තයගෙ වාහනේ වගේ.."

ඉස්කෝලෙ නෝනා, පුතුයා සස්මිතට ඇහෙන්න කීවේය. දියණියත් එක්ක සෙල්ලමක උන් සස්මිත මිදුලට එබුණේ කුඩා සඳමිණිගේ අතකින් අල්ලා ගත් ගමන්ය.

"සස්මිත පුතා.."

පළමුව රියෙන් බිමට බැස්සේ නිශ්ශංකය.

"අන්කල්.."

ලොකු, පාට කොටු විසුල සරමක් හා ලා පාට කමිසයක් හැඳ උන් සස්මිත ඉදිරියට ගියේය. වාහනය ඇතුලේ තව පිරිසක් උන් බව සස්මිත දුටුවේ ඒ මොහොතේය.

"මන්න අපි සස්මිතගෙ නෑදෑයො කට්ටියක් එක්කරන් ආවා.."

නිශ්ශංක කීවේ ඉස්කෝලෙ නෝනාටය. රාජිතත් අනිත් කට්ටියත් පිළිවෙළට රියෙන් බැස්සෝය.

"සර්.."

සස්මිත වහා රාජිත ඉදිරියට ගියේය. නිශ්ශංක ගෙදරදී අහම්බෙන් වරුසප්පෙරුම පවුල දකිද්දී තමා ගැස්සුණා ඇත්තය. ඒත් ඒ සිදුවීමෙන් සස්මිතගේ බිඳුණු බලාපොරොත්තුවලට නව පණක් ලැබිණ. තමාට එදා වචනයෙන් පැහැදිලි කර දෙන්නට බැරිව ගිය ඇත්ත කතාව නිශ්ශංක ගෙදරදී එළිවේ යැයි ඔහුගේ හිතේ පොඩි පැතුමක් තිබිණ.

"එන්න සර්.."

සස්මිත, රාජිතට කීවේය.

"මට සර් කියන්න එපා පුතා.. මං කැමතියි පුතා මට තාත්තෙ

කියනව නම්.. කොල්ලෙක් නැති මට එනකොට පුතෙක් ලැබුණ වගේ දැනෙයි.."

රාජිත, සස්මිතගේ උරහිසට අතක් තියා කීවේය. ඔහු අතින් යම් වරදක් වී නම් ඒ වරදට සමාව ඉල්ලන්නට ඊට වඩා හොඳ වචන පෙලක් රාජිතට නොවිණ.

"මන්න ඉස්කෝලෙ නෝනා.. අනාගතේ මේ ගෙදර ලේලි වෙන කෙනා අපි අරගෙන ආවා.."

නිශ්ශංක මහතා කීවේ ගෙට ගොඩවෙමිනි.

"පුතා මට හැම දෙයක්ම කියල තියෙන්නෙ.. ඒත් මං මේ කල්පනා කළේ ඔය කියන කෙනා මේ දෙන්නගෙන් කවුද කියලා..?"

ඉස්කෝලෙ නෝනා මිදුලේ උන් නිවුන් සොයුරියන් දෙස බලා කීවාය.

"ඔය ප්‍රශ්නෙ අම්මට විතරක් නෙමේ මටත් තිබ්බා.. මං වරද්දගෙන පටලගත්ත තරම් ඇති.. අම්මා නම් වරද්දගන්න එපා.."

සස්මිත හිනාවී කීවේය. ඒ කතාවට ඔක්කොටම වඩා හිනා ගියේ අක්ක නගාලටය.

"මේ තමයි ශික්ෂා.. මේ ගෙදර ලේලි වෙන කෙනා.."

මෝක්ෂා, නංගිගේ උරහිස බදා වැළඳ සස්මිතගේ අම්මාට කීවාය. ශික්ෂාගේ ලැජ්ජාබර මුහුණේ අහිංසක ඇස් දෙස බැලූ ඉස්කෝලෙ නෝනා පුතාගේ තේරීමේ කිසි දොසක් නොවුණ බව දුටුවාය.

"ආනේ.. කවුද මේ බෝනික්කී..?"

මෝක්ෂා, සස්මිතගේ අතේ එල්ලී උන් සඳමිණිව ඇද තුරුළට ගත්තාය.





"පුතාගෙ නම මොකක්ද දෝණි..?"

"ස..ඳ..මිණී..."

ලා නිල් පාට ඇස් ඇති, කොණ්ඩා දෙකක් ගොතා, මල් ගවුමක් හැඳ උන් හුරුබුහුටි දැරිය දෙස බලා ශික්ෂා කල්පනා කළේ ඇගේ අම්මා වූ කෙනා කොයි තරම් රූමත් ගැහැනියක වෙන්න ඇතිද කියාය.

"ඉතිං..?"

මෝක්ෂා, සඳමිණීත් එක්ක ගෙට යද්දී සස්මිත අතකින් ඇද ශික්ෂාව මිදුලේ නතර කර ගත්තේය.

"තමන්ගෙ අතේ වරදක් නැති බව දැන දැන ඇයි එදා නිශ්ශබ්දව හිටියෙ..?"

දවස් ගාණක් අහන්නට බලා උන් පැනය කෙලින්ම ශික්ෂා, සස්මිතගෙන් ඇසුවාය.

"දැක්කද අර අහිංසක දරුවගෙ මූණ.. ඒ කිරිකැටියා මගෙ අතට දීලා, අක්කා යන්න ගියා.. මං දරුවගෙ මූණින් දැක්කෙ මගෙ අක්කව.. අක්කට තිබුණෙත් නිල්පාට ඇස්.. ඔය බැල්ම.. ඔය හිනහව... මං එදා හිතාගත්තා මේ දරුවා මගේමයි කියලා.. මට මාව විතරක් බාරගන්න තැනක් ඕන උනේ නෑ ශික්ෂා... ඔක්කොම කතන්දරේ තේරුම් කරවන්න මට තේරෙන්නෙ නැති හින්දා.. හැමදේම දෙවියන්ට බාර දීලා මං එළියට බැස්සා.."

සස්මිත තේරුම් කළේය. ඊළඟට ඔහු ශික්ෂාගේ ඇස් දෙක දෙස කෙලින්ම බැලුවේය.

"ශික්ෂා.. මගෙ දරුවට අම්මා වෙන්න ඔයා කැමතිද..?"

සස්මිත ඇසුවේය. ශික්ෂාගේ ඇස්වලට කඳුළු පිරිණ.

"මට හිතෙන්නෙ මං හරි වාසනාවන්තයි කියලා සස්මිත.."

"ඇයි ඒ..?"

"මට එකපාරම ඔයා වගේ ලස්සන මහත්තයෙකුයි. චූටි හුරතල් දූ පැටික්කියෙකුයි දෙන්නෙක්ම ලැබෙන්න යන්නෙ.."

ශික්‍ෂා සෙමින් කීවාය.

"මං ඔයාට ආදරෙයි ශික්‍ෂා.."

සස්මිත, ශික්‍ෂාගේ කර වටා අතක් දා ගත්තේය. ආත්මයට දැනුණ ආදරය හද විලම පුබුදුවාගෙන යනවා ඔහුට දැනිණ.

- අවසානයි -

The Reader's Place



*Monika Pushpa Kumari*
*Hadawila pubuda*



# හදවිල පුබුදා

පුංචිරට උරුම ගීතල සහර අතරේය,
කන්දෙපති පවා සීතලෙන් ගල්වෙතිය ගානය.
ඒත්..........
සිතන්ගින්දර නිවන්නට මේ ගීතලට බැරිය.
මම ආතුලතින් දැවී පිච්චියමින් උන්නෙමි..
සිතෙන වේදනාවන්නෙම්..........
මගෙ ආදරියේ.........
අම්මා ආදරයෙන වරදක් නැතිව
මහමෙර්ක වැරදි බාර ගෙන
මම ඔබේ හෙදුරින් වලියට බැස්සෙමි,
ඒ මුණිවතින.......
දනිමි මේ දුක හුඹට බර වැඩිය,
ඒ නිසාදා මේ දුක මා එක්කම මිය දුනාවේ.......
- සස්මිත මහතාමි

The Reader's Place



වරණ ග්‍රැෆික් සහ ප්‍රකාශන
" විසකිත "
නො:175/3
රම්‍ය උයන
ගොඩමහර
දෙල්ගොඩ

ISBN 978-955-0225-30-9
9 789550 225309

රු.490/=

00158614-1